

# බුදුගුණ අලංකාරය

# බුදු ගුණ අලංකාරය

විදාගම

මහානෙත්‍රප්‍රාසාදමූල මෛත්‍රෙය මහාස්ථවිරයන්

විසින් රචිත යි

මුනිදාස කුමාරණතුංග විසින්

ලියන ලද

# විවරණය

සහිත යි

2473

# විඥාපනය

බුදුගුණ අලංකාරයෙහි තත්ත්වය මේ දක්වා මුද්‍රිත ව පැවැති පොතින් අවබොධ කැරැ ගැනීම දුෂ්කර සේ පෙනී ගියෙන් මෙසේ ශක්ති ප්‍රමාණයෙන් සංස්කරණය කළම්හ. ගතානුගතික වූවනට නම් මේ දක්වා පැවැති සංස්කරණය ඉතා පිරිසුදු සේ වැටහෙනු ඇත. එහෙත් මේ සංස්කරණය බැලූ කලැ ඒ කොතරම් මුළාවෙක් ද යනු වැටැහෙනු නිසැක යැ. මේ සඳහා විමැසීමට ප්‍රමාණ වන පද්‍ය කිහිපයෙක් නම්, 4, 20, 40, 47, 49, 50, 57, 61, 65, 70, 88, 100, 102, 113, 132, 154, 159, 168, 169, 181, 203, 261, 276, 289, 322, 339, 369, 394, 423, 495, 506, 514, 526, 534, 537, 545, 549, 576, යන මේ යැ.

ඇතැම් පද්‍යයන් ගේ අර්ථ ද මේ දක්වා වරදවා ගැනුණු බව ව්‍යාඛ්‍යානයන් ගෙන් පෙනේ. අප ගේ විවරණය බැලීමෙන් ඒ මොනොවට පැහැදිලි වෙයි.

බාල ශිෂ්‍යයන් ගේ අර්ථසිද්ධියට ඉතා විස්තර කළ යුතු තැන් ද ඇති වන බැවින් බුදුගුණ අලංකාර පරිකථාව ද ඉක්මනින් ප්‍රකාශ කරනු ලැබේ. කර්තෘකාලාදිය ගැන ද කාව්‍ය තත්ත්වය ගැන ද සැලැකියැ යුතු කරුණු එහි කියැවෙයි.

**මුනිදස කුමාරණතුංග.**

2473 බක් පුර 14
පාණදුරේ නොරකපොළැ දී යැ.

# සූචි පත්‍රය.


බුදු ගුණ අලංකාරය (පෙළ) පිටු 1–48

| | | | |
|---|---|---|---|
| 1 | කව් මුව (කාව්‍ය මුඛය) | පද | 1– 9 |
| 2 | විසල් පුර වැනුම් | | 10– 35 |
| 3 | රද වැනුම් | | 36– 76 |
| 4 | තුන් බිය | | 77–102 |
| 5 | ලොවට වැඩ අවැඩ | | 103–119 |
| 6 | සෙත් මග | | 120–183 |
| | (1) නිවට බුදු පුද | 121-133 | |
| | (2) බමුණු ගහ සිතිදෙවි පුද | 134-158 | |
| | (3) ඉපුරු පුද | 159-173 | |
| | (4) උවිදු පුද | 174-183 | |
| 7 | බුදු බල | | 184–238 |
| 8 | පැරුම් බිම් | | 239–261 |
| 9 | නව ගුණ | | 262–271 |
| 10 | දෙතිස් මහ පුරිස් ලකුණු | | 272–304 |
| 11 | අසූ අනුවියදුන් | | 305 |
| 12 | බුදු පෙළහර | | 306–328 |
| 13 | බුදු ගුණ පමණ | | 329–338 |
| 14 | බුදුන් කුල පුවත් | | 339–351 |
| 15 | බුදු පිය | | 352–355 |
| 16 | බුදු මව | | 356–367 |
| 17 | බිසෝ වැනුම් | | 368–387 |
| 18 | මහ බිනික්මන්, බුදුබව, වේළු වන වස් | | 388–431 |
| 19 | බුදුන් ඇරියුම් (ආරාධනා) | | 432–440 |
| 20 | විසල් ගමන් ඇරඹුම් | | 441–483 |
| 21 | මඟැ පුද | | 484–507 |
| 22 | ගඟ තැරුම (ගඞ්ගාතරණය) | | 508–522 |
| 23 | විසල් මග සැදුම් | | 523–543 |
| 24 | මහ වැසි | | 544–562 |
| 25 | සෙත | | 563–592 |
| 26 | රුවන් සුත් දෙසුම් | | 593–600 |
| 27 | උවදෙස (උපදේශන) | | 601–608 |
| 28 | කතු නිදෙස (කතෘ නිදේශන) | | 609–611 |

බුදු ගුණ අලංකාර සාරය පිටු 49– 72

,, විවරණය ,, 73–140

# බුදු ගුණ අලංකාරය.

## 1. කව් මුව.

කුලුණු මෙත් සත වෙ ත
පතල නැණ සව් පදරු ත
එළි කළ ලොවට සෙ ත
නිතර නමදම් මුනිඳු සරණ ත

2

ලං කැරූ සසර ගි ම්
දුරු කැරූ කෙලෙස් බිය ගි ම්
සිදු කළ සුතු උතු ම්
වඳිම් නව ලොවුතුරු සදහ ම්

3

කිසි කෙනකුත් පම ණ
නොකළැකි ගුණැති අපම ණ
සත හට පිළිසර ණ
වඳිම් අදරින් අරි සග ග ණ

4

බව සිදු පසු රුවන්
අව බිය අදුරු ගි රුවන්
මුනි පෙර මහ රුවන්
මෙසේ නම කැරූ පුදු තෙරුවන්

5

කය නම් අසා ර ය
බව නම් බයංකා ර ය
කියනුව දිවා ර ය
කියම් බුදු ගුණ අලංකා ර ය

6

මහ කිවි වරන් පෙ ර
පවසා නොපත් පර තෙ ර
සුගතිඳු ගුණ ගැඹ ර
මෙ මා කියමි යි සිතනු වැරසැර

7

සුවාසූ දහස ක්
යොදුන් ගැඹුරැති මුහුද ක්
ගොඩ කෙරෙමැයි උද ක්
ලෙහෙනු කළ තැත් වැත්නැ දවසක්

8

එතෙකුදු වත් සො ඳි න්
පුරමි පිනක් නොම ඳි න්
මුනිඳු ගුණ මුහු ඳි න්
බිදක් දක්වමි උදක් ඔක ඳි න්

9

නුවණැතියෙනි මෙ මා
බස දෙස ඇතත් එ ද මා
දෙ සවන් පුව න මා
පමා නො වැ ගනුව මුනිගුණමා

## 2. විසල් පුර වැනුම්.

10

සඟ සිරි අ සා ලා
කළ ඹුරු සොඳුරු සා ලා
සිරින් සුවි සා ලා
පවර නුවරෙක් වී වී සා ලා

11

සත් සමුදුර අග ල
සත් ගිරි පවුරු වට ක ල
සක් පුර මිසැ උඩු ල
එ පුර සරි කො ද පුරෙක් සක්ව ල

12

බබළන පැහැ ගිගි ණී
වෙන වෙන දෙසින් සැපැමිණී
පබළු රන් මුතු මි ණී
නොයෙක් සල්පිල් සියෙන් පුසැදිණී

13

ගන රන් කොත් පැලැ ඳි
බිතු සිතුවමින් සිත් බැ ඳි
මිණි පහ පැහැ විහි ඳි
කොවේ මාවේ සියෙන් සිය සැ ඳි

14

පුරවැසියන් ති ළි
කෙළින කෙළි මෙන් නියැ ළි
දද ඉන් ඉන් වෙ ළි
කෙළි පුරඹර රැසින් බැබැ ළි

15

මනහර රුසිරි ස ර
දෙවියන් ලෙසින් සුර පු ර
උරයෙන් උර පැහැ ර
නිතර මහ සෙන් සිටිති එනුවර

16

සෙණ හෙන සේ කිපෙ න
නවසුන් ලෙසින් නික්මෙ න
හැම රුපු සෙන් දින න
මහත් ගජ සෙත් සිටිති තැනැ තැ න

17

හසළ පස් දහ රේ
කිසි දෙස් නොවැකි සිරු රේ
යනෙන තිති එ පු රේ
තුරඟ සෙන් වැනී තරඟ සයුරේ

18

එ පුර රජ මහව ත
බත් රන් දෙදෙන් පැහැප ත
සක් සත් ගත් දිග ත
නිතර රථ සෙත් විතර වනු නැ ත

19

සුර තුරු මෙන් කැමැ ති
දෙය යැදියනට දෙන ති ති
ලොවැ පරසිඳු පිනැ ති
නොයෙක් මඟසල් කුලත් ගෙන් පුති

20

සුරගන සිරි සි ලු
වරගන කෙළින සඳ ලු
ලිය ගී කන්ක ලු
ඉමෙක්-නැත නරඟ රඟ මඬුලු

21

ඇම තැනැ ඇති සැප ත්
එක තැනැ මැවූ සිරි ග ත්
දුකැ දුකැ රිසි නුමු ත්
තැතැ සි යන සම්පතෙක් එහි නැ ත්

22

නන්වෙස් නන්බර ණ
සැපතින් පිරුණු අපම ණ
සිරි වයසෙහි තරු ණ
කෙසේ මෙතකැයි යෙත් ද නරග ණ

23

සිහිල් දිය පිරු ණු
පිය ගැට පෙළින් දිලු ණු
බිඟු දුල් විසුරු ණු
වී ඇ තැනැ තැනැ පියුම් පොකු ණු

24

නල'බල නත් කෙහෙ ලි
බත් මිණි කිකිණි මුතු ලැ ලි
රන් වැට පහන් දි ලි
දෙරින් දෙරැ දත් දෙවන දත් හ ලි

25

අසුර සෙන් තර මින්
තැනැ තැනැ පණ අත'ර මින්
රුපු මත් උපුර මින්
සරන මහ සෙනඟැ අවි සර මින්

26

ගිජිඳුන් තිමද ගි ලි
තුරඟුන් ලෙසින් නොහැකි ලි
තබා බත් රනැකි ලි
කෙළින තත් තන්හි හිහි අලි කු ලි

27

දුනැ ගෙනැ විදු සිය ල්
උනුනට වෙමින් පිළිම ල්
කියනා රැ දෑ ව ල්
සැදිණි වෙන වෙන නොයෙක් විදුහල්

28

විහිදි මිණි කිර ණය
දොරදොරහි රන් තොර ණය
තිති සතොස කර ණය
සිරින් පිරිතිරි එපුර දෙර ණය

29

සතුරන් කළු නිහ ඬ
එහි රිය සක්හි සක් හ ඬ
වැජැඹෙයි දසත මැ ඬ
ලෙසින් රළු ගලු සයුර ගත්හඬ

30

පුර දෙරණතැ පි රි
තුර රෙන් සමඟ ඉති රි
දිගතැ ගොස් පැති රි
පවිති හය මිණි කිකිණි ගිගිරි

31

පසග තුරු නාදේ
ගජ සෙන් කුංචි නාදේ
සමඟ තුති නාදේ
එ පුරැ දිව රැ එක ති නාදේ

32

එව කාව බොව කිය න
තෙපුලෙන් පිරුණු ඇම තැ න
උතුරුකුරු දිවයි න
වැත්තැ ඉපුරින් එ පුර ඇම තැ න

33

සුරන් පහ සදි සිය
දිලි සත් රුවන් බිතු සිය
සත් දහස් සත් සිය
සතක් රජ මහ පහය ගැවැසිය

34

කෙළින පුර වැසි යන්
ලොබ වන තරම් දෙවි යන්
සව් සිරිනි සැදි යන්
සැදිණි එපමණ පොකුණු ගෙ උ යන්

35

තිරිඳුන් පෙම් බැ දි
උනුන් වෙතැ සිත් පැහැ ද
ඉඳිනෙන් එහි සැ දි
බියෙන් මෙන් කිසි දුකෙක් නො වදි

## 3. රද වැනුම්.

36

රැ දෙවෙනි නිතො රේ
මිණි පහ පැහැය පැති රේ
දුරු වන ගනඳ රේ
ලොවැති සව් සිරි සපිරි එපු රේ

37

සත් සිය දහස් ස ත්
සත් නරනිඳුනු සම ගො ත්
සත් වග කෙරෙහි මෙ ත්
සුත් වැ පවතිත් සිතින් මැදහ ත්

38

දුසිරි සිත නැවැ ති
රද නිති දත් ගුණ ඇ ති
මැදහත් ලෙස පැවැ ති
එ රජ ලිච්චවි නිරිඳු නම් වෙති

39

කුල දෙටුවන් පැවැ ති
සෙබෙහි තෙදණින් නොදිලෙ
වෙත් වූ සඳැ දිලෙ ති
රසින් මුසු නුමුසු රන් සේ වෙ ති

40

නො වලා 'වරද තත්
නො නැමී බසට මහ තත්
විලසින් පිය සු තත්
සතත් රකිනු යැ බලා ඇමතත්

41

නො මකා කුල සිරි ත්
නො තබා මැ දෙන දන් ව ත්
නො වඩා අය බදු ත්
නැගු සිත්සේ මැ දියැ දිය කො ත්

42

ගත උන් • ස බා මැ යැ
බස උන් ගේ ස බා මැ යැ
ඉසුරින් ස බා මැ යැ
සබා නම් උන් උන්ස බා මැ යැ

43

අවා බිය ඇවූ රු
සිත් සත් ගුණෙන් සපි රු
දිගු කීතැ කිවිය රු
ඔවුන් ගුණ සිතුවමින් තැවැ රු

44

රන් රූ සඳි සි ය හ
දූකැ දූකැ නොයන රි සි ය හ
කන්කලු සුබැ සි ය හ
ඔහු මැ තර දෙවිනමට නි සි ය හ

45

රුසිරින් ලොවැ ග රු
අසුරු සුරිඳුන් පිළි රු
දස රජ දම් දූ රු
ඔ න් සරි වෙති මෙලොවැ කවුරු

46

සක බිමැ පෙරලෙ මි ත්
ගැලැ බඹු නිසල කෙරෙ මි ත්
පවතින මෙත් නො මි ත්
තුමූ දුක් විඳිති සත රකි මි ත්

47

රෙන් ඇරැ ගෙනැ පෙ මි ත්
යන බිගු ලෙසින් කුසු මි ත්
ලොවට දුක් නො දෙ මි ත්
ගනිති අය පඩුරු පෙර නිය මි ත්

48

ලූව ද සිදු පෙදෙ සේ
දිය නො ගෙනැ සිපි නැව සේ
දන නො ගෙනැ මැ තො සේ
සිපිති දනවත් දෑහන් සිත සේ

49

පල ගත් අතු න සා
පල කන්නවුන් විල සා
දැන ගැනුමක් නි සා
දහම් නො හසති දනත් වන සා

50

සවනින් අසන බ ස
නුවනින් අසව යන ලෙ ස
කෙරේනි තමා බ ස
යමක් නො යොදති විසක් නිසි ලෙස

51

දෙන'තුල් සේ ඉස ට
සතින් වළකන වැස්ස ට
යෙදෙන මහතුන් හ ට
දෙසක් නො යොදති ගිනයන් හ ට

52

පර අඟනන් දෙ සේ
බලන ලෝ වැඩ පිණි සේ
ගිම් රිවි මඬල සේ
බලති ඇස හකුළුවා දූක සේ

53

පුතු වෙන සනහ සේ
පසව දුක් ඉවසන සේ
ලොව රැකුම්'දහ සේ
විඳිති දුක් සරු නො කොට සැපසේ

54

බබලන තුරු ව සා
වලා ලන මරු විල සා
අනුන් ගුණ කෙලෙ සා
නුගුණ නො මැ පතුරුවති වෙසෙසා

55

ඇත් ගොවුවන් ම රා
තුටු වන ගජන් අසු රා
දුක් ගත්තන් ම රා
එයින් තුටුසිත් නො වෙති ඉදු රා

56

සුවඳ හැල් උදු රා
රකිනෙව් වරා ඉඳු රා
අදහම් රැකැ පු රා
දහම් නො නසති සිතින් නිතො රා

57

පස් ඉඳුරන් රැග ත්
අරමුණු පසින් සැප ල ත්
විලසින් ජවන් සි ත්
ලෙවන් ලද සැපතින් මැ තුටු වෙ ත්

58

වතුරු වැලි බිම් පෙ ත
නොහැරැමැ කරනමෙත්තෙත
දුප්පත් සතුන් වෙ ත
කෙරෙති නිති මහ කුළුණු මෙන් සිත

59

කළු පිරුණු තෙල් ඇ ති
රකිනෙව් නිසල කොට නි ති
මහතුන් ගුණ නැණැ ති
නිතර රැකැ බැති සිතින් පවති ති

60

හමන පවනක් සේ
ගවර වළැ පුල් සර සේ
කුලනුකුලන් දෙ සේ
සම වැ පවතිති සිතින් සොඳ සේ

61

හිරු නැංග ද කෙ සේ
රකින'දුරු ගිරි ලෙණ සේ
සැඩ දනැතත් කෙ සේ
දුගී සත රැකැ සිටිති සිත සේ

62

දත් මැදූ ලා දම න
දුහැවි දඹු මෙන් දිනැ දි න
මෙහෙ ගෙනැ දනන් ගෙ න
පසුවැ නො දමති නොදත්තත්මෙන

63

වෙන වෙන කුරලැ දු වූ
වී ගෙනැ පුරන මෙන් අ වූ
හැම සත සිතැ සතු වූ
තමා ලෙඩී ලා නො වී අක පටු

64

කුස ගිනි විතර මි ස
නොකරන ලෙසින් බත් කි ස
නො කරවති දන රැ ස
සතන් රකිනා විතරකට මි ස

65

පිශුමෙහි මී විලෙ හි
තබා බොන හස මෙන් එ හි
දන දනවතුන් ගෙ හි
තබා වැඩ විදැ ගනිති නිතිගෙ හි

66

ඇතු රකිනා පිණි ස
දෑ ලන අඳුන් සස් ලෙ ස
එකකුට වැඩ පිණි සෑ
නො දෙති උඳුරු එකකුගේ යස

67

මෙ වැනි දස් කම් කො ව
ලබම් යමක් අභ ව
නො මැ දී ඒ ඔහු ට
නො සා දෙති දෙම්නසින් ඔහු ගෙට

68

මල සිදෙන පමණ ට
දවන රන් සේ ගිනි කො ට
කළු වරද පමණ ට
දෙවති සන්තාප ඔහු දන හ ට

69

සිඳු වඩ දිය නො ව න
කලපුව සිදෙන දිය මෙ න
සැපෙන් දුරු වූව ද න
තුමූ නො ඉඳිති සිතින් සැප ගෙ න

70

දුන්නෙහ් දැඩි ක මෙන්
විදි සරය දුර යන මෙන්
තම කළ දැඩි ක මෙන්
සතුන් දුරු නො කරවති නිය මෙ න්

71

මූල තිර වැ සිටි සේ
සලල වන තුරු සිර සේ
සත සුව විඳින සේ
තුමූ සලල වැ සිටිති සිත සේ

72

නුවර රකවරණ ට
කරන පවුරෙව් තිර කො ට
ලොවට රකවරණ ට
තමා තර කොට ගතිති හැම වි ට

73

බොන මෙන් මුව රැගෙ න
ඇතු සොඬිනුකා ගත් පැ න
ලෝවැස්සන් පොව න
තමා ලත් සැපත්’මා තිතියෙ න

74

මල් නො ගෙනැ පල දෙ න
දිඹුල් තුරු සේ ඇම තැ න
කිසි කරුණක් නො ගෙ න
දනන් පුවපත් කෙරෙති නිතියෙ න

75

සගිනි තොප පුහු දුන්
නුදුටුයෙන් සග සුරි දුන්
බලව සි තෙල ර දුන්
බුදුන් වදහල බැවින් සෙත දු න්

76

සැබැවින් තිදස පු ර
සුර සෙන් ලෙසින් මනහ ර
තුවූ කළ ලොව නො හැ ර
කෙසේ වනමු ද ඔවුන් සිරි ස ර

## 4. තුන් බිය.

77

සුර සිරි මෙන් නොම ද
රජ සිරි යෙහෙන් විඳැ වි ද
ඔවුනොවුන් පෙම් බැ ද
මෙසේ එ රජුන් රජ කරන ය ද

78

දෙවියන් ගනෙහි දි ලි
දිසි මෙන් ජරා විලි පි ලි
එ නුවරැ පවා ක ලි
හෙළකෑ දුබ්බික් දුකෙක් වීය ක ලි

79

නැතැ නිත්ත ව න්නේ
සව් සැප ලොව සතු න්නේ
පාණෙව් මෙතැ න්නේ
රෝග බියෙකුත් අවුත් ව න්නේ

80

ඉසුරින් තම නුව ර
සරි යැ යි සිතින් බැඳැ වෙ ර
දුන් මෙණ් කුවෙර ව ර
වන්නු යක් සෙන් අවුත් එ නුව ර

81

නුවරෙණි විසා ලා
යම් කිසිවකු තබා ලා
යම් දුසි සිතා ලා
මරු ගොසින් උන් වැනි වසා ලා

82

ගජ තුරග සෙන් හ ඬ
රිය සක් පසඟ තුරු හ ඬ
මෙ හැම වෙසෙසින් මැ ඬ
වැජැඹි බලුකැණසිලුත් ගේ හ ඬ

83

දිය අගල ගැඹු රු
වසා පවුරිස් අතු රු
මල මිනියෙන් පි රු
වට කල වැනි අමුතු පවු රු

84

දඹදිව් තල අව ට
උවදුරු නාක් එක් කො ට
නො හැරැ ගෙනැ එ පුර ට
අවුත් මරු බට වැන්නැ එක වි ට

85

ගොඩැ ගොඩැ ඇට සැකි ලි
තැනැ තැනැ තුබූ බලි බි ලි
මගැ මගැ රෙදි වැරැ ලි
එ පුර ඇම තැන බලත් පිලිකු ලි

86

දෙරැ දෙරැ මිනී බෙ ර
ගෙයි ගෙයි හඬ යැ බියක ර
සිලැ පිලැ අඳින ම ර
දුගී සිලතුන් නෙත් නැත'වස ර

87

මූත වරලැ ඉසැ ඉ සැ
හෙන කඳුලැලි යැ ඇසැ ඇ සැ
සා ගිනි යැ කුසැ කු සැ
කියන දුකුලවු මැ වියැ බයැ බ සැ

88

කඩ කබලැ අතැ අ ත
ඉපිලි නහර යැ ගතැ ග තැ
බැගැ හඬැ වතැ ව ත
වැඩුණු දල සෝ ගිනි යැ සිතැ සි ත

89

බිය තුනෙකින් රුදු රු
බලා සැපැමිණ් උවදු රු
ඇදුරන් ගෙනැ නැඹු රු
ඇතුළු නුවරට වන්නු එ නුව රු

90

උනුන් වෙතැ පිය බ ස
සොඳමින් සිහින් සහතො ස
උන් රජ මැති පිරි ස
නැමැදැ ඇති තතු කිවු යැ මේ ලෙ ස

91

දුඞි දුබ්බික් දුකෙ කි
කිසි වෙද කමක් නොකලැ කි
සැඩ රෝ දුක් බියෙ කි
යකුත් ගෙන් වන මහත් වසනෙ කි

92

කෙත් වත් විප තවි
ගං හෝ දිය ගිය තැවි
වැසි නැති විය තවි
නොයෙක් තුරු ලිය දැ පති තවි

93

තොලුු ගානා ත ණක්
දිය තලු තෙමන පම ණක්
නැති වැ තුරු සෙව ණක්
දුකෙකි සිවුපාවුනට දිසු ණක්

94

පෙර සුරඟනන් වැ නි
අඟනෝ සොඳුරු රුසිරි නි
මස් ලේ නැති බැවි නි
උදක් ගෙයි ගෙයි යකින්නන් වැ නි

95

නොයෙක් උක් මී ර ස
ගිය වැනි බිමයන් පර දෙ ස
සුලබ පස් ගෝ ර ස
දුලබ වියැ මෙහි ඇතැයි යන බ ස

96

පෙරළු සත සිත ලෙසි නි
තෙවුනා මනා සුවඳි නි
කපුරු කස්තුරු දු නි
මෙ පුර තපුරැයි දමා ගිය වැ නි

97

නැති වත් සිල් අට ග
සුවද ගැමෙක් නැත ඇ ග
දුර ලුයැ ලිය සස ග
පිහිටි අය සේ මැ බඹ සර ම ග

98

දුසිරි මග නැවැ ති
සිල්වත් දනන් සේ නි ති
කාව් නළු රසිනි ව ති
නටන නටවන අයෙක් නම් නැ ති

99

දැනෙන් එකග සි ත
වූ මෙන් කෙළි සිනා නැ ත
නොසිඟනා කෙනෙක් නැ ත
පිහිටි අය මෙන් දුහග පිළිවෙත

100

අයකු රටවැ ස් සෝ
වට ලූ යැ දුසිද ස් සෝ
ළඹ යැ පෙරළු නි ස් සෝ
දුනුත් වට ලා දුවති මැ ස් සෝ

101

දිය සෙ සිවු සසු රේ
මහ සෙනඟ ඇති නිතො රේ
සැපැම්ණී උවදු රේ
ඔවුන් ගැණෑ ගත හැකි යැ එව පුරේ

102

වැඩ කැරුමෙන් ලොව ට
සැපැම්ණී මෙ රජ සැපත ට
කිසි කම් නැති ලෙස ට
කිමෙක පිහිටක් නොවනු මෙ දුක ට

## 5. ලොවට වැඩ අවැඩ.

103

දුබ්බික් දුක් මු සු
තම සිත දුකට සුදු සු
නුවරුන් බස් ඇ සු
නිරිඳු මෙලෙසින් තෙපුල් පැවැ සු

104

රජුන් අදම්ටු ව ත්
වෙති මැතිදෝ ද එපම ත්
දුකැ උන් ගේ පුම ත්
බමුණුගහපතියෝ ද එ ගනිත්

105

උන් දුකැ දනවූ වැ සි
දන වෙති අදහමට රි සි
රුකැ උන් වෙතැ පැහැ සි
සුරන් සිතවත් අදම් අදහ සි

106

එ දුකැ තුරැ දෙ වි යෝ
වෙති අදහම මැ සෙ වි යෝ
එයිනා'හසැ දෙ වි යෝ
කෙරෙති සිත අදහමින් නො වි යෝ

107

මෙලෙසින් අදහම ට
නිරිඳුන් ලොවැ පැමිණි වි ට
එ රඳුන් සතු රට ට
හමයි විසම වැ පවත් දඩි කො ට

108

එ පවන් වැදූ සැලෙ ත
තුබ දෙව් විමන් ගමනො ත
කිපුණෙන් සුරන් සි ත
නො වස්වති වැසි ලොවට කැරැසෙ ත

109

රිවිසඳහු ද තො සේ
යන මඟැ නො යෙති පෙරැ සේ
එ සුරන් වත එ සේ
නැති වැ වැසි සස් කලට නො පැ සේ

110

එක ගමෙක ද වැ සි
වසිතත් සම වැ නො ව සි
ඉන් විසම වැ පි සි
තුබූ සස් වග ඉතා නොර සි

111

ඒ අහර කන බො න
දන හට එයින් ෙ න වෙ න
රෝ දුක් වන බැවි න
ලොවට වැඩ අවැඩ නිරිඳුන් ගෙ න

112

එ බැවින් අප ලොව ට
පෙර රජ සිරිත් වෙන් කො ට
කළ කී දෙය තොප ට
දැනෙන කියව යි කිවූ නියම කො ට

113

නුවරෝ එබස සා
නිරිඳුන් නුගු ණ විම සා
නැතියෙන් කිසි දෙ සා
මෙසේ පවසති ඔවුන් පස සා

114

සව් සතරෙහි පුරු දු
මහ සත් ගුණෙන් පරසි දු
මහ පින් ඇති මෙබ දු
උපන් නිසි කැත් කුලෙන් පිරිසු දු

115

දූනැ කළ ගුණ වෙසෙ ස
නුවණැති දනන් කී ලෙ ස
පවතින ඇම දව ස
දුරින් දුරැ කොට වසන බොරැ බ ස

116 .

මෙරමා වැඩ කැමැ ති
කීකරු ඇමැත්තන් ඇ ති
නො හැරැ මැ රද නී ති
කැමැති දෙය සිදු කරන විකුමැ ති

117

නැගෙන රිවි විල සින්
දිනැ දිනැ උදය සිර සින්
පෙර නිරිඳුන් වි සින්
පැවැති ලෙසට මැ පැවැති වෙසෙසින්

118

විකුමට නිබොරු ව ට
දෙන මහ දනට දන හ ට
දිවි සතර වනු කො ට
රකින සිඟිපත් ඇති වැ හැමවිට

119

පිරි සුසිරි ම ගේ
සිටි මැනි වරන් සම ගේ
රකින නිති සත ගේ
කවර වරදෙක් ද ඔබ ඇම ගේ

## 6. සෙත් මඟ.

120

නිරිඳෝ එ බස සා
මැතින් වෙතැ නෙත් සල සා
කියව කිවූ නොල සා
එ දුක් පහ වන කරුණු විම සා

### (1) නිවට බුදු සඳ.

121

නිවටුන් බස් නිව ට
දුවැටි පිවිටු සසර ට
නට ගුණ ගත් ගුණ ට
එවිටැ මැතිඳෙක් සෙබෙත් නැඟැසිට

122

නිරිඳු පද තඹර ට
නම කැරැ සෙමෙන් නැඟැ සිට
දිලි බදැඳිලි වැ සි ට
මෙසේ දත්වයි තෙපුල් සබය ට

123

සිත කෙලෙසුන් පසි ඳ
සැනැහුණු නිවන් පුර වැ ඳ
බුදු කෙනෙකැත මෙස ඳ
පවර පූරණ කසුප් නම් ල ඳ

124

කළ සතන පිරි සු දු
තපෝ ගුණයෙන් පිරි සු දු
ඇත බුදු කෙනෙක් සි දු
කකුද කසයින් නමින් පර සි දු

125

දුසිරි සිත නැවැ ති
තපෝ ගුණයෙන් ලද තු ති
බුදු කෙනෙකැත තෙද ති
අජිත කෙස්කම්බලී නම් ඇ ති

126

තුටු කළ සත සත න
දිලි තව තෙදින් ඇම තැ න
බුදු කෙනෙකැත සොබ න
නිගට නාතපුත් නමින් බබළන

127

සඳ සෙ තරු වැළැ මැ ද
බබළන තවුස් ගණ මැ ද
බුදු කෙනෙකැත මෙස ද
සජය බේලට්ටි පුත් නම් ල ද

128

ලොවැ නරයන් කර න
මඟ දුද ලබන නිතියෙ න
බුදු කෙනෙකැත නම් න
පසිදු මක්කලි ගෝසාල ය න

129

මෙ කියන බුදුන් වැ ද
කළ හොත් මහත් නිති පු ද
හිමි සඳ මෙ පුර බ ද
කී යැ උවදුරු දුරු වෙති සෙ ද

130

ජඩ නිවටුන් නි සා
බුදුනැ යි නමක් සල සා
ඔහු කී එ බස සා
කියයි මැතිඳෙක් සෙබෙඟි මෙලෙසා

131

පවු පිත් නැතැයි ය න
නිවටෝ යැමූ හැම දෙ න
ලොවට මුන් ගෙන් ව න
සෙතැත සිහිලස ලැබෙයි කිත්තෙ න

132

පවු පිත් දෙක මැ නැ ත
රකිනා තපස් කම් නැ ත
ඔවුන් බුදුනැ යි යෙ ත
මෙසේ අනුවණ කමෙක් නම් නැ ත

133

මුන් ගෙන් වෙති සෙ ත
කරන පුද මේ ලෙව් ස ත
වැලි මලු ලා සත ත
මඬින වැනි තෙල් පතා තෙලිය ත

## (2) බමුණු ගහ ගිනි දෙවි පුද.

134

බොරුවෙන් වඩන බ ඩ
එබැවින් දුරැරැ මුන් ජ ඩ
දත් සිවු වේ නොක ඩ
ගෙනැරැ බමුණන් කරව ලෝ වැ ඩ

135

ගහ කැන් වළු දවා
ගිනි දෙවියහට පු දවා
යාග කළු සො දවා
ඒ ය සෙත දුක් මුලින් මු දවා

136

එ මැතිඳු කී බස ට
මැතිදෙක් කියයි මෙ ලෙස ට
ලෙඩ දුක් පත් අය ට
තවත් උවදුරු දෙයි ද පිටැ පිට

137

බොරු වේ මතුරු බැ ද
වළහන ලෙවන් හැම ස ද
බමුණන් ගෙන් දුල ද
වැඩක් වූයේ ලොවට කිකල ද

138

ගහයෝ නම් අඹ ර
දෙවියෝ යැ උන සුර පු ර
නො ගනිති අන් අහ ර
උදක් අම රස මිසක් මනහ ර

139

එයිත් උන් පෙර ක ළු
කුසලින් නිපන නිකස ළු
අනෙක් කෙනකුන් ක ළු
දෙයක් උදෙසා නො වෙති උ පහ ළු

140

සිඳු දිය ලෙස නිස ග
පමණ නොකළැකි සැප ස ග
නර ලොවැ සැප එ ර ග
රුදුණු පිනි බිදු වැත්තැ තණ අ ග

141

සිවු සිය ගවු අස ල
වූ නම් නරෝ යම් ක ල
දෙවියෝ තමන් ගෙ ල
දූවැටි කුණු සේ කෙරෙති පිළිකු ල

142

එබඳු සුර ලොවැ සි ට
දෙවියෝ අවුත් මෙ ලොව ට
තමන් දුන් අහර ට
තුටුවැ සෙත කැරැනොයති රැකැසිට

143

නර ලොවැ දෙන පුද ට
රිසි වත දෙරින් දෙරැ සි ට
සුරනැ යි යනු කුම ට
දුගී යාචකයනට එ නිව ට

144

ගැනුමට අන් ඉසු රු
උපමා යොදු විසිතු රු
කෙරෙනී යාග බො රු
කෙසේ දුරුවේ ද ලොවැ උවදුරු

145

නොයෙක් දෙශ රැස් කො ට
කළ පුද ගිනි දෙවියහ ට
සෙත වෙයි යනු ලොව ට
පැවැති බොරු මායමෙකි පෙර සි ට

146

බරණැසැ පෙර කලෙ ක
බමුණු මහසල් කුලයෙ ක
ගුණ නැණ යුත් නිසැ ක
උපන් පින් සර බමුණු උතුමෙ ක

147

සව් සතර සමුදු ර
දැකැ නැණ නැවින් පර තෙ ර
පසිදු වැ ලොවැ පත . ර
තමා බිහි වන දිනෙකි ගුරුව ර

148

නො නිවා තබා රැ ක
දුන් ගිනි රැගෙනැ වනයෙ ක
වැසැ අවුරුදු නොයෙ ක
පුදන ගිනි දෙවියාට දවසෙ ක

149

සිගා ගිය තැනැ ල ද
ගොනකු ගෙනවුත් ගසැ බැ ද
කෙරෙමි මසින් පු ද
සිතා ගිනි දෙවියහට මහපු ද

150

ලුණු නැති මස් පුද ට
නපුරැ සි සිතා ගමක ට
යා දී ඔහු ලුණු ට
අවුත් වල වැදි දනන් එ තැනට

151

එ ගොනා මරා ම ස්
පලහා කමින් නොසර ස්
උන් ගිය සඳැ එ ගො ස්
බලා ගොන් නඟුට කුර ඇටරැ ස්

152

අප රකිනා තබා
තොප සතු ගොනා නො තබා
කන තෙක් වෙතැ තබා
බලා උන් කෙනෙකි තෙපි අ ත බා

153

එයින් ගිනි දෙවි නැ ත
උන් නැත පුදෙන් පල නැ ත
බොරු බස් ලොව පැවැ ත
කරන පුදයෙකැ නුවණ නැති ස ත

154

ගොන් මස් නොලදී නී
මෙ පමණ කව යි ඉනී
කියමින් වල'ගි නී
ගසා දියවර නිවි යැ එගි නී

155

උපන් බමුණන් කු ල
නුවණැතියවුන් පෙර ක ල
නිසරු කොට හැරි ක ල
එවැනි ගිනි පුද කළැයි කිම පල

156

ගිනි දෙවියා කැමැ ති
ගෙයි ගෙයි තබා කැරැ රු ති
නො නිවා රකින නි ති
මෙ ලොවැ ගැහුදු දුහුදු ලෙඩ වෙති

157

කලෙකින් බමුණු ද න
උදෙසා තම ලබන ද න
ගිනි දෙවියා පුද න
පුදෙන් පල කිම ලොවට සිදු ව න්

158

ගෙනැ බමුණන් ක තා
කරවන යාග මෙ ස තා
සුවඳැල් වී ප • තා
අකුරු වපුරන වැන්නැ නිය තා

## (3) ඉසුරු පුද.

159

තිසුලවි ගත් කා රින්
කළු පැහැ රැගත් උගු රින්
හත් සළු ගත'ඹ රින්
අඬක් උමයගන ගත් සිරු රින්

160

දළු අඩ සඳ බ ඳිනා
ඝොර සප් හරක් පල ඳිනා
රඟ කරන ඳිනැ ඳිනා
මහලු ගොන් වාහනෙන් ඇවි දිනා

161

ලත් මහ පද වියා
සිර සුර ගඟින් දෙ වියා
අනඟ රුව දූ වියා
යෙහෙකැ පුදකරත මහදෙවියා

162

එ මැ මහ දෙවිඳු හෝ
නො හොත් සිව ලිංගය හෝ
වැඳැ පිදුවොත් බො හෝ
එනී කී ලොවට සෙත ඇමහෝ

163

එ මැතිඳු බස් අ සා
මැතිදෙක් කියයි මෙ ලෙ සා
ඇති දුක් මද නි සා
තවත් දුක් ගෙන ලයි ද එව සා

164

දෙවියෝ නම් ස ගය
පැලැඹෙන අයෙකි ස ස ගය
උන් රූ මනර ගය
එසුළු වෙස් ඇති නො වෙයි මෙරගය

165

උතුමෝ ලියන් වෙ ත
නො ඉඳිනි විළින් දූකැ ස ත
මෙහෙසුරු උමා කා ත
තබා රකිති කියයි සිය ග ත

166

පවතිනා මෙ ලොව රැ කා
නැති කලැ ගිරි ඔතප් දෙ කා
ඔහු වැඳැ පුද නොමයෙ කා
කළුදැයි වැඩ සිදුවේද කිකලෙකා

167

අවි අත් වැනැසුම ට
නැත වෙයි තමා රැකුම ට
එයින් තිසුලවි හ ට
ඇතැ යි රාදෙස් දූනෙයි මොහව ට

168

රාදෙස් පවු මි ඳි
නිසි උතුමනාට නොබැ ඳි
සිටි බවයෙන් බැ ඳි
ඔහුට පුද කොට කිම් ද පැහැදි

169

ස සරෙහි සබව ද ත්
සිල්වත් දනෝ නැණව ත්
තුමූ රඟ නො කෙරෙ ත්
අනුන් රඟන රඟකුත් නො බල ත්

170

නළු වෙස් ගෙනැ එ සේ
නටන කලැ හැම දව සේ
උන් පිදුව යි කෙ සේ
වැඩක් සිදු වෙ ද ලොවට සිත සේ

198

බව දුක් ගිනි නි වන
සත මගපෙලෙන් පින වන
නැත සරි වත දෙ වන
කෙසෙත් මුනිඳුට තිලෝගුරු වන

199

සග මොක් සැප දෙව නී
අවා බිය දුක් නවත නී
පිරි මෙත් කුළුණු ඇ නී
ලොවට උතුමෝ ඔවුන් මුත් නැ නී

200

උන් උන් තැන් පු දා
උන් වන දෙසට නැම දා
යෙති බව දුක් මු දා
කියනු කිම උන් මිහිම පහ දා

201

උන් වැළැඳූ පය ද
උන් පද ලැසැති පහණ ද
උන් පිට දුන් රුක ද
පුදා මොක් සැප ලබති දුක් සි ද

202

එ මොක් පුර ව න් දූ සි
සෙත දෙන්ට එළිව න් දූ සි
නො කියව කුම න් දූ සි
තමා පද ගිරිතුරුඳු ව න් ද සි

203

තම රුව දුටු නෙත ට
තම ගුණ සිතූ සතන ට
දුක් නොවඳින ලෙස ට
දෙසියැ නිසි මග දහම් මෙ ලොව ට

204

හිස දිටු මුළුපු ලේ
අටග මග බිජු වපු ලේ
දහම් ගඟ දිය ලේ
ඔවුන් ගෙනැ සෙත දියත පත ලේ

205

දියැ සේ බිම ගිලෙ න
බිමැ සේ දියෙහි ඇවිදි න
අහසත් එ මැ කර න
සමත ඒ මුනි මිසක් වෙන නැ ත

206

දිනැ දිනැ දිනිඳු මෙන්
කර රස නොවන සි මෙන්
නොනැසී විදු කිඳු මෙන්
වැජැඹි අඩු නොවන පුන් සඳු මෙ න්

207

ලෙඩට දිව ඔසු සේ
මරු කතරැ පුල් විල සේ
දුකෙනි පිහිටෙක සේ
පිහිටි දෙර දෙරෙහි කප්තුරු සේ

208

ලං වැ සිටැ මරණ ට
වැදැ හොත් එ සක් දෙවිඳු ට
තෙකෙළ සුවහස් සැ ට
අසූ දිනි එක බසින් එ මැ වි ට

209

තබා තුන් පියව ර
වැඩි කලැ තිදස පුර ව ර
මුනි සඳු ගේ පව ර
කෙසේ පැවැසියැ හැකිද සිරිස ර

210

දසට රියනක් ග ත
රැගෙනැ අබ එව ඇතුළ ත
යත සැතැපෙත ඉඳි ත
සමත ඒ මුනි මිසක් වෙන නැ ත

211

සවනක් රසිනුඳු ළ
තිල බිජු පමණ ගනින ළ
ඇම තැන එකෙළි ක ළ
අනත' පිරියත් සියලු සක්ව ළ

212

දෙසත බණ එක වි ට
එක මගද බසිනෙළි කො ට
සිය බස ලෙස කත ට
ඇසෙසි මුළු ලොවැ සියළු සත හ ට

213

ඔහු බණ දෙසත වි ට
වන් සඳ දහම් මඬල . ට
මිසැ පිරිස විතර ට
නො යෙසි එක අගලකුත් බැහැර ට

214

වඩිම් යි සිතූ වි ට
දෞරගුළු ඇරෙසි එක වි ට
දිගු කල කළ පය ට
පිපෙසි සත්බුමු පිපුම් මුනිඳු ට

215

වළ ගොඩ එ විග සේ
සම වේ යැ බෙර ඇස සේ
දිව මල් වැසි වැ සේ
සැදෙසි මුනි වඩන මග දෙ ප සේ

216

මුනි සඳ යත උ සේ
වූවත් මෙර ගිරි සිර සේ
තිවූ වේ බඩ'ග සේ
නැමී පිළි ගනි යැ පද එ මැ සේ

217

බඹ ලොවැ ගොස් ඉඳි ති
කප් සිය දහස් නරඹ ති
රිවි සඳ පිරිමදි ති
මෙසේ ඔහු සඟ ගණ ද වැජැඹෙ ති

:218

සක්වළ ගිරි සුනෙ ර
දෙරණ සොල්වා එක ව ර
කරනා මහ පෙළහ ර
පවර සඟ ගණ යැ මුනි පිරිව ර

219

මේ සසරැ පෙර දව ස
නොයෙක් කප් කෙළ සුවහ ස
කුද පිළිවෙළ වෙසෙ ස
දකින සඟ පිරිවර යැ නිසි ලෙස

220

ලක් තබතත් දෙර ණ
පස් මද යැ යන අපම ණ
ලැබැ ගෙනැ මහ තුව ණ
එ මුනි වෙතැ සිටිති මහ සඟ ග ණ

221

මුළු ලොවැ ඇම දෙ සේ
දකින සත සිත සිත සේ
ලැබැ ගෙන දිව ඇ සේ
සිටිනි මහ සගහු ඔහු දෙ ප සේ

222

සුර බඹ ලොවැ සත න
කියන බස් හැම තැනැ තැ න
දිව කන් ලැබැ අස න
එ මුනි වෙත සඟ ගණ යැ වැජැඹෙන

223

කෙලෙසුන් දුරැරැ සි ත
විදසුන් මගින් ලැබැ සෙ ත
පින් කෙත් වන දිය ත
පසිඳු සඟ ගණ යැ මුනි සඳු වෙ ත

224

පහදු තමන් සි ත
මුඳුනැඳිලි බැඳැ වැඳි ස ත
ලන සඟ මොක් සැප ත
එ මුනි වෙතැ මෙවැනි සඟ ගණ ඇත

225

මහ බඹහු මුනිඳු ට
සේ සත් නගති මුදුන ට
එ මුනි සඳු පුදය ට
පිඹිති සක් සක් දෙවින්දෝ සි ට

198

බව දුක් ගිනි නි ව න
සත මගපෙලෙන් පින ව න
නැත සරි වන දෙ ව න
කෙනෙක් මුනිඳුට තිලෝගුරු ව න

199

සග මොක් සැප දෙව ති
අවා බිය දුක් නවත ති
පිරි මෙත් කුලුණු ඇ ති
ලොවට උතුමෝ ඔවුන් මුත් නැ ති

200

උන් උන් තැන් පු දෘ
උන් වන දෙසට නැම දෘ
යෙති බව දුක් මු දෘ
කියනු කිම උන් මහිම පහ දෘ

201

උන් වැළැඳු පය ද
උන් පද ලැසැති පහණ ද
උන් පිට දුන් රුක ද
පුදෘ මොක් සැප ලබති දුක් සි ද

202

එ මෝක් පුර ව න් දූ සි
සෙත දෙන්ට පිළිව න් දූ සි
නො කියව කුම න් දූ සි
තමා පද ගිරිතුරුඳු ව න් ද සි

203

තම රුව දුටු නෙත ට
තම ගුණ සිතු සතන ට
දුක් නොවදින ලෙස ට
දෙසියැ නිසි මග දහම් මෙ ලොව ට

204

මිස දිටු මුළුපු ලේ
අටග මග බිජු වපු ලේ
දහම් ගඟ දිය ලේ
ඔවුන් ගෙනැ සෙත දියත පත ලේ

205

දියැ සේ බිම ගිලෙ ත
බිමැ සේ දියෙහි ඇවිදි ත
අහසත් එ මැ කර ත
සමත ඒ මුනි මිසක් වෙන නැ ත

206

දිනැ දිනැ දිනිඳු මෙන්
කර රස නොවන සි මෙන්
නොනැසී විඳු කිඳු මෙන්
වැජැඹි අඩු නොවන පුන් සඳු මෙ න්

207

ලෙඩට දිව ඔසු සේ
මරු කතරු පුල් විල සේ
දුකෙහි පිහිටෙක සේ
පිහිටි දෙර දෙරෙහි කප්තුරුසේ

208

ළං වැ සිටැ මරණ ට
වැඳැ හොත් එ සක් දෙවිඳු ට
නෙකෙල සුවහස් සැ ට
ඇසූ දිනී එක බසින් එ මැ වි ට

209

තබා තුන් පියව ර
වැඩි කලැ තිදස පුර ව ර
මුනි සඳු ගේ පව ර
කෙසේ පැවැසියැ හැකිද සිරිසර

210

දසට රියනක් ග ත
රැගෙනැ අබ එව ඇතුල ත
යත සැනැපෙත ඉඳි ත
සමත ඒ මුනි මිසක් වෙන නැත

211

සවනක් රසිනුඳු ළු
තිල බිජු පමණ ගනින ළු
ඇම තැන එකෙළි ක ළු
අනත' පිරියත් සියලු සක්ව ළු

212

දෙසන බණ එක වි ට
එක මගද බසිනෙළි කො ට
සිය බස ලෙස කන ට
ඇසෙයි මුළු ලොවැ සියලු සත හ ට

213

ඔහු බණ දෙසන වි ට
වන් සඳ දහම් මඩල ට
මිසැ පිරිස විතර ට
නො යෙයි එක අඟලකුත් බැහැර ට

214

වඩිමි යි සිතු වි ට
දෙරගුළු ඇරෙයි එක වි ට
දිගු කළු කළු පය ට
පිපෙයි සත්බුමු පියුම් මුනිඳු ට

215

වළ ගොඩ එ විග සේ
සම වේ යැ බෙර ඇස සේ
දිව මල් වැසි වැ සේ
සැදෙයි මුනි වඩන මඟ දෙ ප සේ

216

මුනි සඳ යන උ සේ
වුවත් මෙර ගිරි සිර සේ
ගිවු වේ බඩ'ග සේ
නැමී පිළි ගනි යැ පද එ මැ සේ

217

බඹ ලොවැ ගොස් ඉඳි ති
කප් සිය දහස් නරඹ ති
රිවි සඳ පිරිමදි ති
මෙසේ ඔහු සඟ ගණ ද වැජැඹෙ ති

:218

සක්වළ ගිරි සුනෙ ර
දෙරණ සොල්වා එක ව ර
කරන මහ පෙළහ ර
පවර සඟ ගණ යැ මුනි පිරිව ර

219

මෙ සසරු පෙර දව ස
නොයෙක් කප් කෙළ සුවහ ස
කුඳ පිළිවෙළ වෙසෙ ස
දකින සඟ පිරිවර යැ නිසි ලෙස

220

ලක් තබතත් දෙර ණ
පස් මඳ යැ යන අපම ණ
ලැබැ ගෙනැ මහ නුව ණ
එ මුනි වෙතැ සිටිති මහ සඟ ග ණ

221

මුළු ලොවැ ඇම දෙ සේ
දකින සත සිත සිත සේ
ලැබැ ගෙන දිව ඇ සේ
සිටිති මහ සඟහු ඔහු දෙ ප සේ

222

සුර බඹ ලොවැ සත න
කියන බස් හැම තැනැ තැ න
දිව කන් ලැබැ අස න
එ මුනි වෙත සඟ ගණ යැ වැජැඹෙන

223

කෙලෙසුන් දුරුරු සි ත
විදසුන් මගින් ලැබැ සෙ ත
පින් කෙත් වන දිය ත
පසිඳු සඟ ගණ යැ මුනි සඳු වෙ ත

224

පහදූ තමන් සි ත
මුදුනැඳිලි බැඳැ වැඳි ස ත
ලන සඟ මොක් සැප ත
එ මුනි වෙතැ මෙවැනි සඟ ගණ ඇ ත

225

මහ බඹහු මුනිඳු ට
සේ සත් නගති මුදුන ට
එ මුනි සඳු පුදය ට
පිඹිති සක් සක් දෙවින්ද්‍රො සි ට

226

ගමනොත මුනි දූ නා
සුරිඳු රජ සිරි වි දූ නා
සිහිල් නල වි දූ නා
සලනි සුදු සිනිඳු වල් වි දූ නා

227

මුනි සඳු වඩින තැ න
දිව මල් දිව පහන් ගෙ න
පුද කෙරෙති වෙන වෙ න
දහස් සුවහස් පමණ සුරඟ න

228

සිතු මිණි මෙන් ලොව ට
සැපැමිණී මෙ අප මුනිඳු ට
සුර සෙන් සිටැ දෙ පි ට
සලනි පැහැ විහිදි මිණි තල් වැ ට

229

දෙවියෝ දිව ම ලි න්
අසුර සෙන් සිත් පලො ලි න්
දිව නාගි කඩුපු ලි න්
පුදති ගිරිතුරු දූ පුල් කම ලි න්

230

සවනක් රස් දිගෑ ත
පැතිරෙයි බුදුන් ගේ ග ත
බඹ ලොවැ සිටැ බල ත
අනෝලෝකිත යැ උන් මුදුන ත

231

සැදි මුළු තුන් දිය ත
විසිතුරු පෙනෙයි සරණ ත
රූ සිරි සර සුග ත
බලන අම රස වැන්නැ නෙතැ නෙ ත

232

එළි පත මිටි වැ යෙ යි
උඩෙළි පත හෝ උඩ යෙ යි
සත සිත තුටු වැ යෙ යි
මුනිදු නොනැමී මැ ගෙට වැදූ යෙ යි

233

නරඹා එක් දිග ත
මුනිඳුන් දහම් පවස ත
සිටි අය දස දිග ත
දකිත් අප මුනි සඳුන් මුවන ත

234

සදහම් දෙසනා ස ද
නිකුත් කට හඬ මුනිස ද
කුරවි වෙණ නාදට ද
වඩා දසසක් ගුණෙන් වෙයි න ද

235

සක්වළ නුබ දෙර ණ
පිරුණු දිය කඳ සතර ණ
කිය හැකි දූනැ පම ණ
පමණ නොකළැකි එ මුනි සඳු ගු ණ

236

මෙ තැනට මේ ව ටී
කියන උතුරක් නො දි ටී
එ ගනිති වැදැ වැ ටී
එ මුනි මැ යැ මුළු ලොවට බුහු ටී

237

සේ නො සේ කම් ප ල
ඇ ඇම තන්හි ඇම ක ල
පවති නුවණ බ ල
එ මුනි දසබල යැ ඉන් එම්බ ල

238

කිසිවකුට ලොව ඇ ති
දූකක් නොකරනු මිසැ නි ති
එ මුනි සඳ රුව ඇ ති
ඇතුන් කෙළ දහසකට බල ඇ ති

# 8. පැරුම් බිම්.

239

දිවකුරු බුදුන් කා ල
පටන් වන තෙක් දසබ ල
මෙ සතර අසෙකි කා ල
නො කෙලෙ එක උපතකුත් නිස්ප ල

240

දිසි ඇම තැනැ අහ ස
පමණ කළ හැකි තුරු රු ස
මුනි සඳු පෙර දව ස
පමණ නැත යදියනට දුන් ඇ ස

241

පරයා පොලොව ප ස්
දුන් යදියනට ඇඟ ම ස්
ඔහු දනට දුන් ඉ ස්
වේ යැ මහ මෙර ගිරි සිරට උ ස්

242

දිවකුරු මුනි කො රේ
පටන් බුදු වන අත රේ
දුන් ලෙයට සිරු රේ
මඳ යැ දිය කද මෙ සිවු සයු රේ

243

අප මුනි සස කා ලේ
දුන් දනට නො වැ සස ලේ
දෙවිඳු ඇඳි සස ලේ
දැනුත් පවති යැ සිසි මඬ ලේ

244

බුදු බල මින් දැ නේ
නො කිවත් බොහෝ මෙ තැ නේ
වටු වැ ද උන් තැ නේ
මෙ කපැ ගිනි නො ගනී යැ එ ව නේ

245

වඳුරු වැ උපන් කා ල
කළ අදිටනින් දසබ ල
පුරුක් බට දඬුව ල
දැනුත් නැත්තේ යැ උන් උන් ව ල

246

වඳුරු වැ මහ වන ත
මිනිසකු වළින් ගොඩ ල ත
එමෙ කා තම මර ත
ඔහුට මග පෑ කෙළේ මහ මෙ ත

247

පිය රද යෙදූ ව ද
කම්කරු කරත ඉස් සි ද
මව වලපුත් වැලැ ද
කෙළේ සම මෙත මැ සත්මැසි වැ ද

248

ගුණිමයෙකැ බුදු න් නේ
සිවි නිරිඳු වැ උප න් නේ
ඇස් උපුට දු න් නේ
සිතෙහි පිරි සත්තොස මැ දු න් නේ

249

පුණු යකු ගෙනැ දම ත
විදුරු පඩි කලැ එ සුග ත
ගල සැට යොදුනුසැ ත
වැටෙන අතුරෙහි ගණින් දැනැ ග ත

250

ගිජිඳු වැ මුනි සෙත ළු
විදී වැද්දවුට සිටැ ව ළු
සියතින් කපා ද ළු
දුන්නෙ සතොසින් සවන් පැහැ දු ළු

251

දිව නයි වැ ද නොම ද
වද කැරු රුගත ගත වි ද
ඇත ද දිව විස තෙ ද
රුහැණි නො වැ සිල්මැ රැක්කේ වෙද

252

මහජනක වැ පව ර
නැසුණු තුරු දැකැ පල බ ර
සපිරි රජ සිරි හැ ර
ගොසින් වන වැද කෙළේ තව ස ර

253

මුව රද වැ මුනි වි රු
විදූ විදූ දුවනා නරවි රු
වැටුණු වල ගැඹු රු
බලා ගොඩ ලා කෙළේ බිය දු රු

254

වදුරු වැ එ තෙර ග ග
පැනැ වේ වැලක් බැදැ ඉ ග
වානර සෙන් සම ග
ගඟින් එතෙර වැ යන්ට කෙළෙ ම ග

255

මැස්සකු බොනා විත ර
ලෙහෙයක් නො සොල්වා වෙර
මහබඹු පඬි වැ පෙ ර
දිනි යැ දඹදිවැ රජුන් එක ව ර

256

සීලව රද වරු දූ
නුවර ගෙනැ රුපු නරනි දූ
මහත් වද කරනු දූ
කෙළේ තම සිත සිල් මැ පිරිසු දු

257

බලා සත සිත ර ග
පැවැසූ දහම් මන ර ග
සිදූ කැරු සැප ස ස ග
සිටි පස් වා දහස් එක ර ග

258

බව දුක් විදැ න දී නි
සිටිනා සත දූකැ නොම දී නි
ගොඩ ලම් යන ස දී නි
දනට අඹුදරුවන් ද බැදැ දී නි

259

මග පල නියම කො ට
පැහැදූ ඔහු කී දහම ට
වන් සත මොක් පුර ට
කියත් සූවිසි අසංඛ්‍යක ට

260

දූඹි බැල්මක් නෙ තින්
මද දෞම්නසක් සිත තින්
කිසි අවියක් අ තින්
නො ගෙනැ මර සෙන් දිනියැ එ මෙ නි න්

261

ගණ්ත දත් අ තෙකින්
නො ඉගෙනැ දෙයක් පො තෙකින්
නො අසා ඉව තෙකින්
මෙ ලොව දූනැ නිමැවීයැ ම තෙකින්

## 9. නව ගුණ.

262

රහසත් පවු නො කො ට
කෙලෙසරයනුත් දුරු කො ට
නිසි වූයෙන් පුද ට
අරහ යැ යි නම කියති මුනිඳු ට

263

තුන් කල්හි මැ පැවැ ති
පදරුත් සියල් ලොවැ ඇ ති
අතැඹුල සෙ දූනැ ග ති
එයින් සම්මා සම්බුදුනැ යෙ ති

264

විද්දූ නැණ අට ද
පසළොස් සරණ ගුණය ද
ඇතියෙන් එ මුනි ස ද
පිරුණු විජ්ජා චරණ නම් ල ද

265

යහපත් කොට යෙ තැ සි
සුන්දර තැනට සැප තැ සි
සොඳුරු බස් කිය තැ සි
කියති ඒ මුනි රජුට සුග තැ සි

266

තුන් ලොව තතු ලෙස ට
දැනැ ගෙනැ නොදත් මෙ ලොව ට
දෙසුයෙන් නියම කො ට
ලෝකවිදූ යැ සි කියති මුනිඳු ට

267

හැම ගුණයෙන් න දු
සම වැඩි සතකු ඇම දු
දියතෙහි නැති ස දු
අනුත්තර යැ සි කියති මුනි දු

268

බඹසුරයකුන් ත ද
දමනය කැරැ තමන් ල ද
සෙසත් දී මුනිඳු ස ද
පුරිසදම්සාරථි නම් ල ද

269

බව කතරින් එ තෙ ර
ලනුයෙන් සතන් හැම ව ර
තිලෝගුරු මුනි ව ර
වී යැ සත්ථා නමින් පුවත ර

270

සිවු සස් සිය නැ ණි න්
දැනැ දැන්වී යැ කුලු ණි න්
දුරු ලයි අනුව ණි න්
එ බුදු නම් වී යැ නැණ පමණි න්

271

බෙදුයෙන් දහම් ක ද
බජනය කෙලෙන් ගුණ ක ද
බග දහමින් සස ද
බැවින් බගවත් වී යැ මුනි ස ද

## 10. දෙතිස් මහ පුරිස් ලකුණු.

272

රන් මිරිවැඩි ලෙස ට
වළු ගොඩ නො වී එක වි ට
වැදූ නැඟෙන මිහි පි ට
මෙ වැනි දෙ පතුල් යැ අප මුනිඳු ට

273

නැබ නිම් දිසි නිම ල
අර දහසෙකින් මනක ල
සියටක් රුවිනිඳු ල
මෙ වැනි රිය සක් දෙකෙකි දෙ පතු ල

274

පතුල සතරක් කො ට
බෙදුමෙන් එකක් විලුඹ ට
දිලි රත් පලස් ව ට
ලෙසින් දිගු විලුඹැ අප මුනිඳු ට

275

අඩු වැඩි නු ජීත ර
ඉඟුල් පලු සේ පැහැ ස ර
රතැඟිලි යැ මුනි ව ර
මොලොක් දික්අක් සිහින් මතහ ර

276

පිටි පසැ ඉදිරි පි ට
බැලූවත් දෙඅත්වරු සි ට
යටි පතුල පෙනෙන ට
උස් වැ සිටි බොලට වෙයි මුනිදු ට

277

මුලින් දළු සිහින ග
වට වැ සිටි මස් එක ර ග
සොඳුරු ඇල් ගප් ර ග
කෙරෙයි මන දහ මුනිදු පුග ද ග

278

දිලි මුනි දිව නෙ තිත්
කුදු මිටි නොවී නිය තිත්
නො නැමී සිටැ ග තිත්
දෙ දණ ඇරිමඩිතේ යැ දෙ අ ගිත්

279

ඇඳුරකු විසින් කා ළ
දූල් කවුළු සේ නිකස ළ
අතපය මුනි ලකා ළ
ඇඟිලි සම අතුරු වෙයි පැහැදු ළ

280

පොළමින් සියක් ව ට
පහන් ගිතෙලෙහි ලූ ය ට
කපු පුලුනක් ලෙස ට
මොලොක් අත්පා යැ අප මුනිඳු ට

281

පිණුම් පෙති ඇතුළ ට
වැදූ සිටිනා කෙමි විලස ට
වැදූ සිටි කය තුළ ට
පුරිස් ලකුණැත්තේ යැ මුනිඳු ට

282

දෑ ඟිඟුලින් මැද ළ
ඔප් ලා බහා දිවි ද ළ
ගුරු පිරියම් ලකා ළ
මුනිඳු රුව රන් රුවෙව් නිකස ළ

283

අල පතැ දිය ලෙස ට
දූලි තෙල් රජස් හැම වි ට
ගත නොරඳනා ලෙස ට
සිඹුම් සිවි ඇත්තේ යැ මුනිඳු ට

284

දුට වෙයි පෙරේ ම ය
දූකැ දූකැ රිසි නො යේ ම ය
මුනිඳු ඇඟ රෝ ම ය
දෙකෙක් එකතැනැ නොසිටිතේ ම ය

285

නිල් මිණි රස් තර ග
විහිදුවා සිටි මනර ග
හැම ලොම් මුනිඳු ඇ ග
වළලූ හී උඩ බලා සිටි අ ග

286

නෙතැ නෙතැ පියකා රුව
තිරසර ගුණෙන් විදු රුව
ලෙසින් මහ බඹ රුව
මුදු වැ ඉරිඳු වැ සිටි මුනි රුව

287

දෙ අත් පිටැ පා පි ට
දෙ උරෙහි කඳෙහි නහරැ ට
නොපැනෙනා ලෙස උස ට
පිරුණු මස් ඇත්තේ යැ මුනිඳු ට

288

සී රදු ගෙ හිම ද ඩ
පිරුණු වන් වෙයි පෙර කා ඩ
පෙර කඩ ද පසු කා ඩ
පිරුණු වනා මුනිඳු ගේ දියවැ ඩ

289

කටියෙහි පටන් කො ට
කැඳට දක්වා සම කො ට
රන් පලගක් ලෙස ට
පිහිටි මස් ඇත්තේ යැ මුනිඳු ට

290

මුළු තුන් ලෝ වි යත්
දනයන් කරනා නොවි යත්
මුනිඳුන් ඉග් කා යත්
දිගින් එක පමණ වෙයි බඹ යත්

291

සදහම් දෙසනා ව ර
නොඉපිලි නහර පැහැ ස ර
මෙන් රනා මිහිඟු බෙ ර
වට වැ මොනොවට සිටි මුනි කා ර

292

මුනි සඳු ගෙ ළඟු රා
සත් සියක් රස නහ රා
සිටියෙන් තුඩු පු රා
යැපෙසි මද අහරෙකින් සිරු රා

293

දෙළොස් වකැ සඳු ගේ
මඬල හනු සි රජු ගේ
පරයා එක ර ගේ
පිරුණු හනු දෙක යැ මුනි සඳු ගේ

294

පිහිටි අත් දෙ නික ට
දෙතිසෙක් වේ යැ දන හ ට
උස් මිටි නො වැ රුව ට
පිහිටි දත් සතළිසෙකැ මුනිඳු ට

295

ගා ඇතුළත් පිට ත්
සම කොටැ තුබූ සක් ප ත්
විලසින් මුනිඳු ද ත්
සිටි යැ උස් මිටි නො වී මඳකු ත්

296

තෙලි තුඩෙකින් සොඳු රු
ඇඳි හිරි ලෙසින් පැ'තු රු
මඳකුත් නො වැ සිඳු රු
විඳුරු සේ සිටි යැ දත් මුනි වි රු

297

සුදු රස් මනර ගේ
ලෙසින් සුර ගඟ තර ගේ
විහිදින දස දි ගේ
සතර දළ දා යැ මුනි සඳු ගේ

298

දිග පැ දෙකන් සි ල
මොළක දස්වා නැහැ තු ල
පළලින් මුළු නළ ල
එසක දිවැ මුනි සඳු ගෙ පැහැදු ල

299

කුරවී කෙවිලි හ ඬ
මියුරු යි කියන බස මැ ඬ
දෙවා තුති තුඬැ තු ඬ
පවතිතෙයැ මුනි සඳු ගෙ කට හ ඬ

300

ඉඳුනිල් මැණික ර ස
සරිකොටැ නො කියැ හැකි ලෙ ස
වඩවන සත සතො ස
පහන් නිල් පැහැ යැ මුනි පුවළු ස

301

එ කෙණෙහි මනර ගේ
උපන් රතු වස්සකු ගේ
ඇසි පිය ගුළි ර ගේ
පහන් ඇස් ගුළි යැ මුනි සඳු ගේ

302

ඇඳු රියනක් දිග ට
හළ සඳ මඬල සේ ව ට
බැම මැදු නළල් පි ට
දිලෙන උණු ලොම් යැ අප මුනිඳු ට

303

දිය බුබුළක් ලෙ සේ
වට වැ ගෙනැ සිටැ සොඳ සේ
නිල් මිණි රස් ලෙ සේ
බැබැළි අප මුනි සඳු ගෙ සිර සේ

304

මෙ ලෙසින් බුදුන් බ ද
දෙතිසෙකැ ලකුණු මනන ද
එ බැවින් මුනිඳු ස ද
පහන් තුරු සේ දිලෙයි හැම ස ද

## 11. අසූ අනුව්‍යඥන්.

305 නෙතැති වැ උප න්ජන
කරවන මනෝර ංජන
මුනිඳු ගෙ නිර ංජන
අසූවෙකැ ඇඟෙහි අනුවැ ංජන

## 12. බුදු පෙළහර.

306 තම වන දෙස නැමි ඉස කෙනකු න් නේ
දෙස වඳිනා ලෙස නො නැමියැ දෙ න් නේ
තම යස තුති කළ වුතට දන න් නේ
කලෙකත් පිරිදෙව් වැද්දූ නොදෙ න් නේ

307 ත ම නම සිඟි කළ සිතට සතු න් නේ
හැ ම දොම්නස් දුක් වැද්දූ නොදෙ න් නේ
හැ ම ලෙඩ සුව වන ලෙසට දන න් නේ
ත ම උපත මැ බෙහෙදක් කොට දූ න් නේ

308 තම වෙතැ දික් කළ අත පැ දේ යා
සිඟමනකට දික් කරනු නො දේ යා
තම වෙතැ යෙමි එසැවූ පා දේ යා
නිරයට වැදූ දුක් විඳිනු නො දේ යා

309 සි ඟි ලැ ල් පවතින් ගිම් ම ඩ වා ලි යැ
මෙ සි ය ල් ලොවැ පිය බස් දෙ ඩ වා ලි යැ
වි ය වූ ල් සත සිතැ තොස් ව ඩ වා ලි යැ
ග න බො ල් බිම මහඩින් හ ඩ වා ලි යැ

310 මුහුදූ ද පුප් රත් පඬෙර ගැ වැ ස් වි යැ
තුබ තල පිපි මල් වියනින් වැ ස් වි යැ
මුළු ලොවැ සුවදැති මල් වැසි වැ ස් වි යැ
සතර අපා සත සුව සේ වැ ස් වි යැ

311 අ ට තු රු සිය සුබ ලකුණෙන් සිරිම ත්
ය ට කැරැ බව දුක් එ බුදුන් බුදු ව ත්
ව ට සිය යොදුනෙකැ ගන ගිනි දූල් ග ත්
අ ට මහ නරකය විය'වුල් සියප ත්

312 ගෝ තු ම නම් එ බුදුන් බුදු වන ස ද
ජේ ත ලොවේ සා ගිනි දුක් මූල් සි ද
බී ත කරන ලෝ දිය උන් මුව වැ ද
සී ත අමා මිහුරස වියැ එ මැ ස ද

313 අ වි ග ත් යම්පල් කෙළි නන්දනවන
බ ල ව ත් කම් කවුලින් නන්දනවන
අ සි ප ත් වන බිය පත් නන්දනවන
සි රි ග ත් සුර සෙන් කෙළි නන්දනවන

314 ස ත් වග වෙත් මහ මෙතට අ මා ව ට
ප ත් වත උන් බුදු බවට අ මා ව ට
ප ත් වන නිරි සත් මුවට අ මා ව ට
ප ත් විය දිලි රත් යවට අ මා ව ට

315 බි ය ක රු ගිනි දූල් විසිරැ තුමූ ල් ව න
නි ර තු රු කවු සොළසඟුලින් තු ල් ව න
නි ර තු රු ඔසුපත් පිහිටි ඉඹු ල් ව න
සු ර තු රු වියැ සත සතොස උපු ල් ව න

316 ක ර වැ ල්  අවුලින් තිරිසන් වන ද  ග
ය ම ප ල්  බිළියෙන් අදනා ළගැ ළ  ග
ඈ ම ක ල්  දලවුල් වේතරණී ග  ග
සි හි ලැ ල්  දිය වියැ විලසින් සුර ග  ග

317 ග න බො ල්  යකබල් තිති ගිනී ගෙනැ ර  ත්
ඈ ම ක ල්  සිලිලොත් මෙන් සිහිලැල් ව  ත්
ගි නි දූ ල්  ලෝ දිය ලෝකුඹු තිරය  ත්
ම න ක ල්  මලවුල් පිරි කුඹු සිරි ග  ත්

318 ද රැ  ඤු වැ දස දහසක් සක්වළ තු  ර
දු රැ  නො වැ සිටි එක රගට මැ ඇම ව  ර
දු රැ  වියැ ලොවැඳිරි තිරයේ ගනද  ර
ඉ රැ  සඳු සුවහස් වන් මෙන් එක ව  ර

319 හි ම  වතැ මෙර ගිරි කුල ගිරි සිර  සේ
හැම  දිවසිනැ සක්වළැ දස දහ  සේ
බි ම  සිටැ තුරැ සිරට මැ එකබඳ  සේ
හැම  තැනැ හැම මල් පිපුණෙයැ එ මැ  සේ

320 උ ර ගු න්  ගේ ගත දුහුලින් රැ  ස් වූ
මොනා රැ න්  ගේ පිල් කලබින් පි  ස් වූ
දි වි ය න්  ගේ කෙළි මඬලෙහි රැ  ස් වූ
වෙ හෙ ලූ න්  අං දළුයෙන් කර කැ  ස් වූ

321 උ ර ගු න්  සතපා මුගපින් අර  ණේ
මැ ඩි ය න්  නිඳි ගැන්වූ උන් දර  ණේ
සි ව ලූ න්  කෙළිමින් සිටි තුරැ සෙව  ණේ
ස හ වූ න්  පෙම් කෙළි කෙළැවූ එ කෙ  ණේ

322 උ ර ගු න්  ගේ පෙණ මඬලට ව  ණ වූ
ගු රැ ළු න්  පිය තෙපුලෙන් ඔසු ඇ  ණ වූ
න ර ය න්  මෙන් සෙනෙහස එක ප  ණ වූ
තු ර ගු න්  මිහිවූන් පිය බස් බැ  ණ වූ

323 බ ළ ලූ න් ගේ  වෙතැ තිති අරත  ර වූ
මි හි ය න් ගේ  සිතැ ඇති බිය ඇ  ර වූ
දි ව දූ න් ගේ  වෙතැ පෙරැ තර වෙ  ර වූ
ක පු ට න් ගේ  සිත සෙනෙහස කැ  ර වූ

324 කෙ ස රැ න්  ගෙනැ ඇරැ දුන් නිය පඳු  රි න්
ගි ජි දූ න්  සනහා ලූ රස ගොදු  රි න්
ගි ජි දූ න්  ගෙනැ වත්කළ කර පොකු  රි න්
කෙ ස රැ න්  ගිම් දුරැ ලූ දිය දහ  රි න්

325 ගො එ ව න්  කී මිහුරස ගී ලෙස  වා
බි හි ර න්  දෙන අත් තල තාළම  වා
දූ ය දූ න්  ඇසැ දුන් රසඳුන් ලෙස  වා
පි එ න න්  දන රග කැරැවූ රුව  වා

326 මි නි ස ත් බව තිරිසන් අත් බව ල ද
හැ ම ස ත් වග විඳිනා හැම දුක් ත ද
බැ ලූ ව ත් දස දහසක් සක්වළෑ වැ ද
ම ද කු ත් නැත එ බුදුන් බුදු වන ස ද

327 ද ස දෙස මැදූ හළ මෙන් නිකස ළි වී
නි ස ල වැ සිවු සයුර'ම රසෑ'ති ළි වී
තො ස කැරැ මුළු ලොව ගත් පුද කෙ ළි වී
ද ස දහසක් සක්වළ එක හෙ ළි වී

328 මු ළු තු න් ලොව ගෙයෑ ගෙයෑ හළ දෙ ර වී
ද නා කැ න් වද බන්දනයෙන් තො ර වී
හැම තැ න් දිව සුවඳින් මනහ ර වී
මෙ ලෙසින් මුළු ලොවැ මහ පෙළහ ර වී

## 13. බුදු ගුණ පමණ.

329 එ බ සි න් බසට මැ කරවා තුති න ද
වෙසෙ සි න් තම නැණ පමණින් පිරිසි ද
අ හ සි න් බානා මෙන් එක පිනි බි ද
මෙලෙසි න් එ මැතිඳු බුදු ගුණ කී ස ද

330

ඔහු තෙපුලෙන් සුබැ සී
අසා මුනිඳුන් ගුණ නී සී
නැවැතත් අසන රි සී
නිරිඳු ගෙණෙ මේ ලෙසින් පිළිවි සී

331

උතුමැ සි යන ලොව ට
බඹසුරනරන් පසු කො ට
පැවැසූ තියම කො ට
මෙතෙක් ගුණ ඇද්ද ඒ මුනිදු ට

332

මුනිඳුන් ගුණ වෙසෙ ස
දනැ ගත නො හී තතු ලෙ ස
නිරිඳුන් කී එ බ ස
අසා ඒ මැතිඳු කියයි මේ ලෙ ස

333

බඹ සුර ලොව දෙර ණ
හැම තැනැ දනන් අපම ණ
කියතත් ලැබැ නුව ණ
පමණ නැත අප බුදුන් ගේ ගු ණ

334

නිතොර පැරුමන් ද ස
සාර සැකි කප් සුවහ ස
නුපුරා ඔවුන් ලෙ ස
කෙසේ පැවැසියැ හැකි ද ගුණ රැස

335

උන් රුසිරි දුකැ නෙ ත
ඔවුන් සදහම් වැදූ සි ත
නොපහන් කෙනෙක් නැ ත
එයින් උන් ගුණ කියත් හිම් නැ ත

336

බුදු ගුණ මහ මුහු ද
නුදුටු පර තෙර හැම ස ද
මා කී ගුණ මෙ ස ද
එයින් ගත් වැත්නැ එක දිය බි ද

337

පොළොවෙහි පස් ර ගින්
දිසි බුදු ගුණ යැ සැම ගින්
ම කී ගුණ මෙ ර ගින්
එයින් ගත් පස් වැන්නැ නියගි න්

338

බුදු ගුණ මහ අහ ස
තුදුටු නිම්මක් දස දෙ ස
ම කී බුදු ගුණ ලෙ ස
වැත්නැ මැසි පියෙනි යෙව් තුබ කු ස

## 14. බුදුන් කුල පුවත්.

339

මුනිඳුන් ගුණ මහ ත්
අසා නිරිඳෝ තුටු සි ත්
ඔහු පුර කුල පුව ත්
කෙබඳු දැයි ඔහු අතින් පුලුවු ත්

340

එ සඳැ කුල පරපු ර
පුර ඉසුරු පිරි පිරිව ර
වරගන රුසිරි ස ර
සරා මෙ ලෙසින් කියසි මැති ව ර

341

බඹ උපතින් සැප ත
පෙර නරලොවට කැරැ සෙ ත
නරන් කල සම්ම ත
වී යැ නිරිදෙක් මහා සම්ම ත

342

රිවිකුලෙහි මනන ද
ඔහු දරු මුනුබුරු වැ සො ද
සක්විති ඉසුරු ල ද
උතුම් නිරිඳුන් ගෙන් සැදුම්ල ද

343

ලත් සක් දෙවි ප දෙවි
දෙවියනට වූ කුල දෙවි
මන්දා තු නර දෙවි
පසන් කිත් දිය කඳින් කුලදෙවි

344

මුළු සක්වලැ වැජැ ඹි
සිත අවගුණෙන් නොකැලැ ඹි
බෝසත් ගුණෙන් දු බි
මහා සුදසුන් රජුන් ගෙන් සෙ බි

345

පද නිය කිරණ ම ලි
කල නිරිඳුන් මුදුන් ම ලි
බඳ ලොවැ ජය කොහෙ ලි
පසිඳු මුවදෙව් රජුන් ගෙන් දිලි

346

ගොස් බඹ තලැ දූවැ ටි
යස ලිය රඳන දිගු ය ටි
ලොවැ තුගුණ කල පැ ටි
පවර නිමි නිරිඳු ගෙන් සුපිහි ටි

347

රුපු සෙන් බිදැ ගිහි ණී
ලත් දෙවිඳු ගෙන් අග මි ණී
සව් සිප් කෙල පැමි ණී
කුසා රජ පරපුරින් සැපැමි ණී

348

අව බිය නැවැ ත් වූ
දස රජ දම් පැවැ ත් වූ
විකුමෙන් මහ ත් වූ
එ රම් රජු ගෙන් සසිරිම ත් වූ

349

පුන් සඳ කිරණ බ දු
යසසින් දියත කල සු දු
සිව් සගරු පුරු දු
ඔකාවස් පරපුරින් පරසි දු

350

මෙ ලෙසින් ලොවැ පැවැ ත
ආ රජ පරපුරින් ප ත
ජයසේන නම් සු ත
පවර නිරිදෙක් වී කිඹුල් ව ත

351
ඔහු පුත් වූ තොම ද
විකුමෙන් රජුන් මත් බි ද
සිහ හනු නම් ල ද
රජෙක් එ පුරෙහි මැ රජ සිරි ල ද

## 15. බුදු පිය.

352
රිවි කුල සුර තු රේ
ගත් අම පලෙක අසු රේ
සිටි පිය තනතු රේ
වී යැ ඔහු පිත් රජෙක් එපු රේ

353
ලෙස සරද දෝ නා
යසසින් ලොව් සු දෝ නා
සිතැ කිලුටු දෝ නා
නමින් ඒ රජ වී සු දෝ නා

354
මුනිඳුට තිලෝ ගු රු
ලබන ලෙස පිය තනතු රු
දස පැරුමන් එ පි රු
පුරා කප් සුවහසක් නිරතු රු

355
සුර බඹ සතුටු කො ට
හැම නරනිඳුන් පසු කො ට
එ පින් පල දෙනු කො ට
පැමිණේ මහ රජ තුඹෙමකැ ඒ පුරට

## 16. බුදු මව.

356
මවු තනතුරු ප තා
බුදු කෙනකුනට නිය තා
දන් සිල් ගුණ ඉ තා
පුරා කප් සුවහසක් සත තා

357
සිරින් සුරි ඳු වූ
යසසින් පුන් ස ඳු වූ
තෙදින් දිනි ඳු වූ
අදුන් සක් නරනිඳුට ඳු වූ

358
රූසිරින් ත මායා
සරි කළ ලෝ අ මායා
වන් නෙතට මායා
රදූ සුත් වූ නමින් මායා

359
සුදෙවුන් රජු පිණි ස
එ මායා බිසොවුන් කු ස
පිළිසඳ ගෙනැ සක ස
බිහි වැ මැදි පෝ දා වෙසක් මස

360
දුටු දුටුවන් සිත ට
සක්විති සැපත් පසු කො ට
සැපැමිණැ ඉඳු ලෙස ට
කිඹුල්වත් පුරෙහි රජ සැපත ට

361
යසසින් සුපිරිසු ඳු
කළ තුන් ලොව් මැ සව්සු ඳු
රජ උතුමෙක් මෙබ ඳු
වී යැ සිදුහත් නමින් පරසි ඳු

362
අසුර සුර බඹ හැ ම
තුටු කැරැ නරන් නො හැරැ ම
දක්වා ලොවැ මහි ම
එ හිමි සඳ තම උපන් දිනෙහි ම

363
මිහි පිටැ සිටැ තො සින්
දිගත නරඹා දිගැ සින්
සක්විති රජ වෙ සින්
ගොසින් සත් පියවරක් වෙසෙස සි න්

364

සුර බඹ මහ ස . බව
පුදන දන බුදු වන බව
තෙපුලෙන් හෙන ස බව
කී යැ තම මුළු ලොවට අඟ බව

365

සිටැ සත්මැසි වය ස
පලක් බැඳැ ඉඳැ නුබ කු ස
නම්මා පිය සිර ස
දියතැ කියැවියැ තමා යසරැ ස

366

ලොවැ හැම සතන් නි නි
ඇරැ ගෙනැ යතත් අබු නැ නි
නිදන් සතරෙක් ඇ නි
ගවු දෙ තුන් ගවු සොදුන් ගැඹුරැ නි

367

හිම ගිම් වසන් කා ල්
විසුමට සුදුසු සුවිස ල්
තුන් පස් සත්මහ ල්
එ තුන් පහ කුසෙහි විසි මතක ල්

## 17. බිසෝ වැනුම්.

368

තෙසු කුලගනන් හැ ර
රජ කුලැ උපන් මනහ ර
සුරගනාසුරු පව ර
ලියන් සතලිස් දහස් පිරිව ර

369

දිලි රුව මෙන් කා සුන්
ගමනින් හසුන් මන් සුන්
වුවොව්හට සුද සුන්
යසෝදර නම් කතක් මෙහෙ සුන්

370

මුන් වරලස කල බ
සරි වන වතක් නො මැ ලැ බ
නුදුටු නො ඇසූ සු බ
මුනුල කෙලෙසින් මැවී දෝ බඹ

371

ඉඳු නිල් ඉඳුවර ට
නැත මෙ වැනි පැහැ මුළු ර ට
මොවුන් ඇස් මැවුම ට
කුමන පැහැයක් ගති ද එක් කො ට

372

දුටුදුටුවන් ඔකා ද
වනා මුන් වුවන් පුන් ස ද
මවනා කලැ නුබ මැ ද
අනේ කුමකට මැවී දෝ ස ද

373

වට මට සිලුටු කො ට
ගත හැකි ලීමෙකින් ව ට
මුන් කරැ හිරි තුන ට
කුමන උපදෙස් ලදී ද ඇඳුම ට

374

ගන රන් කුඹු අසු රු
දුටුදුටුවනාව පියකා රු
කලොත් මුන් පියොවු රු
බඹා බඹ සර වේ ද තහවු රු

375

මොලොක් සිගිලැල් ව ත
එක් කොටැ අඹා පැහැප ත
අසුරු මුන් කොමල ත
බලව උවමක් සොයත අන් නැ ත

376

සඳත් කුඹු අසු රු
උසුලනා පින් පියොවු රු
ඉගැ සිහින නිබො රු
කිව යි අදහා ගනිති කවු රු

377

කැරැ තුනු තුනු රුව ට
කල කැම් වෙසෙස පැම ට
දුන් කළු හුය ලෙස ට
වසා රොද මුන් වැජැඹි මොනවට

378

රඹ කඳ ගදැත් කු ර
පෙරළ කල බඹසු මෙහෙව ර,
නපුරු සී හැම දුරු ර
මැවූ වැනි මැය වටොර මින් හර

379

දනත් කල ඌ තුං මතු
දණ උතු සුගට ර ත් ළතු
සරි නො වත ද තුං සුතු
ලුවම් නැත දුට කියම් මින් මතු

380

තුබ මැද පතී පත ග
නොදිලෙන පහන් සිළු ර ග
උවම් නොකලැකි ල ග
කෙසේ වනමුද මොවුන් සුගදග

381

රූ සශුරේ ප තුල්
නො පෑ මුත් ගේ දෙ ප තුල්
කෙරෙඩි සත ලොබ තුල්
කුමක් කියමු ද මෙ ලොවැ කැරු තුල්

382

නො වසා සුවලැ සේ
දුකැ දුකැ රිසි නොයන සේ
රුව ඇති කලැ මේ සේ
කිම් ද නර සුර ලොවැසි මවනසේ

383

නම ඇසූ පමණ ට
ලොබ වත මතුරු විලස ට
මුත් රුව වන නෙත ට
ලැබෙනු සග මොක් ඉතා උගහ ට

384

සුරගන සරි සි රින්
බබළන මොවුන් රුසි රින්
බැඳුණෝ පෙම් බ රින්
කෙසේ ගැලැවී යෙද්ද සස රින්

385

මෙලෙසින් ලොවැ මහ ත්
වියතුන් බසින් තුති ල ත්
පවර රිවි කුල කො ත්
රුවින් මුළු දඹදිවට අග ප ත්

386

දුකැ රුව මේ ර ගින්
නෝරු ගනෙව් ස ස ගින්
බබළන තුනුව ගින්
පවර එ බිසෝ ළඳුන් සම ගින්

387

නො හැරු මැ දස දී ගෙනි
පෙන්වා යසස බව ගෙනි
අඩු කල සිරි ස ගෙනි
විසි විසි නව වසක් ගිහි ගෙයි

## 18. මහ බිනික්මන්, බුදු බව, වේළු වන වස්.

388

සක කුලඹර ල ස ද
එ යසෝදරා නම් ල ද
පින් සිරි පිරි නොම ද
පවර රාහුල කුමරු ලත් ස ද

389

දුකැ සිවු පෙර නිමි ති
හැරු රද සැපත සිත රු ති
ලබන මතු සක්වි ති
සැපත් නො තකා සිතිත් නොනැවැ ති

390

ඉසෝරු මැදුර ට
දිගු කල පයැදූ එ මැ වි ට
සත් මැතිඳු පසු කො ට
නැගී කන්තක මඟුල් අසු පි ට

391

නික්මෙනු දුකැ එව ර
හල සඳ සුරන් පුර දෙ ර
පසු පෙර දෙ අත් ව ර
සුරන් සැට සැට දහස් පිරිව ර

392

දිගු බිත කැරැ පහන්
ගත් මිණි දඹු වැට පහන්
හිමි සිත තුටු පහන්
ගෙවා තිස් යොදන රැ නො පහන්

393

අරුණු රස් ප තරව
සහ තඹසිළුත් ම තරව
රිවි එත රත තරව
අනෝමා නම් ගඟින් එ තරව

394

දස පැරුමන් බුහු පි
පිරුණෝන් සිතෙහි නොකිලි ටි
කෙලෙසෙව් හළ දිගැ පි
මඟුල් කඩුවෙන් කපා කෙස් වැ ටි

395

ලොවට පිය කර ණව
මහ බඹහු දුන් පම ණව
සිවුර ගෙනැ මහ ණව
එතෙර වන ලෙස සසර මහ ණ ව්

396

පිළිවෙත කර ත දින්
හවුරුදු සයක් පබ දින්
ගත් වෙන වෙන ල දින්
නිවන් මඟවත සොයා නො ල දි න්

397

මැදුම් පිළිවෙතැ සි ට
සැප දී මදක් සිරුර ට
සේනානී ගම ට
ගොසින් අජපාල නුග සෙවණ ට

398

සුජාතා නම් ළ ද
ගන රන් තලියෙකින් සො ද
දිව ඔද ලූ නොම ද
මිහුරු කිරි පිඩු ගෙනත් දුන් සඳ

399

කිරි පිඩු නො අඩු කො ට
එකුන් පනසක් පිඩු කො ට
වළඳා උඩු ගඟ ට
තලිය හැරැ සුබ නිමිති දක්ම ට

400

බමුණකු දුන් අත ට
ගෙනැරැ කුස තණ අට මි ට
ගොස් බෝ තුර මුල ට
සලා පැළ දිග බලා වැඩැ සි ට

401

මිහිරු නැඟි රුව ට
තුදුසත් විදුරසුන් පි ට
පිට ලා බෝ තුර ට
යෙහෙන් ඉඳැ සිවු ඉටන් දැඩි කො ට

402

ඈ මරසෙන් රෙ සේ
දස බිම්බරක් එ මැ සේ
බිඳැ හැරැ දස දෙ සේ
තුමුල් නල පත් පුළුන් රළ සේ

403

පෙර යමැ පෙර දව ස
නොඑක් කප් කෙළ සුවහ ස
කද පිළිවෙළ වෙසෙ ස
පැවැති මොහඳුරු දමා මුල් පිස

404

මැද යමැ ලැබැ දිවැ ස්
සැවපිළි සඳෙහී දන රැ ස්
දකැ මතු වන දව ස්
පැවැති මොහඳුරු දමා නො වැ ල ස්

405

සුවිසි පසාක ර
විමසා නැණින් සැක හැ ර
වත්මන් කල් අත ර
වැසුණු මොහඳුරු පටල දුරු කැ ර

406

පෙර බුදුවරත් හැ ම
දුටු ලෙස දකින නො හැරැ මූ
නුවණින් අසම ස ම
බුදු වැ සව් නේ ගෙවා අලුය ම

407

වැලැදු අම ර සින්
කිරි පිඩු එකුන් පන සින්
වෙන අහර'දහ සින්
නො ගොස් සත් සතියක් මැ වෙසෙ සි න්

408

ඉදසු මේ ස දමින්
මුදම් යි සතුන් අ දමින්
සවන් රස් වි දමින්
ගොසින් බරණැසට බඹ යැ ද මි න්

409

විහිදෘ බඹ ගො සා
සිවු සස් දෙසා සක සා
නිවන් පුර සල සා
බමුන් අවලොස් කෙළක් නොල සා

410

තුටු කැරැ සත ස තන්
දෙසව යි දහම් ඇම තන්
සිතැ කෙලෙසුන් මු තන්
යවා මුළු ලොවැ සැටක් රහ ත න්

411

නො දුනැ බුදු බල පෙ ර
තවුසන් කරත අනද ර
දක්වා වරින් ව ර
දහස් තුන් පන්සියක් පෙලහ ර

412

තුන් තවුසන් එ දෘ
පිරිවර සමග සමු දෘ
බව බැඳුමෙන් මු දෘ
යොදෘ මග පල රසෙහි නොමදෘ

413

එ සඟ පිරිවර කො ට
බඹසුරනරන් තුටු කො ට
සක් රුවන සේ බ ට
එයින් වැඩැ රජගහා නුවර ට

414

මුනි සඳ සඳ මෙ නේ
දහසක් සඟුන් රැගෙ නේ
විසල් සල් උය නේ
වැඩැ ඉඳිති යනු අසා එ දි නේ

415

මහ සෙන් පිරිව රා
පිරි ඇතුළු පිපි නුව රා
බිම්සර නරව රා
අවුත් වැඳැ මුනි සරණ තඹ රා

416

උන් සදැ තමන් වෙත
සදහම් දෙසා උන් සි ත
කෙලෙසුන් ඇරැ ඉව ත
ලොවට දක්වා නිවන් මහව ත

417

නරනිඳු සඳ තො සේ
මහ සෙනග ගෙනැ එ මැ සේ
එ නුවරැ අබියෙ සේ
නිවන් පුර නම් මෙ යැ සි යන සේ

418

මල් වතු පලොල් ස ල්
පුල් විල් පොකුණු සිහිලැ ල්
පන් හල් ද දම් හ ල්
පවුරු පළ හෙළ විසල් වාස ල්

419

බඹ විමනෙව් ඉහි ල්
ලඹ කිකිණි දූල් මුතු ලැ ල්
සුවිසල් මතු මහ ල්
තුමුල් පැහැ පහ පෙළින් මන කැ ල්

420

නුබ මෙන් සතා රය
දිලිහෙන නිති දිවා රය
අසුරු අමතා රය
වේළුවන නම් කැරළු විහා රය

421

දුන් සඳැ නිරිඳු ස ද
පිළිගෙනැ මුනිඳු මනන ද
දිය පොළොව පිරිසි ද
ගුගුරුවා මුළු පොළොව එකබඳ

422

දහම් වැසි ව ස් වා
තුන් දෙස් ගිමන් නා ස් වා
සත සිත සතො ස් වා
කුසල් බිජු පින් කෙතෙහි ඉ ස් වා

423

දහම් සක් පු ම් බා
පද සුරබඹුන් සු ම් බා
රූපැ ගුණ බි ම් බා
දෙ සැට මිස දිටු සිඳු කල මී බා

424

අවා බිය අවර ණ
දක්වා ලොවට තිසර ණ
පහළ කැරළු අපම ණ
තමා නව අරහාදි බුදු ගු ණ

425

පන්වා දුසිරි සි ත
නංවා දහම් ජය කො ත
පෙන්වා ගුණ මහ ත
ලොවට දන්වා තමන් දළ මෙ ත

426

ලෙසින් සිහිල ඹයා
තෙපුලෙන් සතන් පො බයා
සුර වැඩ අර බයා
දියතැ සිටුවා දහම් ටැ ඹයා

427

සසරට ස තුරුවා
කෙලෙසදරට මි තුරුවා
සම මෙත් ප තුරුවා
දහම් මහ ගඟ ලොවැ උතුරුවා

428

තමන් නම අ ස්වා
දහම් ජය බෙර ග ස්වා
පිරිසිඳු පස ස්වා
සොඳුරු සග පවග මග ස ස්වා

429

දහම් සිතැ පු රවා
නිවන් පුර දොර හ රවා
මරු මන් දෙද රවා
තමා නම නිතොර සිහි කා රවා

430

සමවත් සුව යෙ දී
එ සුව සගවත් ගෙනැ දී
මහ කුලුණෙන් බැ දී
ලෙවන් කළ'මිස පුදෙහි නො බැ දී

431

උස් කැරළු සිල් පවු ර
තර කැරළු දහම් කදවු ර
සඟ සවු මැති පව ර
වෙසේ දම් රජ වැ මුනි එ වෙහෙ ර

# 19. බුදුන් ඇරියුම්.

432

ගොතින් ගෞතම නම්
ගුණෙන් සැදි සම්බුදු නම්
මුළු ලොවැ තමා නම්
මතුරු කළ එ බුදු වැඩියෝ නම්

433

අප ගේ රටැ මෙබ දු
ඇති උවදුරින් මදකු දු
අල පතෙහි දිය බි දු
ලෙසින් නො තිබෙයි කී සැ මැති සඳු

434
එ මැනිඳු බස් අ සා
නිරිඳෝ මෙමින් සතො සා
යහ ලෙස නො වැ ල සා
තමන් අතුරින් රජකු විම සා

435
තිලෝගුරු මුනිඳු ට
වඩනා ලෙසට මේ පුර ට
අයදින ලෙස එ වි ට
යව යි බිම්සර නිරිඳු නුවර ට

436
බිම්සර රජුට සො ද
මාඇගි වත් පඬුරු බැ ද
මහාලි නම් ල ද
නිරිඳු නිරිඳෝ යැවූ එ මැ ස ද

437
එ නිරිඳු සද එ වි ට
මහ සෙනඟ පිරිවර කො ට
පරසිඳු මගද ර ට
ගොසින් වැදු රජගහා නුවර ට

438
බිම්සර නර ඉසු රු
දුකැ රැගෙනැ ගිය විසිතු රු
දක්වා දී පඬු රු
කියා පිළිසඳර බස් පියක රු

439
තම නුවමෙරහි පැවැ ති
ලෙඩි දුක් කියා ඉක්බි ති
මුනි වඩනා කැමැ ති
අසුන් දක්වා රැගෙනැ අනුමැති

440
දිය ගිම් මුනි වෙත ට
ගොස් වෙළුවනා වෙහෙර ට
වඩනුව තම පුර ට
කෙළේ ආරාදනා මුනිඳු ට

## 20. විසල් ගමන් ඇරැඹුම්.

441
අසා එ නිරිඳු බ ස
විමසා නැණින් තතු ලෙ ස
වන ලෝ වැඩ පිණි ස
මුනිඳු දූක්වි වඩන අදහ ස

442
සමඟින් මුනි පව ර
පන්සිය රහත් පිරිව ර
වඩිති විසල් පු ර
අසා බිම්සර නිරිඳු පින්ස ර

443
වඩන සුගතිඳු ඟ ට
මග සරහමැයි නිසි කො ට
සිතා වැදූ වෙහෙර ට
මෙසේ දූන්වූ එ මුනි සඳු හ ට

444
ගිම් සද මෙ පුරැ සි ට
පස් යොදනෙකැ ගං තෙර ට
එ මග සරහනු හ ට
මදක් බලව යි කියා මුනිඳු ට

445
යොදන යොදනත රා
කරවමිනි මහ වෙහෙ රා
බඹ විමනෙව් ස රා
නොයෙක් පුද පෙරහරින් සපුරා

446
අට ඉස්බක් දෙප ස
මග කණු කටු ද සැසැ පි ස
තනා බෙර ඇස ලෙ ස
වනා සුදු වැලි අයුරු සද රැ ස

447

පිරි කුඹු සුවහ සේ
රඹ තුරු සදැ දෙ ප සේ
දණ පමණක් උ සේ
පුරා මහවත මලින් සක සේ

448

බඳ පට වැරැ ල්ලෙන්
යන ලෙසට සෙවණැ ල්ලෙන්
දිලි රන් කෙහෙ ල්ලෙන්
සදැ මඟ දිගට මැ සිය ල්ලෙන්

449

පුද පෙරහර මඟ ත
සිටුවා දෙ පසැ මහව ත
බැඳැ මුඳුනතැ දෙහො ත
මුනිඳු වඩනට කලැ සි දන්ව ත

450

සිත බිය නො වැ තො සින්
දක්වන විකුම් වෙසෙ සින්
රන් ගිරි ලෙණ කු සින්
නික්මුත් වන සී රජකු විල සින්

451

එ මුනි සඳ ගමන ට
දික් කරත පය දෙරණ ට
මිහිරා නැඟි රුව ට
සුපිපි සත්බුමු පියුම් පිටැ සි ට

452

ලා රසිනි රැඳු උ දු
බදු වඳ කුසුම් පට බ දු
දෙපට අඳනය මු දු
වඩා තෙ මඬුලු වසා මුනි ස දු

453

බඳින රන් දම නේ
පබළු කලබක් ලෙසි නේ
බබලන හැම දි නේ
පටී දැතුවෙනි බැඳෑ අඳ නේ

454

සක්වළ ගිරි අව ට
සිටි සඟ සුනෙර ගිරි පි ට
දිය පොළොව හිම් කො ට
රැගත් මිහි මඬල කම්පා කොට

455

නුග පල සේ සුර ත්
පැහැයෙන් කරන දිගු බි ත්
කිසි කිලුටක් නොග ත්
සුගත් මහ සිවුර ගෙනැ එ සුන ත්

456

රත් පලසෙකින් මෙ ර
වට කරන මෙන් මනහ ර
දිලි රත්වන් සිරු ර
වසා ගෙනැ පෙරෙවැ මුනි සිටි වර

457

නුවන් ලද පල වි ද
ලෙවන් තුටු වන ලෙස සො ද
සවන් සිරුරින් න ද
මෙසේ නික්මිණී සවන් රස් කද

458

ඉඳු නිල් මිණි රැ සින්
නවහම් කරනී විල සින්
නික්මුණු නිල් ර සින්
සැදිණි හැම සක්වල මැ වෙසෙ සින්

459

කිණිහිරි පෙති සම ග
සඳන සපු මල් පෙති ර ග
රන්වන් රස් තර ග
විදැ දිවැ ගති දියතැ එක ර ග

460

බඳු වඳ පෙති නිස රැ
සඳැ වෙලෙඟි සිරි කැරැ දු රැ
රත් පැහැසර සොඳු රැ
දිවි රත් කැරැ දියතෑ නිරතු රැ

461

තරුෑ වැල පැහැ පැහැ ස
කැරැ සඳ රසට අපහ ස
නිකුත් සුදු බුදු ර ස
රිදී රස සේ දිවි දස දෙ ස

462

හැම තැනැ සක්ව ළේ
සලා ගෙනැ ගෙනැ උතු ළේ
ලොව තම පැහැ කෙ ළේ
මදට වන් රස් කදක් පත ළේ

463

සොඳුරු සිනියම් ප ට
විදූ ලන සේ දිගු කො ට
පබසර රස් රුව ට
දිවි ලොවැ තවරමින් පිටත ට

434

සක්වල ගිරි සිර ස
පැනැ ගෙනැ පැතිරැ දස දෙ ස
දිවි සවනක් ර ස
නගා හැලි සිය දහස් සුවහ ස

465

බෙර සිය ඝොස කර ත
වීණා නාද නික්මේ ත
වස් දඹු නද ගනු ත
නො පිඹැ සක් ගඬ දිගත මැඬැ ය ත

466

මොනරුන් නද කර ත
ගිජිඳුන් කුංච නද දෙ ත
තුරගුන් හෙසරව ත
ගමක් නො වැ රිගෙනි සක් ගඬ ලත

467

පවනක් මග පිසි ත
පවනක් සුවඳ මල් ල ත
පවනක් සම කර ත
වලා පොද විසිරැ මල් පොබය ත

468

බුදු රස් වැදැ දිග ත
තුරු ලිය නොයෙක් පැහැ ව ත
දියැ ගොඩැ මල් පිපෙ ත
වරල් විදහා මසුන් ඉපිලෙ ත

469

අවි වග සිටැ දිලෙ ත
පලන් අබරණ නද දෙ ත
දිව සෙන් නුබ සැදෙ ත
වුහුටු දිව මල් දෙරණ විසිරෙ ත

470

උරගුන් පෙණ විද ත
මුවන් පෙම් කෙලැ කෙලැ එත
ලිහිණි ගණ නුබ ප ත
පියා විදහා සැදී සිටැ ග ත

471

විතරට තම් සැප ත
සඳු සළු බරණින් ශ ත
මුනි වඩන මහව ත
දෙ පසැ නරයන් අවුත් රැස්වත

472

කණු කටු මුල් ඉව ත්
වීමෙන් සිනිදු ගුණ ග ත්
මුනි වඩන මහව ත්
දෙරණ බෙර ඇස සේ මැ සම ව ත්

473

වසා ගෙනැ දිගු බි ත්
සුදු නිල් වලා දිවැ ග ත්
බඳ වියනෙව් මහ ත්
දිනිඳු මැඬැ රස් නවත්වත් ව ත්

474

මුනි දැකුමට මහ ත්
තුවූ සිතිනවුත් වෙත ප ත්
සුර සෙන් තම රැග ත්
පසඟ තුරු ගොස පවත්වත් ව ත්

476

පිපි තුරු වන මහ ත්
සොල්වා කුසුම රද ග ත්
සිහිලැල් ගුණ නුමු ත්
සුවඳ ගෙනැ මඳ පවන් එත්එත්

476

එකලූ කැරැ දිගු බි ත්
රුසිරින් දන නුවන් ග ත්
සුරගන සිට දිමු ත්
සුවඳ සුනු ගෙනැ විසුරුවත් වත්

477

බුදු සිරුරින් නිකු ත්
රිවි රස් මකා දිවැ ග ත්
බුදු රස් දකැ දිමු ත්
බලා සිටි සෙනඟ වැදැ හෙත් හෙ ත්

478

මහ රැටි ගණ අවු ත්
පිළිවිසැ නිරිඳු මහව ත්
සඳනුව වඩා නැ ත්
බුදුන් වඩිනි කියා යත් ය ත්

479

සුර පුරයෙන් අවු ත්
අතුරු නො වැ නුබ සිටැ ග ත්
බුදු පුදට කළ සි ත්
සුරඹ ගණ සුවඳ දුම් ලත් ල ත්

480

වුවත් එක සතකු ට
වන වැඩ තකා දුරක ට
වඩනා බැව්නෙව් ට
නික්මැ ගත් සදැ මුනිඳු ගමනට

481

මහ බඹ ඉදිරි කො ට
නික්මැ යන බඹ පිරිස ට
නො හොත් සඳ මඩල ට
පසු වැ පෙළ සැදුණු තුරු විලස ට

482

සක් දෙව් රජ පෙර ට
කැරැ සැදුණු සුර සෙනඟ ට
නො හොත් මිණි රුවන ට
පසුවැ යන මිණි රුවන් විලසට

483

සදත් ගජ රජ හ ට
පසු වැ යන ගජ සෙනඟ ට
වෙසෙසින් නිසරු කො ට
නිකුත් සඟ ගණ පසු වැ මුනිඳු ට

## 21. මඟැ පුද.

484

රජදරුවෝ මහ ත්
ආදර ඇති වැ බලව ත්
මුනිඳුට ලොවග ප ත්.
නැඟු සේ සත් පිටැ මැ සේ සත්

485

මිනිසත් බවට දි ඩ
මෙ මැ යැ සි දනෝ වන වැ ඩ
සඟ ගණ හට නොක ඩ
නැඟු පන්සියයන් මැ සුදු කු ඩ

486

දද කුඩ කොඩි ග න්නෝයා
සොඳ ගඳ දුම් ල න්නෝයා
පින් පල බල ද න්නෝයා
මුනි පුදයට ව න්නෝයා

487

අ ති න් රැගත් කුසුම් දමින්
සි ති න් රැගත් මුන් ස දමින්
බැති න් අයෙක් ඇති ප දමින්
නි ති න් මුනිඳු යෙති පු දමින්

488

රූ ළි රුගෙනැ හෙන ගිරි පිට
දු ළි ගඟුල් හැලි විලස ට
නි ළි අයෙක් මුනි පුදය ට
පි ළි සිසාරති ඉස ව ට

489

මුනි පුදයට සතො සේයා
පුද බඩු ගෙනැ එ මැ සේයා
ඔද වැඩි සිදු රළු සේයා
රුස් වෙති මඟ දෙ ප සේයා

490

නැවැති ගඟක් සේ සිදු වැ ද
කැමැති වැ සිටැ රජ සෙන් මැද
රුවැ ති ලියන් සහ ළඳ සො ද
න ට ති අයෙක් බහු රූ බැ ද

491

නැ ණැ ති දනෝ සිට වෙන වෙ න
වි ම ති නො වී අදහා ගෙ න
කැ මැ ත ලෙසින් කවි බැඳැගෙන
කි ය ති බුදුන් ගුණ නැනැ නැ න

492

තද දුක් දුරු ල න්නෝයා
සඟ මොක් සැප් දෙ න්නෝයා
මොහු මැ වෙතැ යි ද න්නෝයා
වැද වැද බිමැ හෙ න්නෝයා

493

මුනි ගුණ දස දිනැ වි දේ
තුටු වූ සත සිත පැ දේ
නො අසන ලෙස අපවා දේ
කෙරෙති පසඟ තුරු නා දේ

494

අප මුනිඳුන් ගේ අපම ණ
ගුණ දැනැ ගෙනැ රුගෙනැ සර ණ
බව දුක් වෙවයි නිසර ණ
දමිනි අසෙක් පලන් බර ණ

495

ලොලා වඩන සිත ළද රූ
ප ලා නොයන ලෙස සොඳු රූ
කා ලා සපිරි සඳ අඟු රූ
බ ලා ගෙනැ මැ යෙනි මුනි රූ

496

මුනි යන මඟ ගෙනැ පිරි බඩ
ගෙනැ දරුවන් ගෙන් පිරි බඩ
සල්පිල් වෙතැ සිටැ මං'ග බඩ
වඳිති ලියෝ සිටි මඟ බඩ

497

වෙ නිත් වෙත මැ පිපි මල් සි ද
රොනිත් රොන මැ ගෙනවුත් සොඳ
නැ නිත් නැනැ මැ අඟනෝ ල ද
වෙ නිත් වෙත මැ කොලෝ යැ පු ද

498

බුදු මහිමය දැකැ පූවෝ
නැත සිටි වන සිටැ පූවෝ
වැඳැ වැඳැ අත සැනැ පූවෝ
නැත බුදු බව නොපැ තුවෝ

499

දැකැ මුනි රුව රස වි න්දෝ
වැඳූ වෙතැ සිරි පද වැ න්දෝ
බව සැපතැයි නොසි ම් න්දෝ
නම් සිතැ කෙලෙසුන් සි න්දෝ

500

අ ද මදකුත් නොකිලි ටියෝ
ම ද ළද කිරි බොන පැ ටියෝ
නැද මුනි රුව දැකැ අ ඩියෝ
බැද මුදුනත වැඳැ සි ටියෝ

501

දෙ න දනට මැ රට ර ජිනී
දූ න නිසි බඩු ගැල් පි ටිනී
වෙ න වෙන රඟ නැව් පි පනී
ගෙන එනි සමහරු ව ජිනී

502 වෙ ත් ප ත් ස්‍ූරඹුන් නො මැ නරඹ න්නෝ
නෙ ත් සි ත් මුන් රූ රසෙහි තබ න්නෝ
ග ත් ග ත් කුඩ කොඩි හැම නොතබ න්නෝ
ය ත් ය ත් රජ සෙන් මුනිඳු පුද න්නෝ

503 මොනොවට දිලි මිණි කිරුළු පැලැ න් දෝ
මෙ ර ව ට ලූ කුල ගිරි සිරි වි න් දෝ
මු නි දු ට වැඳැ මුදුනතැඳිලි බැ න් දෝ
පු ද කොට කැටි වැ මැ යෙති නරනි න් දෝ

504 ය ත් ය ත් සෙත් මුනි විද්දෝ තම් නේ
ග ත් සි ත් සු ත් පුද වද්දෝ අනි නේ
කැ ත් ගොත් යු ත් පර සිද්දෝ නම් නේ
නෙ ත් සි ත් ල ත් පල ලද්දෝ එ දි නේ

505 දූ න ගෙ න මුනි සිරි සෙනඟ බ ලෝ යා
තැ න තැ න මුනි දැකුමට ඔස ලෝ යා
ම න පි න වන දසනෙහි හස ලෝ යා
වෙ න වෙ න දෙයකට ලොබ නොකො ලෝ යා

506 ස ව න කිරණ දුලු මුනි මෙර වැ න් නෝ
ව ඩ න ඒ සඟ ගණ කුල ගිරි වැ න් නෝ
ප න න තුරඟ පෙළ සිඳු රළ වැ න් නෝ
එ ය න සෙනඟ ගොඩැ යන සිඳු වැ න් නෝ

507 සුර පා මෙන් දිලි වෙහෙරින් වෙහෙ රා
ස ත පා සඟ ගණ සහ මුනි පව රා
පෙළ පා ප්‍රිය දනැ කෙරෙමින් අද රා
න ර පා දන් දී පුද කෙළෙ නිතො රා

## 22. ගඟ තැරුම.

508 ස තො සි න් පුද කෙරෙමින් මුනි සඳු වා
නො ල සි න් ගොස් වැදූ මහ ගං තෙර වා
වෙ සෙ සි න් මුනි පුද කරවන ලෙස වා
මෙ ලෙ සි න් දින'සුන් එ විසල් පුර වා

509 අ ප අපගේ බල පමණින් මුනිඳු ට
සැ ප සපයා කළු පුද ලැබැ නිසි කො ට
සැ ප මිණියේ මුනි සඳ ගඟ මෙ තෙර ට
තොප තොප ගේ බල පමණින් පුද කො ට

510 කැ ද වා ගෙනා ගොස් මුනිඳුන් නුවර ට
සොද වා මහ පුද කරවා තිසි කො . ට
මු ද වා ළුවදූරු කරව යි සෙත ර ට
යොද වා අස්නක් මෙහෙයා එ මැ වි ට

511 සොද වා මහ නැව් බැද ගල පා යා
සි වු වා එහි දිලි පෙළ පෙළ පා යා
නා ද වා සුර පහ සිරි වෙළ පා යා
කා ර වා දිගු පුළුලැති මහ පා යා

512 බ ද වා සුර සිදු බඳු සුදු විය නේ
අ ද වා වට පට තිර සරහමි නේ
ස ද වා ලඹ ඉදුවර මල් දම් නේ
සි වු වා වට රන් වැට මිණි පහ නේ

513 කොන් කොන් වලා මිණි මුතු ලැල් එ ල් ලා
බ න් නා න් රන් දද නෙලෙනී වෙවූ ල් ලා
ග න් මි න් පිරිබඩ සුවද කල ල් ලා
නා න් ව න් රන්මිණි කිරණී නුඩු ල් ලා

514 බැ ද රන් මිණි මුතු දිගැ රැස් ව නා වා
සොද පට ඇතිරිලි මාඇගි ව නා වා
ස ද මඩලෙව් පිරි සත සිත පි නා වා
මැ ද මුනිදුට තිසි අස්නක් ප නා වා

515 බි ම ව ස වා දුසමන් මල් ඉ ස් නේ
වැඩැ හි දූ වා මුනිඳුන් මැද අ ස් නේ
ව ට හි දූ වා රහතන් සිත තො ස් නේ
සි ත පිනා වා ලියැ ඉන් බුදු ස ස් නේ

516 ර ත් පලසින් වට කල රන් වැඹ සේ
ර ත් පිඹුම්ඵ මැද පත් රන් නැව සේ
ර ත් පිළි මිණි මැද දිලි ගිනි කඳ සේ
ර ත් තුරු වැල මැද දිසි පුන් සඳ සේ

517 පිඹුම්ඵ වටකල රත් පිඹුමක් සේ
පෙති මැදූ වැද සිටි කෙසුරු සලා සේ
කෙසුරින් පිරිවැරූ රන් කෙමියක් සේ
බබළයි සඟ පිරිවැරූ මුනි සොඳ සේ

518 පු ද ල ත් මිණි කිරුළින් සුරිඳු න් නේ
වි හි දෙ ත් සවනක් රස් මුනිඳු න් නේ
ප ල බි ත් පහ එ මැ වැදූ දිලියෙ න් නේ
නොකලත් සත් රුවනින් කළ වැ න් නේ

519 සො ද වා රන් පලු විදුලි සහ ස් සේ
බ ද වා අඳ ඉඳු දුනු සුවහ ස් සේ
වැ සු වා මෙන් ගඟ නො වැ සිදුර ස් සේ
යො ද වා ලියැ තිසි නැව් පසු ප ස් සේ

520 මෙ ලෙ සි න් සඳමින් නැව් එක රඟ ටා
ර ජ සෙ න් හැම සලසා පිරිවර ටා
බ සි මි න් කර පමණක් ගඟ දිය ටා
මු නි දු න් වැදැ රජ කී මේ ලෙස ටා

521 හැ ම උවදුරු දුරු කැරැ එ රදුන් ර ට
ස ම මෙත් මුනි වඩනා තෙක් මෙ තැන ට
පෙ ම වඩමින් ඔබ ගුණ සිහි කොටැ කො ට
ම ම නො ගොසින් ඉඳිමැයි කී නුවර ට

522 ස ග පිරිවර මුනි දැකුමට එ කෙ ණේ
ල ග දිව නඩි කැල පෙණ කැල පෙනු ණේ
ද ග වන මන සුරගන රඟ සැදු ණේ
ශ ග සුදු රත් පිපි පියුමින් සැදු ණේ

## 23. විසල් මඟ සැදුම්.

523

කරනුව ලොවට සෙ ත
වඩිති අසා එ සුග ත
සක්විති රජ සැප ත
සැපත් වූ මෙත් සතොස්වා සි ත

524

කප් කෙළ සුවහ සේ
බුදුනැ යන නම මෙ ලෙ සේ
නො ඇසෙයි අප මෙ සේ
සිටිනු නො යෙදෙයි සිතා එ මැ සේ

525

මුනි සඳ වඩි න් නේ
සිතැ මෙතකුලුණෙකි න් නේ
මෙ අප නරය න් නේ
මහත් කළ පිනෙකැ පල දු න් නේ

526

අපි යැ දුක් වූ න් නෝ
උතුමෝ යැ දුරු ල න් නෝ
බුදුහු යැ වඩි න් නෝ
කවුරු පෙර ගමන නොකර න් නෝ

527

එ බැවින් අප වෙත ට
වඩනා තිලෝ ගුරු හ ට
අප ගෙ බල පමණ ට
කරම්ග සි මඟ පුදුක් තිසි කො ට

528

තුන් සිය යොදුන් ර ට
නුවරැ උන් දන රැස් කො ට
කරන මුනි පුදය ට
යොදු මඟ සරහන්ට තිසි කො ට

529

අප හිමියෝ අප ට
සැරැහූ යැ මඟ තිවන ට
එ වැනි සුගතිඳු හ ට
සදනු මඟ අරුම කිම මෙ අප ට

530

එ පුරෙහි පටන් කො ට
තුන් යොදුන ගං අතර ට
දමා කණු මුල් කැ ට
තනා බෙර ඇස සේ මැ සම කොට

531

වැලි එවැ බිමැ අතු ට
රිදී පට සේ සුදු කො ට
ඇම තැනැ මගැ දෙපි ඊ
පහන් ලා රන් රිදී මිණි වැ ට

532

බිගු දූල් ගත් මුම ණ
සුවඳැ'ති කුසුම් අපම ණ
පූරවා මග දෙර ණ
තනා ඇම තැනැ මැ කැරැ අතර ණ

533

නන් පුන් කුඹු ත බා
බඹා දිගු කැන් ඔල බා
සිටුවා රන ර ඹා
ලඹා මල් කැන් අතුරු නො ත බා

534

ඇඳූ පට වට සු දෝ
බැඳැ කෙහෙලි රන් කල දෝ
මග සරසා සො දෝ
දහස් සත් සත් සියක් නිරි දෝ

535

මිහි වදයෙහි ගඳ ට
දිවෙන බිගු මෙන් ඉව කො ට
තද ගිම් කල දිය ට
දිවෙන ගජ සෙන් ලෙසින් විලක ට

536

ගැසූ මස් ගොදුර ට
දිවැ එන මසුන් විලස ට
සාගෙහි කිරි බත ට
දිවෙන බමුණන් ලෙසින් එක වි ට

537

පිරි සත් රුවන් ගෙ ට
දෙර හල ද දන් දීම ට
ඔවුනොවුන් පසු කො ට
දිවෙන දිළිඳුන් ලෙසින් ලොබ කොට

538

තුන් යොදුන මැ තො සේ
තුන් පියවරින් යන සේ
සමග මහ පිරි සේ
ගොසින් වැදූ ගං තෙරට එ මැ සේ

539

එන බුදු රුස් බ ලා
පිපෙන මෙන් විල් කම ලා
වෙසෙසින් තුටු වැ ලා
නැමඳැ මුනි සිටි දෙසට ඉස ලා

540

මහ පුද කටැ රි යෝ
රුසිරින් සුරන් සැ රි යෝ
බුදු ගුණ දූවැ රි යෝ
වඩනා මුනි දෙස බලා සි රි යෝ

541

අහසැ සිටි වි දූ මෙ න්
සුර සෙන් කරනි පි දූ මෙ න්
නැව් සෙනඟ පැ දූ මෙ න්
එ තෙරැ සිටි නරනිඳුන් යෙ දූ මෙ න්

542

රස් වතුරේ දූවැ ටි
නරන් කැරැ රන් රු සැ ටි
නැව මුනිඳුන් පිහි ටි
නිවන්පුර සේ මැ වූත් ගොඩ දිටි

543

ගල පමණක් දිය ට
බැසැ නරනිඳුහු එ මැ වි ට
නැවැ ඇදූ ගෙනැ ගොඩ ට
බුදුන් බාවා ගත් හ එ ගොඩ ට

## 24. මහ වැසි.

544

පිය නිරිඳු සිරස ට
මිණිබර කිරුළ විලස ට
පත් මල් වට බව ට
කාලදේවල රුසින් මුදුන ට

545

කොසොල් රද රද හ ස
තුටු කළ පිපි පියුම් ලෙ ස
දනපල් ඇතු සිර ස
එ ගෑ කිරි සිඳුරු පා පෑ ඇ ස

546

උසින් තම හට වැ ඩි
කෙනකුන් නැතැ යි කල එ ඩි
රිවි සඳ කිරණ මැ ඩි
එබඳු රා අසුරිඳු ගෙ මන් මැ ඩි

547

මොලොක් ගුණයෙන් දු රු
ගලට ද තමා සත් දෑ රු
උදක් සිත් පිත් දු රු
පවා වඳවන නොයෙක් ගිරිතුරු

548

දික් කළ හොත් මෙර ට
උසුලන නැමී ගෙනැ සි ට
සක් ලකුණෙන් ලොව ට
රුපෑ සක්විති බව මැ දියත ට

549

ගලැ වුව එරී ය න
පුලුනැ වුව රළ නොමඩ න
සැම ලකුණෙන් සොබ න
සුපිපි සත් බුමු පියුම් පිටැ ය න

550

බඹ සුර නර මු දුන්
විලැ පිපි පියුම් සිරි දුන්
සියුමැලි වන න දුන්
තබන සිරි පා දෙරණැ මුනිඳුන්

551

බව ගිම් හැරැ එ ර ට
වුස්වන දහම් වැස්ස ට
සැක දුරු කැරැ ලොව ට
පාන පෙර නිමිති සේ එ මැ විට

552

මුල දුබ්බික් දුක ට
තද රිවි කිරණ මැ යැ බ ට
එ බැවින් ඒ මෙ වි ට
වැද්දු නොදෙමැයි යනු සෙ දෙරණට

553

නිල් පැහැ කවද ගෙ න
මහ ගිරි දුඳුලු පැනැ ගෙ න
මහ සෙන් මෙන් දිවෙ න
වසා තුබ ගන අඳුරු කොටැ ගෙ න

554

අප මුනිඳු වැඩි දෙ ස
නො තිබියැ යුතු යැ කුණු රැස
දමව යි කියන ලෙ ස
පුරා ගෙනැ ගන ගොසින් දස දෙ ස

555

විදිනට යක් සෙන ග
දෙවියන් රැගත් දුනු ර ග
ගත් නන් පැහැ තර ග
සඳ, ඉඳු දුනු රැසින් සුර ම ග

556

අප හිමි මුනි පුද ට
සිකි නළු රගන රැඟුම ට
හළ මලැඳිලි ලෙස ට
සඳ කොක වැල නැගෙන අහස ට

557

එළි කැරැ විදුලි ද එ
පලා ගෙනැ හෙණ ගන කු එ
මුනි පුදයට ලකු එ
විදෑ පත් කරන සේ දිව ස එ

558

හිම වන පෙත නැබු ළු
ඉපිලැ නැගි මෙන් ගිරි කු ළු
අඳුන් කුළු සේ ක ළු
වසා නුබ පතලේ යැ ගන කුළු

559

වැසි වැසැ වතු රුවිය
කුණප කුණු හැම දු රුවිය
එ පුර පිවිතු රුවිය
එ වරැ හැම තුරුලිය ද'කුරුවිය

560

නො හැරැ විල් වාපී
ගංහෝ ද පුර වාපී
මහ ගිම් නි වාපී
සතුන් සිත සතොස කර වාපී

561

තම තම බල පම ණ
සෙනග සහ මහ රජ ග ණ
මුනිඳු සහ සඟ ග ණ
පුදැ නන් පුද වතින් අපම ණ

562

සුර බඹ සෙන් සම ග
පුද යොදයොදැ මනර් ග
සැතැපි අතර ම ග
වූ යැ තුන් දවසෙකින් පුර ල ග

## 25. සෙත.

563

වත මුනිඳු දුර වෙ ත
පුද කොටැ සුර සෙනග එ ත
උන් දැකැ බිය වැ සි ත
දිවූ යක් සෙන් නො සිටැ දස අ ත

564

හැම රෝ දුක් පී සුන්
වත යත යකුන් පිස සුන්
මුනිඳුන් බුදු ස සුන්
නිසා සුවපත් වැ යත මිනි සුන්

565

පත් මෙන් එ පුර මැ ද
දහස් සුවහස් රිවි ස ද
දිගු එළි කැරැ එ ස ද
පැමිණැ පුර දෙරට සුගතිඳු ස ද

566

තම හට මෙහෙ ප තා
කල පින් කමින් සැප තා
වෙතැ සිටි නිති ප තා
අනඳ මහ තෙරිඳු සඳ අම තා

567

යක් බූ පිසස් ක ල
උවදුරු දුරින් දුරු ක ල
අණ සක නිති පත ල
නො හැරැ කෙල සුවහසක් සක්ව ල

568

පවතින සත සෙත ට
මෙ ලොවැ පස් වා දහස ට
කියා පුර පිරිත ට
රුවන් මහ සුතුර ඒ තෙරිඳු ට

569

මිණි පයැ දිය පු රා
මෙ පිරිත දෙසා සපු රා
එ දිය ඉසැ මෙ පු රා
පිරිත් කරව යි කියා ඉඳු රා

570

සිටි සඳැ මුනිඳු ස ද
නිරිඳෝ වෙමින් මන න ද
සිවුරඟ සෙන් නොම ද
රැගෙනැ එ පුරෙසි යොදැ මඟ පු ද

571

නොනැගෙන ලෙස රජ ස
බිමැ නොහෙන ලෙස රිවි ර ස
සිතියම් කළ දෙ ප ස
සොයා මාඇඟි වතින් නිසි ලෙ ස

572

ලඹ මල් විඳු ලෙස ට
සඳ බිමැ සුදු මල් ප ට
පුර මහ වේ දෙ පි ට
පහන් ලා රන් රිදී මිණි වැ ට

573

පුර පෙරහර සක ස්
කැරැ සරහමින් නොසර ස්
බුදුන් සහ සඟ රැ ස්
ඇතුළු නුවරට වඩා ගෙනැ ගෙ ස්

574

දහස් සිය සත් ස ත්
නිරිඳුන් ඉඳිනා මැති සු ත්
දිගු පුළුලැති මහ ත්
පුරිඳු විජයොත් පාය සිරි ග ත්

575

සුරන් ලෙස මෙර ගේ
රන් දද ලෙලෙන පල ගේ
නුබැ සිතියම් ර ගේ
පැතිරි මිණි කොත් කිරණ තර ගේ

576

හිමි සඳ මුදුනැ දුන්
රන් කිරුළු මිණි සිරි දුන්
සත සිත කළ න දුන්
නුවරැ මැදූ මහ පාය නිරි දුන්

577

සිටි සුර සිඳු සෙ වැ ද
පිරිසුදු සුදු වියන් බැ ද
දිලෙන රන් තරු මැ ද
මලෝලඹු මුතු ලැලින් කැරැ ත ද

578

දුරැ ලන ගනද රා
හත් රිවි රසෙව් උදු රා
ඇගත් නෙත් පැහැ රා
අවට රන් පට තිරෙන් අවු රා

579

සිවු දූ ගඳ කල ල්
පිරිබඩ රැගෙනැ බිමැ නි ල්
සිතියම් කළ නිම ල්
අනැගි බුමුතුරුණු ලා මනක ල්

580

ලෙළ මුතු ලැල් නොම ද
බඳ සේ සතින් මතන ද
අසුනක් එ මඬු මැ ද
සඳ වැඩැ ඉඳින ලෙස මුනි ස ද

581

සක් රුවන ල දුවා
ලෙස තම සිත පුබු දුවා
ගුණෙන් පිරිසු දුවා
මුනිඳු අස්නෙහි වඩා හි දුවා

582

ඉදිරි කැරැ සිතූ මි ණ
පෙළ සඳන මෙන් මිනි ග ණ
සත සිත පිය කර ණ
වඩා හිඳුවා රහත් සඟ ග ණ

583

තම මිණි කිරුළු දෝ
සිලිලින් සරණ කැරැ දෝ
තබා මුදුනත දෝ
මුනිඳු වැදැ උන්නෝ යැ නිරිදෝ

584

රන් මිණි මුතු පබ ළු
අබරණ පැලැඳැ සුලකු ළු
ඇඳැ නිසි කසී ස ළු
පසෙකැ උන්නෝ යැ රජ මැති මු ළු

558

හිම වන පෙත නැබු ළු
ඉපිලැ නැගි මෙන් ගිරි කු ළු
අඳුන් කුළු සේ ක ළූ
වසා තුබ පතළේ යැ ගන කු ළු

559

වැසි වැසැ වතු රුවිය
කුණප කුණු හැම දු රුවිය
එ පුර පිවිතු රුවිය
එ වරූ හැම තුරුලිය ද'කු රුවිය

560

නො හැරූ විල් වාපි
ගංහෝ ද පුර වාපි
මහ ගිම් නි වාපි
සතුන් සිත සතොස කර වාපි

561

තම තම බල පම ණ
සෙනග සහ මහ රජ ග ණ
මුනිඳු සහ සඟ ග ණ
පුදා නන් පුද වතින් අපම ණ

562

සුර බඹ සෙන් සම ග
පුද යොදයොදා මනර ග
සැනැපි අතර ම ග
වූ යැ තුන් දවසෙකින් පුර ළ ග

## 25. දෙසන.

563

වන මුනිඳු දුර වෙ ත
පුද කොටැ සුර සෙනග එ ත
උන් දැකැ බිය වැ සි ත
දිවූ යක් සෙන් නො සිටැ දස අ ත

564

හැම රෝ දුක් ජ සුන්
වන යත යකුන් පිස සුන්
මුනිඳුන් බුදු ස සුන්
නිසා සුවපත් වැ යත මිනි සුන්

565

පත් මෙන් එ පුර මැ ද
දහස් සුවහස් රිවි ස ද
දිගු එළි කැරූ එ ස ද
පැමිණෑ පුර දෙරට සුගතිඳු ස ද

566

තම හට මෙහෙ ප තා
කළ පින් කමින් සැප තා
වෙතැ සිටි නිති ප තා
අනද මහ තෙරිඳු සඳ අම තා

567

යක් බූ පිසස් ක ළ
උවදුරු දුරින් දුරු ක ළ
අණ සක නිති පත ළ
නො හැරූ කෙළ සුවහසක් සක්ව ළ

568

පවතින සත සෙත ට
මෙ ලොවැ පස් වා දහස ට
කියා පුර පිරිත ට
රුවන් මහ සුතුර ඒ තෙරිඳු ට

569

මිණී පයැ දිය පු රා
මෙ පිරිත දෙසා සපු රා
එ දිය ඉසැ මෙ පු රා
පිරිත් කරව සි කියා ඉඳු රා

570

සිටි සඳැ මුනිඳු ස ද
නිරිදෝ වෙමින් මන න ද
සිවුරඟ සෙන් නොම ද
රැගෙනැ එ පුරෙහි යොදා මහ පු ද

571

නොනැගෙන ලෙස රජ ස
බිමැ නොහෙන ලෙස රිවි ර ස
සිතියම් කල දෙ ප ස
සොයා මාඇසි වතින් නිසි ලෙ ස

572

ලඹ මල් විදූ ලෙස ට
සදෘ බිමැ සුදු මල් ප ට
පුර මහ වේ දෙ පි ට
පහන් ලා රන් රිදී මිණි වැ ට

573

පුර පෙරහර සක ස්
කැරැ සරහමින් නොසර ස්
බුදුන් සහ සග රැ ස්
ඇතුළු නුවරට වඩා ගෙනැ ගෙං ස්

574

දහස් සිය සත් ස ත්
නිරිඳුන් ඉඳින මැති සු ත්
දිගු පුළුලැති මහ ත්
පුරිඳු විජයොත් පාසැ සිරි ග ත්

575

සුරන් ලෙස මෙර ගේ
රන් දද ලෙළෙන පල ගේ
නුබැ සිතියම් ර ගේ
පැතිරී මිණි කොත් කිරණ තර යේ

576

හිමි සඳ මුදුනැ . දුන්
රන් කිරුළු මිණි සිරි දුන්
සත සිත කල න දුන්
නුවරැ මැදූ මහ පාය නිරි දුන්

577

සිටි සුර සිදූ සෙ වැ ද
පිරිසුදු සුදු වියන් බැ ද
දිලෙන රන් තරු මැ ද
වලෝලඹු මුතු ලැලින් කැරැ න ද

578

දුරැ ලන ගනද රා
ගත් රිවි රසෙව් උදු රා
රැගත් නෙත් පැහැ රා
අවට රන් පට තිරෙන් අවු රා

579

සිවු දෑ ගද කල ල්
පිරිබඩ රැගෙනැ බිමැ නි ල්
සිතියම් කල නිම ල්
අනැඟි බුමුතුරුණු ලා මනක ල්

580

ලෙල මුතු ලැල් නොම ද
බද සේ සතින් මනන ද
අසුනක් එ මඩු මැ ද
සදෘ වැඩැ ඉඳින ලෙස මුනි ස ද

581

සක් රුවන ල දුවා
ලෙස තම සිත පුබු දුවා
ගුණෙන් පිරිසු දුවා
මුනිඳු අස්නෙහි වඩා හි දුවා

582

ඉඳිරි කැරැ සිතූ මි ණ
පෙල සදන මෙන් මිනි ග ණ
සත සිත පිය කර ණ
වඩා හිඳුවා රහත් සඟ ග ණ

583

තම මිණි කිරුළු දෝ
සිලිලින් සරණ කැරැ දෝ
තබා මුදුනත දෝ
මුනිඳු වැඳැ උන්නෝ යැ නිරිදෝ

584

රන් මිණි මුතු පබ ළු
අබරණ පැලැඳැ සුලකු ළු
ඇඳැ නිසි කසී ස ළු
පසෙකැ උන්නෝ යැ රජ මැති මු ළු

585

සව් සතර නිපූ ණෝ
සුරඳුරු ලෙසින් දපූ ණෝ
කුල සිරිතැ දමු ණෝ
මුනිඳුවැදැඋන්නෝයැබමුණෝ

586

මෙදනෙන් සුපිහි පියෝ
සිටු තනතුරෙහි සි පියෝ
යෙසෙන් නොකිලි පියෝ
බුදුන්වැදැඑක්පසෙකැසිටියෝ

587

තැනෙකත් නොල ස්වූ
මුනි රූ දකුමැ තො ස්වූ
නො කොටැ තැන් හි ස්වූ
සෙනඟ මහ වතුරු සේ රැ ස්වූ

588

අහසත් අට දිග ත්
සක්වල ගිරින් ඇතුළ ත්
නො හැර'තුරු මදකු ත්
අවුත් රැස්වූ යැ දිව සෙනග ත්

589

සිඟුම් ඉඳි කටු මූ න
පමණක් ඔබා ලන තැ න
සැව සැත්තෑ බැගි න
එ මුරු සිටියහ සිඟුම් වෙස්ගෙන

590

එ පුර පිරි පිරි වට
කල තුන් පවුරෙකින් වට
ඝනිඳුන් ගොස් අ වට
පිරිත් පැන් ඉසි සඳෙහි මොහත වට

591

එපිරිත් පැන් ඇඟ ට
වැදූ ලෙඩ රෝග එ මැ වි ට
දුරු වත කිසි නො සි ට
නිඳු පුබුදිනා ලෙසින් නැගැ සිට

592

දනයෝ එ පුර වර
සැරැහී රැගෙනැ පිරි වර
තෙරිඳුන් සහ එ වර
ගොසින් වන්නු යැ ඇතුළු පුර වර

## 26. රුවන් සූත් දෙසුම.

593

නුවරුන් සමඟ වැ ද
මුනිඳුන් සිරි සරණ වැ ද
අනඳ තෙර හිමි ස ද
එ සබ තුලැ එක් පසෙකැ උන් ස ද

594

රැස් වූ මහ පිරි ස
වෙන වෙන මැ සිත අදහ ස
යොදමින් තම දිවැ ස
සොළොස් රහෙකින් බලා තතු ලෙස

595

රැඳි දත් කෙසුරු බ ර
දිලි දිව් කෙමින් මනහ ර
පොබයා මුව තඹ ර
සුවඳ කැරැ මුළු දෙරණඹර තු ර

596

සලා මහ දඹ ග ස
අවුලා සියලු පල ර ස
යොදා ගෙනැ අම ර ස
බෙදූ දෙන මෙන් ලොවට හිසිඵල ස

597

දෙරණ පෙරලා ය ට
මතු කොටැ එ රස රැස් කො ට
වැඩි වන මිහි රස ට
එ මිහි රස දෙන ලෙසින් ලෙව්හ ට

598

වන් සවනැ මිහි බි දු
සත සිතැ අමා රස බ දු
බඹ ගොස කැරැ සිනි දු
රුවත් මඟ සුත දෙසත මුනි ස දු

599

බඹසුරනර එ වි ට
පැහැදී දෙසූ දහම ට
පැමිණීය හ එක වි ට
සුවාසූ දහසක් මැ නිවන ට

600

මෙ මැ සුතත සතිපෙ ක
මුනි සඳු දෙසත ලොව රැ ක
තුටු සත නිවන් දැ ක
අටාසූ පන්සියක් දහසෙ ක.

## 27. උවදෙස.

601

මෙලෙසින් මුනි ලොව ට
පිහිට වැ සිටිය දෙ ලොව ට
සැබැවින් ඉන් තොප ට
එමුනි මැ ඝැ පිළිසරණ හැමවිට

602

ඉන් එ බුදුන් ව දුව
උන් ගුණ කඳට පහ දුව
උන් සරණට ව දුව
ඔවුන් සදහම් අසව පුරැ දුව

603

උන් කල වැඩ සි තව
සසරැ දුක් දැකැ විර තව
උන් දැකුමට ප තව
නො ගොස් මිස දිටු කිලුටු පනි ත ව

607

මෙ ලෙසින් හැම දව ස
හැම පින් පුරා නිසි ලෙ ස
බුදු වන එන දව ස
මෙතේ මුනි රජ තුමන් දැකැ නො ස

608

පුද කෙරෙමින් නොම දැ
බණ'සා උන් සසුන් වැ දැ
හැම කෙලෙසුන් පසි දැ
වසව සැනැහී නිවන් පුර වැ දැ

604

පේ වව පෝ දව ස
පන්සිල් රකුව දිවි ලෙ ස
නො කොටැ අකුසල් දැ ස
පුරව නිති පින් කිරිය වත් දැ ස

605

තුන් සිත මැ පිවිතු රැ
කැරැ පුද වතින් විසිතු රැ
කරව පුද නිරතු රැ
දැතු දළ දා පිළිම බෝ තු රැ

606

හිත අහිත සත වෙ ත
වඩමින් කුලුණු මෙත් සි ත
දෙන සග මොක් සැප ත
පවතු මුනිඳුන් දෙසූ පිළිවෙ ත

## 28. සාතු නිදෙස.

609 ස ම තැ ස් මුනිඳු පිරිනිවි වස පවත් ල ද
දෙ ද හ ස් පසළොසක් හවුරුදු පිරුණු ස ද
දිය ගොස් පැතිරි බුවනේකබුජ නිරිඳු ස ද
පිරි ව . ස් තුනෙහි සිරි ලකැ රජ බිසෙවි ල ද

610 දි න දි න නොඅඩු දින පුද පැවැති මනහ ර
ද න ම න රදන සැදි ගෙළයත් සිරින් ස ර
වැජැඹෙන පසිදු මහ රයිගම් පුර අත ර
බ බ ළ න සොඳුරු වීදෑගම මහ වෙහෙ ර

611 කි ත් යස කොත් දස දිගු දිගු යටනැ බ ද
මෙත් මහ නෙත් පා මුළු මහ තෙරිඳු ස ද
සෙත් කළ මුනිඳු සඳු ගුණ කව් පෙදෙන් බැ ද
ස ත් වැඩ පිණිස මෙ ද කෙළෙ මෙත් සිතින් න ද

නිමි.

පොත ලියුවහු පැතුම.

සි ලී කුලුණු සයුරේ සත් සෙතට ස රූ
ඇ ලී පැරුම් කෙරෙ පුදමින් වෙමින් සු රූ
බ ලී එ මර සෙන් බිඳැ හරිමින් කුරි රූ
මෙලී පිනින් බුදු වෙම් වා තිලෝගු රූ

# බුදු ගුණ අලඞ්කාර සාරය.

බුදු ගුණ අලංකාරය බලා මෙත් මිහ නෙත්පා
මුළු හිමියන් පසසන්නෝ බොහෝ යැ. රවේ
පණ්ඩිතයෝ රුස් වැ ඔවුන් සඳහා ඊදූගමැ
ජයඝතමහසකුදු තැඟු හ. සඨාථීනාම ධර
වූ විද්‍යාචක්‍රවර්ති ඔබ ගේ ජයඝතමිහාත
මේ මැ වේවා!

---

## බුත් සරණ

---

(මේ එහි බුදු ගුණ අලඞ්කාර කථා ශරීරය දක්වන කොටස යැ.)

අංශයෙහි බුදුගුණාලඞ්කාර පද්‍යයෝ යැ.

තව ද, එක් සමයෙක්හි **විශාලාමහනුවර** නානා ප්‍රකාර වූ
වෙශයෙන් හා භූෂණයෙන් යුක්ත වූ, සම්පත්තියෙන් අන්‍යූන 22
වූ, යෞවනයෙන් උදාම වූ, රූපයෙන් මනොහර වූ, කුලයෙන්
අනින්දිත වූ, විද්‍යායෙන් ප්‍රසිද්ධ වූ, සැරුසුම්හි තන්වැසි වූ,
කෙළියෙහි විදග්ධ වූ, සත්‍යයෙහි ස්ථිර වූ, ප්‍රෙමයෙහි නිබොරු
වූ, අභ්‍යන්තරඞ්ගබාහිරඞ්ගකාර්‍ය්‍යයෙහි ප්‍රමාදයක් නැත්තා වූ,
ගැනුන් හා පිරිමින් විසින් ගැවැසී ගත්තේ යැ.

සියලු දෙශයෙහි සමෘද්ධිසාරය තාක් එක් තැන්හි කොටැ 21
මිවා ලූවාක් සෙ නානා දෙශයෙහි වූ අනෙක ප්‍රකාර වස්තු
යෙන් 'අසෝ වස්තුව මෙහි නැතැ'යි නො කියත පරිද්දෙන්
කපුරු, කස්තුරු, සඳුන්, කලුවැල්, ලමහ, තකුල්, පටපිළි,
දොවාහ, රත්රන්, රිදී, මුතු, මැණික්, ආදි වූ නොයෙක් 12
සාර වස්තුයෙන් සම්පූර්ණ යැ.

**අඤ්ජනකූටපර්වතය** සේ උස් වූ, මහත් වූ, ජාතියෙන්
භද්‍ර වූ, සත්ත්වයෙන් දෙවසත්ත්වාදි උත්තමසත්ත්ව ඇති, දශා
හෙයින් චතුර් දශා ඇති, ශොභායෙන් චතුර් ශොභායෙහි
පවත්නා වූ, විනීත කැමින් තපස්වීන් වැනි වූ, කොපයෙන්
අශනිපාතයක් සේ නො වළකා ගත හැක්කා වූ, ක්‍රියායෙන් 16

උත්තම වූ, සන්නාහ්‍ය කර්ම ඖපවාහ්‍යකර්මයෙහි දක්‍ෂ වූ, වන්නි
දක්‍ෂ, වන්නි පරිඝාත, පාණිපරිඝාත වේණුපරිඝාතාදි වූ
නානා ප්‍රකාර පරිඝාතයෙන් හික්මවන ලද්දා වූ, ශාස්ත්‍රා
ඛ්‍යාත විධියෙන් ග්‍රාම්‍ය කරන ලද, පමණ නැත්තා වූ, හස්තීන්
ගේ කුඤ්චනාදයෙන් ගැවැසී ගත්තේ යැ.

තව ද, දෙශ හෙයින් සින්ධුදෙශාදි උත්තම දෙශයෙහි
උපන්නා වූ, වර්ණ හෙයින් ජාති හෙයින් සත්ව හෙයින්
17 ප්‍රකෘති හෙයින් කිසි දොෂයක් නැත්තා වූ, පඤ්චධාරායෙහි
ඉතා ශික්‍ෂිත වූ, රළ සේ අනවරතයෙන් දිවෙන්නා වූ පතන්
නා වූ අශ්වයන් ගේ හේෂා රවයෙන් එකකොලාහල යැ.

එසේ මැ නානා ප්‍රකාරවර්ණකම්බල අතුළා වූ, නඟන ලද
ධවජපතාකා ඇති, විනීත වූ අශ්වයන් යෙදූ දෙව රථ යැ,
පුෂ්‍ය රථ යැ, සංග්‍රාමික යැ, පුරපරිඝාතික යැ යනාදි නො
18 යෙක් රථයෙහි චක්‍රනාදයෙන් නිරන්තර යැ.

පුඹුනාවුන් ගේ තුඬින් නික්මුණු, එහි රජ කරන රජ
දරුවන් ගේ මූර්තිමත් කීර්ති බඳු වූ, අති ධවල දක්‍ෂිණාවෘත්ත
සංඛනාදයෙන් එකනාද යැ.

සන්තුෂ්ට වූ ස්ත්‍රීපුරුෂයන් ගේ නානා ප්‍රකාර මඞ්ගලයෙහි
හා නෘත්‍ය ගීත වාද්‍ය ප්‍රසඞ්ගයෙහි ගසන ලද මිහිඟු බෙරෙහි
ගම්භීර ධීරනාදයෙන් ශ්‍රවණරමණීය යැ. ප්‍රවීණ වූ වීණා
කාරයන් ගේ වීණාස්වරයෙන් සාඩම්බර යැ. දෙශීය මාර්ගී
දෙක්හි සුශික්‍ෂිත වූ වංශකාරයන් විසින් පුඹුනා ලද වංශ
නාදයෙන් මනොහර යැ. ලයමානයෙහි දක්‍ෂ වූ තාලධරයන්
විසින් ප්‍රයොග කරන ලද තාලයෙහි ශබ්දයෙන් දුරු කරන
ලද උත්කණ්ඨා ඇත්තේ යැ.

තන්හි තන්හි නෙහි නෙහි දොර දොර දේවාලයයෙන්
20 දෙවාලයයෙහි නටන්නා වූ ස්ත්‍රීන් ගේ නෘත්‍යයෙන් පුරුෂ
යන් සිත් ගන්නේ යැ. පුරුෂයන්ගේ නෘත්‍යයෙන් ස්ත්‍රීන්
සිත් ගන්නේ යැ. කාමවෙෂයට මතුරන මන්ත්‍ර බඳු වූ ස්ත්‍රීන්
ගේ මධුර ගීතයෙන් පුරුෂයන් ගේ කන්හි අමා නමන්නේ යැ.
පුරුෂයන් ගේ ගීතයෙන් ස්ත්‍රීන් ගේ කන්හි අමා නමන්නේ යැ

“මේ මධුරාහාර අනුභව කරව, මේ මධුර වූ පානීයය බො
32 ව” යි මෙසේ හඬ ගහන වචනයෙන් සා පිපාසා ඇත්තවුන්
ගේ කන්හි දරිද්‍රය හරනේ යැ.

සුවාසූ දහසක් කුළින් ගැවැසී නත් **හිමාලය පර්වතය** සේ
උස් වූ ධවල වූ අනෙක ප්‍රකාර වූ ප්‍රාසාදශතසහස්‍රයෙන් හොබ
නා ලද්දේ යැ. නොඑක් හංසචක්‍රවාකාදි වූ ජලචර පක්ෂීන්
ගේ මනොහර ක්‍රීඩායෙන් යුක්ත වූ, පියුම්හි මී බී මත් බමර 23
පිය රැවින් මධුර වූ, අනවරතයෙන් පිපී සිටිනා පස් වණක්
පියුම් ඇති, මඳ මාරුතයෙන් සොලොවන ලද පද්මොත්පල
යෙන් වගුළ අභිනව රේණු නමැති කුංකුමයෙන් අංගරාග
ගත්, හිමට සතුරු වූ, ක්‍රීඩාවට නිධාන වූ, දිය මැදින් අවුත්
වෙළලූ ගැසෙන්නා වූ රළින් මැ බලන්නවුන් ගේ සිත් දෙමී
නස් තාක් තමා අතින් නෙතැ ගොඩට ගසන්නාක් වැනි වූ,
වෙර ලෙහි සුදු වැලි තලායෙන් සංසාර මුඛය නිරුපද්‍රව වන
පිණිස පාන්වලි දුන්නාක් වැනි වූ, තෙරෙහි ලතාමණ්ඩප
යෙහි හිඳැ හඬන්නා වූ රාජහංස නමැති වන්දීන් විසින් අනව
රතයෙන් ස්තුති කරන ලද්දා වූ, නොඑක් පොකුණින් හා
විලින් ගැවැසී ගත්තේ යැ.

වසන්තකාලයා ගේ අවන් බිම් වැනි වූ, බමරුනට කුල
පරපුර වූ, මොනරුනට නෘත්‍ය ශාලා වූ, නොඑක් ජාතියෙහි
මුවනට ක්‍රීඩා ගොෂ්ඨීස්ථාන වූ, ලතායෙන් වෘක්ෂයට යන
වෘක්ෂයෙන් ලතාවට යන බමරුන් ගේ මධුර වූ නාදයෙන්
අනවරතයෙන් සහොත්සාහ ගායනා පවත්වන්නාක් බඳු වූ,
මනුෂ්‍ය ලොකයෙහි ඇති තාක් පුෂ්ප ජාති යැ, ඵල ජාති යැ,
යන මේ එක් කොටැ සැමනුම් සැමනුම් ගන්නා තැන් බඳු වූ,
නොඑක් වැලි මලුයෙන් නොඑක් ලියමඬුයෙන් නොඑක්
ධාරාගෘහයෙන් නොඑක් හැල්මෙලන් නොඑක් පතසින් නො
එක් විලින් නොඑක් ඇලින් හොබනා වූ සියදහස් ගණන්
උයනින් **ශක්‍රයාගේ නන්දනවනයට සපඬා** කරන්නේ යැ. 34

සියලු සත්ත්වයන් දරුවන් කොටැ සිතන්නා වූ රජ දරු 40
වන් විසින් යුක්ත යැ. "අප ගේ ස්වාමි මධ්‍යස්ථය හ. අප ගේ
ස්වාමි න්‍යායනට නිෂ්ඨුරය හ. අප ගේ ස්වාමිදුෂ්ටනිග්‍රහ ශිෂ්ට
පරිපාලන දෙකට මැ සැරැහී සිටිය හ. අප ගේ ස්වාමි සත්‍යවා 115
දී හ. අපගේ ස්වාමි ත්‍යාගීහ. අප ගේ ස්වාමි උදාර වූ පරාක්‍රම
ඇත්තා හ. අප ගේ ස්වාමි ශස්ත්‍ර ශාස්ත්‍ර දෙක්හි සමර්ථය හ. 14
අප ගේ ස්වාමි ස්වමණ්ඩල පරමණ්ඩල කාර්‍යාකාර්‍යයෙහි විභාග
දන්නා හ. අපගේ ස්වාමි ඇත් පිටැ අස් පිටැ රථ පිටැ ඉතා
ශික්ෂිතය හ. කෝපයෙහි යමයා වැන්න හ. කීර්තියෙන් සඳු
වැන්න හ. ලෝවැස්සනට සුව දී තුමූ සුව අනුභව කෙරෙ

ති.'' මෙසේ අනවරතයෙන් තමන් ගේ ස්වාමීන් ගේ ගුණ කිය
116 කියා මත් වැ මත් වැ ඇවිදුනා වූ, හය පක්ෂ පාත දෙකින්
යුක්ත වූ රාජසෙවකයන් ඇත්තේ යැ.

සියලු සත්ත්වයන් ගේ අන්‍යායනිවාරණය පිණිස ස්ථාන
ස්ථානයෙහි පිහිටුවන ලද, ලොවට මවුපියන් සේ සිටියා වූ
සතර අගතියට නො ගිය සභ්‍යයන් විසින් පිහිටි ධර්මාධි
කරණ ඇත්තේ යැ. සද්ගුරුන් ගේ උපදෙශයෙන් මනා වැ
27 පවත්නා වූ ක්ෂුද්‍රවිද්‍යාවන් හා මහා විද්‍යාවන් ගේ පැලැඹුම් ඇති
නොයෙක් විද්‍යාශාලා ඇත්තේ යැ.

එහි වාරයෙන් වාරයෙහි රජ කරන රජදරුවෝ සත්දහස්
37 සත්සිය සත්දෙනෙකැ. ඔවුන් වසන්නා වූ එතෙක් මැ ප්‍රසා
33 ද ඇත්තේ යැ. එතෙක් මැ කූටාගාර ඇත්තේ යැ. එතෙක්
34 මැ පුෂ්පාරාම ඵලාරාම ඇත්තේ යැ. එතෙක් මැ පොකුණු
ඇත්තේ යැ.

77 මෙසේ සමෘද්ධ වූ දිව්‍යපුරයට සපඝා කරන්නා වූ මේ
78 **විශාලා** නම් මහනුවර කාලාන්තරයෙකින් දුර්භික්ෂයෙක්
ඇති වී යැ. මෙ සේ දුර්භික්ෂ ඇති වූ කල්හි සර්කාලයෙහි
පළමු කොටැ ගෝකුර වියැළී යන්නා සේ, පළමු කොටැ
අනාථ වූ දිලිඳු වූ ජනයෝ මළ හ. ඒ මළා වූ මනුෂ්‍යයන් ගේ
80 කුණප ගන්ධයෙන් යක්ෂයෝ අවුත් ඒ නුවරට වන් හ. මෙ සේ
පළමු ඇති වූ දුර්භික්ෂභය ද ඇතිවන්නා හා, නැවැතැ
බොහෝ දූස් මිනිස්සු මිය යන්නට වන්හ. මෙ සේ කුණප
ගන්ධයෙන් එනුවර පිරී ගිය කල්හි සත්ත්වයනට අහිවාතක
79 නම් රොගයෙක් ඇති වී යැ. මෙසේ දුර්භික්ෂ භය යැ,
අමනුෂ්‍යභය යැ, රොගභය යැ යන මේ තුනින් එනුවර
සර්වාකාරයෙන් උපද්‍රැත වී යැ.

ඉක්බිති මෙ කී තුන් භයින් පීඩිත වූ සියලු නුවර වාසීහු
89 රාජාඞ්ගණයෙහි රැස් වැ මහත් කොටැ හඬ ගැසූ හ. ඒ
අසා රජ්ජුරුවෝ ''මේ කිමෙක් දැ?''යි විචාළ හ. නගරවාසී
91 හු ද ''ස්වාමිනි! මේ නුවර දුර්භික්ෂභය යැ, අමනුෂ්‍යභය යැ,
රොගභය යැ යන මේ මහත් වූ තුන් භයෙක් ඇති වී යැ.
මෙයට පළමු සත් වන රාජපරම්පරාව දක්වා මෙ සේ වූ තුන්
92 භයෙක් නො උපන් විරී යැ. ක්ෂෙත්‍රයෙහි ශස්‍ය නැති වී යැ.
වැව්අමුණුවලැ දිය නැති වී යැ. අහස්හි වැසි නැති වී යැ·
කොටු ගෙවලැ පිරූ ධාන්‍යසඤ්චය නැති වී යැ· බිමැ තණ

නැති වී යැ. තලු තෙමන පමණක් පැන් නො ලබන්නා වූ, 93
තොලු ගානා පමණක් තණ නො ලබන්නා වූ, සියලු
චතුෂ්පාද ජාතීහු මියැ වැගිරැ ගිය හ. දෙරැ දෙරැ
මිනී යැ. ගෙසි ගෙසි වළාමැ. ඇසෑ ඇසැ කඳුළු යැ. සිතැ
සිතැ ශොක යැ. තන් තන්හි මිනීබෙර හා අවමඞ්ගල්‍යකා 86
හල යැ. ගෙහි ගෙහි කණ්ඨගතප්‍රාණ වැ හොත්තා වූ අනාථ
සත්ත්වයන් ගේ බැනෑ පත් හඬ යැ. පවුරින් පිටතැ සියලු
ගුම්ය මිනී මත්තෙහි මිනියේන් පවුර හා සම වැ උස් වී යැ. 83
'ප්‍රාණරක්ෂා කොටැ ගනුම්හ' සි සියලු ධනධාන්‍ය හා බන්ධුවර්ගී
යා හැරැ පියා හිත්ති බිදැ ගෙනැ නික්මෙන්නාවූ ජනයා ගේ
සංඛ්‍යා නැතැ. සියලු ජම්බුද්වීපයෙහි උපද්‍රව තාක් හැම 84
හැකිළී මෙ නුවරෙහි රැස් වූවාක් වැන්නැ. අපි හැම දෙන
සතුටු කඳුළෙහි රස නො දනුම් හ. ශොකයෙන් තොර වූ
ළයක් නො ලබම් හ. දිව්‍ය ස්ත්‍රීන් හා සමාන වූ ස්ත්‍රීන් ගේ ශරී
රයෙහි ලේමස් නැති වැ ඇටසම් මාත්‍රයක් තුබූ හෙයින්, ඔහු 91
හැම ගෙසි ගෙසි යකින්නන් වැන්න හ. මේ වූ තුන් උපද්‍රවය
අසා සියලු දෙශාන්තර වාසීන් ගේ උපසර්පණයක් නැති වැ
ගිය හෙයින්, දෙශාන්තර යෙන් එන්නා වූ අමුතු පඬුරෙකැ
රස නො දනුම් හ. 'අද මර යැ' යන භයින් ආතුර වූ චිත්ත
යෙන්, කාමානුභවතෘෂ්ණාවෙක් නම් දුරින් දුරැ වී යැ. 97
කාමාස්වාද විගමනයෙන් අප ගේ දරුමුණුබුරැ පරම්පරාව
පිරිහෙන්නට වනැ. එහෙයින් මැ, මේ රාජධානියෙහි එසේ
ගහන වූ මිනිස්සු දැන් ගැණැ ගත හැක්කා සේ ඉතා විරල 101
වැ ගිය හ. මර තෙමේ **විශාලාමහනුවරැ** මිනිසක්හු තබා ලා 81
ඔබ්බෙහි මිනිසුන් අල්වම් දැ?' සි ප්‍රතිඥා කළාක්හු වැන්නැ.
පෙරැ සම්පත්තීන් විශාල වූ මේ නුවර දැන් විපත්තීන් විශාල
වී යැ. පෙරැ ධර්මිෂ්ඨ වූ රජ දරුවන් දවසැ මෙසේ වූ භයක්
මෙසේ වූ විපත්තියක් නුදුටු විරූම් හ'' සි කියා, තමන් ආ
කටයුතු දැන්වූ හ.

එබස් ඇසූ රජ්ජුරුවෝ සියලු නුවර වැස්සන් සන්ථාගාර
යෙහි රැස් කරවා, "ලොවට විපත්ති නම් රජ දරුවන් ගේ 111
අධර්මිෂ්ඨ කැමින් වන්නේ යැ. ඉදින් මෙලෙස විපත්ති වීමට
කාරණ වූ කිසි අධර්මිෂ්ඨ කමෙක් ඇත් නම්, තෙපි හැම 112
දෙන මැ පරීක්ෂා කොටැ කියව"සි කී හ.

ඉක්බිති නගර වාසිහු හැම දෙන මැ රැස් වැ ගෙනැ
'ලොකසම්පත්ති ලොකවිපත්ති දෙක රජ්ජුරුවන් ගේ ධර්මාධර්ම

111 දෙකින් වන්නේ යැ. රජු ධර්මිෂ්ඨ කල්හි උන් ගේ රක්‍ෂාවෙහි
104 සිටිසා වූ දෙවතාවන් ආදි සියල්ලෝ මැ ධර්මිෂ්ඨ වන්නා හ.
109 හිරසඳ දෙ දෙනා ද රජ දරුවන් රාජධර්ම මාර්ගයෙහි පවත්නා
කල්හි තුමූ ද තමන් ගේ මාර්ගී නො ඉක්මැ පවත්නාහු යැ.
සියලු කර්මජ රූපයන් රක්නා ජීවිතෙන්ද්‍රියය සේ, සියලු සත්ත්ව
යන් ගේ රක්‍ෂාව රජ දරුවන් පිළිබඳ යැ. ශුද්ධාෂ්ටකයෙහි
සෙසු රූපයන් ඇත ද, ද්‍රවගුණය ආපො ධාතුවෙන් මැ
පවත්නා සේ, සත්ත්ව ලොකයෙහි අනන්ත සත්ත්වයන් ඇත
ද, රජ්ජුරුවන් ගේ කරුණායෙන් මැ සියලු සත්ත්ව යන් ගේ
ළය සැනැහී තිබෙන්නේ යැ. මෙසේ ලොවට බොහෝ උප
කාර වූ ස්වාමිකුලයෙහි උපන් අප ගේ ස්වාමි මේ සා විපත්ති
යක් වන පරිද්දෙන් කවර දොෂයක් කළ සේක් දො
හෝ? සි පරීක්‍ෂා කරන්නෝ, අප ගේ ස්වාමි මහා කුලීන
114 සෙයින් හා, දෛව යැ බුද්ධිය යැ සත්‍ය යැ යන මෙයින්
සම්පන්න හෙයින් හා, ඥානවෘද්ධයන් කී පරිද්දෙන්
115 පවත්නා හෙයින් හා, ධර්මිෂ්ඨ හෙයින් හා, සත්‍යවාදි
හෙයින් හා, අවිසංවාදක හෙයින් හා, කෙලෙහිගුණ
දන්නා හෙයින් හා, බොහෝ අවගුණයන් අතුරෙහි
ගුණ මාත්‍රයක් මැ ගන්නා හෙයින් හා, උත්සාහසම්පන්න
116 හෙයින් හා, අතිමත වූ කාර්ය්‍ය සාධා ගැන්මෙහි දක්‍ෂ හෙයින්
හා, කීවෘ කරන අමාත්‍යයන් ඇති හෙයින් හා, ඉන්ද්‍රිය විජය
යෙන් යුක්ත හෙයින් හා, කිසි රජ දරුවනට සුදුසු වූ ගුණයෙ
කින් හීන නො වෙති සි. පානබ්‍යසන යැ, ස්ත්‍රී බ්‍යසන යැ,
මෘගයාව්‍යසන යැ, ද්‍යූතව්‍යසන යැ යනාදි වූ සප්තවිධ ව්‍යසන
යෙන් දුරු වැ සිටිසා හ. ත්‍යාග යැ, සත්‍ය යැ, ශෞර්‍ය්‍ය යැ
118 යන මහා ගුණ තුනට ජීවිතය සතර වනු කොටැ සේ රක්‍ෂා
61 කරන්නා හ. හිරු නැංග ද, ගුහාවට වන්නා වූ අන්ධකාරය
නො නස්නා සේ, ලොවැ චණ්ඩ වූ බලවතුන් බොහෝ
වුව ද, මොවුන් ආශ්‍රය කළා වූ අනාථයෝ නො නැසී මැ
සිටිය හ. ශාලි රක්‍ෂාව පිණිස කෙත්වත්හි ලවන් නෙළන්නා
සේ, ශිෂ්ටයන් ගේ රක්‍ෂාව පිණිස දුෂ්ටනිග්‍රහ කරන්නා හ.
56 වරු අතුරෙහි නැඟි හැල්පත උදුරන්නා වූ මලය වැස්සන්
සේ, අධර්මය රක්‍ෂා කොටැ ධර්මයට හිංසාවක් නො කරන්නා හ.
වැව් පත්ලෙහි දිය පුරා උඬත් තව දිය ගන්නා සේ, සත්ත්වයා
සුවපත් කොටැ තුමූ සුවපත් වූ හ. මල් පෙති නො බිඳැ මී
47 බොන බමරක්හු සේ, යෙහෙන් ලෝ වැස්සන් නො මිරිකා
50 අය ගන්නා හ. ඇසින් දක්නා රූප කනින් දක්නට නියොග

නො කරන්නා සේ, සත්ත්වයා සුදුසු කට යුත්තෙකැ මුත්
නුසුදුසු කට යුත්තෙකැ නො සොදන්නා හ. කරයෙන්
තැබුව මනා අන්දම් වැයෙන් පොරොවින් නො තබන්නා
සේ, ක්‍ෂුද්‍රයන් හා කළ මනා කටයුතු මහතුන් හා නො ක
රන්නා හ. ඡත්‍රයෙන් වැළැකෙන්නා වූ වැස්සට අතුල් හිසැ 51
තබන්නවුන් සේ, මහතුන් කළ මනා කටයුතු ක්‍ෂුද්‍රයන් ලවා
නො කරවන්නා හ. දවසක් මුළුල්ලෙහි තැවූ ය කබල්හි ලූ
කිහිඹියන් සේ, අඹුවන් දරුවන් හැති යහන්හි මිනිසුන්
නො හෙවූ විරූ හ. ශරත් සමයෙහි දිලියෙන්නා වූ සූර්‍ය්‍ය
මණ්ඩලය ඇස හකුළුවහකුළුවා බලන්නා සේ, ලොකාර්‍ය්‍ය 52
යක් තකා ද පරස්ත්‍රීන් බලත් නම්, ඇස හකුළුවහකුළුවා මැ
බලන්නා හ. මවුන් ගේ සෞභාග්‍යයෙහි රාගොත්පත්තියක්
නො වන්නා සේ, පරස්ත්‍රීන් ගේ සෞභාග්‍යයෙහි රාගොත්
පත්තියක් නො කරන්නා හ. දියෙහි ලූ නැව දිය නො උකා 48
රාකෙන්නා සේ, ධනීන් කෙරෙහිත් උන් ගේ ධන නො
ගැණූ පැවැත්තා හ. දත් මැද අනතයෙහි දූවටු දඬ නිර 62
පෙක්‍ෂක වැ දමන්නා සේ, පුරුෂයා ලවා ප්‍රයොජන කරවා
ගෙනැ නිරපෙක්‍ෂ වැ අත් හැර නො පියන්නා හ. වෙන
වෙන කරලෙහි තුබූ වී එක් කොටැ ගෙහි රැස් කොටැ 63
බොහෝ කරන්නා සේ, හැම සත්ත්වයන් සිතැ ඇති
සන්තොෂ තමින් ළෙහි බහා ලා බොහෝ කළ හ. පුත්‍ර ප්‍රෙම
ඇති මව ප්‍රසව වෙදනාව ඉවසන්නා සේ, සත්ත්වයා කෙරෙහි 53
කළ සෙනහයෙන් තමන් ගන්නා ආයාසය සරු නො කළ හ.
මහ නැව පස්සෙහි යන ගල්වතක් සේ, පූර්වරාජධර්මය පෙර
දැරි කොටැ තුමූ ඒ අනු වැ පැවැත්තා හ. කුස පිරෙන
පිණිස මියෙහි ආහාර තබන්නා සේ, ලෝ වැස්සන් සමෘද්ධ 64
කරනු පිණිස තුමූ මැ ධන සඞ්චය කළ හ. විල්හි පියුම් මී
බොන රාජහංසයකු සේ, ධන ඇති ඇත්තවුන් ගේ ගෙහි මැ 65
තබා, තමා මැ එයින් ප්‍රයෝජන වින්ද හ. ඇත් හට ගොයම්
පිණිස කුඹුරු ඇත්තවුන් හඬව හඬවා ගොයම් දෑ ගන්නා 66
සේ, එකකු හට ඉෂ්ට පිණිස එකක්හු ගේ ධනය හැර එකකු
හට නො දෙන්නා හ. ආකාශයෙහි තරු වසා වලාකුළු ඉදු 54
වන පවනක් සේ, අනුන් ගේ ගුණ වසා නො ගුණ නො ලූ හ.
පිරිමැසූ තෙනැත්තවු මැරූ දෑ යෙහෙන් නිදන මනැතක්හු 55
සේ, තමනට දුක් ගත්තවුන් මරා සුව නො වින්ද හ. ‘මේ
දස් කම කොටලා අද මා ගේ දරිද්‍රය හැර ගනිම්’යි ආ 67
තැනැත්තවු හඬව හඬවා ගෙට නො යවන්නා හ. අතු

49 කපා මොර කන්නා සේ, ලෝ වැස්සා නසා ප්‍රයොජන
නො ගන්නා, ශුඩ කරන පිණිස මල සිඳෙන පමණක් රත්
68 රන් දවන්නා සේ, සත්ත්වයා ගේ දොෂ පමණක් මැ සන්තාප
69 කරන්නා හ. මුහුද වඩදිය නැති විටැ මැ කළපුයෙහි දිය
නැති වන්නා සේ, සත්ත්වයා හට සුව නැති දූ මැ තමන්
සිතැ සුව නැති කළ හ. ගැල යෙහෙන් තබා, තමා බිමැ
46 පෙරළී දුක් ගන්නා ගැල් සක සේ, සත්වයා යෙහෙන් සිටුවා-
තුමූ දුක් ගත් හ. පඤ්චෙන්ද්‍රියයන් වෙන වෙන ගත්තා වූ
57 ආලම්බනයෙහි රස විඳුනා වූ සිතක් සේ, සත්ත්වයන් වෙන
වෙන ලද්දූ වූ සම්පත්තියෙන් තුමූ සුව වුන් හ. දුන්නෙහි
70 දැඩි කැමින් ශරය දුරු හෙන්නා සේ, තමන් ගේ දැඩි කැමින්
සත්වයන් දුරු නො කළ හ. වෘක්ෂයෙහි මූලය සපිර වැ පිහිටි
71 පිහිටි සේ ගසැ අග සලෙළ වන්නා සේ, සත්ත්වයා සපිර වැ
පිහිටි පිහිටි සේ තුමූ සලෙළ වූ හ. නුවර රක්‍ෂාවට පවුර සපිර
72 කරන්නා සේ, ලොවට රක්‍ෂා පිණිස තමන් සපිර කළ හ.
73 ඇතු සොඬින් ඉකැවූ පැන් මුඛය අනුභව කරන්නා සේ,
තමන් සඤ්චය කළ ධනය ලෝ වැස්සන් ලවා අනුභව කැරූ
74 වූ හ. මල් නො ගෙනැ පල දෙන්නා වූ දිඹුල් රුක් සේ,
කාරණ නිරපෙක්‍ෂ වැ මැ ලෝ වැස්සනට සුව දෙන්නාහු යැ.
58 වෙහෙල්ල තෙමා ගෙනැ බස්නා ජලප්‍රවාහය සේ, අනාථ
යන් තෙමා කරුණා චිතුරු පැවැත්වූ හ. අශුචි භූමියත් පියුම්
60 වනයත් නො හැරූ හමන්නා වූ පවන් සේ, රාජ පුත්‍රයන්
කෙරෙහි දූ චණ්ඩාලයන් කෙරෙහි දූ සම වැ සිත් පැවැත්
117 වූ හ. දවස් පතා උදය රෙඛාව නො හැරූ නැගෙන හිරු
සේ, තමන් ගේ ධර්ම රෙඛාව නො හැරූ පැවැත්තා හ. හිරු
රුසින් වන්නා වූ තැවුලියට වඩා ප්‍රයොජන මැ බොහෝ
වන්නා සේ, තමන් ගේ ආඥයෙන් කරන සන්තාපයට වඩා
ප්‍රයොජන මැ බොහෝ කළ හ. විකාරයට මැ වඳුරන් වඩන්නා
සේ, චපලයන් චපල කමට මැ රක්‍ෂා කළ හ. පැන් පිරුණු
59 කළය නො සොල්වා තබන්නා සේ, ගුණෙන් පිරුණු
ධීරයන් නො සොල්වා මැ රක්‍ෂා කළ හ. මෙසේ හෙයින්
අප ගේ සවාමීන් ගේ කිසි දොෂයෙක් නැතැ”යි කියා නිශ්චය
කොටැ ගොස්, “සවාමීනි! අපි හැම කැටි වැ පරීක්‍ෂා කරන්
නමෝ, මේ සා මහත් විපත්තියට කාරණ වූ කිසි දොෂයක්
නුදුටුම් හ”යි කියා දැන්වූ හ.

ඉක්බිති, රජ්ජුරුවෝ ඒ උපද්‍රවයන් සන්හිඳුවන පිණිස
නොයෙක් බලිකර්ම යැ, දෙවතාරාධනැ ය යන විධි කොටැ

ද, ඒ උපද්‍රවයන් සන්හිඳුවා ගත නුහුන හ. ඉක්බිති සමහර
කෙනෙක් කිරි පිරුණු බුරුලු තිබියැ දී ගහ ශෙනැ කිරි 185
දෙනා සේ, කරුණායෙන් පිරුණු සර්‍වඥයන් වහන්සේ
වැඩැ හින්දැ දී, උන් වහන්සේ ගේ නම නො කියා **කකුද
කාත්‍යායන** නම් එක් සර්‍වඥ කෙනෙක් ඇත. ඔවුන් අව 124
හොත්, මේ උපද්‍රව සන්හිඳෙයි'' කී හ. සමහර කෙනෙක්
ඔවුන් වළකා, අඳුරු නිසා පහන් අවුලුවන්නට තෙල් ගන්නා 133
පිණිස වැලි මලු තෙලියත්හි ලූවා සේ, ''මේ උපද්‍රව සන්හිඳු
වන පිණිස **අජිතකෙසකම්බලිහු** මෙයට ගෙන්වුව හොත් 125
යහපතැ''යි කී හ. එසේ කියන්නවුන් වළකා සමහර
කෙනෙක් වසත් කෙළියට සාවුන් හං පෙර මඟ බලා හිඳිනා
සේ, ''**මක්ඛලිගොසාල** නම් බුදුන් මෙයට වැඩිය හොත්, 128
මේ උපද්‍රව සන්හිඳෙයි'' කී හ. එසේ කියන්නවුන් වළකා
සමහර කෙනෙක් හැල් බත් පතා හකුරු වපුරන්නා සේ, 158
''**නිගණ්ඨනාතපුත්‍ර** නම් සර්‍වඥ කෙනෙක් ඇත. උන් මෙයට 126
ගෙනාව හොත්, මේ උපද්‍රව සන්හිඳෙයි'' කී හ. ඔවුනුදු
වළකා සමහර කෙනෙක් ගිතෙල් පිණිස ඔටු කිරි අලළන්නා 183
සේ, ''**සඤ්ජයබෙල්ලට්ඨිපුත්‍ර** නම් සර්‍වඥ කෙනෙක් ඇත. ඒ 127
බුදුන් මෙයට ගෙනාවොත්, මේ උපද්‍රව සන්හිඳෙයි'' කී හ.
ඔවුනුදු වළකා වියතුන් හඳුනන සමහර කෙනෙක් මල්
ගන්නා පිණිස අහසට පැන් දමා ලූවා සේ, ''**පූරණකාශ්‍යප** 123
නම් එක් සර්‍වඥ කෙනෙක් ඇත. උන් මෙයට ගෙනාව
හොත්, මේ උපද්‍රව සන්හිඳෙයි'' කී හ.

මෙසේ අඥානයන් කැටි වැ තමන් තමන් ගේ මත කිය කියා නිමැවූ කල්හි, එවැනි හයක් සන්හුන මනා කල්හි, කෙළලක්‍ෂයක් සක්වළැ ආඥා පවත්නා වූ එකිඑකී ගාථා යෙන් යුක්ත වූ, අද දක්වා නම සිහි කළ සියලු සත්ත්ව යන් ගේ සියලු භය සන්හිඳුවන්නා වූ රතනසූත්‍රයක් වැනි ධර්‍මරත්නයක් ලොවැ පහළ වුව මනා කල්හි, පස් වා දහ සක් මුළුල්ලෙහි සියලු සත්ත්වයනට සියලු උපද්‍රව දුරු කරන ධර්‍ම නමැති ඖෂධමහාවෘක්‍ෂයක් ලොවැ මුල් බට මනා කල්හි, ශක්‍රබ්‍රහ්මාදි දෙවතාවන් ගේ පා බිම්හි දු පහළ මනා කල්හි, සුවාසූ දහසක් ප්‍රාණීන් එක ගෙලා අමාමහ නිවන් දුට මනා කල්හි, එතන්හි හුන් පිරිසින්
සමහර කෙනෙක් නැඟී, ''මහරජ, මොවුන් හැම දැන්වූයේ
'අපට මෙසේ වූ තුන් උපද්‍රවය මඳ යැ'යි කියා නැවැතැ 163

මෙ කී සදෙනා විසින් මේ මත්තෙහි උපද්‍රව ගණනක්
වඩනා පිණිස යැ. ඉදින් ඉදුරා මැ මේ උපද්‍රවයන් සන්
හිඳුවනු කැමැත හොත්, අප කියන්නකුදු ඇසුව මැන
වැ'' යි ගිම් නිවා බස්නා ආකාශගඞ්ගාප්‍රවාහයක් සේ,
සියලු සත්ත්වයන් ගේ සන්තාප නිවන්නා වූ සද්ධර්ම නමැති
ගඞ්ගාප්‍රවාහයට උඩු ගං වැ සිටියා වූ එක් වියත් නා
කෙනෙක් ඇත. මේ උපද්‍රවය සන්හිඳුවනු පිණිස ගෙන්
වුව මැනැවැ''යි කී හ.

නැවැතැ කියන්නෝ, ''මහරජ, මෙ කී සදෙනා බුදු
131 බවට උසුළු ගන්වන්නා වූ නිවටුන් බව මුත්, තුමූ බුදු නො
වෙති. අප දන්වන සවාමිදරුවාණෝ වූ කලී වොටුන්නෙහි
නිමාම් වැ සිටියා වූ අග්‍රමාණික්‍යයක් සේ ශාක්‍ය කුලයට
මුදුන් පත් වැ සිටියා හ. තමන් පිළිසිඳ ගත් මිහුලෙහි සියලු
ප්‍රෙත ලොකය **ආලකමන්‍ද**, නම් දිව්‍ය රාජධානිය සේ, සා
312 පිපාසා දුක් නැති කොටැ සවසථ කළ හ. දුකින් අතුරැ නැත්
තා වූ අටමහනරකය චිත්‍රසුඛය පුරා ලූ අටමහා නිධානයක්
311 සේ, සුවයෙන් නිරන්තර කළ හ. නරකයෙහි සත්ත්වයන්
314 මුවෙහි ලා ලූ ය වට අමා වට කළ හ. ඝොර වූ **අසිපත්‍රවනය**
313 **නන්‍දනවනය** කළ හ. සොළොසඟුල් කටු ඇති හිඹුල්රුක්
315 නරකසත්ත්වයනට කප් රුක් කළ හ. කපක් මුළුල්ලෙහි නැවී
ගියා වූ ලොහො දියෙන් පිරුණු **වෙතරණී** ගඞ්ගාව පස්
316 වණක් පියුමින් ගැවැසී ගත්තා වූ **ආකාශගඞ්ගාව** කළ හ.
ලොහො දියෙන් පිරුණු **ලොහොකුඹු** නරකය අභිම
317 තාර්ථ සාධන්නා වූ භද්‍රකුම්භ කළ හ. නවයොදුන් බො
ල යකබල පළා ගෙනැ පිටතැ සියක්යොදුන් තන්හි
පවත්නා වූ, සුවාසූදහසක් යොදුන් තන්හි පවත්නා වූ,
සුවාසූදහසක් යොදුන් ගැඹුරු මහාසමුද්‍රජලය එක පැහැර
තමා කරා නමා ලූව හොත්, දූරා දී මැ පිනි බිඳක් සේ
වියළවා පියන්නට සමර්ථ වූ, මහ ගින්නෙහි ආදි කල්පයෙහි
317 පටන් තැවී පියා තුබූ යකබල සියක් දවස් දියෙහි ලා
නහා ගත්තා වූ යපල්ලක් සේ සිහිල් කළ හ. අවීචි මහා
නරකයෙහි දන පමණ වතුරැ යන පරිද්දෙන් සත්ත්වයන්
සනහා වැසි වැස්වූ හ. සියක්යොදුන්හි සිටැ කර දික්
කළවුන් අතුණුබහන් පිටත් වැ යන පරිද්දෙන් ඉතා
පිළිකුල් වූ දුර්ගන්‍ධ ඇති **ගූථමහානරකය**, අඹක් පිපි මුව
රඳින් පිරී සිටි පරසතුම්ඳුරා මල් ගබක් සේ එකසුගන්‍ධ
කළ හ. තුන් ගවු **පමණ** සත්ත්වයා ගේ සම් හා මස් හා

නාගර හා ඇම් විදූ ඇම මිඳුලු කන්නා වූ ශිප්‍ර ශ්‍රිණීයන්
ගේ භයඞ්කර වූ නාද පුරවි කෙවිල්ලන් ගේ හඬ සේ
මිහිරි කළ හ. යකබලින් පිටනැ සියක්යොදුනෙහි සිටැ
බැලූවන් ඇස් පිපිටැ පළා යන තරම් රළු වූ අවීචි මහා
නරකයෙහි ගිනි සිළු මැදට වන්නා වූ සත්ත්වයන් රක්තො
ත්පල ගණයට වන් මත් බමරුන් සේ සැනැසූ හ. සත්
ත්වයන් සුනු කරන පිණිස සංඝාත මහානරකයෙහි
නැංගා වූ, නැගී මුදුන්හි හෙන්නා වූ ලෝදිය ධාරා
ඇති මහා පර්වත, හිසින් හෙන්නා වූ ගඟුල්හැලි ඇති
ක්‍රීඩාපර්වත සේ සිත්කලු කළ හ. කපක් මුළුල්ලෙහි
ආලොකයෙක්හි රස නො දන්නා වූ ලෝඇඳිරි මහ
නරකයෙහි අන්ධකාර විජයයට දස දහසක් සක්වළැ 318
හිරසඳ එක විටැ වැදූ ගියා සේ, එහි එක විටැ මැ
මහාආලොක පැවැත් වූ හ. එ මැ ලොකාන්තර
නරකයෙහි චක්‍රවාට පර්වත පාර්ශ්වයෙන් ගිලිහී ලොක සන්ධාරක
උදකයෙහි ගී පෙනකඳු සේ විරී යන සත්ත්වයන්, සත්රුවන්
අතලෙහි සිටැ නන්දාපුෂ්කරිණියෙම පැනැ සැනැහෙන
තුසිපුරයෙහි දෙවියන් සේ කළ හ. නව දෙරින් වැදූ
සියලු ශරීරය පුටපාකයක් සේ තවන හළුවෙන් ගැවැසී
ගන්නා වූ කුක්කුලනරකයෙහි පැසෙන සතුන්, ආකාශ
ගඞ්ගායෙහි ජලකණිකා ඇඟැ ගස්වගස්වා වෙරළැ වැලි
තෙලෙහි හෙවැ නිදන්නා වූ රාජහංසයන් සේ මිහිරි
නිදි නිඳැවූ හ. නයින් හා ගුරුළුන් යහළු කම් ගැන්වූ හ. 322
බළලුන් හා මීයන් එක කෙළි මඬුල්ලෙහි කෙළි රස දැනැ 323
වූ හ. ඇතුන් ගේ පොකුරගින් ඉස්නා ජලකණිකායෙන් 324
සිංහයන් ඇඟැ විඩා දුරු කළ හ. සිංහධේනූන් ගේ තනයෙහි
කිරියෙන් ඇත් පොව්වන් පෙවූ හ. ඇතින්නන් ගේ කිරි සිංහ
පොතකයන් පෙවූ හ. නයින් ගේ පෙනගබ තමැති සේ සත් 321
යටැ මඬුවන් සතපා හිඳුවූ හ. සෙනඟයෙන් අසුන් හා මීවුන් 322
හා ඔවුනොවුන් ඇඟ ලෙවැවූ හ. මුවන් ගේ අඟින් දිවියන් ගේ 320
කර කැස්වූ හ. කවුඩන් හා බකමූණන් හා බොහෝ කලෙ 323
කින් ප්‍රෙමයෙන් ඔවුනොවුන් මුහුණ බැලැවූ හ. සියලු සතුන්
ගේ ශරීරයෙහි ඇති වූ අසාධ්‍ය වූ ව්‍යාධීනට තමන් උපන් මීහු 307
ලින් මැ පිළියම් කළ හ. තමන් සියලු සංසාරයෙහි වක් හර
නට පූර්වනිමිත්ත පාතා සේ, කුදුන් ගේ වක වූ ශරීරයෙහි හැද
මරා ඉදි කළ හ. සියලු සත්ත්වලොකයාට දිවඇස් දෙන 325
බවට පූර්වනිමිත්ත පානා සේ, ජාත්‍යන්ධයනට ඇස් දුන්

හ. එසේ මැ සියලු සත්ත්වයනට දිවකන් දෙන්නට
පූර්ණිමිත්ත පානා සේ, බිහිරනට කන් දුන් හ. සියලු
සත්ත්වයනට සතරසෘද්ධිපාද දෙන්නට පූර්ණිමිත්ත පානා
සේ, පිළුනට පා දුන් හ. ධර්මයට ගොළු වූ සියලු සත්ත්ව
යන් ලවා සුවාසූ දහසක් ධර්මස්කන්ධය හදාරවන්නට පූර්
ණිමිත්ත පානා සේ, ගොළුවනට බස් දුන් හ. එක්ලක්ෂ
අටසැටදහසක් යොදුන් මහමෙර තමන් පිළිසිඳැ ගත්
**කිඹුල්වත්** පුරය දිශාවට වැඳුම් ගන්වා පූ හ. සප්තකුල
පර්වතයන් ලවා සේ තහා කෙළවා පූ හ. **වෛසඟුරු** අත්
බව්හි සත් ඉඩක් හඬා විඩා වැ ගියා සේ මිසෙන් නො
බැණැ හොත්තා වූ මහ පොළොව, මනැතක්හු මැඩැ ලූ
හුණ පඳුරක් සේ, දිය පොළොවෙහි පටන් ගෙනැ එක
309 පැහැර ගුගුරුවා පූ හ. එක පැහැර ලුණුකර වූ මහා
327 සාගර ජලය ශකීරු බහා ලා සකාරු ගත් කිරි ඇතිළි
යක් සේ මිහිරි කළ හ. පස්වනක් පියුම් පිපුනා වූ පර්වත
319 ශිඛහි හා සඳත් දහතළා හා වාද කැරැවූ හ. මල්හි රස
නො දන්නා වූ දිඹුලෙහි පිපි මල් පරසතුමඳාරා මල් හා එක්
කොටැ දෙවියන් මුදුනෙහි පැලැඳැවූ හ. වැසි නැති වැ මැ
පොළොව බිඳැ ගෙනැ වැගිරැ නැඟෙන නාඹ තල් කඳ
සා ජලධාරයෙන් සියලු ලොවට ශාන්තිජලය දුන් හ.
බඹලොව හා දෙව්ලොව හා මිනිස්ලොව හා යන තුන්
තන්හි මැ සම්පත්තියෙන් වෙනසක් නො කළ හ. තමන්
ගබ්ගත්මඟුලෙහි මැ සියලු සත්ත්වයන් නිවන් සුවයට ගබ්
ගැන්වූ හ. දසදහසක් සක්වළැ සඳම්බුලු හා හිරැම්බුලු
තමන් ගේ මඟුලට නැඟු සේසත් සේ **කිඹුල්වත්** පුර
යෙහි තමන් ගෙදොර ආකාශයෙහි රැඳැවූ හ. තමන්
551 මතු වස් වන්නා වූ ධර්මාමෘතවර්ෂාවට පූර්ණිමිත්ත පානා
සේ, මුළු සක්වළැ පොකුරු වැසි වැස්වූ හ. ගුණෙන් සිස්
වූ සසර තමන් ගේ කරුණායෙන් පිහිට ලබන්නා සේ,
310 නිරාලම්බ වූ ආකාශයෙහි මල්වියන් බැඳැවූ හ. **කාසුබුසම්මා**
සම්බුදුන් වහන්සේ පිරිනිවි තැන් පටන් ගෙනැ නො පිඹැ
තුබූ **විජයෝත්තර** ශඞ්ඛය, **ශක්‍රයා** ලවා තමන් ගේ
225 ගෙදොර පිඹැවූ හ. හේළ කුඩ ගත් මහබඹු තමන් ගේ
රාජාඞ්ගණයෙහි ඔකඳ කෙළි කෙළැවූ හ. දෙවියකු වැදැ
208 ගෙනැ හොත, ඔහට තුන් කෙළ සැට ලක්ෂයක් හවුරුද්
දට ආයු දී ලති. මිනිසකු වැදැ ගෙනැ හොත, එක්සිය
විසිහවුරුද්දට ආයු දී ලති. මුහුණ බලා සතුටු වැ හුන්

බකමූහුණන් ගේ ප්‍රසාදයට පසේබුදුන් අන ගෙනෙති.
තමන් ගේ සව්වන් ලවා අවීචි මහානරකයෙහි ගිනි නිවා
වැසි වස්වා වතුර ගෙලවති. දීපංකර පාදමූලයෙහි අත් 239
පත් නිවන් හැර, අපට ශාන්ති පිණිස සංසාර රාක්ෂසයා කටැ
හුන හ. දූත් බෝ මැඩැ වැඩැ හිඳැ සවාසන සම්කෙලශයන්
නසා බුදු වැ නිරුපධිශෙෂනිර්වාණධාතුයෙන් පිරිනිවන් නො
පැ, දෙතිස්කුණප කොටසින් යුක්ත වූ පඤ්චස්කන්ධභාරය
දෙතිස්මහා පුරුෂලක්ෂණයෙන් සාදා පිළිකුල් පැවි කොටැ
ගෙනැ, එබර උසුලා, ගම්නියම්නම්රාජධානියෙහි ඇවිදැ
සත්ත්වයනට වැඩ කරන්නා හ. තමන් වසන විහාරය දිශා
වට නැගූ පය නැවැතැ සතර අපාය දිශාවට නැගී යා 308
නො දෙන්නා හ. තමන් දිශාවට නැගූ අත නැවැතැ 308
අනුන් දිශාවට නැගිසැ නො දෙන්නා හ. තමන් ගේ විහා
රයෙහි තණ ගැටක් නෙළා පියන්නට දික් කළ අත නැවැ
තැ අනුන් දිශාවට සිහන පිණිස දික් කට නො දෙන්
නා හ. තමන් ගේ ශ්‍රීපාදයට නැමූ හිස නැවැතැ අනිකක්හු 306
ගේ පාදමූලයට නැමිසැ නො දෙන්නා හ. තමන් දිශාවට
නැමූ සිත නිවන් රස පුරා දෙන්නා හ. තමන් බලා සතුටු
කඳුළු ගත් ඇසට දුකින් වන කඳුළක් වැද්දැ නො දෙන්
නා හ. තමන් ගේ ගුණයට සාධුකාර ගත්තවුන් ගේ තුඩට 306
කිසි ශොක විලාපයක් වැද්දැ නො දෙන්නා හ. තමන් ගේ
බස් ඇසූ කනට ‘අනුව, බඳුව, ගනුව, මරව’යනාදී බස් වැද්දැ
නො දෙන්නට තුමූ මැ එහි රකවල් ගන්නා හ. තමන් ගේ
ගුණ සිහි කිරීමෙන් ලොමුදහ ගත් ශරීරය සසර පමණින්
හයින් ලොමුදහ ගත නො දෙන්නා හ. මර හට වඩා බල
වත් හ. සසරට වඩා මහත් හ. පසේ බුදුනුදු නො වියත්
කළ වියත් හ. මේ ආදිවූ අනන්ත ගුණයෙන් සම්පූර්ණ වූ
ශාක්‍යසිංහ වූ දශබලධර වූ අනාවරණඥාන ඇති චතුර්වෛ
ශාරද්‍යවිශාරද වූ, අවීචියෙහි පටන් ගෙනැ භවාග්‍රය දක්වා,
භවාග්‍රයෙහි පටන් ගෙනැ අවීචිය දක්වා, සියලු ලෝවැස්
සන් ගත්තා වූ, “**ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො
විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො
පුරිසධම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.
සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්ස
මණබ්‍රාහ්මණිං පජං සදෙව මනුස්සං සයං අභිඤ්ඤා සච්ඡි
කත්වා පවෙදෙති. සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං
මජ්ඣෙකල්‍යාණං පරියොසාන කල්‍යාණං සාත්ථං සව්‍ය**

**සඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙ
ති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොති”**
424 යන කීර්ති ඝොෂයෙන් දශ දිග්භාගය එකකොලාහල කැරූ
වූ හ. කරුණායෙන් ලොකොත්තර වූ ප්‍රඥායෙන් අසාධාරණ වූ
මෛත්‍රියට කුලදෙවතා වූ ස්වාමිදරුවාණ කෙනෙක් ලොක
යෙහි ඉපිද වදාළ සේක. ඒ ස්වාමිදරුවාණන් ගේ ශ්‍රීපාදය
මෙනුවරට දික් කළ හොත් ඒ ශ්‍රීපාදය පිළිගන්නට නැහෙන්
නා වූ ආශ්‍රවක්ෂයප්‍රදමයෙහි සුනඛයෙන් මැ මේ කුණපගන්ධ
451 නාක් පැටි වැ යන්නේ යැ. ඒ ස්වාමිදරුවාණන් ගේ හිසට
කුඩ ගෙනැ ආ මහා බ්‍රහ්මයෝ යැ, සක් පිඹැ ගෙනැ
228 ආ ශක්‍රයෝ යැ යන මහෙශාඛ්‍ය දෙවතාවන් ගේ සන්නි
පාතයෙන් මේ මනුෂ්‍ය මාංස භක්ෂණය කරන්නා වූ හීන වූ
භූතපිශාචයෝ තුමූ මැ තමහට ප්‍රලය වන්නා හ. උන්
පිරිවරා ආ වැසි වලා දෙවියෝ මැ ශතපටලසහස්‍රපටලයෙන්
මහා වැසි වස්වා, මේ මුළු නුවර සෝධා ශුද්ධ කරන්නාහු
යැ. එසේ හෙයින් ඒ ධර්මචක්‍රවර්ති ස්වාමීන් වහන්සේ මැ
අප ගේ දුක් නිවන පිණිස මෙයට වඩා එන්නා කැමැත්තම්
හ ” සි දැන්වූ හ.

එසේ කියන්නවුන් ගේ බස් හැම දෙන මැ ‘යහපතැ’ සි ගිවිසැ, “දැන් ඒ ස්වාමිදරුවාණන් වහන්සේ කොයි වැඩැ වසන සේක් දැ?” සි විචාළ හ.

එසමයෙහි සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ වස් එළැඹෙන
කාලය ආසන්න වූ හෙයින්, තමන් වහන්සේ ගේ ප්‍රථම දර්ශන
යෙහි මැ ධර්මදෙශනා අසා එක්ලක්ෂ දසදහසක් බ්‍රාහමණ
ගෘහපතීන් හා සමඟ අමාමහනිවන් දුටු **බිම්බිසාර** රජ්ජුරු
වනට ප්‍රතිඥා දී, **රජගහා** නුවර නිසා **වෙළුවන** මහාවිහාර
යෙහි වැඩැ වසන සේකැ. එ පවත් ඇසූ **විශාලා**මහනුවර
වසන්නා වූ **ලිච්ඡවි** රජදරුවෝ, **බිම්සර** රජ්ජුරුවන් හා සමඟ
බණ අසා සෝවාන් වූ **මහාලි** නම් ලිච්ඡවි කෙනකුන් හා පුරෝ
හිතයන් ගේ පුතණුවන් හා කැඳවා, “තෙපි බොහෝ පඬුරු
436 සරහා ගෙනැ **රජගහා** නුවරට ගොස් පඬුරු පෑ දී ලා, අප
ගේ රාජ්‍යයට වූ තුන් උපද්‍රවයන් කියා ලා, සර්වඥයන් වහන්
සේ වැඩියැ හොත් මුත් ඒ නොසන්සිඳෙන බව කියා, රජ්ජු
439 රුවන් ගිවිස්වා ගෙනැ, සර්වඥයන් වහන්සේ වඩා එව” සි
යැවූ හ. ඔහු ඒ පඬුරු ගෙනැ ක්‍රමයෙන් ගොස් **රජගහා** නුව
438 රට වැදැ, රජ්ජුරුවන් දැකැ, ගෙනැ ගිය පඬුරු දී, එපවත්

දන්වා, “සර්වඥයන් වහන්සේ අප ගේ නුවරට වඩනා පිණිස ආරාධනා කළ මැනවැ” යි දැන්වූ හ.

පෙරැ මේ සර්වඥයන් වහන්සේ බොධිසත්ත්ව භූමියෙහි සිටි කලැ පවා ජම්බුද්වීපයෙහි එක් සියක් රජදරුවෝ ඔවුන් ගේ ධර්ම දෙශනායෙහි පෙළැඹි, පූර්ණක නම් යක්ෂ සෙනාධිපතිහු ඔවුන් හැරැ ගෙනැ ගිය කල්හි, ඔවුන් ගේ විරහය ක්ෂමා කොටැ ගත නො හී, ‘සත් දවසක් ඇතුළතැ අප ගේ පණ්ඩිතයන් නුදුටුමෝ නම්, ගිනි වැද මියම් හ’’ යි සැරැසුණ හ. බොධිසත්ත්ව භූමියෙහි විධුර පණ්ඩිත වැ සිටියා වූ ස්වාමිදරුවාණන් ගේ ධර්මයෙහි රස දත් පෘථග්ජන රජදරුවන් පවා, ඔවුන් ගේ විරහය ක්ෂමා කොටැ ගත නො හී, “ගිනි වදුම් හ” යි කියන කලැ, දුන් සවාසනා සකලක්ලෙශයන් නසා බුදු වූ ස්වාමි දරුවාණන් ගේ ධර්මදෙශනා අසා අමා මහ නිවන්හි රස දත්තා වූ මේ රජ්ජුරුවෝ තමන් ගේ නුවරින් සර්වඥයන් වහන්සේ වඩා යන්නට අනුදනිති යනු කවර නම් බසෙක් ද? එසේ හෙයින් ‘තොපට නුගුණෙකැ’ යි කියා තුමූ එ බස් නො අනුදත් හ.

ඉක්බිති එබස් ඇසූ **මහාලිලිච්ඡවි** රජ්ජුරුවෝ **බිම්සර** රජ්ජුරුවන් උපෙක්ෂක වූ බව දැනැ, “මේ රජ්ජුරුවන් නො අනුදත් හෙයින් කිම් ද ? පරදුඃඛයෙහි කම්පා ඇත්තෝ සර්වඥයන් වහන්සේ මුත් නැත්තෝ වෙත් දැ’’ යි
සිතා, වැඩැ හුන්නා වූ **වෙළුවන** විහාරයට ගොස් ශ්‍රීපා 440
දය වැඳැ සිටි කල්හි, සර්වඥයන් වහන්සේ ආගන්තුක යනට සුදුසු මධුර කථා කොටැ වදාරා, “ආ කාම් කිම් දැ”යි විචාරා වදාළ කල්හි, “ස්වාමිනි, **විශාලා** මහ නුවරැ දුර්භික්ෂ භය යැ, යක්ෂ භය යැ, රොග භය යැ යි තුන් භයෙක් ඇති වී යැ. ඒ භයින් පීඩිත වූ **විශාලා** මහ නුවරැ **ලිච්ඡවි** රජදරුවන් ප්‍රධාන කොටැ ඇත්තා වූ සියලු පර්ෂද, “මේ උපද්‍රව කෙසේ සන්හිඳුවමෝ දැ”යි මන්ත්‍රණය කොටැ නො එක් පරිද්දෙන් ප්‍රතිකාර කොටැ, නොසන්සිඳෙන හෙයින් මෙ කී තුන් භයට ස්වාමීන් ඇතුළු වූ තුනුරුවන් සරණ කොටැ දුම හ: එ හෙයින් පරාර්ථ පිණිස සන්නද්ධ වූ ස්වාමි දරුවාණන් කරුණායෙන් වැඩැ වදාරත් කලැ”යි දැන්වූ හ.

ඉක්බිති සර්වඥයන් වහන්සේ. ඔවුන් ගේ බස් අසා "මා ඔබ ගිය කල්හි කෙසේ වූ අර්ථ සිද්ධියෙක් වේ දෙහෝ"යි පරීක්ෂා කොටැ වදාරන සේක්, "මා **විශාලාමහනුවරට** ගොස් **රතන** සූත්‍රය දෙසූ කල්හි, ඒ **රතන** සූත්‍රයෙහි එකි එකී ගාථායෙන් වන්නා වූ ආරක්ෂාව කෙළ ලක්ෂයක් සක්වළැ පැතිර සිටුනේ යැ. ඒ සූත්‍රය දෙශනා කොටැ අනාගතයෙහි සුවාසූදහසක් ප්‍රාණීනට අමෘත මහා නිර්වාණය සිද්ධ වන් නේ යැ. ඒ තුන් භය සන්සිඳෙන්නේ යැ"යි දැකැ වදාරා,
441 ඔවුන් ආරාධනා කළ ගමන අනුදැනැ වදාළසේක. එක
සත්ත්වයකුටත් වූන ඉෂ්ට තකා දික් කළ අතක් වක් නො
කරන තුරු ගොස් බඹ ලොවැ පැනී යන්නා වූ මහාපුරුෂයා
ණන් වහන්සේ, දැන් මෙ නෙක් සත්ත්වයනට වන ඉෂ්ට තකා
එයට වැඩම අනුදනිති යනු කවර ආශ්චර්ය්‍යයෙක්ද? ඉක්බිති
**බිම්සර** රජ්ජුරුවෝ සර්වඥයන්වහන්සේ ආරාධනාව ඉවසා
වදාළ බව අසා, සර්වඥයන් වහන්සෙ කරා ගොස්, "ස්වාමීනි,
442 **විශාලාවට** වැඩම අනුදැනැ වදාළේ ඇද් දෑ"යි විචාරා, "එසේ
යැ මහරජ, "යි වදාළ කල්හි, "ස්වාමීනි, එසේ වුව හොත්,
443 මා වඩනා මග සරහා ලන තුරු හැම්මී වදාළ යහපතැ" යි
දන්වා, **රජගහා** නුවර හා ගංගාව හා දෙ මැද පස් යොදනක්
444 පමණ මග එක පැහැර සම කරවා, යොදනෙහි යොද
445 නෙහි විහාර කරවා, "ස්වාමීනි, ඉනිඹ වඩනා කලැ" යි
449 දැන්වූ හ.

ඉක්බිති සර්වඥයන් වහන්සේ ස්වාර්ථයෙහි කළ නිරපෙක්ෂතායෙන් පරාර්ථයෙහි කළ අභිලාෂයෙන්, පරදුඃඛයෙහි කළ අනුකම්පායෙන්, පුරුදු වැ ආ ධාර්මිකත්වයෙන්, 'මෙ තැන්හි සතර පස සුව සේ ලැබෙති'යි සිතා, එක් තැනෙක්හි නොකළ ආශායෙන්, හුදු සත්ත්වයනට මැ වැඩ පිණිස මැ පවත්නා වූ කායවාඞ්මනඃප්‍රයොගයෙන්, '**විශාලා** මහ නුවර දුඃඛිත වූ සත්ත්වයන් ගේ සතුටු මුහුණක් බලා පුව' යන මන දෙළින් පන්සියයක් භික්ෂූන්වහන්සේ පිරිවරා මඟට පිළිපන් සේකැ.

ඉක්බිති රජ්ජුරුවෝ, ඒ ඒ විහාර අතුරෙහි සර්වඥයන්
වහන්සේ වඩනා පස් යොදනක් පමණ මඟෙහි පය ඔබා ලූ
447 කලැ දණ දක්වා එරී යන පමණින් පස් වනක් පියුමින්
හෙබියා වූ නොඑක් ජාතියෙහි සුවඳ මල් ඉස්වා, ධවජ,
පතාක, කෙහෙල්, තොරණ යැ, පූර්ණකලස යැ යනාදීන්

මහ සඳ බුදුන් වහන්සේට සේ සත් මත්තෙහි සේ සත් බැගින් 484
දෙ සේ සතක් ධරා, එකි එකී භික්ෂූන් වහන්සේට එකි එකී 485
ශ්වේතච්ඡත්‍ර බැගින් ලවා, ගඳ දුම් මල් පහන් ආදීන් පූජා 486
කරන්නාහු, දවසින් දවස් එකි එකී විහාරයෙහි වස්වා,
පන්සියක් පරිවාරයෙන් යුක්ත වූ ස්වාමීනට දවස් පතා මහ
දන් දී පස් දවසෙකින් ගංතෙරට වඩා නොස්, එතැන්හි සිටැ 508
වඩනට සුදුසු වූ හොරුහඟුළු ඉදි කරන්නාහු, පූජාසත්කාර
ගෙනැ අවුත් තමන් ගේ නුවරට ස්වාමිදරුවාණන් වහන්
සේ වඩා ගොස් අභිමතාර්ථය සැධුව මැනැවැ සි හසුන් දුන් හ. 508

ඒ අසා විශාලාමහනුවරැ ඇත්තෝ අපගේ "උපද්‍රව
දුරැකරන්නට වඩනා ස්වාමිදරුවන්ට කරන පූජා අපට මැ
අවශ්‍ය බව මුත්, තමනට කවර අවශ්‍යයෙක්ද? අප වුන් දුක් වූ 526
නියාවට ද, එයට සුදුසු වූ වහලක් කවරදෑ ලබමෝ දෝ
හෝ සි අප ගත් සිතිවිලි වූ නියාවට ද, 'සර්වඥයන් වහන්සේ 524
වැඩි සේක' යන බස අසා අපට වූ සතුටු නියාවට ද සුදුසු
කොටැ අප ශක්ති පමණින් පූජා කෙරෙම්හ" යි විශාලා මහ
නුවර හා ගංඟාව හා දෙදෑමැ තුන් යොදනක් පමණ බිම එක
පැහැරැ සම කොටැ, සර්වඥයන් වහන්සේට කුඩ මත්තෙහි
කුඩ සතරක් හා, සෙසු පරිවාර භික්ෂූන් වහන්සේ කෙරෙන්
එකි එකී වහන්සේ කෙනකුන් දෑට කුඩ මත්තෙහි කුඩ දෙක
බැගින් මෙසේ පූජා සරහා ගෙනැ, දවසක් මුළුල්ලෙහි
සයින් සිටි වස්සා දුරැ එන මවු දෙන අභිමුඛයට යුහු වැ
දිවෙන්නා සේ ද, මී වදයෙක්හි ඉව ඇසූ බමරුන් එතනට 535
වෙගයෙන් ඔවුනොවුන් පරයා දිවැ ගන්නා සේ ද, සමියෙන්
සන්තප්ත වූ හස්තීන් ප්‍රසන්න වූ මධුර වූ අති ශීතල වූ 535
ජල ඇති වන විලට මධ්‍යාහ්නසමයෙහි දිවැ ගන්නා සේ ද,
පිපාසිත වූ වැසි ලිහිණියන් මෙඝනාදය අසා මෙඝකූටයට
උන්මුඛ වැ දිවැ ගන්නා සේ ද, මස් ගැසූ තෙනට එක හෙළා
දිවැ ගත් මහා මය කැලක් සේ ද, පද්මයෙහි සුගන්ධය අසා 536
පියුම් විලට දිවැ ගත්තා වූ රාජහංස කැලක් සේ ද, සත්
රුවන් පිරුණු බිලයෙහි දොර හැරී ගිය ශබ්දය අසා එදි 537
ගට උන්මුඛ වැ දිවැ ගත්තා වූ දරිද්‍ර වූ ධනාර්ථීන් සේ ද,
චුම්බක පාෂාණමුඛයට හැසී යන්නා වූ ලොහ ධාතු සේ ද,
වෙහෙල්ලට දිවැ ගත්තා වූ ජලප්‍රවාහයක් සේ ද, කිරිබර
තනයෙන් යුක්ත වැ එන්නා වූ මවුන් අභිමුඛයට දිවෙන්නා වූ
කුමාරයන් සේ ද, නිධාන තුබූ තැනට බස්නා අරළුවක්
සේ ද, මධුර වූ දිව්‍යරූපාදි ආලම්බනයට දිවෙන්නා වූ
චක්ෂුරාදි ඉන්ද්‍රියයන් සේ ද, සගෞරව වැ සස්නෙහ වැ

සාභිලාෂී වැ දිවෙමින්, බුදුන් වැඩී බව කියන්නට නික්
මුණාක් මෙන් ගඟ පැනැ ගෙනැ මෙතෙරෙහි පැනී ගියා
වූ සවනක් ඝන බුදු රස් දක්මින් මැ, දුටු දුටු තන්හි මැ
වැදැ පෙරළෙමින්, සොම්නස්හි ගැලෙමින්, ‘අප ගේ මනො
538 රථය පිරිණැ ‘යි යන ගජීයෙන් තුන් යොදනක් පමණ තැන්
තුන් පියවරෙකින් නික්මෙන්නා සේ ශුහු වැ අවුත්
තමන් ගේ සීමායෙහි ගඞ්ගාතීරයෙහි රැස් වැ එතෙර
539 වැඩැ හුන් සවාමිදරුවාණන් දිශාවට වැදැ ගෙනැ
හොත් හ.

511 ඉක්බිති බිම්සර රජ්ජුරුවෝ හොරු දෙකක් එක්
කොටැ බැදැ එහි මණ්ඩපයක් කරවා විචිත්‍ර වූ කුසුම
514 යෙන් ඒ මඬුව සදා සත්රුවන්මය වූ බුද්ධාසනයක් පැනැ
වූ හ. ඉක්බිති සර්‍වඥයන් වහන්සේ තමා ගේ රශ්මීන් රැඳී
ගිය යුගන්ධර පර්‍වත මස්තකයට පැනැ නැඟි තරුණසූර්‍ය
මණ්ඩලය සේ දිලියෙමින් පැනැවූ ආසනයෙහි වැඩැ හුන්
සේක. භික්ෂූන් වහන්සේ ද නැවට නැඟී සර්‍වඥයන්
වහන්සේ පිරිවරා වැඩැ හුන් සේක. ඉක්බිති බිම්බිසාර රජ්
520 ජුරුවෝ ද කරවටක් පමණ දියට බැසැ දෙහොත් මුදු
නෙහි තබා ගෙනැ’ “සවාමිනි! යම් තාක් වැඩැ වදා
521 රණ සේක් ද, ඒ තාක් මෙහි මැ වෙසෙමි”යි දන්වා නැව
යවා තුමූ නැවැත්තා හ. ඉක්බිති සර්‍වඥයන් වහන්සේ ද
යොදනක් පමණ තැන් ගඞ්ගායෙන් වැඩැ විශාලාමහ
නුවර වාසීන් ගේ හිමට පැමිණිසේකැ. ඉක්බිති විශාලා
525 මහනුවර ලිච්ඡවිරජදරුවෝ ද, “අප ගේ දුක් නැති කර
526 න පිණිස කරුණායෙන් වැඩියා වූ සවාමිදරුවනට පෙර
527 ගමන් කරම් හ යි”යි කරවටක් පමණ දියට ගොස් නැව
543 ගොඩට ඇදැ සර්‍වඥයන් වහන්සේ ගොඩට බහා ගත් හ.

සවාමිදරුවන් නැවින් බැසැ ශ්‍රීපාදය ගොඩ සපශී
කළ විට මැ, “තමන් වහන්සේ ගේ සිතින් රාග නමැති
කුණපයක් වත් ද්වේෂ නමැති කුණපයක් වත් මොහ
නමැති කුණපයක් වත් නොගෙනැ වැඩියා වූ සවාමිදරු
වන් ගේ එබඳු වූ අටතුරුසියක් මඞ්ගල ලක්ෂණයෙන් යුක්ත
වූ, කුමාරකාලයෙහි පවා ‘වඳවන්නට යැ’යි ගෙනැ
544 ගිය කාලදේවලයන් ගේ මුදුනෙහි සැතැපී ගියා වූ, ඒ
ආශ්චර්‍ය දුටුවා වූ ශුද්ධෝදන රජ්ජුරුවන් ගේ මුදුනට
මුදුන්මල් වූ, සවාමිදරුවන් ගේ ගුණයෙහි ප්‍රසන්න වූ

**ඝොසාලයන්** තමන් ගේ මුහුණ තබා සනහා නො විඩා වූ, 545
කිපි දිවැ ගෙනැ ආවා වූ **අඞ්ගුලිමාලයන්** අහනසෙනි
සවාමිදරුවන් ගේ ධර්මය අසා වැදැ ගෙනැ හොත් කල්හි
ඔහු ගේ සිතැ පහළ වන්නා වූ ලොකොත්තර ධර්ම නමැති
චන්ද්‍රොදයයට උදයසන්ධ්‍යාරාගයක් බඳු වූ රත්පැහැයෙන්
උජ්ජවලිත වූ, මරන්නට මෙහෙයූ තන්හි වැදැ ගෙනැ
හොත්තා වූ **ධනපාලයා**ගේ මුදුන්හි සිඳුර ගල්වා ඉතිරි 545
කළ සිඳුරම්ලා දෙකක් බඳු වූ, **රාත්‍රියක්** මුළුල්ලෙහි උප .
ක්‍රම කොටැ කිසි උපද්‍රවයක් කොටැ ගත නො හී අනන්ත
යෙහි වැදැ ගෙනැ හොත්තා වූ **ආලවක** නමැති **රාජ**
හංසයා විසින් සුඹුනා ලද රක්තපද්මයක් බඳු වූ, **නිඝිර**
**ගුරුදූ**හි ගිනි වළ පළා ගෙනැ නැඟි පියුමින් පිළිගන්නා
ලද්දා වූ, **මෙරට** දික් කළ හොත් එක්ලක්ෂ අටසැටදහසක් 548
යොදුන් පමණ මහමෙර තම හට නැමී අවුත් පිළිගන්නා වූ,
සියක් තල පමණ ප්‍රපාතයකට දික් කළ හොත් ඒ කඹුරු
**සමක්** සේ පිරී බෙර ඇසක් සේ සම වැ පිළිගන්නා වූ,
අනවරතයෙන් වඳනා වූ **ශක්‍රයා** ගේ පරසතුමඳාරමල් දම්හි
රෙහෙණුයෙන් නිරන්තරයෙහි රැඳී තිබෙන්නා වූ, **බ්‍රහ්ම**
**යාගේ** මුදුනෙහි පිහිටා එයට 'උත්තමාඞ්ගය' යන නම 550
සාර්ථක කළා වූ, සාරසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි 'අසත්
පුරුෂයන් කරා යෙම්'සි දික් නො කළා වූ, සත්පුරුෂයන්
කරා එළැඹැ නො විඩා වූ, මුළු ලොවට මුදුන් මල් වූ, ඒ
ශ්‍රීපාදය පහරන බිමැ කුණපයක් තිබෙන බව සුදුසු
නො වන්නේ වේ දෑ?" සි කියා ගජිනා කරන්නාක්හු මෙන්
ගම්භීර වූ නාද පවත්වන්නා වූ, සර්වඥයන් වහන්සේ වඩුත්
මැ **විශාලා** මහනුරු තුන්උපද්‍රව විදිනට දෙවතාවන් 555
ගත් දුනු බඳු වූ ඉන්ද්‍රචාපයෙන් ගැවැසී ගත්තා වූ, **විශාලා**
වාසීන් ගේ සිත්හි ශොකය කඩ කඩ කොටැ කපා හරනට
**වැසිවලා**දෙවින් ගත්තා වූ කඩු බඳු වූ අනන්ත වූ විජ්ජුලල
තායෙන් හොබනා වූ, ගොබෙහි ශ්‍රීපාදය තුබූ විටැ මැ
සර්වඥයනට වැසිවලා දෙවින් දැමූ කුසුමාඤ්ජලියක් සේ
ආකාශමණ්ඩලයෙහි විසිරැ ගිය කොක් පෙළින් යුක්ත වූ 556
මහාමෙඝයෙක් නඟා, තෙමෙනු කැමැත්තන් තෙමා,
නො තෙමෙනු කැමැත්තන් නොතෙමා වැසැ, දණක්
පමණ උඩු කළවයක් පමණ හිණ මසක් පමණ වතුරැ
හෙළා සියලු **රාජධානියෙහි** කුණප තාක් ඉසාදා ගඞ්ගා 559
ඉයෙහි ලා පී යැ.

559 ඉක්බිති සියලු විශාලාපුරයෙහි භූමිභාගය පරිශුද්ධ වී යැ.
ඉක්බිති ලිච්ඡවි රජදරුවෝ මෙ මැ සලකුණින් තමන් ගේ
මනොරථය සිඬවන බව දැනැ නියත කොටැ උපන්සොම්
නසින් ස්වාමීන් වඩා යන්නාහු, යොදනෙහි යොදනෙකි
562 මහ පූජාසෙන් වාසය කරවමින් මහ දන්දී තුන් ද වසෙකින්
තමන් ගේ නුවරට වඩා ගිය හ. එසමයෙහි "සියලු භය
සන්සිඳුවන්නා වූ **රත්නසූත්‍රය** ලොවට පහළ කරන්නට
යැ යි වඩනා වූ ස්වාමිදරුවන් ගේ බුද්ධ විලාශය බලමී"යි
සැරැහී දෙ දෙව් ලොවැ දෙවතාවන් හා සමඟ **ශක්‍රදෙ
වෙන්‍ද්‍ර** ද අවුත් වඩනා පෙර මැ රැස් වී යැ. ඉක්බිති මහෙ
ශාක්‍යදෙවතාවන් රැස් වත් රැස් වත් චන්‍ද්‍රොදයයට
563 බිඳෙන්නා වූ අන්ධකාරය සේ යක්‍ෂයෝ බිඳී පලන්නට
පටන් ගත් හ.

565 ඉක්බිති ස්වාමිදරුවෝ සවස් වේලෙහි නුවර දොරට
පැමිණැ මුළු ලොව සතහමින් වැඩැ සිටැ, **හංසජාති
යෙහි** මලැ බැඳී සිටියවුනට තමන් නො බැඳී සිටැ දිවි
දී තමන් වහන්සේට වූ උපද්‍රව දුරැ කළා වූ **රන්වන්කකුළු**
වැ ඉපිද තමන් වහන්සේට උපද්‍රව කළා වූ කපුටුවා හා
සපියා හා නළින් ගෙනැ, ගිය ජීවිතය පෙරළා දෙවා මිත්‍ර
ධර්මය රක්‍ෂා කළා වූ, **ජුණ්හජාතකයෙහි** බොහෝ විශ්වා
සයක් තබා පියා උරයෙන් උරය සැවුණුමාත්‍රයට තමන්
වහන්සේ අතින් ගම්වර පසෙකැ මිඹියෝ සියයෙකැ ගෙරි
සත් සියයෙකැ යනාදීන් නොයෙක් උපකාර ලද්දා වූ, තමන්
වහන්සේ **අස්** වැ ඉපැද සත් රජ්ජුරැ කෙනකුන් සාධා
අභ්‍යයෙහි ප්‍රාණ පරිත්‍යාග කොටැ රාජ්‍යදානයෙන් උප
කාර කළා වූ, මෙසේ ජාති ජාතියෙහි පුරුදු වූ ගුණ ඇති
දූන් මේ අනන්‍යජාතියේ තමන් වහන්සේට උපස්ථාන කරන්
නවුන් කෙරෙහි අග්‍ර වූ, බහුශ්‍රැතයන් කෙරෙහි අග්‍ර වූ,
තමන් වහන්සේ වදාළ සූවාසූදහසක් ධර්මස්කන්ධ නමැති
භාණ්ඩාගාරය නො නසා රක්‍ෂා කොටැ සිටියා වූ ධර්මභාණ්ඩ
ගාරික වූ, තමන් වහන්සේ මරන්නට හළ **ධනපාලක** අභි
මුඛයෙහි ප්‍රාණය පරිත්‍යාග කොටැ සිටැ පොළොව
පෙරළා පස්සෙහි තබා පියන තුරැ පසු නොබටුවා
566 වූ, සෙනහයෙන් හා පක්‍ෂපාත කමින් යුක්ත වූ **ආනන්ද**මහ
තෙරුන්වහන්සේ කැඳවා, මහානුභාව ඇති මහ රජක්හු
තමා පස්සෙහි සිටි මූධ්‍යයොධයක්හු අතට තමා ගේ

ආයුධය දී ඔහු ලවා ශත්‍රුසේනාව බිඳුවන්නා සේ, තමින්
වහන්සේ නුවරින් පිටතැ වැඩැ සිටැ තමින් වහන්සේ
වදාළා වූ සද්ධර්ම නැමැති ආයුධය ඔබට දී, ඔබ ලවා මැ
මේ තුන් උපද්‍රවය දුරු කරවා ස්ථානොචිත වූ කටයුතු
දන්නා ස්වාමිදරුවෝ "තමින්වහන්සේත් නො වැඩැ, අග්‍ර
ශ්‍රාවකයන් දෙ දෙනා වහන්සේ ඇතුළු වූ සෙසු ක්ෂීණාශ්‍රව
යන් වහන්සේ වරුන්දූ කෙරෙන් ද එක් කෙනකුහුදු
නො යවා, සියලු නිත්‍ය පරිවාර පන්සියයක් දෙනා වහන්
සේ අතුරින් ලද ගුණයෙන් හැම දෙනා වහන්සේට
අඩු වූ, ගඳකිළිය හැමැඳැ ලා ගිඳිනා වහන්සේ කෙනකුන්
ලවා ඒ උපද්‍රවයන් සන්සිඳුවා වදාළ සේක" යන කීතිය
කල්පාන්තස්ථායි කරන පිණිස, "ආනන්දය තෝ මේ
**රත්නසූත්‍රය** ඉගෙනැ ගෙනැ **ලිච්ඡවි** රාජ කුමාරයන් 568
හා සමඟ මේ **විශාලා** මහනුවරැ තුන් පවුරු වළල්ල ඇතු
ළෙහි ඇවිදැ පිරිත් බණ"යි වදාළ සේක. 569

ඒ අසා සකල ලොකයට ආනන්දකර වූ **ආනන්දමහා**
**ස්ථවිරයන්** වහන්සේ සර්වඥයන් වහන්සේ විසින් වදාළ ඒ
**රත්නසූත්‍රය** ඉගෙනැ, එ මැ ස්වාමීන් ගේ ශෛලමය වූ
**සතරවරම් මහරජදරුවන්** දුන් පාත්‍රයෙන් පැන් හැරැ
ගෙනැ නුවර දොර කඩැ සිටි සේක්, එ මැ සර්වඥයන් වහන්සේ
**සුමෙධතාපස** කාලයෙහි කළා වූ ප්‍රණිධානයෙහි පටන් රැස්
කළා වූ නොයෙක් ගුණ සමූහාරය සිහි කොටැ, 'මා ගේ ස්වාමි
දරුවෝ 'සමතිස් පැරුම් නමැති මහා සාගරය පිහිනා
ගොඩ දක්මී' යන මහාපරාක්‍රමයෙන් **දීපඞ්කරපාද** මූලයෙහි දී
පිහිටුවෝ සාරසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි නො හැරැ පිනා
අනන්තයෙහි බෝමැඩැ **වජ්‍රාසන** නමැති සුපවුන් ගොඩට
පැනැ නැඟී සසර සයුරෙහි තෙර පත් වැ, අසාධාරණ වූ
පාරමිතායෙහි කුළු ගත් හ. අඞ්ගපරිත්‍යාග යැ, ජීවිත පරි
ත්‍යාග යැ යනාදි වූ පඤ්ච මහා පරිත්‍යාග කරන්නෝ ඒ
ගන්නවුන් හැරැ ගනුත් 'මාගේ යැ' යන ලොභය බලත්,
තමන් ගේ 'දීපුව මැනැව' යන ලොභය එයට ද වඩා බලව
තැ. එයට ද වඩා පඤ්ච මහාපරිත්‍යාග කළ හ. ලොකාර්ථචර්‍යා
ආදි වූ ත්‍රිවිධ අර්ථ චර්‍යායෙන් ශූන්‍ය වූ ජාතියක් බලු වැ ද
ඊවු වැ ද කවුඩු වැ ද නො ලත් හ. මුහුකළා වූ ඵලය අගැ
අත්තෙන් බිමැ හී බිමැ සිටියවුනට ප්‍රයෝජන සැදුවා සේ
පශ්චිම භවයෙහි **තුෂිත** භවනයෙන් ච්‍යුත වැ මනුෂ්‍ය
ලොකයෙහි ඉපැදැ සියලු සත්ත්වයනට ප්‍රයෝජනවත් වූ හ.
සඳ නැඟෙන කලැ සියලු ආකාශ මණ්ඩලය ආලොක

කොටැ ගෙනැ නැහෙන්නා සේ, තමන් මවු කුසින් බිහි වන කලැ සියලු දසදහසක් සක්වළ එක පැහැර ආලෝක කොටැ ගෙනැ උපන් හ. යශෝධරාවන් වහන්සේ ප්‍රධාන කොටැ ඇති සතලිස් දහසක් අන්තඃපුර ස්ත්‍රීන් විසින් හෙබියා වූ කිඹුල්වත්පුරයවැනි පුරයක් හැරැ පියා යන්නාහු, මිනිස් වෙස් ගත් යකින්නන් විසින් ගැවැසි ගත්තා වූ යක්ෂ පුරයක් හැරැ පියා යන්නා සේ නැගී ගිය හ. ස හවුරුද්දක් මුළුල්ලෙහි මහා වීර්‍ය කරන්නෝ කෙළ දහසක් ඇතුන් රඳවා ලන්නට සුදුසු වූ ඒ සා මහත් කාය බලය තමන් ගේ එක ශරීරය මතු රඳවා ගත නොහෙන පරිද්දෙන් සියලු කායශක්තිය ගෙවා වීර්‍ය කළ හ. බොධිමණ්ඩලයෙහි වජ්‍රපර්‍යඞ්කයෙහි වැඩැ හිඳැ මරහු ලුහුබඳවන්නෝ මරහු දුටු ඉතිරියන් දිවෙන්නා සේ තමන් දුටු මරහු ලුහුබැඳැවූ හ. ඉක්බිති සහස්‍ර රශ්මීන් යුක්ත වූ සූර්‍යයාගේ උදය ලත් යුගන්ධරපර්වතය සේ, අනන්ත පරිමාණ ගුණයෙන් විශිෂ්ට වූ සර්වඥතාඥානය ලදින් මොහාන්ධකාර විධ්වංසනය කළ හ. නවසත්තාවාසයෙහි දුක් දුරැ කරන්නා වූ නවලොකොත්තර ධර්මයන් සියලු ලොවට තමන් බෙදා දෙන පරිද්දෙන් පළමු කොටැ ලදහ'' සි මෙ සේ සර්වඥයන් වහන්සේ ගේ අනන්තා පරිමාණ ගුණයන් සිහි කොටැ, මෙසේ වූ ගුණ ඇති මහා පුරුෂයාණන් වහන්සේ ගේ ගුණ මහිමය එල්බැ ගෙනැ යැ මා මේ පිරිත් බණන්නේ ''සි නුවරට වැද තුන් පවුරු වළල්ල ඇතුළෙහි රාත්‍රිය මුළුල්ලෙහි පිරිත් බිණූ හ.

ඔවුන් පළමු වන ගාථායෙහි ''යං කිංචි'' යන පදය සෙල්වූ විටැ මැ යම්කිසි යක් කෙනෙක් නැති වූ හ. යම්කිසි දුඃඛයෙකුත් නැති වී යැ. තුන් වන ගාථායෙහි පටන් රිදී බුබුළු වැනි ඉසිනා පිරිත් පැනින් විසුරුණු ජලබිඳු රොගීන් ගේ ශරීරයෙහි හෙන්නට වනැ. සර්වඥයන් වහන්සේ වැනි ලොකස්වාමී කෙනකුන් ශාන්ති පිණිස වදළ සූත්‍රයක් වුව, ඉගෙනැ ගෙනැ පිරිවහන්නන් අනඳ මහතෙරුන් වහන්සේ වැනි වියත් කෙනකුන් වුව, පැන් ඉස්නා පන්සාලිස් හවුරුද්දක් ස්වාමීන් ගේ ශ්‍රී හස්තයෙන් පිරිමසා අහර වළඳන්නට නිසි වූ පාත්‍රයක් වුව, ස්වාමිදරුවාණන් ඒ පිරිත් බැණැ ඉසුත්
591 ඉසුත් මියන්නට හොත් රොගීහු අනුන් වෙහෙසන්නට මළ වෙස් ගෙනැ හොත්තවුන් කණ්ණකණ්ණයෙහි සිසී

නැඟී සිටිනා සේ, ක්‍ෂණයෙහි නැඟී සිටැ, තෙරුන් වහන්සේ පිරිවරා ගෙනැ වඳිමින්, "ස්වාමිනි, සියලු සත්ත්වයන් ගේ දුක් හරන ස්වාමිදරුවෝ තුඹ වැඩිදූ ද? ගැත්තවුන් විඳිනා දුක් ස්වාමිදරුවාණන් ඇසට පැනිණි ද?" යනාදි වූ මිහිරි බස් බෙණෙමින්, තමන් ගේ දුක් දුරු කළා වූ ඒ සර්වඥයන් වහන්සේ සිහි කොටැ "නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස" සි දෑහොත් මුදුනෙහි තබා ගෙනැ වඳිමින්, එ මැ විටැ මැ ඇති වූ කාය බලයෙන්, එ මැ විටැ මැ ඇති වූ ශරීරපුෂ්ටියෙන්, එ මැ විටැ මැ ඇති වූ මුඛශොභායෙන්, එ මැ ශරීරයෙන් නො මිසැ මැ දෙවතා වූවන් සේ, පිළී හිස සිසාරමින් අපොළමින් කොක්සන් ගසමින් මහතෙරුන් වහන්සේ සිසාරා ගත් හ.

"යං කිංචි චිත්තං" යන පදයෙහි පටන් ගෙනැ ඉසැ ලූ දියබිඳු ඇඟැ හෙත් හෙත්, පළමු පලනා යකුන් හා කැටි වැ නො පලා සාහසික කොටැ සිටි යක්‍ෂයෝ වෛතරිණී ගඞ්ගායෙහි ජල බිඳු ඉසී ගිය නරකයේ සත්ත්වයන් සේ වෙවුලමින් පස්පස් බලමින් පිට හඹමින් ඔවුනොවුන් ගත නො ගී එක හෙළා දිවැ ගත් හ. ඔවුනට වාසල් දොර නො සෑහිණ. එ විටැ කේලමක් සා පමණ තැනින් සැත්තෑ අසූ දෙනකුන් නැඟී යන පමණ සියුම් අත් බව් නො මැවූ හ සි නො සිතමි. එසේ වුව ද, තමන් පලන්නට මහ දොර නො සෑහෙත් පවුරු බිඳැ ගෙනැ පදනම් බිඳැ ගෙනැ හිස් ලූලු දිග පැලෑ හ. සියලු භය ද ඔවුන් හා කැටි වැ ගියේ යැ. එසේ දුක්පත් වූ **විශාලාමහනුවර** අසුරයන් ජය ගෙනැ වැදූ ගිය දෙවතාවන් විසින් ගැවැසි ගත්තා වූ **තව්තිසැ** භවනය සේ එක පැහැරැ සැදී ගියේ. එවැනි ලොක ශාන්තියෙක් නො වේ නම්, ඒ ස්වාමි දරුවාණෝ වැඩැහුන් තැනින් ශ්‍රීපාදය නඟන දූ ද? "යං කිංචි චිත්තං" යනාදි වූ එ නෙක් ගාථා බැඳැ **අනඳ** මහතෙරුන් වහන්සේට උගන්වන දූ ද? තමන් වහන්සේ වළඳන්නා වූ පාත්‍රය උන් වහන්සේ අතට දී වදාරන දූ ද? එසේ හෙයින්, "ලෝවැස්සන් සුවපත් කරම්හ" සි දුක් ගත්තවුන් මෙ නෙක් ශාන්ති නො කරත්, අනෙක් කවුරු කෙරෙද්ද?

මෙසේ උඩ අපොළනා දෙවියන් විසින් හා, බිමැ අපොළනා මිනිසුන් විසින් හා, කමැ කමැ සාධුකාරයෙන් හා,

ආකාශයෙහි දිව්‍යභෙරියෙන් හා, භූමියෙහි මනුෂ්‍යභෙරි
යෙන් හා, ආකාශයෙහි දිව්‍යගීතයෙන් හා, භූමියෙහි මනුෂ්‍ය
ගීතයෙන් හා ආකාශයෙහි දිව්‍යනෘත්‍යයෙන්හා, භූමියෙහි
මනුෂ්‍යනෘත්‍යයෙන් හා, සියලු අහස්පොළෝ දෙක නිරන්තර
වැ ගිය කල්හි, ජනපුරයකට වදනා මහරජක්හු සේ ස්වාමිදරු
වෝ ඉන්ද්‍රඛීලපැනැ ගෙනැ ඇතුළට වන් හ. ඉක්බිති ඖෂධ
තෙල්ඉසැලූ ක්ෂණයෙහි නිල් වූ මුහුදු දියකඳ මැඬැ ගෙනැ
දිවෙන්නා වූ මහගිනිකඳක් සේ නිල් වූ බුදු රැස් මත්තෙහි
දිවැ ගත්තා වූ රන්වන් පැහැ මිශ්‍ර වූ රත්පැහැ කඳෙක්
සියලු නුවර පුරා ගෙනැ සක්වළ මුවවිට දක්වා දිවෙන්නට
වනැ. පිරිත් පැනට දිවෙමින් සිටි යක්හු, පස්සෙහි
දිවෙන්නා වූ ඒ රස් දකිමින්, මුහුණින් හිඟී දිවෙමින්
සක්වළ ගල පැනැ ගෙනැ ඇතැ වැගිරැ ගිය හ යි සිතමි.
අතුරතුරෙන් දිවන්නා වූ නානා ප්‍රකාර වූ රශ්මිජාලා
යෙන් සියලු නුවර සදමින් **ලිච්ඡවි** රජදරුවන් සඳ
576 නිමැවූ සන්ථාගාරයෙහි මනොඥ වූ සප්තරත්නමය වූ
580 බුද්ධාසනමස්තකයෙහි වැඩැ හුන් සේක. ස්වාමිදරුවන්
583 ආසනයෙහි වැඩැ හිඳින්නා හා මැ ශ්‍රමණ බ්‍රාහ්මණ රාජ
කුමාරාදි නානා ප්‍රකාර වූ පිරිස් බුදුන් පිරිවරා එහි මැ
හුන් හ. **ශක්‍රදෙවෙන්ද්‍රයා** ද තමන් ගේ දෙ දෙව් ලොවැ
588 දෙවතාවන් හැරැ ගෙනැ සුදුසු තැනෙක්හි හිඳැ ගත.
ඉක්බිති තෙරුන් වහන්සේ සියලු නුවර පිරිත් කොටැ
591 රොගයෙන් මිදී තමන් වහන්සේ පිරිවරා ගත් මහජනයා
592 ගෙනැ අවුත් “ස්වාමිනි, ස්වාමීන් වහන්සේ ඇතුළු වූ
රත්නත්‍රයයෙහි බලයෙන් ජීවිත ලද්දා වූ ගැත්තෝ
ස්වාමින් වහන්සේ වඳිති” යි ඒ පිරිස් වඳවා තමන් වහන්
593 සේ ද ශ්‍රීපාදය වැඳැ එකත් පස් වැ වැඩැ හුන් සේකැ.
594 සර්වඥයන්වහන්සේ හුන්නා වූ පර්ෂද බලා ස්ථානොචිත ධර්ම
දෙශනාවක් පරීක්ෂා කොටැ වදාරා සම්ප්‍රාප්තවූ පර්ෂදට එමැ
**රත්නසූත්‍රය** දෙසා වදාළ සේකැ. දෙශනා පර්‍යවසානයෙහි
599 සුවාසූ දහසක් ප්‍රාණීහු එක පැහැරැ අමෘතමහානිර්වාණ
යට වන් හ.

මෙසේ නැඟු නැඟු පියවරින් සිතු සිතු සිතින් කළ කළ දෙසින් වන් වන් තන්හි සිටි සිටි තන්හි හුන් හුන් තන්හි සියලු උපද්‍රව පහ කොටැ සියලු ශාන්ති ඇති තාක් නමා ලෙව් ලොවුතුරා සැපත් දී සියලු ලොව සතහන්නා වූ මා ගේමැ ළයක් වැනි, මාගේ මැ ඇසක් වැනි, මට මැ පිහිට වූ, මට මැ රක්ෂා ස්ථාන වූ **බුදුන් සරණ යෙමි යි බුද්ධසරණ යා** යුතු.

# බුදු ගුණ අලංකාර විවරණය.

## 1. කාව්‍ය මුඛය.

1. අන්වය:— කුලුණු සත වෙතැ (පතලා) මෙන් නැණ සව් පද අරුතැ පතල, ලොවට සෙත එළි කල, මුනිඳු සරණත නිතර නමඳිමි.

අර්ථ:— බුදුන් ගේ කරුණාව සකල සත්ත්වයා කෙරෙහි පතළේ යැ. එ මෙන් මැ ඥානය සකල පදාර්ථයෙහි පතළේ යැ. බුදුහු ලොකයට ශාන්තිය එළි කළා හ. එබඳු වූ ඒ බුදුන් ගේ පාදය නිතර වඳිමි.

විපසණී:— 'පදරුත'- සචෙතන වූ හෝ අචෙතන වූ හෝ රූපි වූ හෝ අරූප වූ හෝ සියල්ල පදාර්ථ යි, පදයන් ගෙන් දැක්වි යැ යුතු අර්ථ වන බැවින්. එ හෙයින් ලොකයෙහි ඇති තාක් සියල්ල පදාර්ථ නම්. බුදුන් සියල්ල දත් බව මේ කී පරිදි යි 'ලොවට සෙත' නම් නිර්වාණය යි. 'සරණත'—මෙහි 'අත්' යනු නිරර්ථක යි. සවනත්, නුවනත්, වුවනත් යනාදි තන්හි දු ඒ පෙනේ. වරලස, මුහුලස, යනාදි තන්හි 'අස' යනු ද මෙබඳු යැ.

2. අන්වය:— සසර හිමි ලං කැරැ, කෙලෙස් බිය හිමි දුරු කැරැ සිදු කළ සුතු, උතුම්, නව ලොව්තුරු සදහම් වඳිමි.

වි. 'සසර හිමි'- සංසාරයේ සීමාව. නිවන. 'කෙලෙස් බිය හිමි'-කෙලශ භීතියේ සීමාව. 'සිදු කළ සුතු'- මෙහි සිදු කිරීම නම් අවබොධ කිරීම යි. 'නව ලොව් තුරු සදහම්'-සතර මග සතර ඵලය නිවන යන නවය

3. අන්වය: කිසි කෙනකුන් පමණ නොකළ හැකි ගුණ ඇති, අපමණ සත හට පිළිසරණ අරී සඟ ගණ අදරින් වඳිමි.

වි. 'අපමණ' ඇතැමෙක් මෙය 'ගුණ' යන්නට විශෙෂණ කොටැ ගනිති. 'පමණ නොකළ හැකි අපමණ ගුණ' යනු උමතු බසෙකි. 'අරී' ආර්‍ය. සතර මඟ සතර ඵලයට පැමිණියාහු ආර්‍යයෝ යැ.

4. අන්වය: බව සිඳු පසුරු වන්, අව බිඳ අඳුරු හිරු වන්, මහ රුවන් මුනි පෙර නෙ රුවන් මෙ සේ නම කැරැ පුද—

අර්: සංසාර නමැති සමුද්‍රයට පසුරු වැනි වූ, අපාය භය නමැති අන්ධකාරයට සූර්යයා වැනි වූ, මහාරත්න වූ බුදුන් මුල් කොට ඇති රත්නත්‍රයයට මෙ සේ නමස්කාර කොට, පූජා කොට—

වි. 'මහ රුවන්'-තමනට වඩනා රත්නයන් නැති වන බැවින් බුද්ධාදීහු මහාරත්නයෝ යැ. 'මුනි පෙර'- බුද්ධාදි. මුනි පූජී.

5. වි. 'බව'- භවය. සංසාරය. 'කියනුව'- කියනු පිණිස. මෙහි 'නුව,'ප්‍රත්‍යය යි; අනාගතාර්ථයෙහි වෙයි. 'දිවා රය'-දිවා රෑය. එළි වැට රැකෑ ගන්නා පිණිස 'ඇ'කාරයට කළ අගෞරවයෙකි.

විශාලාවට පැමිණි තුන් බිය සැලැකිමෙ දී 'භය නම් අසාර යැ' යි ද 'බව නම් බයංකාර යැ' යි ද කියන්නට සිදු වේ.

6. 'සුගතිඳු'- (සුගත් + ඉඳු) මුනීන්ද්‍රයා ගේ. 'වැරසැර'- වීර සාරය. නිර්භිතත්වය.

7. වි. 'උදක් ගොඩ කෙරෙමි යි'-ගොඩ මැ කෙරෙමි යි. හුදු ගොඩක් කෙරෙමි යි. 'දවසක්'- කලන්දක ජාතකයෙහි.

8. වි. 'එ තෙකුදු වත්'- (එතෙක් + දු) එ තරම් (එසේ) ද වන නමුත්. 'නොමඳින්'- බෙහෙවින්. 'උදක් ඔකඳින්'- හුදු මහත් ප්‍රීතියෙන්. 'ඔකඳ' නම් මහත් ප්‍රීතිය යි.

9. වි. 'එ දමා'-එ (දෙෂය) ඉවතැ ලා. 'දෙ සවන් පුට'- දෙ කන් නමැති (පත්) ගොටු. 'නමා'- යොමු කොට. 'මුනි ගුණ අමා'- මුනි ගුණ නමැති අමෘතය.

## 2. විශාලා පුර වර්ණනය.

10. අන්වය: සග සිරි අසා ලා කළ අයුරු සාලා සොඳුරු, සිරින් සුවිසාල, විසාලා නම් පවර නුවරෙක් වි.

වි. 'සග සිරි'-ස්වර්ගයෙහි ශ්‍රීය. 'සාලා'-ශාලාවන්. 'සොඳුරු'- යහපත් වූ. 'සුවිසාල'- ඉතා විශාල වූ. එළි වැට රැකෙන පිණිස කළ දිගි.

11. වි. 'සත් සමුදුර- සප්ත සීදන්ත සාගර. මහ මෙර වටා සිටි සාගර සත. 'සත් ගිරි' මහ මෙර වටා සිටි පර්වත සත. සප්ත සාගර නමැති අගල් ද සප්තකුල පර්වත නමැති ප්‍රාකාර ද වට කළා වූ ශක්‍ර පුරය මෙහි ගැනිණ. 'එ පුර සරි පුරෙක් සක්වළැ කො ද'- 'සරි'- සමාන. 'කො ද'- කවරේ ද?

12. අන්වය: වෙන වෙන දෙසින් සැපැමිණි පබළු රන් මුතු මිණි බබලන පැහැ ගිහිණි නොයෙක් සල්පිල් සියෙන් (එ පුර) සුසැදිණි.

වි. 'පැහැ'- ප්‍රභාව. 'ගිගිණි' ගැවැසී ගත්තා වූ. 'සුසැදිණි'- මොනවට අලඞ්කෘත වී. යුක්ත වී.

13. වි. 'සිත් බැඳි'- සිත් ගත්තා වූ. 'මිණි පහ'- මණි ප්‍රාසාදයන් ගේ. 'කොවේ'- කුඩා වීථි. 'මා වේ'- මහා වීථි. සැදි- යුක්ත වී.

14. වි. 'තිළි'- සතුටු වැ. 'දද'- ධ්වජ, කොඩි 'තියැළි'- ශක්ත වැ. විශෙෂයෙන් ඇලී. 'ඉන් ඉන් වෙළි'- එකිනෙකින් වෙළී. අහස්හි දද ඇඹැරෙන කලැ එකෙකින් අනෙකක් වෙළෙන හෙයින් කියත්. 'රුසින්'- රශ්මියෙන්- ස්වර්ණාදියෙන් කැරුණු හෙයින් කොඩි රුසින් බැබැළී කෙළී. 'පුර අඹරැ'- පුර ආකාශයෙහි.

15. අන්වය: සුර පුරැ දෙවියන් ලෙසින් මනහර රුසිරි සර මහ සෙන් එ නුවරැ උරයෙන් උර පැහැරැ නිතර සිටිති.

වි. 'මනහර'- මනොහර. සිත් ඇදූ ගන්නා. 'සෙන්'- 'සෙනඟ, යන්නෙහි අන්ත්‍ය ලොපයෙන් නිපන. 'උරයෙන් උර පැහැරැ'- එ තරම් ළං වැ ගැවැසී යැ යු සේයි.

16. වි. 'සෙණ හෙන සේ'- අශනිය පතිත වන්නා සේ- හෙණ ගසන්නා සේ. 'තවසුන්'- තාපසයන්. 'හික්මෙන'- හීකරු වන්නා වූ.

17. වි. 'පස් දහරේ හසල'- පඤ්ච ධාරායෙහි පුරුදු වූ. පඤ්ච ධාරා නම් අශ්වයන් ගේ පඤ්චවිධ ගමනය යි. ආස්කන්දිත, ධෞරිත, රෙචිත, වල්ගිත, ප්ලුත, යනු ඒ පසට නම්. තුරඟ සෙන්'- අශ්ව සේනාව. 'තරඟ වැනි'-රළ වැනි යැ.

18. අන්වය: බන් රන් දෙදෙන් පැහැ පත සක් සන් දිගත ගත් රත සෙන්, එ පුරැ රජ මහවතැ නිතර විතර වනු නැත.

වි. 'බන්'- බඳනා ලද. 'දෙදෙන්'- ධ්වජයන් කරණ කොට ගෙනැ. 'පැහැ පත'- ප්‍රභාවට පැමිණියා වූ ප්‍රභාවත් වූ. 'සක් සන්'- චක්‍ර ස්වනය. රිය සකෙහි නාදය. 'දිගත ගත්'- දිශාන්තය ගත්තා වූ. දිශා කෙළවරට ගියා වූ. 'රජ මහවතැ'- සාමාන්‍ය මහා මාර්ගයෙහි. මහා ජනයාට අයත් වූ මාර්ගය (Public Road) රාජ මාර්ග නම්. 'විතර වනු නැත'- (මෙ පමණෙකැ යි) ප්‍රමාණ වීමෙක් නැත. අපමණ යැ.

19. වි. 'සුර තුරු'- දිව්‍ය වෘක්ෂ. සිතූ පැතූ දෑ දෙන ගස්. 'යැදියනට'- යැදියා වූ (ඉල්වූ) අය හට. 'මහසල් කුලන් ගෙන්'- මහාසාර කුලයන් ගෙන් මහ පොහොසත් පවුල්වලින්. 'යුති'- (යුක් + ති) යුක්ත යි. 'එ පුර' යනු ආධ්‍යාහාර්‍ය්‍ය උක්ත යි.

20. අන්වය: සුර අඟන සිරි ඉසිලූ, වර අඟන කෙළින සඳලු ලිය ගී කන් කලු. නරඟ රඟ මඬුලු ඉමෙක් නැත.

අර්ථ: දිව්‍ය අඞ්ගනාවන් ගේ ආකාරය ඉසිලූ උතුම් අඞ්ගනාවන් ක්‍රීඩා කරන්නා වූ චන්ද්‍රිකා ශාලාවෝ යැ. මධුර ගීතිකාවෝ කනට ප්‍රිය වූ යැ. (එ හෙයින්) අඞ්ගනාවන් ගේ නෘත්‍ය මණ්ඩලයන් ගේ ගණන සීමාවෙක් නැත. චන්ද්‍රිකා ශාලාවන්හි කාන්තාවන් ගේ රූපය දැක, මධුර ගීතිකා අසා, රාගය උපදනා බව මෙසින් කියැවිණ.

21. අන්වය: ඇම තැනැ ඇති සැපත් එක කැනැ මැ වූ සිරි ගත්, දැකැ දැකැ රිසි නුමුත් එහි, නැතැ සි යන සම්පතෙක් නැත්.

පි. 'සිරි'- ආකාරය. ශෝභාව. 'දැකැ දැකැ රිසි නුමුත්'- කොපමණ දුටුව ද රුචිය නැති නොවන්නා වූ. 'නුමුත්'- 'නො' නිපාත සි. 'මුස්' (මිදුම්හි) දය සි. මුසී- මුසිත්- මිති- මුතු- ආ විසින් වරනැගේ.

22. පි. 'නන්වෙස්'- නානාවේශ වූ මෙහි වේශ නම් ඇඳුම්. 'නර ගණ'- මනුෂ්‍ය සමූහයා. 'යෙත් ද'- කියත් ද. 'ය' (කිවුම්හි) දය සි.

23. පි. 'පිය ගැට'- පඩි. 'බිඟු දැල්'- භෘඞ්ගජාල. බමර සමූහ 'විජුරුණු'- ඒ සිරි ගිය.

24. අන්වය: රන් කෙහෙලි තලැ අඹල, මිණි කිකිණි මුතු ලැලි බන්, රන් වැට පහන් දිලි, දෙරින් දෙරැ දන් දෙවන දන් හලි.

අර්ථ: රන් කොඩි සුළුහෙහි ඇඹැරුණා වූ, මැණික් රසු ද මුතු ලැලි ද බඳනා ලද්දා වූ, සවණි ප්‍රදීපයන් බැබැළුණා වූ, දොරක් දොරක් පාසා දන් දෙවන්නා වූ දනශාලා යැ.

පි. 'රන් වැට පහන්'- 'වැට පහන් නම් වැටියෙකින් දැල් වෙන පහනි මෙහි ඒ පහන් රනින් කැරුණේ ය. 'දන් හලි'- දන් හල් + සි.

25. අන්වය: අසුර සෙන් තරමින් තැනැ තැනැ පණ අත් අරමින්, රුපු මන් උපුරමින්, අවි සරමින් සරන මහ සෙනඟ යැ.

පි. 'තරමින්'- ලෙසින්; ප්‍රමාණයෙන්. 'පණ අත් අරමින්'- ප්‍රාණය හස්තයට ආරූඪ කෙරෙමින්. පණ අතට ගනිමිනැයු සේ සි. දිවි නො තකා ඉදිරියට යන බව මින් කී හ. 'මන්'- මානය. දර්පය. එහිය 'උපුරමින්'- උදුරා හරිමින්. 'අවි සරමින්'- ආයුධ සරඹයෙන්. අවි සරඹ කෙරෙමින් හැසිරෙන සේ කී හ,

26. අන්වය: තිමද ගිලි ගිජිඳුන් නොහැකිලි තුරඟුන් ලෙසින්, බන් රන් ඇකිලි තබා තන්තන්හි කෙළිත, බිහි අලි කුල යි.

අර්. තුන් මද ගලන්නා වූ ඇතුන් හැකිලි නැති අශ්වයන් මෙන්, බඳනා ලද රන් හැකිලි තබා, තන්හි තන්හි ක්‍රීඩා කරන කලැ, බැහැර හාඞග සමූහයෝ යි.

ඇතුන් කෙළනා කලැ උන් ගේ මදට ලොබින් වටා හැසිරෙන භෘඞග සමූහයන් වෙති යි මේ කී සැටි යි.

වි. 'තිමද'- තුන් මදය. ඇතුන් ගේ තුන් තැනෙකින් වැහෙන මදය. 'හැකිලි ඇකිලි'- මෙ දෙක මැ එකාර්‍ථ යි. ශෘඞ්ඛල නම් ඇත් ආදීන් බඳනා යදම් යැ.

27. වි. 'විදු'- විද්‍යා. ශාස්ත්‍ර. 'උනුනට'- ඔවුන් ඔවුන් හට. 'පිළිමල් වෙමින්'- (ප්‍රතිමල්ල) විරුද්ධ වෙමින්. තරඟ වෙමින්. 'කියන'- පාඩම් කියන්නා වූ. 'විදු හල්'- විද්‍යා ශාලා. පල්ලි. පාඨ ශාලා.

28. අන්වය: දෙර දෙරෙහි රන් තොරණ මිණි කිරණ විහිදී, සිරින් පිරි ඉතිරී එ පුර දෙරණ, නිති සතොස කරණ යැ.

'තොරණ ය' යනාදි තන්හි 'ය' පාද පූරණ යි.

අර්. දෙරක් දෙරක් පාසා රන් තොරණෙහි මණි රශ්මිය විහිදුණා වූ, සම්පත්තින් පිරුණ වූ ඉතුරුණා වූ ඒ නගරයෙහි භූමිය, නිරන්තරයෙන් සන්තොෂයට කාරණ හේතු) යැ.

29. අන්වය: එහි රිය සක්හි සක් හඬ සතුන් නිහඬ කැර .......

වි. 'රියසක්හි'- රථ සමූහයෙහි. 'සතුරන් නිහඬ කැර-', සතුරන් නිශශබ්ද කොට. ඒ නගරයෙහි රථ 'චක්‍රනාදය ඇසූ පමණින් මැ සතුරන් භය වැ නිශශබ්ද වෙති යි කී සේ යැ. 'සයුරු රළ ගල ගත් හඬ ලෙසින්'- සාගරයෙහි තරඞග සමූහය ගත්තා වූ හඬ ලෙසින්. 'දස-අත' දශ දිශාව. 'මැඩැ'- මර්දනය කොටැ. අන් හඬ යට පත් කො වැ යැ යූ සේ යි.

30. අන්වය: හය මිණි කිකිණි ගිගිරි කුර රොන් සමඟ පුර දෙරණතැ පිරී ඉතිරී දිගතැ පැතිරී ගොස් පවති.

වි. 'හය'- අශ්වයන් ගේ. 'ගිගිරි'- ඝොෂය. 'පුර දෙරණ තැ'- නගර භූමියෙහි. දිගතැ- දිශාන්තයෙහි.

31. අර්: පඤ්චාඞ්ගික තූර්‍ය නාදය ද හස්ති සෙනාවන් ගේ කුඤ්චනාදය ද සමඟ සතුති නාදය වෙයි (ඒ හෙයින්) ඒ නගරය දිවා රාත්‍රි දෙක්හි එකනිනාද යැ(එක කොලාහල යැ.)

වි. 'නිනාදේ'- නිනාද නම් ශබ්දය යි.

32. වි. 'උතුරු කුරු දිවයින'– මහ මෙරින් උතුරෙහි ඇතැයි යන ද්වීපය. එහි කල්ප වෘක්ෂයෙන් සියලු සැප ලැබේ ල

33. අන්වය. සුරන් පහ සදිසි, සත් රුවන් බිතු සිය දිලි.........

වි. 'සදිසි'– සාදෘශ්‍ය. සමාන. 'සත් රුවන්'– සප්ත රත්නමය. 'බිතු සිය' – භිත්ති ශතයන්. සිය ගණන් භිත්ති.

34. වි. 'සව් සිරිනි සැදියන්'– මෙහි 'යන්' යනු පාදපූරණ යි. සව් සිරිනි සැදි අපමණ පොකුණු ගෙ උයන්" යි අන්වය වේ.

35. වි. 'සැදී'– සජ්ජිත වැ සැරැසී.

## 3. ලිච්ඡවි රාජ වර්ණනය.

36. වි. 'පැතිරේ'– පැතිරැ' යනු එළි වැට රක්නට විරූප වී යැ. 'ගනදරේ'– මේ 'ගනදර' යනු යි.

37. වි. 'සමගොත්'– සමානගොත්‍ර වූ 'සත් වග' –සප්ත වර්ග්‍යා.

38. වි. 'දුසිරි සිත නැවැති'– දුශ්චරිත චිත්තය නැවැත් තා වූ. දුශ්චරිතයට නැමුණු සිතක් ඒ රජුනට නැතැයි කී සැටි යැ. 'එ රජ'– ඒ රජයෝ. මෙහි 'රජ' යනු බහුවචන රූප යි.

39. අන්වය: (ඔහු) කුල දෙටුවන් පැවැති සෙබෙහි තෙදඅණින් නො දිලෙති; වෙන් වූ සඳ දිලෙති; රසින් මුසු නුමුසු රන් සේ වෙති.

අර්: ( ඒ ලිච්ඡවි රජයෝ) කුලජ්‍යෙෂ්ඨයන් ඉන්නා සභා යෙහි තෙජසින්ද ආඥයෙන් ද නො දිලෙති; වෙන් වූ කල්හි දිලෙති; (එ හෙයින්) රස දියෙන් මිශ්‍ර වූ ද අමිශ්‍ර වූ ද ස්වර්ණය සේ වෙත්.

රස දියෙන් මිශ්‍ර වූ රන නො දිලෙයි; අමිශ්‍ර වූ රන දිලෙයි. එ මෙන් මැ කුල දෙටුවන් ඉන්නා සභායෙහි ලිච්ඡවි රජයෝ තමන් ගේ තෙජස හෝ ආඥා බලය හෝ නො දක්වති; ඔවුන් ගෙන් වෙන් වූ කල්හි දක්වති.

වැඩි සිටි අයට රජ දරුවන් දක්වන ගෞරවය මෙයින් වැනූ හ.

40. අන්වය: අවරද නන් නො වළා, මහ නන් බසට නො නැමි, ඇම නන් බලා, සතන් පිය සුතන් ලෙසින් රකිනු යැ.

අර්: අවරජ වූ තැනැත්තන් හෙවත් හීන ජනම ඇත් තන් දුරු නො කොට, උසස් තැනැත්තන් ගේ වචනයට නො නැමී, සියලු තැන් බලා සත්ත්වයන් ප්‍රිය පුත්‍රයන් මෙන් රකින්නෝ යැ.

පි. 'අවරද'- අවරජ. 'අවර' යනු 'පහත්' යන අර්ථයෙහි යෙදේ. පහත් ව උපන්නාහු අවරජයෝ යැ. 'වලා'- වලා හා. 'වලහ' ධාතු යි.

41. පි. 'නො මකා'- විනාශ නො කොට. 'දන් වත්' දන වස්තු. 'නො තබා'- නො තබ්ත්වා. 'නො වඩා'- වැඩි නො කොට. 'දියැ'- ලොකයෙහි. 'දිය කොත්'- ජය කොඩි.

42. පි. – 'ගත'- ශරීරය.' සබා මැ යැ'- කාන්තිසහිත මැ යැ. 'බා' නම් කාන්තිය යි. 'බස සබා'- මෙහි සබා නම් සත්‍යය යි. ඉසුරින්'- ඓශ්වර්‍යයෙන්. 'සබා'- භාග්‍යසහිත.

43. පි. 'අවා'- අපාය. 'ඇවුරු'- ආවරණය කළා වූ. 'සත් ගුණෙන්'- සත්පුරුෂ ගුණයෙන්. 'දිගු බිත'- දිශා නමැති භිත්තිය. 'කිවියරු,- කිවිවරු. 'තැවැරු'- ආලෙප කළ හ.

කවීහු ඔවුන්ගේ ගුණ නමැති සිතියම දිශා නමැති භිත්තියෙහි ඇන්දෙ යැ. කාව්‍යයන් කිරීමෙන් ඒ ගුණ දිශාන්තයෙහි පැතිරී ගිය සේ මෙයින් කියැවිණ.

44. අන්වය: (ඔහු) රන් රූ සදිසිය හ; දූකැ දූකැ නො යන රිසිය හ; කන් කලු සුබැසිය හ. ඔහු මැ නර දෙව් නමට නිසිය හ.

අර්ථ: ඒ ලිච්ඡවි රජහු සුවර්ණ රූප සමානයෝ ය; දූකැ දූකැ ද නොයන්නා වූ රුචි වඩන්නා හ. කනට ප්‍රිය වූ යහපත් වචන ඇතිය හ. ඔහු මැ නරදෙව නාමයට නිස්ස හ.

පි. 'සුබැසි'- සුබස් (මනා බස්) ඇතියේ සුබැසි යි. 'නර දෙව්,-'නර දෙව' යනු රජුනට නමෙකි. නරයනට දේව වන හෙයිනි.

45. පි. 'පිළිරූ'- ප්‍රතිරූප. කෙනකු ලෙසට කැරුණු රුව පිළිරුව යි. 'දස රජ දම්'- දශරාජධර්මය.

46. පි. සක- චක්‍රය. 'නොමින්'- බෙහෙවින්. බඩු නිසල කරනු පිණිස සක පෙරළෙයි. සතුන් සුව පත් කරනු පිණිස රජහු දුක් විඳිත්.

47. පි. 'පෙමින්'- ප්‍රෙමයෙන්. ගැහැට නො කොට. නො තළා. 'අය පඩුරු'- අය බදු. 'පෙර නියමින්'- පූර්ව රාජයන් විසින් නියම කරන ලද පරිදි.

48. පි. 'සිඳු පෙදෙසේ'- සමුද්‍ර ප්‍රදෙශයෙහි. 'ලුව ද'- ලත ලද නමුත් සමුද්‍ර මධ්‍යයෙහි සිටිය ද නැව දිය නොගන්නා සේ ධනවතුන් අතර සිටිය ද මේ රජහු ඔවුන් ගේ ධනය නො ගනිත්.

49. පි. 'දහම්'- ධර්මය, යුක්ති ධර්මය.

50. වි. 'සවනින්'- කනින්. 'නුවනින්'- නයනයෙන්. ඇසින්. 'යන'- කියන 'තමා බස කෙරෙති යි'- තමා කීවා කෙරෙ තිසි කියා. 'තිසි ලෙස මිසක්'- තිසි සේ විනා (අන් පරිද්දෙකින්.) බස ඇසියැ යුත්තේ කනිනි. "එය ඇසින් අසව" යි කීම තිසි ලෙස යෙදීම නො වේ. තමාට කීකරු වූ පමණින් ඒ රජහු මෙ බදු අයුතු යෙදුම් නො කෙරෙති.

'නුවණින්' යන්නක් ගෙනැ 'ඥානයෙන්' යි අරුත් බණණුවෝ පද්‍යාර්ථ නො දනිත්.

51. අඬය.: සතින් වලකන වැස්සට ඉසට අතුල් දෙන සේ...........

වි. 'සතින්'- ඡත්‍රයෙන්. කුඩයෙන්. 'වැස්සව'- වැස්සෙහි දී. 'අතුල්'- හස්ත තලය. 'යෙදෙන'- සුදුසු වන. මහතුනට සුදුසු දූයක් හීනයනට යෙදීම කුඩය වෙනුවට අත්ල හිසට දීමක් වැන්නැ.

52. වි. 'ලෝ වැඩ පිණිස'- නඩු ඇසීම් ආදියෙන් වන ලොකාර්ය පිණිස. මෙ බඳු තන්හි දී අන්‍යයන් ගේ ස්ත්‍රීන් දෙස ද බැලීමට සිදු වෙයි. එ කලැ සූසියා දෙස බලන්නා සේ ඇස හකුළුවා ගෙනැ දුක සේ බලත්. පර ස්ත්‍රීන් කෙරෙහි කිසි ඇල්මක් නොකරන බව මෙ සේ කී හ.

53. වි. 'සනහසේ'- සෙනහයෙහි ලා. සෙනහය කරණ කොට ගෙනැ යැ යු සේ යි. කරණාර්යෙහි පස් වන විබති. පසව දුක්'- ප්‍රසව දුඃඛය. වැදීමේ දුක 'අදහසේ'- අදහස කරණ කොට ගෙන. 'සරු නො කොට'- නො සලකා. 'සැප සේ'- සැප මෙන්.

54. වි. 'තුරු'- තාරකා. 'වලා'- වලාහක. වලා කුළු. 'මරු'- මාරුතය. සුළඟ. 'කෙලෙසා'- කිළිටි කොටැ. 'වෙසෙසා'- විශෙෂ කොට.

55. වි. 'ගජන්'- හස්තීන්. 'ඉඳුරා'- සෘජු වැ. මැනැවින් යැ යු සේ යි.

56. වි. 'සුවඳ හැල්'- එනම් ගොයම්. 'වරා'- එනම් වල් පැලය. 'රකින එව්'- රකින්නාක් මෙන්. 'අදහම් පුරා රැකැ,- අධර්මය සම්පූර්ණ කොට රැකැ.

57. වි. 'පස් ඉඳුරන්'- පඤ්චෙන්ද්‍රියයන් විසින් ඇස, කන,

නාසය, දිව, කය යනු පසිදුරු යි. 'අරමුණු පසින්'- රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන ආලම්බන පසින්. 'ජවන් සිත්'- ජවන චිත්ත යන්. 'ලෙවන්'- ලෝකයන්. ඉන්ද්‍රියයෝ අරමුණු ලබත්. ජවන චිත්තයෝ එයින් සන්තර්පිත වෙත්. ලෝක සත්ත්වයෝ සැප ලබත්. රජහු එයින් මැ සතුටු වෙති.

58. වි. 'වතුරු'- ප්‍රවාහය. ඔඝය. ගලා යන දිය පහර. වැලි බිම් පෙත්'- වාලුකා භූමි ප්‍රදේශය. විද්‍යුච්චක්‍රවර්තීහු-"වෙහෙල්ල තෙමා ගෙනැ බස්නා ජල ප්‍රවාහය සේ අනාථයන් තෙමා කරුණා වතුරු පැවැත්වූ හ"යි යෙති. 'මහ කුලුණු මෙත් සිත්'- මහා කරුණා මෛත්‍රී චිත්ත ය.

59. වි. 'කල'- කළය. 'නිසල'- නිශ්චල. ගුණ නුවණ ඇති මහාත්මයන ට ගෞරවයෙන් පවතිතියි යු සේ යි.

60. වි. 'ගවර වළු'- අශුචි වලෙහි. 'පුල් සරසේ'- පිපුණු විලෙහි. සුළඟ මේ දෙ තන්හි මැ සම වැ හම යි. 'කුලනුකුලන් දෙසේ'- කුලීනයන් හා අකුලීනයන් කෙරෙහි.

61. අන්වය: රිවි කෙසේ නැංග ද, අඳුරු රකිත ගිරි ලෙණ සේ, කෙසේ සැඩ දන ඇතත්, දුගී සත සිත සේ රැකැ සිටිති.

වි. 'කෙසේ නැංග ද'- කවර ආකාරයෙන් නැගියත්. 'ගිරි ලෙණ'- පර්වත ගුහාව. සූර්යයා කෙසේ නැඟුණත් ගුහාව අන්ධකාරය රකී මැ යැ. 'කෙසේ සැඩ දන'- කොතරම් චණ්ඩ ජනයා.

62. වි. 'මෙහෙ ගෙන'- කටයුතු කරවා ගෙනැ. 'නො දමති'- බැහැර නො කෙරෙති. 'නො දත්තන් මෙන'- නො දත්තවුන් මෙන්. ඇතැම්හු මිනිසුන් ගෙන් මෙහෙ ගෙනැ පසු වැ ඒ බවක් නො දත්තන් මෙන් ඔවුන් අහක් කෙරෙති. මේ රජහු එසේ නො කෙරෙත්.

63. අන්වය: වෙත වෙත කරලැ දුටු වී ගෙනැ අටු පුරන මෙන්, හැම සත සිත සතුටු තමා ලෙයි ලා අක පටු නො වී.

අර්ථ: වෙත වෙත කරලෙහි දක්නා ලද වී ගෙනැ ( ඒ වී ) අටු පුරන (රැශියක් වන්නාක්) මෙන්, සියලු සත්ත්වයන් ගේ සිතහි සන්තෝෂය තමන් ගේ හෘදයයෙහි ලා (ඒ සන්තෝෂය) හක හෝ පටු හෝ නො වී යැ හෙවත් ඉතා මහත් වී යැ.

එක් එක් කරලින් ගැනෙනුයේ වී ස්වල්පයෙකි. එ හෙත් ඒ වී අටුව පුරයි. මෙ රජහු එක් එක් සත්ත්වයා ගේ සන්තෝෂය තමන් ගේ හෘදයයෙහි ලති. මෙසේ ඔවුන් ගේ හෘදයයෙහි එක් වූ සන්තෝෂය ඉතා මහත් වේ. ලෝවැස්සන් ගේ මඳ වූ ද සන්තෝෂය රජුන් ගේ මහත් ප්‍රීතියට හෙතු වන බව මෙයින් කී හ.

වි. 'ලෙයි'– ලෙහි. 'අක'– ශක්‍ය හැකුළුණු. අල්ප.

64. වි. 'බත් කිස'– භක්ත කෘත්‍යය බත් කෑම.

65. අන්වය: විලෙහි පියුමෙහි මී එහි තබා බොන ශශ මෙන්, දන දනවතුන් ගෙහි තුබා නිතියෙහි වැඩ විඳැ ගනිති.

වි. 'එහි'– ඒ විලෙහි පියුමෙහි මැ. 'නිතියෙහි'– නිරන්තර යෙන්. 'වැඩ'– ප්‍රයොජන. මෙසේ කිරීමෙන් 'අප ගේ ධන නො ගත් හ' යි ධනවස්තු ද සතුටු වෙත්. රජුන් ගේ කාර්‍ය්‍ය ද පිරි මැසේ.

66. වි. 'දා ලත'– කපා ලන්නා වූ. 'දා' (කැපීමෙහි) ධාතු යි. 'බහා ලත' යි අරුත් බණන්නෝ ධාත්‍වර්ථ නො දනිති. 'සස්'– ශස්‍ය. ගොයම්. 'යස'– සම්පත්තිය.

67. අන්වය: ඔහු "මෙ වැනි දස් කම් කොටැ දෙයක් ලබ මි"යි ආ හට ඒ නො දී, දොම්නසින් ඔහුට ගෙට නො යා දෙති.

දර්ථ: ඔහු (ඒ රජයෝ) "මෙ බඳු වූ සමර්ථ කමක් කොටැ (යම් කිසි) දෙයක් ලබමි"යි ආවහුට ඒ (දෙය) නො දී, නො සතුටු සිතින් ඔහුට ගෙට නො යා දෙති. ඒ දූය දී ඔහු සතුටු කොටැ මැ යවති යි යු සේ යි. ඇතැම් අය මල්ල යුද්ධ කිරීම් ආදියෙන් තමන් ගේ දස් කම් පෙන්වා තෑගි ලැබීමට යෙත්.

68. වි. 'මල'– කුණු. අපිරි සිදු ලෝහ. 'සිඳෙත'– නැති වී යත. 'සන්තාප'– දැඩුවම්.

69. අන්වය: සිඳු වඩ දිය නො වත, කලපුවැ සිඳෙත දිය මෙන, දන සැපෙන් දුරු වුව, තුමූ සිතින් සැප ගෙනැ නො ඉඳිති.

වි. 'සිඳු'– සමුද්‍රයෙහි. 'නො වත'– නො වැදුණ හොත්. වුව'– වුව හොත්.

70. වි. 'දැඩි කමෙන්'– දැඩි බව හෙතු කොට ගෙනැ. තද බැවින්. 'කමින්' යි සිටියැ යුතු වුව ද 'මෙන්' යන්න හා එළි වියැ යුතු හෙයින් මේ වූ රූපය යි. 'නියමෙන්' යනු ද මෙ බඳු යැ. 'සරය'– හිය. 'නියමෙන්'– එකාන්තයෙන්. 'දුරු නො කරවති'– ඈත් නො කරවත්. බැහැර නො කරවත්.

71. වි. 'මුල තිර වැ සිටි සේ'– මූලය ස්ථිර වැ සිටි සිටි පරිද්දෙන්. මූලය ස්ථිර වූ ප්‍රමාණයට. 'සලෙළ වත'– සලීල වන්නා වූ. ලීලා සහිත වන්නා වූ. 'තුරු සිර සේ'– වෘක්ෂ ශ්‍රීය මෙන්. 'සත සුව විඳින සේ'– සත්ත්වයන් සුව විඳිනා ප්‍රමාණයට.

තුරු සිර සලෙළ වීම නම් චලනය වීම යි. රජුන් සලෙළ වීම නම් ක්‍රීඩාදීන් විනෝදාභිරමණය කිරීම යි. මේ රජුන් ගේ විනෝදය සත්ත්වයන් සුවපත් වූ පමණට යැ යනු භාව යි.

72. වි. 'රකවරණට'- රක්ෂාවරණයට. 'පවුරු එවි'- ප්‍රාකාරය මෙන්. 'තමා තර කොට ගනිති'- තමන් මැ සපිර කොටැ ගනිත්. තුමූ සපිර වැ සිටිත්.

73. අකුළ: ඇතු සොඬින් උකා ගත් පැන මුව ඇරැ ගෙනැ බොන මෙන් තමා ලත් සැපත් අමා නිතියෙන් ලෝ වැස්සන් පොවන.

අවි: ඇත් තෙමේ සොඬින් පැන් උකා ගනී. එහෙත් මුඛය ඒ පැන් රැගෙනැ බොයි. රජහු සැපත් නමැති අමෘතය ලබති. ලෝ වැස්සෝ එය බොත්.

මේ රජුන් තමන් ලැබූ සැපත් ලෝ වැස්සන් ලවා අනුභව කරවති යි යූ සේ යි.

75. වි. 'සඟිති'- මහණෙනි. 'පුහුදුන් තොප'- පෘථග්ජන වූ තොප. සතර මඟ සතරඵලයට පැමිණියාහු ආර්‍යයෝ යැ. ඒ ආර්‍ය ධර්මයන් ගෙන් පෘථග්වූවාහු වෙන් වූවාහු පෘථග්ජනයෝ යැ. සෘද්ධි නැති පෘථග්ජනයනට සඞ්ගීයෙහි සුරිඤු නො පෙනෙත්. 'සගැ'- සඞ්ගීයෙහි. 'තෙල'- මේ. 'සෙත දුන්'- ශාන්තිය (නිර්වාණය) දුන්නා වූ.

76. වි. 'සිරි සර-' ශ්‍රීසාරය.

78. වි. 'ජරු විලි පිලි'- ජරුයෙන් වන්නා වූ වලිත පලිත. වලිත නම් ඇඟැ රැළි යැ. පලිත නම් පැසුණු කෙස් යැ. 'දිසි මෙන්' පෙනුණා මෙන්. 'කලි එ පුරෙහි පවා'- කල්‍ය වූ (ප්‍රියකර වූ,) ඒ නගරයෙහි පවා. 'අකලි දුබ්බික් දුකෙක්'- අකල්‍ය වූ දුර්භික්ෂ දුඃඛයෙක්.

79. වි. 'නිත්ත වන්නේ නැතැ'- නිත්‍ය වන්නේ නැත. 'පාත එවි'-පාතාක් මෙන්.

80. වි. 'තමා පුර'- තමා ගේ (වෛශ්‍රවණයා ගේ) අලකා පුරය. 'සරි යැ යි'- සමාන යැ යි. 'වෙර'- වෛරය. 'කුවෙර වර දුන් මෙන්'-කුවෙරයා වර දුන්නාක් මෙන්. කුවෙරයා නම් යක්‍ෂාධිපති වූ වෛශ්‍රවණයා යැ. තපුරු වෙරයක් හෙවත් ශරීරයක් ඇත් තෙන් ගේ කුවෙර නම් වී.

81. වි. 'තබා ලා'- ඉතිරි කොටැ ලා. 'යම් දූයි'- විශාලා නුවරැ එකකු වත් ඉතිරි කොටැ බැහැරකට යෙම් දූයි. 'වසා ලා-

තමා පිවත නො යන ලෙස නුවර වසා ගෙනැ. 'උන් වැනි'- හුන්තාක් වැන්නැ.

82. වි. 'මැඩැ'- යටපත් කොට. 'වැජැඹි'- පැවැතිණ.

83. අන්වය: ගැඹුරු දිය අගල පවුරු ඉස් අතුරු වසා පිරූ මළ මිනියෙන්, වටා අමුතු පවුරු කළ වැනි.

අර්ථ: ගැඹුරු දිය අගල ද පවුරෙහි මුදුන ද අතර වසා පුර වන ලද මළ මිනී කරණ කොටැ ගෙනැ (නුවර) වටා අමුතු පවුරක් කළා වැන්නැ.

84. වි. 'අවට'- හාත් පසැ. 'උවදුරු තාක්'- උපද්‍රවයන් ඇති තාක්. 'බට වැන්නැ'- බැස්සා වැනි යැ.

85; අර්ථ: ගොඩක් ගොඩක් පාසා ඇට සැකිලි යැ. ස්ථාන යක් ස්ථානයක් පාසා තුබූ බලි හා බිලි යැ. මාර්ගයක් මාර්ගයක් පාසා රෙදි වැරැලි යැ. (එ හෙයින්) බලන කල්හි ඒ පුරයෙහි සියලු තැන පිළිකුල් යැ.

86. වි. 'පිළැ පිළැ'- ගෙ පිලක් ගෙ පිලක් පාසා. 'මර අදින'- පණ අදින්නා වූ. 'අවසර'- අවකාශයෙක්.

87. වි. 'ඉසැ ඉසැ'- හිසක් හිසක් පාසා. 'මුන'- මිදුණා වූ. 'වරලැ'-කෙශ කලාපය යැ. 'හෙන'- වැහෙන. 'කඳුළු ඇලි යැ'- කඳුළු ධාරා යැ. 'කුසැ කුසැ'- බඩක් බඩක් පාසා. 'දුකුලව් මැ'- දුක් උලව් වචන මැ.

88. වි. 'අතැ අතැ'- අතෙක්හි අතෙක්හි. 'කබ කබලැ'- බණ්ඩ කපාලය යැ. භින්න වූ යාචක පාත්‍රය යැ. 'ඉපිලි'- මතු වූ. 'වතැ'- මුඛයෙහි. 'හඬ'- හඬ යැ. 'දල සෝ ගිනි යැ'- දෘඪ ශොක ගින්න යැ.

89. වි. 'රැදුරැ'- රෞද්‍ර වූ. 'නැඹුරු ඇදුරන් ගෙනැ'- නමු වූ (නැමුණා වූ) ආචාර්යයන් කැටි වැ ගෙනැ. ඔවුන් ගේ ආචාර්යත්වයෙන් මේ උපද්‍රවයෙහි දී කිසි පිහිටක් නුවූ හෙයින් මත් බිඳී ඔහු ද නමු වූ හ.

90. වි. 'උනුන් වෙතැ පිය බස යොදමින්'- ඔවුනොවුන් කෙරෙහි ප්‍රිය වචන යොදමින්. ප්‍රිය වදන් බෙණෙමිනැ යූ සේ යි. මෙසේ උන්නාහු රජ මැති පිරිස යි.

91. වි. 'වනසෙකි'- විනාශයෙකි.

92. වි. 'ගං හෝ දිය නැවී ගිය'- ගං හෝ වලැ ජලය උෂ්ණ වී සිඳී ගියේ යැ. 'වියත'- අකාශය. 'තුරු ලිය'- ගස් වැල් 'දෘ'- දඬි වැ. 'පතිත වී'- වැටුණේ යැ.

93. **අන්වය:** තොලු ගානා තණක් , දිය තලු තෙමෙන පමණක් තුරු සෙවණක් නැති වැ, සිවුපාවුනට දියුණක් දුනෙකි.

**අර්ථ:** තොල උලා කන තරම් තෘණයක් (හෝ) ජලය තල්ල තෙමෙන ප්‍රමාණයක් (හෝ) වෘක්ෂච්ඡායාවක් හෝ නැති වැ සිවුපා සතුනට ද්විගුණයක් දුනෙකි.

94. **වි.** 'උදක්'– කිසි වෙනසක් නැති වැ.

95. **වි.** 'බියෙන්'– නුවර උපද්‍රවයට බියෙන්. 'පර දෙස'– අන්‍ය දෙශයකට. 'සුලබ'–පෙරැ සුලභ වූ. 'පස් ගෝ රස'- ගවයන් ගෙන් ලැබෙන රස පස. කිරි, දී, වෙඬරු, ගිතෙල්, මෝරු. 'ඇතැයි යන ගෙන් බස දුලබ වියැ'– පස් ගෝ රස ඇතැ යි කීම ද දුර්ලභ වී යැ.

96. **අන්වය:** පෙරැ සත සිත ලෙසිනි මනා සුවඳිනි තෙව්නා කපුරු කස්තුරු දුන් මෙපුර නපුරැ සි දමා ගිය වැති.

**අර්ථ:** පූර්වයෙහි සත්ත්වයන් ගේ සිත් වූ පරිද්දෙන් මනා සුගන්ධයෙන් (යුක්ත වැ) පවත්නාවූ කපුරු කස්තුරු දුන් මෙපුරය අයහපත් යැ නොහොත් පුරයක් නො වෙති සි කියා අත් හැරැ ගියා වැන්නැ.

**වි.** 'දූන්'– මේ එළි වැට රැකෙන පිණිස ඉකාරවත් කිරීමෙන් 'දූනි' යනු වී. 'නපුරැ සි'– මේ අර්ථ දෙකක් දෙයි. "අයහපත් යැ" යනු එක් අර්ථයෙකි. "පුරයෙක් නො වේ" යනු අනෙක සි.

97. **වි.** 'අටඟ සිල්'– අෂ්ටාඞ්ග ශීලය. 'බඹසර මඟැ පිහිටි'– බ්‍රහ්මචර්‍ය්‍ය මාර්ගයෙහි පිහිටියා වූ. බ්‍රහ්මචර්‍ය්‍ය මාර්ගය නම් ස්ත්‍රී සෙවනයෙන් තොර වැ විසීම සි. 'ලිය සසඟ'– ස්ත්‍රී සංසර්ගය. 'දුර ලූ යැ'– දුරු කළෝ යැ. නගර වාසිහු එසේ කළ හ.

98. **අන්වය:** නිති සිල්වත් දනන් සේ දුසිරි මඟ නැවැති. කව්නළු රසින් ඉවති. නටන නටවන අයෙක් නම් නැති.

**අර්ථ:** නිත්‍යයෙන් සිල්වත් දනන් ගේ මෙන් දුශ්චරිත මාර්ගය නැවැත්තේ යැ. කාව්‍ය නාටකයෝ රසයෙන් ඉවත් හ. නීරසය හ. රස නැත්තාහ. (එ හෙයින්) නටන අයෙක් නම් නටවන අයෙක් නම් නැත්තා හ.

99. **වි.** 'දූනෙන්'– ධ්‍යානයෙන්. 'සිත එකඟ වූ මෙන්'– චිත්තය එකාග්‍ර වූවාක් මෙන්. සිත එක් අරමුණෙකැ පිහිටියා සේ. 'කෙළි සිනා'– කවට සිනා. 'දුහඟ පිළිවෙතැ'– ධූතාඞ්ග ප්‍රතිපත්තියෙහි තෙළෙස් ධූතාඞ්ගයන් ගෙන් මෙහි ලා පිණ්ඩපාතිකාඞ්ගය ගැනිණ. පිණ්ඩපාතිකාඞ්ගය රක්නාහු පිඬු සිඟා ගෙනැ මැ අනුභව කළ යුත්තේ යැ.

100. අන්වය: රටවැස්සෝ දූසිදස්සෝ අයකු වට ලූ යැ. පෙරළ තිස්සෝ උන යැ. දනුත් මැස්සෝ වට ලා දිවෙති.

අර්: රාෂ්ට්‍රවාසි වූ දූසි දාසයෝ ඇතැම් සොතකුන් වට ලූ හ. පූර්වයෙහි (එසේ වට ලීමට) සුදුස්සෝ (නම්) ඔහු යැ. දනුත් මැස්සෝ (උන්) වට ලා දිවෙත්.

101 වි. 'සැපැමිණි උවදුරේ'– පැමිණියා වූ උපද්‍රවයෙහි දී.

102. අන්වය: ලොවට වැඩ කැරුමෙන් සැපැමිණි මෙ රජ සැපතට කිසි කම් නැති ලෙසට, මෙ දූතට පිහිටක් නොවනු කිමෙක.

අර්: ලොකයට වැඩ කිරීමෙන් පැමිණියා වූ මේ රාජ සම්පත්තියට කිසි කමක් (ප්‍රයොජනයක්) නැත්තා සේ, මේ දූතට පිහිටක් නො වන්නේ කිමෙක් ද?

ලොකයට වැඩ කිරීමෙන් ලොකයාගේ සිත් ගෙනැ තමන් ගේ අර් සිඩිය කැරැ ගත හැකි යැ. එ හෙත් මේ රජහු සිඬ වූ අභිමතාර් ඇත්තෝ යැ; පැමිණියා වූ රජ සැපත් ඇත්තෝ යැ. එ හෙයින් දූතට මැ පැමිණියා වූ මේ රාජ සම්පත්තියට තවත් ලොකයට වැඩ කිරීමෙන් කිසි කමක් නැතැ යි සිතා මෙන් දූතට පිහිටක් නො වන්නේ කිම් දූසි ඇසූ තියා යැ.

103. වි. 'දුබ්බික් දුක් මුසු'– දුර්භික්ෂ දුඃඛයෙන් මිශ්‍ර වූ. 'නුවරුන් බස්' යි සම්බන්ධය කරනු. 'තම සිතැ දූතට සුදුසු'– තමන් ගේ සිතෙහි දුක් ඉපැදවීමට ප්‍රමාණ වත.

104. වි. 'අදම්වූ වත්'– අධර්මයුක්තවත් මැ. 'එ පවත් වෙති'– ඒ පැවතුම් ඇත්තාහු වෙත්. 'බමුණු ගහ පතියෝ ද'– බ්‍රාහ්මණයෝ ද ගෘහපතීහු ද. ගෘහපතීහු නම් වෛශ්‍යයෝ යැ. 'එ ගතිත්'– ඒ අධර්මය ගනිති.

105. අන්වය: උන් දූතැ දනවු වැසි දන අදහමට රිසි වෙති. උන් රැකැ වෙතැ පැහැසි සුරන් සිතවත් අදම් අදහසි.

අර්: ඔවුන් දූතැ ජනපද වාසි ජනයෝ අධර්මයට රුචි (ඇත්තාහු) වෙති. ඔවුන් රැකැ සම්පයෙහි පහැසුණා වූ හෙවත් සම්බන්ධ වූ දෙවියන් ගේ සිතටත් අධර්මය අභිමත යි.

වි. 'පැහැසි'– 'පහස්' (පැහැසුම්හි) ධාතු යි. පහසි– පහසිත්– පැහැසි– ඇ විසිනැ වරැ නැගෙනුයේ.

106. වි. 'තුරු දෙවියෝ'- වෘක්‍ෂ දෙවතාවෝ. 'අදහම් මැ සෙවියෝ වෙති'- අධර්මය මැ සෙවනය කළාහු වෙත්. 'අහනැ දෙවියෝ'- ආකාශයෙහි දෙවතාවෝ. 'සිත අදහමින් නොවියෝ කෙරෙති'- චිත්තය අධර්මයෙන් නො වෙන් කෙරෙත්. අධර්මයෙන් යුක්ත කෙරෙති සි යු සේ සි. 'වියෝ' නම් වියොගය සි හෙවත් වෙන් වීම සි. 'නොවියෝ' නම් වියොග නො වීම සි.

107. වි. 'සතු'- අයත්. 'විසම වැ'- විෂම වී. සම පරිදි නො වැ. නො තිසි පරිදි.

108. අන්වය.: එ පවන් වැදූ නුබැ ගමන් ඔත දෙව් විමන් සැලෙත පුරන් සිත කිපුණෙන්, ලොව සෙත කැරැ වැසි නො වස්වති.

අර්‍ථ: ඒ සුළඟ වැදී ආකාශයෙහි ගමන් පත් වූ දිව්‍ය විමාන යන් චලිත වත් මැ දෙවියන් සිත කිපුණෙන් (ඒ දෙවියෝ) ලොකයට සෙත් කොටැ වැසි නො වස්වති.

109. වි. 'සස්'- ශස්‍ය.

110. අන්වය: එක ගමෙකැ ද වැසි වසිතත් සම වැ නො වසී. ඉන් විසම වැ පිසී පැසුණු සස් වග ඉතා නො රසි.

අර්‍ථ: එක් ගමෙකැ නමුත් වැසි වසිතත් සම වැ හෙවත් සුදුසු කාලයෙහි නො වසී. ඒ හෙතුයෙන් විෂම වැ වැසී පැසුණා වූ ශස්‍ය වර්ග ඉතා නො රස යැ (රස හීන යැ.)

වි. 'පිසී'- පුෂ්ට වැ. 'පුස්' (පොෂණයෙහි) ධාතු යි. කර්‍ම ප්‍රයොගයෙහි 'පිසී' යනු පූර්‍වක්‍රියා නිපාත රූප යි.

111. වි. 'නිරිඳුන් ගෙත'- නිරිඳුන් ගෙන් යැ.

113. වි. 'ඔවුන් පසසා'- ඔවුනට ප්‍රශංසා කොටැ.

114. වි. 'සව් සතරෙහි'- සකල ශාස්ත්‍රයෙහි. 'මහසත් ගුණෙන්'- මහාසත්ත්ව ගුණයෙන්. 'පරසිදු'- ප්‍රසිද්ධ වූ. 'කැත් කුලෙන්'- ක්‍ෂත්‍රිය කුලයෙන්. රජ කුලයෙන්.

115. වි. 'කල ගුණ වෙසෙස දත'- කලා වූ ගුණ විශෙෂය දතැ.

116. වි. 'මෙරමං වැඩ'- පර වැඩ. පරාර්ථය. 'විකුම් ඇති'- වික්‍රමය ඇත්තා වූ. රජ නීතිය නො හැරැ මැ කැමැති දෙය සිද්ධ කරන්නා වූ වික්‍රමය සි.

117. වි. 'උදය සිරිසින්'- උදය පර්‍වත මස්තකයෙන්.

**118. අර්: වික්‍රමයට ද සත්‍ය වචනයට ද ජනයාට දෙන්නා වූ මහා දානයට ද ජීවිතය සතර වනු කොටැ සියලු කල්හි පැමිණි සිහි ඇති වැ රකින්නා වූ—**

**119. අර්: සම්පූර්ණ සුචරිත මාර්ගයෙහි සිටියා වූ මන්ත්‍රී වරයන් සමඟ නිරන්තරයෙන් සප්තාංගය රකින්නා වූ ඔබ හැම දෙනා ගේ කවර වරදෙක් ද?**

**වි. 'සත් අඟේ'– සප්ත අංගය** (1) **ස්වාමි** (2) **අමාත්‍ය** (3) **මිත්‍ර** (4) **කොශ (භාණ්ඩාගාර)** (5) **රාෂ්ට්‍ර** (6) **දුර්ග (7 බල (සේනාව).**

120. **වි. 'නෙත් සලසා'– ඇස් යොමු කොටැ.**

**121. අන්වය: නිවටුන් නිවට බසැ දූවැටී සසරට පිවිසි, නව ගුණ ගුණට ගත් මැතිදෙක්, එවිට සෙබෙන් නැගැ සිටැ–**

**අර්:** නිර්ග්‍රන්ථයන් (නිගණ්ඨයන්) ගේ අසාර වූ වචනයෙහි වෙළී සංසාරයට ඇතුළු වූ, නෂ්ට ගුණය (ගුණ නැති බව) ගුණයට ගත්තා වූ මන්ත්‍රීද්වයෙක් එවිටැ සභායෙන් නැඟී සිටැ–

122. **වි.** 'පදතඹරට'– පාද නමැති තාමරසයට (පද්මයට.) 'සෙමෙන්'– සන්සුන් වැ. 'දළැ'– තලලෙහි. 'බඳ ඇඳිලිවැ'– බඳනා ලද දෙහොත් ඇති වැ.

123. **වි.** 'පසිඳැ'– සුන් කොටැ. 'මෙසඳ–' මේ කාලයෙහි 'පවර'– ප්‍රවර (උතුම්) වූ. 'පූරණ කසුබු'– පූරණ කාශ්‍යප.

124. **අර්:** සන්තානය (සිත) පරිශුද්ධ කළාවූ ශුද්ධවූ තපෝ ගුණයෙන් පිරුණාවූ සිද්ධවූ (සියලු ගුණධර්මයන් සිද්ධකොටැ ගත්තාවූ) කකුධ කාත්‍යායන නාමයෙන් ප්‍රසිද්ධ වූ බුදු කෙනෙක් ඇත.

125. **වි.** 'තුති ලද'– සතුති ලැබුවා වූ. 'තෙද ඇති'– තේජස් ඇත්තා වූ.

126. **වි.** 'දිලි තව තෙදින් ඇම තැනැ සත සතන තුටු කළ'– ජ්වලිතවූ තපස් තේජසින් සියලු තන්හි සත්ත්වයන් ගේ සන්තානය(සිත)සතුටු කළා වූ. 'නිගටනතපුත්'– නිර්ග්‍රන්ථනාථපුත්‍ර.

127. **වි.** 'සඳ සෙ'– චන්ද්‍රයා සේ. 'තවුස්ගණ'– තාපස සමූහයා.

129. **වි.** 'හිමි සඳ'– ස්වාමිචන්ද්‍රයාණෙනි. හිමිතුමාණෙනි. 'නිතිපුද'– නිත්‍යපූජා. නො කඩ වැ කැරෙන පූජා. 'මේ පුර බඳ උව දුරැ'– මේ පුරයෙහි බැඳුණාවූ උපද්‍රව. 'සෙද දුරැ වෙතී'– වහා දුරැ වෙති සි.

130. **වි.** 'ජඩ'– මෝඩ. 'තිවටුන් තිසා'– තීර්ථකයන් සඳහා. 'බුදුනැයි නමක් සලසා'– බුදුන් යැ යි නමක් යොදා. 'ඒ බසසා'– එබස් අසා.

131. **අන්වය:** මූ හැම දෙන පව් පින් නැතැ යි යන තිවටෝ යැ. මුන් ගෙන් ලොවට එන සෙත ඇත, ගින්නෙන සිහිලස ලැබෙයි.

**වි.** 'සෙත ඇත'– ශාන්තිය ඇත හොත්. 'සිහි ලස'– ශීතලය.

132. **අර්ථ:** පව් පින් දෙක මැ නැත හොත් රකින්නා වූ තපස ඵල (කමක්) නැත්තේ යැ. ඔවුන් බුදුන් යැ යි කියති. මෙසේ වූ මෝඩ කමෙක් නැත්තේ යැ.

පව් පින් දෙක නැත් නම් තපස් රැකීමෙන් ඇති කම් කිම?

133. **වි.** 'පුද කරනු'– පූජා කිරීම. 'තෙලියතු'– තෛල යන්ත්‍රයෙහි. 'වැලි මලු ලා' යි සම්බන්ධය කරනු. 'සතත'– නිරන්තර යෙන්. 'තෙල් පතා'– තෛලය ප්‍රාර්ථනා කොටැ. 'මඬින වැති'– මිරිකන වැන්නැ.

134. **වි.** 'බඩ වඩන'– උදර පොෂණය කරන. බඩ රැකා ගන්නා. 'දුරැර'– දුර හැර. දුරු කොටැ. 'සිවු වේ'– චතුර්වේදය. ඍක්, යජුස්, සාම, අථර්ව යන සතර වේදය. 'නො කඩ දත්'– අඛණ්ඩ කොටැ හෙවත් අඩු නො කොටැ දත්තා වූ. 'බමුණන් ඇරැ ගෙනැ'– බමුණන් පමුණුවා ගෙනැ.

'හර' ධාතුයෙන් හැර යනු වැ 'හ' කාර ලොපයෙන් 'ඇර' යනු ලැබේ. මෙහි අර්ථ 'දුරු කොටැ' යනු යි.'අර' ධාතුයෙන් ද ඇර යනු වේ. මෙහි අර්ථ 'ඉදිරියට ගෙනැ' යනු යි.

135. **වි.** 'ගහ කැන් වළඳවා'– ග්‍රහ සමූහයාට (අහාර) අනුභව කරවා. ග්‍රහ පූජා කොටැ යැ යු සේ යි. 'සොඳවා'– සොඳ වැ. සොඳින්. 'යාග කළ'– යාග කළ හොත්. 'දුක් මුලින් මුදවා'- දුක් සමපූර්ණයෙන් නැති කොටැ. 'සෙත ඒ යැ' යි සම්බන්ධය කරනු.

136. **වි.** 'ලෙඩ දුක් පත් අයට'– ලෙඩදුකට පැමිණියා වූ අයට. 'පිටැ පිටැ'– නැවැතැ නැවැතැ. 'දෙසි' – දෙහි ද?.

137. **වි.** 'වේ මතුරු'– වෙදමන්ත්‍ර. 'ලෙවන් වළහන'– ලොකයා රවටන්නා වූ. 'දුලද'– දුර්ලබ්ධික වූ. මිථ්‍යාදෘෂ්ටික වූ. 'කිකලැ ද'– කවර කාලයෙහි ද?

138. **අව:** (අඹරැ) ආකාශයෙහි ග්‍රහයෝ නම් දෙවියෝ යැ. ඔහු දිව්‍යලොකයෙහි හුදක් (කෙවල වූ) මනොහර අමෘත රසය විනා අන්‍ය ආහාර නො ගනිත්.

**වි.** 'උදක් අම රස මිසක්'– අමෘත රසය මැ විනා.

139. **අන්වය:** එසිත් උන් පෙරැ කළ නිකසළ කුසලින් නිපන. අනෙක් කෙනකුන් කළ දෙයක් උදෙසා උ෴ පහළ නො වෙති.

**වි.** 'එසිත්'– ඒත්. 'සි' ආගම සි. 'උන්'–ඒ දෙවියන් 'නිකසල'–කසළ නැති. නිර්මල වූ. 'නිපන'– උපන්නෝ යැ. 'කළ දෙයක් උදෙසා'- කළාවූ දෙයක් සඳහා. 'උ෴'– ඔහු. ඒ දෙවියෝ. 'පහළ නො වෙති'– ප්‍රකාශ නො වෙත්. නො පෙනෙත්.

140. **අන්වය:** සිඳු දිය ලෙස සගැ නිසග සැප පමණ නොකැළැකි. එරඟ නර ලොවැ සැප තණ අගැ රැඳුණු පිනි බිඳු වැන්නැ.

**වි:** 'සගැ නිසග සැප'– ස්වර්ගයෙහි ස්වාභාවික සම්පත්තිය 'එරඟ'– ඒ ආකාරයට.

141. **වි:** 'සිවු සිය ගවු අසලැ'– යොදුන් සියයක් ආසන්නයෙහි. 'ගෙල දූවැටි'– බෙල්ලෙහි දූවැටුණා වූ (රැඳුණා වූ.)

142. **වි:** 'රැකැ සිටැ'– බලා සිටැ. 'සෙත කෙරෙති යෙති'– සෙත කෙරෙති සි කියත්.

143. **වි:** 'රිසි වත'– කැමැති වත් හොත්. "එ නිවට දුගී යාචකයනට සුරැනැයි යනු කුමට" සි සම්බන්ධය කරනු. 'සුරැනැයි යනු'– දෙවියන් යැ සි කියන්නේ.

නර ලොව දෙන පුදට දෙරින් දෙරැ සිටැ රිසි වත් හොත් ඔහු නිවට දුගී යාචකයෝ යැ. එබඳු වූ නිවට දුගී යාචකයනට සුර නැයි කියන්නේ කුමට ද?

144. **අන්වය:** අන් ඉසුරැ ගැනුමට විසිතුරැ උපමා යොදා බොරැ යාග කෙරෙති සි ලොවැ උවදුරැ කෙසේ දුරැ වේ ද.

**වි.** 'අන් ඉසුරැ'– අන්‍යයන් ගේ සම්පත්තිය. 'විසිතුරැ උපමා'– (විචිත්‍ර වූ) නානා විධ වූ උපමාවන්. 'කෙරෙතියි'– කරත් නමුදු. කිරීමෙන්.

145. **වි.** 'පුද කළ'– පූජා කළ කල්හි. 'සෙත වෙති යනු'– ශාන්තිය වෙති සි කීම. 'බොරැ මායමෙකි'– බොරැ රැවැටීමෙකි.

146. වි. 'තිසැක ගුණ නැණ යුත්'- සැක නැති වැ ගුණ යෙන් ද නුවණින් ද යුක්ත වූ. 'පින්සර'- පුණ්‍යයෙන් සාර වූ. 'බමුණු උතුමෙක්'- බ්‍රාහ්මණ උත්තමයෙක්. එළිවැට රැකෙන පිණිස අකාර යුක්ත කැරිණ. 'උපන'- උපන්නේ යැ.

147. අර්‍ථ: ඥානය නමැති නෞකායෙන් (ගොස්) සර්‍ව ශාස්ත්‍ර නමැති සමුද්‍රයෙහි පාරතීරය (එ තෙර) දැකැ,(පතර)මහත් වූ ලොක යෙහි ප්‍රසිද්ධ වැ, තමා (මවු කුසින්) බිහි වන්නා වූ දිනයෙහි මවු පියන් විසින්-('නො නිවා රැකැ තබා දුන් ගිනි රැගෙනැ' යි සම්බන්‍ධය කරනු.)

වි. 'නැණ නැවින්.........පර තෙර දැකැ'- සියලු ශාස්ත්‍රයන් උගත් බව කී සේ යැ.

148. අර්‍ථ: (තමා බිහිවන දිනෙහි මවු පියන් විසින්) නො නි වා රැකැ තබා දුන් ගිනි ඇරැ ගෙනැ වනයෙකැ වැසැ, නොයෙක් හවුරුදු (ගණනක්) ගිනි දෙවියාට පුදා, දවසෙකැ-('සිහා ගිය තැනැ' යි සම්බන්‍ධය කරනු.)

උපන් දිනැ දැල්වූ ගිනි නො නිවා රැකැ තබා වැඩුණු කලැ දෙනු සිරිති. පුත් ඒ ගිනි රැගෙනැ ගොස් නො නිවා තබා පුදයි.

149. වි. 'දවසෙකැ සිඟා ගිය තැනැ ලද' යි සබඳි. 'ලද'-ලැබු වා වූ. 'මහපුද ගිනි දෙවියා හට'- මහාපූජ්‍ය වූ මහා පූජාවට සුදුසු වූ ගිනි දෙවියා හට.

150. වි. 'නපුරැයි'- නො මැනැවැයි. 'ඔහු ලුණට යාදී'- ඔහු ලුණු (ලබනු) පිණිස ගිය දී (ගිය පසු) මෙහි 'දී' යනු 'දෙ' (දීමෙහි) දයින් නිපන් පූර්‍වක්‍රියා නිපාත පද යි. වියරණ නොදත් තන් කියන සේ ප්‍රත්‍යයයෙක් නො වේ.

151. වි. 'මස් පලහා'- මස් පුලුස්සා. 'සමින්'- සා. 'නොස රස්'-වහා. (සරස් නො වැ.) 'එ ගොස්'- ඒ බමුණා ගොස්.

152. අන්‍වය: තෙපි, අප රකිනා තබා නොප සතු ගොනා නො තබා වෙතැ තබා කන තෙක් අත බා බලා උන් කෙනෙකි.

වි. 'අප රකිනා තබා'- අප රැකිම තිබියැ දී. 'නො තබා'- ඉතිරි නො කොටැ. 'වෙතැ තබා'- ළඟැ මැ තබා ගෙනැ. 'අත බා'- අත හෙළා ගෙනැ. ගොනා කැම වැළැක්වීමට අතක් වත් නො නඟා

153. **අර්:** එ හෙයින් ගිනි දෙවියෙක් නැත්තේ යෑ. උන් නැතහොත් පූජයෙන් ඵල නැත්තේ යෑ. බොරු වචන ලොක යෙහි පැවැති නුවණ නැති සත්‍වයා විසින් කරන්නා වූ පූජාවෙකි.

154. **අර්:** "ගොන් මස් නොලත් හෙයින් ඉතින් මෙපම ණක් (මෙය විතරක්) කව" යි කියමින්, වල් අගින් (නගුට අගින්) දියවර ගසා ඒ ගින්න නිවී යෑ.

**වි.** 'දියවර'– දැන් 'දියරා' යි ව්‍යවහාර යි.

155. **වි.** 'නුවණැතියවුන්'– නුවණ ඇත්තන්. 'නිසරු කොටැ'– සරු නො කොටැ. නො සලකා. 'කාළැ යි'– කළා හ යි. කළායින්.

156. **වි.** 'රුති කැරැ'– රුචි කොටැ.

157. **අර්:** දීඝී කාලයෙකින් බ්‍රාහමණ ජනයා තමන් උදෙසා ලබන්නා වූ ධනය ගිනි දෙවියාට පුදන්නා වූ පූජායෙන් ලොකයට සිදු වන්නා වූ ඵලය කිම.

මේ මදක් ව්‍යාකුල යෑ.

158. **වි.** 'බමුණන් සතා'– බමුණන් ගේ වචන. 'ගෙනැ'– අදහා. 'මෙ සතා'– මේ ලොක සත්‍වයා. කරවන යාග කොබඳු ද යත් – 'නියතා'– එකාන්තයෙන් 'අකුරු'– ශකීරා. ගල් කැට.

159. **අන්වය:** කරින් තිසුල් අවි ගත්, උගුරින් කළු පැහැ ඇරැ ගත්, අඹරින් ගත් සළු හන් අඩක් සිරුරින් උමයගන ගත්.

**වි.** 'කරින්'– අතින් 'තිසුල් අවි'– ත්‍රිශුලායුධය. ඊශ්වරයා ගේ ආයුධයෙහි හුල් තුනෙකි. 'කළු'– ඊශ්වරයා විස පූ හෙයින් උගුර කළු වීයැ. නීලකණ්ඨ යනු එහෙයින් නමි. 'අඹරින් ගත් සළු හන්'– ආකාශයෙන් ගත් වස්ත්‍ර හැන්ද වූ. නග්න වූ. ආකාශයෙහි වස්ත්‍ර නැති. එහෙයින් ආකාශයෙන් ගත් සළු හැඳීම නම් නිර්වස්ත්‍ර වීම යි. 'හන්'– 'හඳ' ධාතු යි. හඳී– හඳිත්– හනි– හනු– ඈ විසින් වර නැගේ. 'අඩක්'– ඊශ්වරයා අර්ධශරීරයෙන් උමාව ගත්තේ යෑ.

160. **වි.** 'දළැ'– ජටායෙහි. 'බඳින'– බඳින්නා වූ. පලඳින් නා වූ ඊශ්වරයා ගේ ජටායෙහි අර්ධචන්ද්‍රයා වෙයි. 'ගොර'– ඝොර. දරුණු. 'සප් හරක්'– සර්ප හාරයක්. සර්ප මාලයක්. ඊශ්වරයා නයකු මාලයක් මෙන් පැලැන්දේ යෑ. 'රඟ'– නැටීම.

162. **වි.** 'සිවලිංගය'– ලිඞ්ගාකාර කොටැ තනන ලද රූපය. 'පිදුවොත්'– පිදුව + හොත් = පිදුවො + හොත් = පිදුවො + ඔත් = පිදු

වෝත් = පිදුවොත්. 'ලොවට බොහෝ සෙත ඇම හෝ (සෙත) එතී'- ලොකයට බොහෝ ශාන්තිය (ඇතැම් විටැ) සියලු මැ ශාන්තිය හෝ එති සි. බොහෝ ශාන්තිය එයි. ඇතැම් විටැ සියලු මැ ශාන්තිය පවා එනු බැරි නො වෙති සි යු සේ සි.

163. වි: 'එ වසා'- ඒ (ඇති දුක්) වසා. ඒ මතු පිටට.

164. වි: 'සගය'- බාලය. ආමන්ත්‍රණ සි. 'සසගයැ පැලැඹෙන අඹයකි'- ෂඩ්ස්වගීයෙහි (දිව්‍ය ලොක සයෙහි) හැසිරෙන්නා වූ, කෙනෙකි. 'උන් රූ මන රඟ යැ'- උන් ගේ රූප චිත්තානුකූල වෙයි (ප්‍රියකර වෙයි.) 'මෙ රඟය'- මෙහි 'ය' පාද පූරණ සි. 'මෙ රඟ'- මෙ සේ. (මේ මහෙශ්වරයා ගේ මෙන්.) 'විසුළු වෙස් ඇති නො වෙයි'- විකාර වෙශ ඇත්තේ නො වේ.

165. වි. 'සත දැකැ'- ජනයා දැකැ. ජනයාට පෙනෙන හෙයිනැ යූ සේ සි. 'විළිත්'- ලජ්ජායෙන්. "ලියන් වෙතැ නො ඉඳි ති" සි සම්බන්ධය කරනු. 'මෙහෙසුරැ'- මහෙශ්වරයා. 'සිය ගතැ'- ස්වකීය ශරීරයෙහි.

166. වි. 'මෙ ලොව රැකැ පවතින හිරි ඔතප් දෙක'- මේ ලොකය පවත්නේ හිරි ඔතප් දෙක නිසා යැ යනු බුද්ධ මත සි. එ හෙයින් එ දෙකට 'ලොක පාලක ධර්ම' යනු නම්. 'හිරි'- පවට ලජ්ජාව. 'ඔතප්'- පවට භය.

167. අන්වය: අවි අන් වැනැසුමට (වෙයි.) නැත, තමා රැක්මට වෙයි: එසින් තිසුලවි හට රා දෙස් ඇතැ යි මොනවට දූනේ.

වි. 'අවි'- ආයුධ (නම්.) 'අන් වැනැසුමට (වෙයි)'- අනුන් විනාශ කිරීම පිණිස වේ. 'නැත'- නැත හොත් . 'එසින්'- ඒ කාරණයෙන්. 'තිසුල් අවි හට'- ඊශ්වරයා හට. 'රා දෙස්'- රාග ද්වෙෂ (යන දෙක.) 'මොනවට'- මනා සේ. ආත්ම රක්ෂාව කර නුයේ රාගය ඇති හෙයිනි. අනුන් වනසනුයේ ද්වෙෂය ඇති හෙයිනි.

168. අර්. රාග ද්වෙෂ (ආදි) පාපයන් ගෙන් මිදී (එ හෙයින් මැ පූජ්‍යවට) නිසි වූ උත්තමයනට නො බැඳී, භවයෙන් (සංසාරයෙන්)බැඳී සිටියා වූ ඔහුට (ඊශ්වරයාට) පැහැදී පුද කොටැ (ඇති ඵලය)කිම් ද?

රා දෙස් පවින් මිදුණාහු භවයෙන් මිදුණාහු යැ . රා දෙස් පව් ඇති මේ තෙමේ භවයෙන් බැඳුණේ යැ. භවයෙන් මිදුණු

උත්තමයනට නො බැඳී භවයෙන් බැඳුණ මොහුට පුද කිරිමෙන් කවර ඵලයෙක් ද?

**169. වි.** 'සබව'– ස්වභාවය. 'දත්'– දැනැ ගත්තා වූ. 'රඟ'– නැටිම. 'රඟන රඟකුත්'– නටන්නා වූ නැටුමකුත්. ඇතැමුන් ගත්තා 'කළ නැටුමකුත්' යනු බුදු ගුණ අලංකාර කාරයෝ ද නො දත් හ.

**170. වි.** 'නළු වෙස්'– නට වෙශය. නටන්නකු ගේ වෙශය.

**171. වි.** 'දද දන'– දඬ (මෝඩ) ජනයා ගේ. 'මල් නිසා'– මල් උදෙසා. මල් පතා. 'නො ලසා'– අනලස ව. 'දියැදූ'– දිය ඇදූ. (ගස මුලට ඉස්නට.)

**172. වි.** 'අයකු පිළිකුල් වන'– සමහරකුට පිළිකුල් වන්නා වූ. 'සිනැ රා'–චිත්තයෙහි රාගය. 'ලිඟු සටහන්'- ලිඞ්ගයෙකැ ආකාරය (රූපය.). ලිඟු සටහන සමහරකුට පිළිකුලෙකි. සමහරකුට රාගය වැඩීමට හෙතුවෙකි.

**173. අර්:** සිත දුශ්චරිතයෙන් කිලුටු වූ මේ ලොකයට පුණ්‍යක්‍ෂෙත්‍ර නොවන්නා වූ ඊශ්වරයාට පූජා කිරීම, ගලෙකැ (වී ආදි) බිජු වැපිරීම වැන්නැ.

**174. අර්:** යගදුව අතට ගත්තා වූ දිව්‍ය ගරුඩ යානයට පැමිණියා වූ සමුද්‍රයේ ජලයට වැදී අනන්ත නාගයා ගේ දරණ වැළ පිටැ සැතැපුණා වූ– ('උවිඳු මැ යැ' යනු හා සම්බන්ධය කරනු.)

**වි.** 'යගදු'– යකඩින් කළ ගදුව. 'දිව ගුරුළු යානට'– විෂ්ණුහු ගේ යානය දිව්‍ය ගරුඩයා යැ. යාන, ශයන (යහන) යන දෙකෙහි වෙනස අවබොධ කළ යුතු සි. හස්ති අශ්ව රථාදීහු යානයෝ ය. ඇඳ ආදිය ශයන සි.

**175. අන්වය:** තෙ දියතැ උවිඳු මැ යැ. එ සම (ය) වෙන කෙනෙක් නැත. පුදයට නිසි ඒ මැ යැ. පුද සාරන ලෙස මහිමය කී යැ.

**වි.** 'තෙ දියතැ'– (ස්වර්ග මනුෂ්‍ය පාතාල යන) තුන් ලොකයෙහි.- 'උවිඳු මැ යැ'- උපෙන්ද්‍රයා (විෂ්ණු) මැ යැ. විෂ්ණුහු ලොවැ හැම තැනැ මැ ඇති සි යන හෙයින් කියත්, 'එ සම (ය)'– ඔහු හා සමාන වූ. 'එ මැ යැ'– ඒ (විෂ්ණු) මැ යැ. 'මහිමය'– (ඒ විෂ්ණුහු ගේ) අනුභාවය. ඇතැමෙක් 'මහිමය' යන්නට 'මහත් වූ' සි අරුත් බැණැ 'පුද' යන්නට විශෙෂණ කොරෙති. ආශ්වර්‍ය සි.

**176. වි.** 'ගුණ වෙසෙස'– ගුණ විශෙෂය. 'අබියෙසැ'– ඉදිරියෙහි.

**177. වි.** 'පැන් පවස'– පැන් බොනු කැමැත්ත. පිපාසාව. 'වෙහෙස'– දුක.

**178. අන්වය:** අන්ද මන්ද, ලොවැ නින්දු නො බා තා කිවත් උවින්දු පුද කැරැ වැඩක් වින්දු ඇසුවා ඇද්ද?

**වි.** 'අන්ද මන්ද'– අඬ බාලය. එළි පිණිස කළ දිගි. 'ලොවැ නින්දු නො බා'– ලොක යා ගේ නිඳුවට භය නො වැ. 'වැඩක්'– යහපතක්.

**179. අර්:** සියලු තන්හි උපෙක්‍ෂායා ඇත හොත් සීතාව වෙත් විමෙක් නැත්තේ යැ. ඒ නිසා යුද්ධත් ඇත් ද? මේ (අනත බොරු) අනන්ත වූ හෙවත් ඉතා මහත් වූ බොරු කුමට කියහි ද?

**180. අන්වය:** වඳුරකු පිනූ මුහුද එ තෙරැ වැ යා නො හී ඉඳැ, රම් හේ බැඳැ ගියේ ල. මෙ ලො වැ දෙවියන් තෙද මෙසේ වෙ ද?

**වි.** 'වඳුරකු පිනූ'– වානරයකු පැන්නා වූ. හනුමතා දඹදිවැ සිටැ ලකට එනුයේ මුහුදෙහි එ තෙරැ සිටැ මෙ තෙරට පැන්නේ ල. 'යා නො හී'– යා නො හැකි වැ. 'රම්'– රාම තෙමේ. රාම වූයේත් විෂ්ණු මැ යැ. 'හේ බැඳැ'– සේතුවක් හෙවත් පාලමක් බැඳැ. 'ගියේ ල'– ගියේ ලු. වානර වූ හනුමතා මුහුදින් එ තෙරට පැන්නේ යැ. දෙවි වූ රාමයා පාලමක් බැඳැ ගියේ යැ.

**181. අර්:** මං ගේ සත්‍ය වචනය අසව. මේ තෝ තත්ත්වය නො දනිහි. ඔහුට (ඒ විෂ්ණුහුට) භය ඇත්තේ යැ. යගඳ ආයුධය ගත්තේ එ හෙයින් යැ.

**182. අර්:** රාග ද්වෙෂ (දෙක) සිතෙහි නො තිබී නම් සක් බෙල්ලකු පිඹී ද? (පිඹී යැ?) ඔහුට භය ඇති කලැ නරයන් ගේ භය කෙසේ දුරැ ලයි ද?

සක පිඹීම ශබ්දයට කළ රාගයෙන් හෝ සතුරනට ද්වෙෂයෙන් හෝ වියැ යුතු. රාගය හෝ ද්වෙෂය හෝ නැත් නම් සකක් නො පිඹි. විෂ්ණුහු සකක් පිඹිනා හෙයින් ඔහුට රාග ද්වෙෂ ඇති. ඔහුට බිය ඇති බව පෙරැ මැ කියැවිණ.

**183. වි.** 'ඉදිරි සෙත'– අනාගතයෙහි ශාන්තිය. 'ලබමි'– ලබමි යි කියා. 'පුද සිරි'– පූජාශ්‍රීය. පූජා සම්පත්තිය. කෙබඳුද යත්:– 'ලබනුව'– ලබනු පිණිස. 'තබා අළලන ඔටු කිරි වැන්නැ'– තබා ගෙන කලඹන්නා වූ ඔටු කිරි වැනි යැ.

**184. වි.** 'සකාසා'– මනා කොටැ.

185. වි. 'මෙ දනා'– මේ ජනයා. 'කිරි පිරි තන හැරූ'- කිරි පිරුණා වූ තන හැරූ දමා. 'කිරි දෙනා වැන්නා'– කිරි දෙවිනා වැනි යැ.

186. වි. 'නිසාසළ'– කිලුටක් නැති. 'දිව ඇස'- දිව්‍ය නෙත්‍රය. 'උදුළ'– බබළන්නා වූ. 'සත් ලොවට'- සත්ත්ව ලොකයට.

187. අන්‍වය: මෙර ගිරි සරි ගිරෙක් නැත. රිවි සඳ සදිසි පහනෙක් නැත. සිඳු සරි සරෙක් නැත. එ මෙන් මුනිඳු සරි උතුමෙක් නැත.

වි. 'මෙර ගිරි'– මෙරු පර්වතය. 'සරි'– සමාන. 'පහනෙක්'– ප්‍රදීපයෙක්. ආලොකයෙක්. 'සරෙක්'– විලෙක්.

188. අර්‍ථ: ඔහු නො වැඩියා වූ දෙශය දෙශයෙක් නො වෙයි. ඔහු දිශාවට නොනැමුණා වූ හිස හිසෙක් නො වෙ යි. ඔහු නුදුටුවා වූ ඇස් ඇස් නො වෙයි. ඔහු ගේ ගුණය නොවැකුණා වූ (නොගැවුණා වූ) වචන වචන නො වෙයි.

දෙශයකට යන්නට හෝ වඳින්නට හෝ දකින්නට හෝ ගුණ වනන්නට හෝ බුදුනට වැඩි සුදුස්සකු නැති යි කී පරිදි යි.

189. වි. 'වත'– මුඛය. 'එ සරණ'– ඔහු ගේ ශරණය (පිහිට.) සත'– සත්ත්වයා.

190. වි. 'ඔහු සිහි නොකළ' යි සබඳ කරනු. 'නොවත්'– නො වැදුණා වූ. 'ගුණ නොදත් පැන පැන නො වෙයි'– බුදුන් ගේ ගුණය නොදත්තා වූ ප්‍රඥාව ප්‍රඥාව නො වෙයි. 'ඔහු මුල් නොකළ පින'– බුදුන් ප්‍රමුඛ නොකළා වූ පුණ්‍යය.

191. වි. 'බව දුකට බටුවෝ' - සංසාර දුඃඛයට බැස්සෝ. 'එ මුනි සඳු දුටුවෝ (යමෙක් ද) මොක් සැපත දුටුවෝ ඔහු මැ වෙති' යි සම්බන්ධය කරනු. 'මොක් සැපත'- නිර්‍වාණ සම්පත්තිය. බුදුන් නුදුටු අය සසරින් නොගැලැවෙන බව ද දුටු අය නිවන් ලබන බව ද මෙයින් කී හ.

192. වි. 'සසර බැසැ විසුවෝ'– සංසාරයට බැසැ වාසය කළාහු.

193. අන්‍වය: මුනි බසැ රස නොදන්නෝ (යමෙක් ද) නොදන්නෝ ඔහු මැ යැ. ඔවුන් ගුණ දන්නෝ (යමෙක් ද) සග අපවග සැප දන්නෝ ඌ මැ යැ.

වි. 'නොදන්නෝ ඔහු මැ යැ'- අඥයෝ නම් ඔහු මැ යැ. 'අපවග'– අපවර්ගී. නිර්‍වාණ.

194. **අන්වය:** අන්ද මන්දෙ කිමෙකින් (දෙ) කුමන් දෙ නො දනිති. මුනි සරණ වැන්දෙ (යමෙක් ද) සැප සිඳු වැදූ කිමින්දේ උඹ මැ යැ.

අර්‍ථ: අඥ බාලයෝ (මේ) කිමෙකින් ද, කිමෙක් වී දූ යි නො දනිති. බුදුන් ගේ පාදය වැන්දහු (යමෙක් ද) සැප නමැති මුහුදට වැදී කිමින්දහු ඔහු මැ යැ.

**වි.** 'සැප සිඳු වැදූ කිමිදීම' නම් කිසි දුකක් නැති වැ සැපයෙහි මැ ගැලීම යි.

195. **වි.** 'පද තඹර'–පාද නමැති පද්මය. 'මුදුනැ ඇඳිලි බැන්දු'–මුදුනෙහි දෙහොත් බැන්දෙ යැ. 'අත් බැවෙහි'–ආත්ම භාවයෙහි. ජන්මයෙහි.

196. **වි.** 'දිටු කිලුටු වන්නෝ'-දෘෂ්ටිය කලිෂ්ට වන්නෝ. මිථ්‍යාදෘෂ්ටි වන්නෝ. 'සරණ වත්තෝ'–ශරණය කොටැ (පිහිට කොටැ) පැමිණියා හු. (යමෙක් ද) 'බව පර තෙරට'–භවයා ගේ කෙළවරට. නිර්වාණයට.

197. **අන්වය:** තම බස වන් සවන් (සතපා) (තම) රූ වන් දෙ නුවන් සතපා සැදැහෙන් වන් ලෙවන් මහ සැපත වත එ නිවන බහයි.

අර්‍ථ: තමාගේ වචනය වැදුණා වූ සත පිනවා, (තමාගේ) රූපය වැදුණා වූ දෑස පිනවා, ශ්‍රද්ධායෙන් පැමිණියා වූ ලොකයා මහත් සැපය වූ ඒ නිර්වාණයෙහි හෙළයි.

198. **වි.** 'සත'–සත්ත්වයා. 'මඟපෙලෙන්'-මාර්ගඵලයෙන්. සතර මඟ සතර ඵලයෙන්. 'පිනවන'–සතුටු කරවන්නා වූ. 'සරි වන'––සමාන වන්නා වූ. 'දෙවන කෙනෙක්'––දෙවන් කෙනෙක්.

199. **වි.** 'ඔවුන් මුත්'–ඒ බුදුන් විනා. 'ලොවට උතුමෝ නිති' යනු හා සබඳි.

200. **වි.** 'උන් උන් තැන් පුදු'-ඔවුන් හිඳැ ගත්තා වූ ස්ථානයට පූජා කොටැ. 'වන'–සිටින්නා වූ. 'බව දුක් මුදු යෙති'–සංසාර දුක මුදු (දුරු කොටැ) යෙති. 'උන් මහිම'–උන් ගේ අනුභාවය. 'පහඳු කියනු කිම'–විස්තර කොට කියනු කුමට ද?

201. **වි.** 'පය'––පාත්‍රය. 'පදලස් ඇති'––පාද ලාඤ්ඡනය (පද ලකුණ) ඇති. 'පහණ'–පාෂාණය. ගල. 'දුක් සිඳැ'–දුක් වනසා. 'ලබති'–'ලොක සත්ත්වයෝ' යි උක්තය සලකනු

202. **වි.** 'ඒ මොක් පුර වන් දූ යි'––ඒ (සර්‍වඥ තෙමේ) නිවන් පුරයට වන්නේ දූ යි. 'කුමන් දූ යි'–කිමෙක්දූ යි. 'නො කියව'–(මෙසේ සැක සිතා) නො කියව. 'තමා පද ගිරි තුරු දු වන්ද යි'–(හේ මුනි තෙමේ) තමා ගේ පාදය පර්‍වතයන් ලවා ද වෘක්ෂයන් ලවා ද වඳවයි.

203. **වි.** 'සතනට'-සන්තානයට. සිතට. 'මහ දහම්'-උත්තම වූ ධර්මය.

204. **අ වි:** (හේ) මිථ්‍යා දෘෂ්ටිය මුලින් ඉදිරී යැ; (ආර්‍ය්‍ය) අෂ්ටාඞ්ගික මාර්ග නමැති ඍජුවට වැපිරී යැ. ධර්ම නමැති ගංගා ජලය එළැවී යැ (පැමිණිවී යැ). ශාන්තිය ලෝකයෙහි පැතුරුණේ ඔවුන් ගෙන් යැ.

205. **අ වි:** දියෙහි මෙන් බිමැ ගිලෙත් හොත්, බිමැ මෙන් දියෙහි ඇවිදිත් හොත්, අහසෙහි ද එය මැ සොරෙත් හොත්, සමර්ථයෙක් ඒ බුදුහු විනා අනෙකෙක් නැත්තේ යැ.

206. **වි.** 'දිනැ දිනැ'-දවලෙහි දවලෙහි. නො බසින්නා වූ යැ යු සේ සි. 'දිනිදු'-සූර්‍ය්‍යයා. 'කර රස'-ක්ෂාර (ලුණු) රස. 'නොනැසි'-නොනැසුණා වූ සපිර වූ. 'විදු කිදු'--විදුලිය කාන්තියක්. 'වැජැඹි'-විජෘම්භමාන වී. පැවැත්තේ යැ.

207. **අ වි:** ලෙඩෙහි දිව්‍ය ඖෂධයක් සේ ද, වාලුකා කාන්තාරයෙහි පිපුණු විලක් සේ ද, දෙරක් දෙරක් පාසා පිහිටි කල්ප වෘක්ෂයක් සේ ද, දුකෙහි එක සේ පිහිට යැ.

208. **අන්වය:** මරණට ළං වැ සිටැ වැදැ හොත් එ සක් දෙව් දුට එ මැ වි ටැ එක බසින් තෙ කෙළ සැට සුවහස් ආයු දිනි.

**අ වි:** මරණයට ආසන්න වැ සිටැ වැදැ ගෙනැ හොත් තා වූ ඒ ශක්‍ර දෙවේන්ද්‍රයාට ඒ ක්ෂණයෙහි මැ එක වචනයෙන් තුන් කෝටි සැට ලක්ෂයක් (හවුරුදු) ආයුෂ දුන්නේ යැ.

**වි.** 'තෙ කෙළ සැට සුවහස් ආයු'-'සුවහස්' යනු සිය දහසට (ලක්ෂයට) නමි. ඇතැමෙක් මෙය 'තෙකෙළ සුවහස කට' සි ගෙනැ ශක්‍රයාට දුන් ආයුෂ එකුන් සැට ලක්ෂයක් අඩු කිරිමෙන් මහාපාපයක් කෙරෙති.

209. **වි.** 'තිදස පුරවර'-ත්‍රිදශ (දිව්‍ය) පුරවරයට. තෘතීය වූ යෞවන දශාව සියලු කල්හි වන හෙයින් දෙවියෝ ත්‍රිදශ නම් වෙති. 'වැඩි කලැ'-ගියකලැ. 'පවර'-ප්‍රවර. උතුම්.

210. **අ වි:** අටලොස් රියනක් වූ ශරීරය ඇරැ ගෙනැ අබ පියල්ල ඇතුළෙහි ගමනය කරත් හොත්, ශයනය කරත් හොත්, හිඳිත් හොත් සමර්ථයෙක් ඒ බුදුන් විනා වෙන නැත්තේ යැ.

**වි.** මෙහි සිවු ඉරියවුව නො කියැවිණ. අඩුවෙකි.

211. **අන්වය:** තිල බිජු පමණ ගතින් අළු, අනත් අපිරි යත් සියලු සක්වළ ඇම තැන් එක් එළි කළ සවනක් රැසින් උදුළ.

අර්: තල ඇටයක් පමණ ශරීරයෙන් නිකුත් කළ කලැ අනන්ත වූ අපර්‍යන්ත වූ සියලු චක්‍රවාටවලැ සියලු තැන් එකා ලෝක කළා වූ ෂඩ්වර්ණ රශ්මියෙන් උජ්ජ්වලිත වෙයි.

වි. 'අළු'-අසම්භාව්‍ය කෘදන්ත නිපාත යි.

212. වි. 'එළි කොට'-ප්‍රකාශ කොට. පහද. 'දෙසත'-දේශනා කරත් මැ. 'සිය බස ලෙස'-ස්වකීය භාෂාව සේ.

213. අර්: ඔහු (ඒ බුදුහු) ධර්ම දේශනා කරන විටැ ධර්ම මණ්ඩලයට වන්නා වූ ශබ්දය, පිරිස පමණට විනා එක අඟලකුත් (ඉන්) පිටතට නො යේ.

වි. ධර්ම මණ්ඩලය නම් දහම් අසන පිරිස රැස් වැ උන් ප්‍රදේශය යි.

214. වි. 'දෙරගුළු'-දෙර අගුළු. 'දිගු කළු කළු පයට'-දික් කළු කළු පාදයට. 'සත් බුමු පියුම්'--පෙති තල සතක් ඇති පද්ම.

215 වි. 'එ විගසේ'-(වඩින්නට වත්) ඒ ක්ෂණයෙහි. 'වළ ගොඩ'-මිටි තැන් උස් තැන්. 'දිව මල් වැසි වැසැ'--(වැසේ යනු එළි වැට රක්නා පෙරළියෙකි) දිව්‍ය පුෂ්ප වැසි වැසැ. (වැස්සක් මෙන් වැටී). 'මඟ දෙපසේ'-මාර්ගයේ උභය පාර්ශ්වය. 'සැදෙයි'-අලඞ්කෘත වෙයි.

'වැසේ' යන්නට ඇතැමෙක් 'වර්ෂනය වේ' යන අර්ථය දෙති. ඒ අර්ථයෙහි 'වැසේ' යනු සිංහල නො වේ.

216. **අන්වය:** මුනි සඳ උසේ යන මෙර සිරස වුවත් හිවු වේ බඩ අග සේ නැමී එ මැ සේ පද පිළි ගනී යැ.

වි. 'උසේ'-උසෙහි. උස් තැනකට. 'මෙර සිරස වුවත්'-('සිරසේ' යනු එළිය රක්නා පෙරළි යි.) මේරුහි මස්තකය වුව ද. 'හිවු වේ බඩ අගසේ'-පතුරු හළ වේවැල් බඩයෙ යෙකැ අගක් මෙන් පතුරු හළ වේවැල් බඩයෙහි අග ඉතා මෙලෙකි. එ හෙයින් වහා නැමෙයි. 'එ මැ සේ'-(බුදුන් පාදය) තුබූ සේ මැ.

217. වි. 'ඉදිති'-මේ ආඛ්‍යාතයනට 'ඔහු' (සඟහු) යනු උක්තය යි. 'කප් සිය දහස්'-කල්ප ලක්ෂ ගණන්. 'නරඹති'-(දිවැසින්) බලති. 'පිරි මදිති'-ස්පර්ශ කෙරෙත්.

218. **අර්ථ:** සම්බුදුයා ගේ පිරිවර (තම) චක්‍රවාට පර්‍යන්තය මහාමෙරුව පෘථිවිය (යන මොවුන්) එක් වර කම්පිත කරවා මහාප්‍රාතිහාර්‍ය කරන්නා වූ ප්‍රවර වූ සඞ්ඝ සමූහයා යැ.

219. **අර්ථ:** මේ සංසාරයෙහි පූර්ව කාලයෙහි අනෙක කල්ප කොටි ශත සහස්‍රයෙහි ස්කන්ධ පරම්පරායෙහි විශෙෂය දකින්නා වූ සඟ පිරිවර යැ. ඒ ඒ ජන්මයෙහි පඤ්චස්කන්ධය කොබඳු කොබඳු වී දූ යි දක්ම කඳ පිළිවෙළ වෙසෙස දක්ම යි.)

220. **අන්වය:** මහ සඟ ගණ (නුවණට) "ලක් තබතත් දෙරණැ පස් මඳ යැ" යන අපමණ මහ නුවණ ලැබැ ගෙනැ එ මුනි වෙතැ සිටිනි.

**වි.** 'ලක් තබතත්'—ලක්‍ෂ්‍ය කොටැ තැබීමට ද, (නුවණ) මැණ බැලීමෙහි දී ලක් කොට ගැනීමට ද. 'දෙරණැ'—පොළොවෙහි. 'මඳ යැ'— අඩු යැ. මහ පොළොවට වඩා අති ශයින් මහත් නුවණ ඇතැ යි යූ සේ යි.

221. **වි.** 'සත සිත'-සත්ත්වයා ගේ චිත්තය. 'සිත සේ දකිත'-සිත් වූ පරිදි දක්නා වූ 'දිව ඇස ලැබැ ගෙනැ'— ('ඇසේ' යනු කවර හෙයින් යෙදිණි ද?) දිව්‍ය නෙත්‍රය ලබා ගෙනැ.

222. **වි.** සතන-සත්ත්වයන්.

223. **වි.** 'විදසුන් මඟින්'-විදර්ශනා මාර්ගයෙන්. තත්ත්වය ඇති සේ දක්ම විදර්ශනා යි. 'සෙත ලැබැ'—නිර්වාණය ලබා. 'දියතැ'-ලොකයෙහි.

224 **වි.** 'මුදුනැ ඇඳිලි බැඳැ වැඳි සත'-මුදුනෙහි දෙහොත් බැඳැ වැන්දා වූ සත්ත්වයන්. 'සග මොක් සැපතැ ලත'-ස්වර්ග මොක්‍ෂ සම්පත්තියෙහි ලන්නා වූ තමන් වැන්දවුනට දිව සැප නිවන් සැප දෙන්නා වූ යැ යූ සේ යි.

225. **වි.** 'සේ සත්'-ශ්වෙතච්ඡත්‍ර. සුදු කොඩි. 'සක් පිඹිති'-ශඞ්ඛයන් පිඹිත්.

226. **වි.** 'මුනිඳු නා'-මුනීන්ද්‍ර නාගයා. මුනීන්ද්‍රොත්තමයා. මෙහි 'නා' යනු හස්ති පර්‍යාය යි. 'ගමන් ඔත'—ගමනට වැටුණු කල්හි. 'සිරි විඳුනා සුරිඳු රජ'-සම්පත්ති විඳින්නා වූ දිව්‍ය රාජයෝ. 'නල'-සුළඟ. 'විදුනා'-පතුරුවන්නා වූ. 'වල් විදුනා'-චාල ව්‍යජනයන්. චාමරයන්.

228. **වි.** 'සිතුමිණ'-චින්තාමාණික්‍යය. සිතූ පැතූ දෑය දෙන මිණ. 'මිණි තල් වට'-මණි තාල වෘන්තයන්. මිණියෙන් කළ පවන් පත්.

229. වි. 'දිව මලින්'-දිව්‍ය පුෂ්පයෙන්. 'පුදති' යි සබඳි. 'සිත් පලොළින්'-චිත්‍ර පාටලී (පුෂ්ප)යෙන්. අසුර ලොව චිත්‍ර පාට නම් වෘක්ෂය වෙයි. 'කඩුපුලින්'-නා ලොව කඩු පුල් මල් වෙයි. 'ගිරි තුරුදු'-පර්වතයෝ ද වෘක්ෂයෝ ද පවා. 'පුල් කමලින්'-පිපුණා වූ නෙළුම් මලින්.

230. වි. 'බඹ ලොව සිටැ බලත'--බ්‍රහ්ම ලොකයෙහි සිටැ බලත් නමුදු. 'මුදුනත'-හිස් මුදුන. 'අනොලොකිත යැ'-අනවලොකිත යැ. නො දක්නා ලද්දේ යැ. බුදුන් මුදුන කිසිවකු විසිනුදු බැලියැ හැක්කේ නො වේ.

231. වි. 'විසිතුරු'-විචිත්‍ර යැ. 'සරණතැ'-චරණයෙහි. පාද යෙහි. 'එ සුගත'-ඒ සුගතයා ගේ (බුදුහු ගේ) 'නෙතැ නෙතැ'-නෙත්‍රයක් නෙත්‍රයක් පාසා.

232. වි. දසට රියන් වූ බුදුන් කුඹා වූ ද ගෙයකට වදනා පරිදි යි.

233. වි. 'වුවනත'-මුහුණ.

234. වි. 'පුරවි වෙණ නදට ද වඩා'-කොවුලන් ගේ හා විණායෙහි ද හා නාදයට වඩා. 'නඳ වෙයි'-නන්‍දනිය වෙයි. සතුටු එළවන්නේ වෙයි.

235. අව: සක්වළෙහි (ප්‍රමාණය) ද, ආකාශයෙහි (ප්‍රමාණය) ද, (සතර අණ) සතර සාගරයෙහි පිරුණු දිය කඳෙහි ප්‍රමාණය ද දැනැ කියැ හැකි යැ. (එහෙත්) ඒ මුනි තුමන් ගේ ගුණ ප්‍රමාණ නො කළ හැකි යැ.

236. **අන්වය**: 'මෙ තැනට මේ වටී' කියන උතුරක් නො දිටි. එ වැඳැ වැටී ගතිත මුළු ලොවට බුහුටි එ මුනි මැ යැ.

236. අව: (ඒ සර්වඥ තෙමේ) 'මෙ තැනට මේ වටී' යනු කියන් මැ උත්තරයක් නො දුටුයේ ය. ('එයට වඩා මෙය මැනැවැ' යි කියන්නක් නො දුටුයේ යැ.) (ලොකයා) එය වැඳැ වැටී ගන්නා කලැ සියලු ලොකයට විශාරද වූ යේ ඒ සර්වඥයා මැ යි.

237. වි. 'සේ නො සේ කම් පල ඇ'-ස්ථාන අස්ථාන කර්ම ඵල ආදි. 'එම්බල'-එම්බා පින්වත. 'ඉන්'-එහෙයින්.

මෙයින් බුදුන් ගේ දස නුවණ බල දැක්විණ. එනම්-

238. අව: ලොකයෙහි ඇත්තා වූ කිසිවකු හට නිත්‍ය යෙන් දුකක් නොකරන නමුදු රූපයෙන් යුක්ත වූ ඒ මුනි උත්තමයා ඇතුන් කොටි සහස්‍රයකට (කාය). බලය ඇත්තේ යැ.

239. අ෴: දීපඞ්කර බුදුන් ගේ කාලයෙහි පටන් දශබල (බුදු) වන නොක් මැ මේ සතර අසඞ්ඛ්‍ය (කල්ප ලක්‍ෂයක්) කාලයෙහි එක උත්පත්තියකුත් නිෂ්ඵල නො කෙළේ යැ.

පාරමී ධර්‍ම පූරණයෙන් සියලු ජන්මයන් මැ සඵල කෙළේ යැ.

241. අ෴: (ඔහු) යදිනට දුන් ඇඟැ මස් පොළොව පස් පරයයි. (පරදව යි.) ඔහු දනයට දුන් ඉස් මහා මේරු පර්‍වතයා ගේ මුදුනට (වඩා) උස් වේ යැ.

242. වි. 'අතරේ'-අතර කාලයෙහි. 'මෙ සිවු සයුරේ'-මේ සතර සාගරයෙහි.

243. වි. 'සස කලේ'-ශශ (සා) වැ උපන් කාලයෙහි. 'සසල නොවැ'-චඤ්චල නො වී. පැකිළීමක් නැති වැ. 'සස ලේ'-ශශ ලෙබාව. සස ලපය. 'සිසි මඬලේ'-චන්‍ද්‍ර මණ්ඩලයෙහි. සිසි වූයේ සස ඇති හෙයිනි.

244. වි. 'මෙ කපැ'-මේ කල්පයෙහි.

245. වි. 'දස බල'-දශ බලයා. සර්‍වඥයා. 'අදිටනින්'-අධිෂ්ඨානයෙන්. 'උන් උන් වල'-උන් (බොධිසත්ත්වයන්) උන්නා වූ වනයෙහි.

246 වි. 'වනතැ'--වනයෙහි. 'වඩ්‍රින්'--තරඝාවාටයෙන්. 'එ මැ එකා'-ඒ එකා මැ. 'තම මරත'--තමා මරන කල්හි ද. (මෙහි මැරීම නම් පහර දීම යි.) 'මඟ පැ'-මාගීය දක්වා. 'මෙත'-මෛත්‍රිය.

247. අ෴: පිය රජ්ජුරුවන් නියම කළා වූ වධය කාමී කාරයා (වධකයා) හිස සිඳැ කරන කල්හි, මව (තමා) වැළඳැ ගෙනැ වලපින කල්හි, සත් මස් (වයස් ඇති) වැ ද (පියාටත්, වධකයාටත්, මවටත්) සමාන මෛත්‍රිය මැ කෙළේ යැ.

248. අ෴: (හේ) සිවි රජ වැ උපන්නේ ඇස් උදුරා දුන්නේ (ද,) සිතෙහි (වනාහි) පිරුණා වූ සන්තොෂය මැ දුන්නේ යැ. මේ වනාහි බුදුන් ගේ ගුණයෙකි.

249. අ෴: ඒ සුගතයා විධුර පණ්ඩිත කල්හි පූර්‍ණක (නම්) යක්‍ෂයා (තමන්) ගෙනැ (ගලින්) දමන කල්හි, ගල සැට යොදුන් උස ඇතැ සි වැටෙන අතරෙහි දී ගණින් දැනැ ගත්තේ යැ.

250. අ෴: ශාන්තිය එළැ වූ (දැමිණී වූ) සර්‍වඥ යා ගජේන්‍ද්‍ර වැ. වලෙහි සිටැ (තමා) විද්ද වූ වැද්දාට, ෂඩ්වර්‍ණ ප්‍රභායෙන් ජ්වලිත වූ දළ සිය අතින් කපා සතොසින් දුන්නේ යැ.

251. **අන්වය**:-දිව නයි වැ ද. නො මද වද කැරැ ගත විදූ රැගත, දිව විස තෙද ඇත ද, රැනැණි නො වැ සිල් රැක්කේ මැ වේ ද?

අර්ථ: දිව්‍ය නාග වැ ද, බොහෝ වධ කොට ශරීරය විදූ ඇරැ ගත් කල්හි, දිව්‍ය විෂ තෙජස් ඇති නමුදු කොප නො වී ශීලය මැ රැක්කේ වේ ද?

252. අර්ථ: ප්‍රවර වූ මහාජනක (රජ) වැ නැසුණා වූ ඵල හරිත වෘක්ෂය දැකැ සම්පූර්ණ රාජ ශ්‍රිය හැරැ ගොසින්, වනයට වැදූ තපශ්චර්යය (තපස් රැකීම) කොළේ යැ.

253. අර්ථ: මූනි වීරයා මෘග රාජ වැ (මුවන්) විදූ විදූ දිවෙන්නා වූ නර වීරයා (රජහු) ගැඹුරැ වළෙහි වැටුණා බලා (ඔහු) ගොඩැ ලා භය දුරැ කොළේ යැ.

254. **අන්වය**: වඳුරැ වැ වේ වැලක් ඉහැ බැඳැ ගඟ එතෙර පැනැ වානර සෙන් සමඟ ගඟින් එතෙර වැ යන්ට මඟ කෙළේ.

255. වි. 'වෙරැ'-ශරීරයෙහි.

256. වි. 'සීලව රද වරැ දූ,--ශිලව රජ (වූ) වාරයෙහි ද 'ගෙනැ'-අසිනි කොටැ ගෙනැ. 'සාරතුදු'-කරත කල්හි ද. 'සිල් මැ පිරිසුදු කොළේ'-(කොප නො කිරීමෙන්) ශීලය මැ පරිශුද්ධ කොළේ යැ.

257. **අන්වය**: සත සිත රඟ බලා පැවැසූ මඟ අනඟ දහම්, ස සගැ සැප සිදු කැරැ පස් දහස් වා එක රඟ සිටි

අර්ථ: (ආශය අනුශය ආදීන්) සත්ත්වයා ගේ චිත්තයෙහි ආකාරය බලා දෙශනා කළා වූ මහාර්ඝ වූ ධර්මය, පන් දහස් වර්ෂයක් (හවුරුද්දක්) ඒකාකාරයෙන් පවතී.

258. වි. 'නොමදිනි'-බෙහෙවින්. 'සදිනි'-සිතින්. 'දිනි'-දුන්නේ යැ. 'දුනි' යනු ව්‍යාකරණ නොදන්නන් ගේ යෙදුම්. මෙහි අගැ එළි දෙ පෙළිනුදු ඒ පෙනේ.

259. අර්ථ: මාර්ග ඵලයන් නියම කොටැ ඔහු (ඒ සර්වඥයා) කිවා වූ ධර්මයට පැහැදී මොක්ෂ පුරයට (නිවනට) වන්නා වූ සත්ත්වයන් විසි සතර අසඞ්ඛ්‍යයකට කියත්.

260. අර්ථ: ඒ (ඒ සර්වඥ තෙමේ) ඇසින් රළු බැල්මක් [හෝ] සිත ඇතුළතින් මඳවූ දෙම්නසක් [හෝ] අතින් කිසි ආයුධයක් [හෝ] නො ගෙනැ; මෛත්‍රියෙන් මාර සෙනාව දිනී යැ.

261. අර්ථ: ගණිතඥයන් ගේ [ගණිත දන්නන් ගේ] අතෙකින් [හෝ] පොතෙකින් [හෝ යම් කිසි] දෙයක් නො ඉගෙනැ

බැහැර කෙනෙකු ගෙන් [යම් කිසි දෙයක්] නො අසා මේ ලොකය [මතෙකින්] එක මතයෙන් [තමා ගේ මැ නුවණින්] දැනැ නිමැවී යැ.

සවයම්භූඥනයෙන් සියල්ල දත් බව මෙයින් කී හ.

262. වි. 'රහස ා'–රහසෙහි ද. රහසින් පවා. 'කෙලෙස් අර යනුත්'–[සංසාර නමැති රථ චක්‍රයෙහි] ක්ලෙශ නමැති අරයන් ද [දැවී ද]. 'දුරු කොට'–නැති කොටැ. 'පුදට නිසි වූයෙන්'–පූජාවට සුදුසු වූ හෙයින්.

263. වි. 'තුන් කල්හි මැ'–අතීත අනාගත වර්තමාන යන කාල ත්‍රයයෙහි මැ. 'අතැ ඇඹුල සේ'–හස්තාමලකයන් සේ. අතෙහි වූ නෙල්ලි දැනැ ගන්නා සේ. [නිසැක වැ.] 'සම්මා ස‍ම්බුදුනැ යෙති'–සම්‍යක් සම්බුදුන් යැ යි කියති.

264. වි. 'විද්දූ නැණ අට ද'––විද්‍යාඥාන අටත්.

'පසළොස් සරණ ගුණය ද'–පසළොස් චරණ ගුණයත්.

'පිරුණු විජ්ජා චරණ නම්':–'විජ්ජාචරණ සම්පන්නො' යන නාමය.

265. වි. 'යහපත් කොටැ'–යහපත් සේ. 'ගතැයි'–යති යි යන හෙයින්. 'සුන්දර'–යහපත්. 'සැපතැ යි'–සම්ප්‍රාප්ත වූ හ යි.

266. වි. 'තුන් ලොව'–කාම, රූප, අරූප වශයෙනුදු සත්ත්ව සංස්කාර අවකාශ වශයෙනුදු ත්‍රිවිධ වූ ලොකය. 'තතු ලෙසට'–තත්ත්වාකාරයෙන්. ඇති සැටි. 'නො ගත්'–දැනැ නො ගත්.

267. වි. 'නඳ'–සන්තොෂකර වූ. 'හැම ගුණයෙන්'–සියලු ගුණයෙන්. 'සම වැඩි සතකු'–සම වූ හෝ වැඩි වූ හෝ සත්ත්වයකු. 'දියතෙහි'–ලොකයෙහි. 'හැම දා නැති සඳු'–සියලු කාල්හි නැති හෙයින්. මෙසේ කී කලැ සමහර දා ඇති සේ හැඟෙන හෙයින් 'හැම දා' යන තන්හි 'හැම' යනු නුසුදුසු යැ. මෙබඳු තන්හි සුදුසු නම් 'කිසි' යනු යි.

268. වි. 'දමන සැරු'–හික්මවා. 'තමන් ලද සෙත් දී'–තමන් ලැබූ ශාන්තිය [නිර්වාණය] දී. [දීම හෙතු කොට ගෙනැ.] 'පුරිස දම් සාරති'–[පුරිස දම්ම සාරථි] දමනය කළ යුතු පුරුෂයන් දමනය කරන්නෝ යනු අර්‍ථ යි.

269. වි. 'බව කතරින්'–සංසාර නමැති කාන්තාරයෙන්. 'සත් තා'–සත්ථා. ශාස්තෘ. අනුශාසනය කරන්නේ යනු අර්‍ථ යි. 'පුව තර වී යැ'–ප්‍රසිද්ධ වී යැ.

270. අර්‍ථ: [ඒ සර්‍වඥ තෙමේ] චතුස්සත්‍යය ස්වකීය ඥාන යෙන් දැනැ, කාරුණායෙන් [අනුනුදු] දැන්වී යැ. අවිද්‍යායෙන් [නොදැන්මෙන්] ඇතැ ලයි. ඒ [මේ කියන ලද] ගුණ ප්‍රමාණ යෙන් බුදු නම් වී යැ.

271. පි. 'දහම් කඳ'– ධර්මස්කන්ධය. ධර්ම සමූහය. 'බෙදූ යෙන්'– බෙදූ හෙයින්. 'භජනය'– සෙවනය. 'භග දහමින් සසඳ බැවින්'– භග ධර්මයෙන් යුක්ත හෙයින්. භග ධර්ම නම් ඓශ්වර්ය, පුණ්‍ය, යශස්, ශ්‍රී, සංකල්පසිද්ධි, ප්‍රයත්න, යන මේ සය යි.

272. 'මිරිවැඩි'– වහන්. 'වළ ගොඩ'– මිටි (හෝ) උස් (හෝ.) 'මිහි පිටැ එක විටැ වැදූ නැගෙන'– පොළෝ මතු පිට එක් වරැ මැ වැදී (එක් වරැමැ) නැගෙන්නාවූ. සියලු පතුල එක් වරැ භූමිය ස්පර්ශ කෙරෙති යි කී සේ යැ. මේ 'සුප්‍රතිෂ්ඨිත පාද' නම් ලක්ෂණය යි.

273. පි. 'දෙ පතුලැ'– පාද තල දෙකෙහි. 'නැබ නිම් නිමල දිසි'– (චක්‍ර) නාභිය ද නිම් (වළලු) ද පිරිසිදු ලෙස දෘශ්‍යමාන වූ. 'අර'– දැවි. 'මනකල'– මනඃකල්‍ය. චිත්ත ප්‍රියකර. 'සිය අටක්'– එක් සිය අටක්. 'රුවින්'– මඞ්ගල ලක්ෂණ රූපයෙන්. මඟුල් ලකුණිනැ යුු සේ යි. මේ චක්‍ර නම් ලක්ෂණය යි.

274. අර්‍ථ: පතුල සතර කොටසක් කොටැ (ඉන්) එකක් විලුඹට බෙදීමෙන් (බෙදීම හෙතු කොටැ ගෙනැ) අප ගේ මුනීන්ද්‍රයාට දිළියෙන්නා වූ රතු කම්බිලි වට (පන්දු) මෙන් දීර්‍ඝ වූ විලුඹු යැ. ආයත පාර්ෂ්ණි ලක්ෂණය යැ මේ.

275. අර්‍ථ: මුනිවරයා ගේ (ඇඟිලි වනාම)ප්‍රමාණය අඩු වැඩි නුවූ හිඟුල් (සාදිලිංගම්) කරල් සේ ප්‍රභාස්වර (බබලන් නා)වූ මොලොක් වූ දික් වූ අග සිහින් වූ මනොහර වූ රත් ඇඟිලි යැ. මේ දීර්‍ඝාඞ්ගුලී ලක්ෂණ යි.

276. අර්‍ථ: පිටි පසැ (හෝ) ඉදිරි පිටැ හෝ දැත්වරැ (දෙ අත් පසෙහි හෝ) සිටැ බැලුව ද යටි පතුල් පෙනෙන සේ උස් වී සිටියා වූ බොලට මුනීන්ද්‍රයාට වෙයි. මේ උත්සඞ්ඛ පාද යි.

277. අනවශ: මුලින් දළු, අග සිහින්, මස් එකරඟ වට වැ සිටි, සොඳුරු හැල් ගප් රඟ මුනිඳු යුග දඟ මන දඟ කෙරෙයි.

අර්ථ: මුලින් මහත් (වූ) අග සිහින් (වූ) මස් එකාකාර යෙන් වට වැ සිටියා වූ, සහපත් ඇල් වී (කරල්) ගප් වැනි වූ මුනීන්ද්‍රයා ගේ උභය ජඞ්ඝාව (ජඞ්ඝා දෙක) සිත හිර කෙරෙයි. (සිත බඳී.) මේ එණිජඞ්ඝ ලක්‍ෂණ යි.

278. අන්වය: දිව නෙතින් දිළි මුනි,ගතින් නියතින් කුදු මිටි නො වී නො නැමී සිටැ,දෙ අතින් දෙ දණ පිරිමදිනේ යැ

පි. 'දිව නෙතින්'– දිව ඇසින්. 'ගතින්'– ශරීරයෙන් නියතින්– එකාන්තයෙන්. දීඝ හස්ත ලක්‍ෂණ යි.

279. අන්වය: මුනි අතැ පයැ ලකළ පැහැදුල ඇඟිලි, ඇදුරකු විසින් කළ නිකසල දැල් කවුළු සේ, සම අතුරු වෙයි.

අර්ථ: මුනීන්ද්‍ර ගේ අත්හි ද පයෙහි ද අලඞ්කෘත වූ ප්‍රභා ජ්වලිත වූ ඇඟිලි, ආචාර්යයකු විසින් කරන ලද නිරවුල් වූ ජාල කවුළු මෙන්, සම අතර ඇත්තේ යැ. ජාල හස්තපාද යි.

280. අර්ථ: අප ගේ මුනීන්ද්‍රයාට (ඇත්තේ) සියක් වරු පොළො, ප්‍රසන්න වූ (පැහැදුණු වූ) ගිතෙලෙකැ යටැ බැහූ කපු පුළුනක් සේ මොලොක් අත්පා යැ. (මෘදු තරුණ හස්ත පාද ලක්‍ෂණ යි).

281. අර්ථ: නෙළුම් (මල්) පෙති ඇතුළතට වැදී සිටින් නා වූ කෙමියා මෙන් ශරීරය ඇතුළතට වැදී සිටින්නා වූ පුරුෂ ලක්‍ෂණය මුනීන්ද්‍රයාට ඇත්තේ යැ. කොෂාවහිත වස්ත්‍රගුහ්‍ය ලක්‍ෂණ යි.

182. අර්ථ: මුනීන්ද්‍රයාගේ රූපය (ල) අලුත් වූ සාදිලිංග මින් මැදූ, කොටි දත් ලා ඔප නගා ගුරු ගැමෙන් අලඞ්කෘත වූ නොකිලිටි වූ රන් රුව වැන් නැ.

283. අර්ථ: ජලය අල පතෙහි (නොරඳන) ලෙසින්, සියලු කල්හි දූලි තෙල් ධූලි ශරීරයෙහි නොරඳන්නා වූ ආකාරයට සියුම් වූ ඡවිය මුනීන්ද්‍රයාට ඇත්තේ යැ. මේ සූක්‍ෂම ඡවි ලක්‍ෂණ යි.)

284. අව: දුටුව හොත් ප්‍රෙමය වෙයි. දක‍ා දක‍ා (ද දක්මට ඇති) රූවිය නො යේ මැ යැ. මුනිඳුයා ගේ ශරීර යෙහි රෝම දෙකෙක් එක් තන්හි නොසිටින්නේ මැ යි.

එකෙකරෙම ලක්‍ෂණ යි.

285. අව: මුනිඳුයා ගේ ශරීරයෙහි, නීලමණි රශ්මි තරඞගයන්(නිල් මිණි රස් රළ)විහිදුවා සිටියාවූ මනොරම්‍ය වූ සියලු රෙමයන් වළලු වැටී අග්‍රය උඩු බලා සිටි.

ඌර්ධ්වාග්‍ර රෙම ලක්‍ෂණ යි.

286. අව: මුනිඳු ගේ රූපය, නෙත්‍රයන් නෙත්‍රයන් පාසා ප්‍රියකර වැ, සවිර වූ සාර ගුණයෙන් වජ්‍ර (සමාන) වැ මහා බ්‍රහමයා ගේ රූපය මෙන් මෘදු වැ ඍජු වැ සිටි.

වි. 'තිරසර ගුණ'– සවිර වූ සාර ගුණය නම් ශක්තිය යි. බ්‍රහමජු ගාත්‍ර ලක්‍ෂණ යි.

287. වි. 'නහරැට'– නහරද ඇට ද. 'උසට පිරුණු මස්'– උස් වැ පිරුණා වූ මාංස. මෙසේ සත් තැනෙකැ මස් උස් වැ සිටි. සපෙතාත්සද ලක්‍ෂණය යි.

288. අව: හිමාලය වනයෙහි සිංහරාජයා ගේ ශරීර යෙහි පූර්ව භාගය පිරුණුවන් වේ. ලෝකයට වැඩ (සල සත්නා) වූ මුනිඳුයා ගේ පූර්ව භාගය ද පසු භාගය ද පිරුණේ වේ. සිංහ පූර්වාර්ධකාය ලක්‍ෂණයි.

289. අඞය: කටියෙහි පටන් කොට කදට* දක්වා, රන් පලගක් ලෙසට සම කොටැ පිරුණු මස් මුනිඳුට ඇත්තේ යැ.

වි. 'කටියෙහි පටන් කොටැ'– ඉගෙහි පටන් ගෙනැ. 'කදට'– ග්‍රිවාව, බෙල්ල, (කන්ධරය). 'රන් පලගක් ලෙසට'– සවර්ණ ඵලකයක් (පල්හක්) සේ. 'සම කොටැ පිරුණු මස්'– වළ තැන් නොඩ තැන් නො දක්වා පිරුණා වූ මාංසය. චිතාන්තරාංශ ලක්‍ෂණය යි.

'රන් පලසක් ලෙසට' යි ඇතැමුන් අනිත් ලා ගන්නා පාඨය හාස්‍යජනක යැ.

290. අඞය: මුළු තුන් ලෝ වියත් දනයන් නොවියත් කරන මුනිඳුන් ගේ, කයත් බඹයක් දිගින් එක පමණ වෙයි.

අර්: සකල ලොකත්‍රයයෙහි ව්‍යක්ත (පණ්ඩිත) ජනයන් අව්‍යක්ත කරන්නා වූ බුදුන් ගේ ශරීරයත් බඹයක් දිගින් එක ප්‍රමාණ වෙයි. න්‍යග්‍රොධ පරිමණ්ඩල ලක්‍ෂණ යි.

බුදුනට සමාන කරනු කලැ අන් සියලු වියත්තු නොවියතුන් සේ පෙනෙති.

291. අර්: සද්ධර්මය දෙශනා කරන කාලයෙහි (ද) නාහර නොඉපිලියා වූ (මතු නූණා වූ) ප්‍රභාසාර වූ බුද්ධ ග්‍රිවාව සවණි මෘදඞ්ග හෙරියක් මෙන් මනා සේ වට වැ සිටී.

වි. 'ඉපිලි'– 'උපුල්' ධාතු යි. උපුලී–උපුලීත්– ඉපිලි–ඈ විසින් ද ඉපිලේ– ඉපිලෙත්– ඉපිලීණි– ඉපිලුණු– ඈ විසින් ද වරනැගේ. සමවෘත්තස්කන්ධ ලක්‍ෂණ යි.

292. අර්: මුනීන්ද්‍රොත්තමයා ගේ උගුරෙහි සත් දහස් රස නාහර අග(තුඩු) පුරා (ගෙනැ) සිටි හෙයින්, ශරීරය සවලා ආහාරයෙකින් පොෂණය වෙයි. රසග්‍රාසාග්‍ර ලක්‍ෂණ යි.

293. අර්: මුනීන්ද්‍රොත්තමයා ගේ (වනාහි) දෑලොස් වක් චන්‍ද්‍රයා ගේ මණ්ඩලය (ද) සිංහ රාජයා ගේ හනු (ද) පරදවා, එක සේ පිරුණා වූ හනු දෙක යැ. දෑලොස් වක් සඳට ද සිංහ හනුවට ද වඩා බුදු හනුව පිරුණු බව කී සේ යැ.

සිංහ හනු ලක්‍ෂණ යි.

294. අර්: (අවශෙෂ)ජනයාට දෙ ඇන්දෙහි පිහිටියා වූ දත් තිස් දෙකෙක් වේ යැ. මුනීන්‍ද්‍රයාට උස් (නො වැ) මිටි නො වැ මනා සේ පිහිටියා වූ දත් සතලිසෙකි.

වි. 'රුවට'– මනා සේ, දශීනීය පරිදි.

චත්වාරිංශද්දන්ත ලක්‍ෂණ යි.

295. වි. 'ගා'– සණ ගල් ආදියෙහි ගා. 'සක් පත් විල සින්'– ශඞ්ඛ පත්‍ර (හක් පෙති) මෙන්. සමදන්ත ලක්‍ෂණ යි.

296. අන්‍වය: මුනි විරු දත්, සොඳුරු තෙලි තුඩෙකින් ඇඳි හිරි ලෙසින් අතුරු මඳකුත් සිදුරු නො වැ විදුරු සේ සිටි යැ.

වි. 'තෙලි'– තුලිකා. සායම් කොස්ස. 'හිරි'– රේඛා. 'අතුරු පෑ'–(දෙ දත්) අතර දක්වා. බෙදුම් දක්වා. 'විදුරු'– වජ්‍ර.

අවිවර– දන්ත ලක්‍ෂණ යි.

•

297. අර්‍ථ: මුනීන්‍ද්‍රයා ගේ (වනාහි), දිව්‍ය නදියෙහි (අහස් ගඟෙහි) රළ පරිද්දෙන් මනොඥ වූ සුදු රශ්මිය දස දිගෙහි විහිදින්නා වූ සතර දංෂ්ට්‍රා ධාතු යැ.

සුශුක්ල දංෂ්ට්‍රා ලක්‍ෂණ යි.

වි. 'සුරගඟ තරඟ'– අහස් ගඟෙහි දිය සුදු යැ. 'දළ'– සතර මහ දත් 'දළ'– නම් වේ. නවීනයෝ මේ සතර බලු දත් යි කියත්.

298. අර්‍ථ: මුනීන්ද්‍රොත්තමයා ගේ (වනාහි,) දෙකන් සිදුරෙහි දී දිඝත්වය පෙන්වා, නාසය තුළෙහි දී මොලොක් බව දක්වා, පළල කරණ කොටැ ගෙනැ මුඛ මණ්ඩලය (සම්පූර්ණ මුහුණ) වසන්නා වූ ප්‍රභායෙන් ජ්වලිත වූ ජිහ්වාව යැ.

දිව ඉතා දික් වන බැවින් දෙ කන් සිදුර පිරිමැදියැ හැකි යැ; ඉතා මොලොක් වන බැවින් නාසා තුළට පිවිසියැ හැකි යැ; ඉතා පළල් වන බැවින් මුහුණ වැසියැ හැකි යැ.

ප්‍රභූත ජිහ්වා ලක්‍ෂණ යි.

•

299. වි. 'මිහුරැයි'– මධුර යැ යි. 'බස මැඬැ'– වචනය මර්‍දනය කොටැ. (නැති කොටැ). 'තුඩැ තුඩැ තුති දෙවා'– කටින් කටැ සතුති වචන කියවා. බුදුන් ගේ මිහුරු කට හඬ ඇසූ සියල්ලෝ එයට තුති කෙරෙත්.

බ්‍රහ්මස්වර ලක්‍ෂණ යි.

300. වි. 'රස'– රශ්මිය. 'සරි කොට'– සමාන කොටැ සමාන කොටැ නො කිය හැක්කේ මෙය එයට වඩනා හෙයිනි. 'පහන්'– ප්‍රසන්න වූ. අභිනීල නෙත්‍ර ලක්‍ෂණ යි.

301. වි. 'එ කෙණෙහි උපන්'– උපන් විගසැ මැ. 'මනරඟේ රතු වස්සකු ගේ'– මනොඥ වූ රතු වස්සකු ගේ. 'ඇසිපිය ගුළි රඟේ'– ඇස් ගුළි මෙන්. ගොපක්‍ෂම ලක්‍ෂණ යි.

302. අ*: අප ගේ මුනින්‍දුයාට (වනාඟි,) රියනක් දිගව ඇදූ හැරිය කල්හි චන්‍ද්‍ර මණ්ඩලය මෙන් වට (වන්නා) වූ, (දෙ) බැම මැද්දෙහි නළල මතුයෙහි දිලෙන්නා වූ ඌර්ණා රෝමය යැ.

ඇදී කලැ රියනක් දික් වෙයි. හළ කල්හි දරණු ගැසී වට වෙයි. ඌර්ණාරෝම ලක්‍ෂණ යි.

303. අ*: අප ගේ මුනීන්‍ද්‍රොත්තමයා ගේ (වනාඟි,) දිය බුබුළක් මෙන් මනා වැ වට වැ ගෙනැ සිටියා වූ, නීල මණි රශ්මි ආකාරයෙන් බැබැළියා වූ ශීර්ෂය යැ.

උෂ්ණීෂ ශීර්ෂ ලක්‍ෂණ යි.

304. වි. 'බඳ'– ශරීරයෙහි. 'පහන් තුරු සේ'– ප්‍රදීප වෘක්‍ෂයක් මෙන්. පාත් ගසක් සේ.

305. වි. 'ජන'– ජනයා. 'මනොරංජන කරවන'– සිත් ඇලැවීම කරවන්නා වූ 'නිරංජන මුනිඳු ගෙ'– නිරඤ්ජන (රඤ්ජනයක් හෙවත් ඇල්මක් නැත්තා වූ) මුනීන්‍ද්‍රයා ගේ. වීතරාග වූ බුදුන් ගේ. 'අනුවැංජන'– අනුව්‍යඤ්ජන. අනු වැ පිහිටි ලකුණු.

306. වි. 'තම වන දෙසැ'– තමන් වන්නා වූ (ඉන්නා වූ) දිශාවට. •'කෙනකුන්නෝ'– අන් කෙනකුන් ගේ. 'වඳිනා ලෙස'– වඳිනා ආකාරයෙන්. 'යස තුති කළ'– කීර්ති ප්‍රශංසා කළා වූ. 'වතට'– මුඛයට. 'පිරිදෙව්'– පරිදෙවනය, හැඬීම.

307. වි. 'හැම දොම්නස් දුක්'– සියලු දෞර්මනස්‍ය දුඃඛය. මෙහි 'කිසි' යනු යෙදියැ යුතු තන්හි 'හැම' යනු යෙදූ සේ නො මැනැවි. හැම දොම්නස් දුක් වැද්දූ නො දේ නම් සමහර දොම්නස් දුකක් වැද්ද දෙන බව හැගෙයි, 'උපත ම'– උත්පත්තිය මැ. තමන් ගේ උත්පත්තිය මැ හෙතු කොටැ ගෙනැ දනන් ගේ ලෙඩ සුව වූ බව කී සේ යැ.

308. වි. 'පැදේ යා'– මෙහි ශුද්ධ රූපය 'පැදූ'– යනු යි. එළි වැට රක්නා පිණිස මෙසේ විරූප කැරිණ. 'පැදූ'– පැහැදී. 'සිගමනකට'– මෙහි භාවයෙහි 'මන්'– ප්‍රත්‍යය යි. පිසමන්. යනාදිය ද මේ පසින් නිපන.

309. වි. 'සිහිලැල්'– ඉතා සිහිල් වූ. 'සිහිල්'– යනු ද 'ඇල්'– යනු ද එකාර්ථ යි. අධික වචනය අධිකාර්ථයක් ගෙනැ දේ. 'ගිම්'– ග්‍රීෂ්මය: 'මඩවා ලී යැ'– මර්දනය කොටැ ලූයේ යැ. නිවවා ලී යැ. 'ඒ මුනි'– යනු උක්තය සේ සැලැක්යැ යුතු. 'වියවුල් සත'– (ශෝකාදීන්) ව්‍යාකූල වූ සත්ත්වයන් ගේ. 'ඝන බොල්'– ඉතා ඝන වූ. 'මහඩින්'– මහ අඩින්. මහ හඬින්. භූමිය කම්පිත කැරැවී යැ යූ සේ යි. මෙසේ කැරැවූයේ කවර දිනෙකැ ද? 'එ බුදුන් බුදු වත්'– යන්නෙන් ඒ නිර්දිෂ්ට යි.

310 වි. 'මුහුදු ද'– මුහුදෙහි ද 'රත්'– රක්ත වූ. රතු වූ 'පබෙර'– සුදු. 'පුප්' පුෂ්පයන්. 'ගැවැස් වී යැ'– ගැවැසී ගත්ත සැලැස්වී යැ. 'වැස්වී යැ'– වාසය කැරැවී යැ.

311. වි. 'අට තුරු සිය'– අෂ්ටෝත්තරශත. අට තුරු සියක්. අටක් වැඩි සියයක්. 'සුබ ලකුණෙන්'– මඟුල් ලකුණෙන්. 'සිරිමත්'– ශ්‍රීමත් වූ. 'එ බුදුන්'යි සබඳි. 'බව දුක් යට කැරැ'– සංසාර දුඃඛය යටපත් කොටැ. 'බුදු වත්'– බුදු වත් මැ. බුදු වන කල්හි. 'ඝන ගිනි දල් ගත්– ඝන වූ වහ්නි ජ්වාලාවන් විසින් ගන්නා ලද. 'සියපත් අවුල් වියැ'– ශතපත්‍රාකුල වී යැ. නෙළුම් මලින් ආකුල වූයේ යැ.

312. වි. 'පේත ලොවේ'– ප්‍රේත ලෝකයෙහි. 'සා ගිනි දුක්'– ක්‍ෂුධාග්නි දුඃඛය බඩ ගිනි දුක. 'මුල් සිදැ'– මූලොච්ඡින්න කොටැ. මුලින් මැ නසා. 'බුදු වන සඳ' යි සබඳි. 'බුදු වන සඳ දුක් මුල් සිද' යි ඇතැමෙක් අන්වය වරදවා ගෙනැ වියරණ නසා අරුත් බෙණෙති. 'භීත කරන'– භීත කරන්නා වූ. බිය වද්දන්නා වූ. 'ලෝ දිය'– ලෝහෝදකය. 'උන්'– ඒ ප්‍රේතයන් ගේ. 'එ මැ සඳ'– ඒ ක්‍ෂණයෙහි මැ. 'මිහුරස'– මධුර රසය.

313. අන්වය. අවි ගත් යමපල් නන්දන කෙළි වන දනවන නන් බලවත් කම් කටුලින් බිය පත් නන් දන වන අසි පත් වන, සුර සෙන් කෙළි නන්දන වන සිරි ගත්.

අර්. ආයුධ ගත්තා වූ නිරය පාලකයන් ගේ (නන්දන) ප්‍රීතිජනක ක්‍රීඩා වන්නා වූ (දනවන) උපදවනු ලබන්නා වූ (නන්) නානාවිධ වූ බලවත් වූ වධයෙන් භයප්‍රාප්ත වූ නානා

ජනයන් වන්නා වූ අසිපත්‍ර වනය (නම් වූ නරකය) දිව්‍ය සේනාවන් ක්‍රීඩා කළා වූ නන්දන වනයේ (සිරි) ආකාරය ගත්තේ ය.

වි. 'නන්දන කෙළි වීන'–මෙ බඳු වනුයේ බලවත් කම් කටුලු යැ. 'දනවන'–'දන' ඉපැනුම්හි ධාතු යි.

314. අන්වය. සත් වග වෙත් මහ මෙතට අමාවට උන් අමා වට බුදු බවට පත් වත, නිරි සත් මුවට අමාවට පත් වන දිලි රත් යවට අමාවට පත් වියැ.

අර්ථ. සත්ත්ව වර්ගයා කෙරෙහි මහා මෛත්‍රිය පිණිස ද අමායාව 'නො රැවැටිල්ල) පිණිස ද ඔවුන් (ඒ බුදුන්) අමෘතය වැස්සා වූ (නිවන් ගෙනැ දුන්නා වූ) බුද්ධභාවයට ප්‍රාප්ත වත් මැ (පැමිණි කල්හි,) නිරය සත්ත්වයන් ගේ මුඛයට ආමය (වෙදනා දුඃඛය) පිණිස පත් වන්නා වූ (ගිනි ගෙනැ) දිලිහුණු වූ රත් වූ (යාවට) අයොගොල (ලොහො ගුළි) අමෘතභාවයට (අමා බවට) පත් වී යැ.

වි. 'මහ මෙතට අමාවට'–උන් බුදුවූ වූයේ සත්ත්වවර්ගයා කෙරෙහි මහා මෛත්‍රිය කරණ කොටැ ගෙනැ යැ. සත්ත්ව වර්ගයා ගේ අමායාව් හෙවත් නො රැවැටීම සඳහා යැ 'අමා වට බුදු බවට'–මෙහි 'අමා'නම් නිර්වාණය යි. අසංඛ්‍ය ජනයාට නිවන ගෙන දුන් හෙයින් ඒ 'අමා වට බුදු බවෙකි 'වස්' (වර්ෂණයෙහි) ධාතුව වසී– වසිති– වපි– වටු ඈ විසින් වර නැගේ අනත්‍යස්වරලොප අකාරයොගයෙන් 'වට' යනු වෙයි. "නිරි සත් මුවට අමාවට'–මෙහි 'අමා' නම් ආමය ය යි. මෙහි (වෙදනා දුඃඛය) යනු අර්ථ යි. 'යවට'–මෙහි 'වට' යනු දූකැ දූකැ මැ ඇතැමෙක් අයොශූලයැ යි අරුත් බෙණෙති. 'ශූල' නම් හුලයි. 'අයඃ ශූල' යනු 'අයොශූල'යි. සන්ධි කළ හැක්කේ සංස්කෘත ව්‍යාකරණානුකූල වැ නො වේ.

315. අන්වය: තුඹුල් වන ගිනි දූල් විසිරැ බියකරු, තුල් වන කටු සොළොස් අඟුලින් නිරතුරු ඔහුපත් නිර අතුරු, පිහිටි දුඹුල් වන, සත සතොසැ උපුල්වන සුර තුරු වියැ.

වි. 'තුඹුල් වන'– මහත් වන්නා වූ. 'තුල් වන'– ස්ථූල (විශාල) වන්නා වූ. 'කටු සොළොස් අඟුලින් නිරතුරු' – කටු අඟල් සොළොසින් (අඟල් සොළො සේ කටුයෙන්) අතරක්

නැත්තා වූ 'ඔසුපත් නිර අතුරු'– උතසද (නම්) නිරය ඇතුලෙහි. 'සත'– සත්ත්වයා. 'උපුල්වන' – 'සන්තාෂයෙහි' ඉපිලී යන්නට සලස්වන්නා වූ.

•

316. අන්වය: කරවැල් අවුලින් දග වන තිරිසත් යම පල් බිළියෙන් ලගැ ලගැ අදනා ඇම කල් දල අවුල් වේතරණී ගඟ සුර ගඟ විලසින් සිහිල් ඇල් දිය විය.

වි. 'කරවැල් අවුලින්'– කියත් දත් වැනි කටු ඇති වැල් අවුලින්. 'දග වන'– හිර වන්නා වූ. ඇවිණෙන්නා වූ. 'බිළියෙන්'– බිළි කටුයෙන්. 'දල අවුල්'– වහ්නිජ්වාලාකුල වූ. 'සිහිල් ඇල් දිය විය'– අතිශීත ජලය ඇත්තේ වී ය.

317. අන්වය: නිති ගිනි ගෙනැ රත් ගන ගොල් යකබල්, ඇම කල් සිලිලැ ඔත් මෙන් සිහිල් ඇල් වත්, ගිනි දල් ලෙළ් දිය ලෙළ්කුඹු නිරයත් මනකල් මල් අවුල් පිරි කුඹු සිරි ගත්.

වි. 'යකබල්'– අයඃ කපාලයන්. අයොමය භූමිභිත්ති ආදිය. 'සිලිලැ ඔත් මෙන්'– ජලයෙහි හොත්තා මෙන්. 'වත්'– වන කල්හි. ගිනි දල් ලෙළ් දිය'–ගිනි දල් ද ලෙළ්දි ය ද ඇති. 'මල් අවුල් පිරි කුඹු'–පුෂ්පාකුල වූ පූර්ණ ඝටයෙකැ (පිරුණු කළයෙකැ.)

•

318. වි. 'සක්වළ අතුරැ'– චක්‍රවාටාකාරයෙහි. 'එක රහට මැ' – එකාකාරයට මැ. 'ලොවැදිරි නිරයේ'– ලොකාන්තරික නරකයේ. 'වත් මෙන්'– වැදූණා සේ පිවිසියාක් මෙන්.

31 . වි. 'හිමවතැ'–හිමාලයයෙහි. 'මෙර ගිරි කුල ගිරි සිරසේ'– මෙරු පර්වත කුල පර්වත ශීර්ෂයෙහි. මෙර වටා සිටි සපත පර්වතයෝ කුල ගිරිහු යැ. 'එකබදසේ'– එකාබද්ධ පරිදි.

320. අර්‍ථ: (බුදුහු) උරගයන් ගේ ශරීරයෙහි රැස් වූ ධූලීන් මයුරයන් ගේ පිච්ඡකලාපයෙන් පිස්වූ හ(පිසැ දැම්මූ හ;) දිවියන් ගේ ක්‍රීඩා මණ්ඩලයට රැස් වූ මුවන් ගේ අං දළුයෙන් (ඒ දිවියන් ගේ) ග්‍රීවාව කැස්වූ හ.

'දෙන්නේ' 'දුන්නේ' 'දේ' 'මඩවා ලිය' යනාදීන් පෙරැ එක බසින් කියා දුන් බුහු බසින් කියනසේ නො මැනැවි.

වි: 'දුනුලින්' – දෙවනා විබත් බුහුබසී. 'වෙහෙලුන්'– 'වෙහෙල්' යනු මෘග විශෙෂයකට නමි.

321. අව. 'අරණේ'– අරණ්‍යයෙහි. වනයෙහි. 'සතපා' නිඳි ගන්වා. 'උන්' – ඒ උරගුන් ගේ 'සහවුන්' – සාවුන්. 'එ කෙණේ' – එකක්‍ෂණයෙහි. එක් වෙලාවෙහි මැ.

322. වි. 'වණ වූ'– ව්‍රණ ඇත්තා වූ. තුවාල වූ. 'ඔසු ඇණෑවූ' – ඖෂධ නියමය කැරුවූ හ. 'සෙනෙහසැ එක පණ වූ'– සෙනහයෙහි ලා එකප්‍රාණ වූ. සෙනහයෙන් එක පණ මෙන් වූ. 'මිහිවුන්'–මහිෂයන්. අශ්වයෝ ද මහිෂයෝ ද උනුන් හට වෛරි වෙති.

323. වි. 'අරතර' – මහත්, 'දිවදුන්'– දිවාන්ධයන්. බක මූහුණන්. 'වෙර' – වෛර.

324. අන්වය. කෙසරුැන් නිය පදුරින් ගෙනැ ඇරැ දුන් රස ගොදුරින් ගිජිදුන් සනහා ලූ. ගිජිදුන් කර පොකුරින් ගෙනැ වත් කළ දිය දහරින් කෙසරුැන් ගිම් දුරු ලූ.

•

වි. 'කෙසරුැන්' – කෙසරුන්. සිංහයන්. 'නිය පදුරින්'– නඛපඤ්ජරයෙන්. 'කර පොකුරින් – සොඬ අගින්. සොඬය ඇතාට අතක් වනුයෙන් 'කර' නමි. සොඬ අගට පොකුරු (පුෂ්කර) යනු යෙදෙයි.

325. අන්වය. ගොළුවන් කී මිහුරස ගී ලෙසට බිහි රන් දෙන අත්තල තාළුමට දෑ අඳුන් ඇසැ දුන් රස අඳුන් ලෙසට නාන් පිළි දුන රුැවට රඟ කැරුවූ.

වි. 'අත් තල තාළුමට'– හස්තතල (ගසන්නා වූ) තාලයට. සිංහල තන්හි 'වා' යනු ජනපද රැකෙන පිණිස කැරුණු දිගි. 'දෑ අඳුන්'– ජාත්‍යන්ධයන් ගේ 'ඇසැ දුන් රස අඳුන් ලෙසට'– ඇසෙහි දුන්නා වූ රසාඤ්ජන සේ. ඇසට අතිශයින් ප්‍රියකර සේ. 'නාන් පිළි' දුන,– නොයෙක් කොර

ජනයන්. ගොළුවන් ගේ ගීතයට අනු වැ බිහිරෝ අත්තල ගසති එයට අනු වැ කොරු නටති. ඒ නැටුම් ජාත්‍යන්ධයන් ගේ ඇසට රාසාඤ්ජනයක් වැන්නැ.

326 වි. 'වැදැ'– වැදී ප්‍රවිෂ්ට වැ. 'මිනිස් අත් බව'– මනුෂ්‍ය ආත්මභාවය. මනුෂ්‍ය ජන්මය.

327. ඞි. 'මැදැ හල මෙන්' – මැදූ හැරියා මෙන්. 'නිකසළි වී' – පිරිසිදු වී යැ. 'නිකසළ' යන්නට එළි පිණිස අගැ 'ඉ' යන්නෙක් වී යැ 'සිවු සයුර නිසල වැ අම රස ඇතිළි වී'– සතර සාගරය නිශ්චල වැ අමෘත රස (පිරූ) ඇතිළියක් වී යැ. කාර රස නැති වැ ඉතා මිහිරි රස වූ හ යි යු සේ යි. 'ගත් පුද කෙළි වී' – ගත්තා වූ පූජා ක්‍රීඩා ඇත්තේ වියැ.

328. අං. සියලු තුන් ලොකයෙහි ගෙයක් ගෙයක් පාසා හරන, ලද දෙර ඇති වැ, ජනසමූහයන් වධබන්ධනයෙන් තොර වැ, සියලු තැන් දිව්‍ය සුගන්ධයෙන් මනොහර වැ, මේ ආකාරයෙන් සියලු ලොකයෙහි මහාප්‍රාතිහාර්‍ය වී යැ.

ප්‍රථම පාදත්‍රයයෙහි 'වී' යනු ආඛ්‍යාතයක් කොට ගන්නාහු ව්‍යාකරණය වනසති. 'දන කැන්' යනු එකවචනාඛ්‍යාතයක් නො ගනී.

329. වි. 'එ බසින් බසට මැ'–ඒ වචනයෙන් වචනයට මැ. වචනයක් පාසා. 'තුති නද කරවා'– ස්තුති නාද කරවා. අසා සිටියාහු වචනයෙන් වචනයට මැ ස්තුති නාද පවත්වති. 'පිරිසිඳ' – පරිච්ඡෙද කොටැ ගෙනැ. සීමා කොටැ ගෙනැ. 'අහසින්'– එක පිණි බිඳ බානා මෙන්'– බුදු ගුණ අනන්ත වෙයි. මේ මැතිඳු බුදු ගුණ කිම අහසින් එක පිණි බිඳක් බැවා වැන් නැ.

330. ෆ. 'සුබැසි තෙපුලෙන්'– සුභාෂිත වචනයෙන්. මනා ලෙස කී වචනයෙන්. 'නිරිඳු ගෙණෙ'– නරෙන්ද්‍ර සමූහ තෙමේ. 'පිළිවිසී'– බහු වචන රූප යි. 'පුළුවුස්' ධාතුව පුළුවුසී – පුළුවුසිති.– පිළිවිසී– ඈ විසින් වරනැගේ. අතීත යෙහි දෙබස් සම යැ.

333. වි. තුන්ලොව සියල්ලන් එක් වැ නුවණ ලැබැ ගෙනැ කියතුදු බුදුගුණ අපමණැ යි යු සේ යි.

334. අ.ඡ. දශ පාරමිතාවන් නිරන්තරයෙන් සාරාසඞ්ඛ්‍ය කල්ප ලක්‍ෂයක් (මුළුල්ලෙහි) ඔවුන් (ඒ බුදුන්) සේ (මැ) නුපුරා, ගුණ රාශිය කෙසේ කියැ හැකි ද.

එසේ පැරුම් පිරුව ද නො කියැ හැකි බැවින් මෙය කී සේ නො මැනැවි.

335. වි. 'නොපහන්'– නොපැහැදුණු. ප්‍රසන්න නුවූ. 'කියත්'– කියත් හොත් 'හිමි'–සීමාවක්.

336. අ.ඡ. බුද්ධ ගුණ නමැති මහාසමුද්‍රය සියලු කල්හි නුදුටු පරතෙර ඇත්තේ යැ. (සෙස්ස සුගම යි )

337. අ.ඡ. බුද්ධ ගුණය සියලු ආකාරයෙන් පොළොවෙහි පස් ආකාරයෙන් දෘශ්‍යමාන යැ. මේ ආකාරයෙන් මා කී ගුණය ඒ පොළොවින් නිය අගින් ගත් පස් වැන්නැ.

වි. 'සැම ගින්'– සියලු ආකාරයෙන්. 'ගි' යනු ආකාරාර්‍ථයෙහි වැටේ.

338. අ.ඡ. බුද්ධ ගුණ නමැති මහාආකාශයෙහි (වනාහි) කෙළවරක් නොදක්නා ලද්දා වූ දශ දිශාව (වේ)යැ. මා කීවා වූ බුද්ධ ගුණ ලෙශය (ටික) මක්‍ෂිකා පක්‍ෂයෙන් (පියාපයෙන්)සොයන ල ද(වසන ලද) ආකාශ කුක්‍ෂිය වැන්නැ.

339. වි. 'සිත්තුට නිරිඳෝ'– සිත සතුටු වූ නරේන්‍ද්‍රයෝ. 'පුර කුලැ පුවත්'– (උපන්) පුරයෙහි ද කුලයෙහි ද ප්‍රවෘත්ති.

340. අන්වය: එ සඳැ මැතිවර, කුල, පරපුර, ඉසුරු පිරිපුර, පිරිවර, රුසිරිසර වරගන සරා මෙ ලෙසින් කියයි

අ.ඡ: එ කලැ මන්ත්‍රිවර (තෙමේ,) කුලය (ද) පරම්පරාව (ද) ඓශ්වර්‍ය්‍යයෙන් පිරුණා වූ පුරය (ද) පරිවාරය (ද) රූපශ්‍රී සාර වූ උතුම් සත්‍රීන් (ද) සරහා (වර්‍ණනය කොට) මෙසේ කියයි.

341. අ.ඡ: බ්‍රහ්ම උත්පත්තියෙන් සම්ප්‍රාප්ත වූ (බ්‍රහ්මයන් ගෙන් පැවැතැ ආවා වූ,) පෘථිවියෙහි මනුෂ්‍ය ලොකයට

ශාන්තිය කොටැ (ශාන්තිය කිරිම හෙතු කොටැ ගෙනැ) මනුෂ්‍යයන් විසින් සම්මත කළා වූ (තෝරා ගන්නා ලද්දූ වූ,) මහා සම්මත (නම්) නරෙන්‍ද්‍රයෙක් වී යැ.

342. වි. 'සක්විති ඉසුරු'– චක්‍රවර්ත්ති ඓශ්වර්‍ය්‍යය (සම්පත්තිය.) 'සැදුම් ලද'– හෙබියා වූ; අලඞ්කාර වූ. (350 වන පද යෙහි 'රජ පර පුරින්'– යන්නට විශෙෂණ යි.)

343. අව: දෙවියනට කුලදෙවතා වූ ශක්‍ර දෙවයා ගේ පදවිය (තනතුර) ලද්දූ වූ, (මහා) මන්‍ධාතු නර දෙවයා ගේ කුල ධොවනය (කුලය සේදීම) කළා වූ කිත් නමැති ජලස්කන්‍ධයෙන් ප්‍රසන්න වූ– 350. පරපුරින් යන්නට විශෙෂණ යි.

වි. 'කුල දෙවි'– කුලය රක්නා දෙවි. 'කුල දෙවි කිත් දිය කඳින්'– මන්‍ධාතු නර දෙවයන් ගේ කීර්ත්තියෙන් ජලස්කන්‍ධයෙකින් මෙන් කුලය ශුද්‍ධ වියැ. මේ, නරපතියා කරණ කොටැ ගෙනැ ඒ රජ කුලය බැබැලුණු බව කී සැටි යි.

344. අව: සියලු සක්වළැ වැජැඹුණා වූ, දුර්ගුණයෙන් නොකැලැඹුණා වූ, බොධි සත්ත්ව ගුණයෙන් දෘඪ වූ (බඳනා ලද්දූ වූ,) මහා සුදර්ශන රජයන් ගෙන් හෙබියා වූ (අලඞ්කාර වූ)– (351. 'පරපුරින්'– යන්නට විශෙෂණ යි.)

345. අව: පාදයෙහි නිය රැස් නමැති මාල්‍යයන් (මල් දම්) නරෙන්‍ද්‍රයන් ගේ මස්තක මාල්‍යයන් කළා වූ, ලොකයෙහි ජය කොඩි බැන්දූ වූ, ප්‍රසිද්ධ මඛාදෙව රජයන් ගෙන් බැබැළුණා වූ– (150 පරපුරින් යන්නා හා සබඳි.)

වි. 'පද නිය............මුදුන් මලි කළ'– අන්‍ය නරෙන්‍ද්‍රයන් ගෙන් වැඳුම් ලද බව කී පරිදි යි. අන්‍ය රජයෝ හිස් බිමැ ඔබා මොහු වඳිති. මොහු ගේ නිය රැස් ඔවුන් ගේ හිසට වැටි මුදුන් මල් මෙන් වේ.

346. අව: දිශා නමැති යෂ්ටින්හි (රිටි වලැ) රඳන්නා වූ කීර්ත්ති නමැති ලතාව බ්‍රහ්ම තලයට ගොස් දුවැටුණා වූ, ලෝකයෙහි අවගුණයන් අල්ප කළා වූ ප්‍රවර වූ නිමි නරෙන්‍ද්‍රයා ගෙන් සුප්‍රතිෂ්ඨිත වූ– (150 'පරපුරින්'– යනු හා සබඳි.)

නිමි රජුගේ කීර්ත්තිය ලතාවෙකි. ඒ ලතාව රඳන්නේ දිශා නමැති රිටිවලැ යැ. ඒ ලතාව වැඩී ගොස් බ්‍රහ්ම ලොක

යෙහි ද දැවැටුණේ යැ. රජුගේ කීර්තිය අවටින් සියලු දිශා යෙහි ද උඩින් බ්‍රහ්ම ලෝකයෙහි ද පතළ බව මෙයින් කියැවිණ.

347. වි. 'ගිගිණි'– ගහන වූ. 'බිදැ'-- භගන කොටැ. පරදවා. 'අග මිණි'– අග්‍ර මාණික්‍යය. අෂ්ටවඞ්ක මාණික්‍යය. 'සැපැමිණි'– පැමැතැ ආවා වූ.

348. වි. 'අව බිය නැවැත්වූ'– සත්ත්වයන් පාපයෙන් වැළැක්වීමෙන් අපාය භීතිය නැවැත්වූ. 'රම්'– රාම. 'සසිරි මත් වූ'– යහපත් ශ්‍රීයෙන් යුක්ත වූ.

349. වි. 'සිවු සගරු'– සතර සඞ්ග්‍රහ වස්තුව.

350. වි. 'පත'– පැමිණියා වූ. 'කිඹුල් වතැ'– කපිල වාස්තුයෙහි ඇතැමෙක් 'කපිල වස්තු'යි ලියති. එහෙත් එ නමින් නුවරෙක් ලොවැ නො වී යැ.

352. වි. 'අම පල එක අයුරේ ගත්'– අමෘත ඵලයක් හා ඒකාකාරය ගත්තා වූ. 'පිය තනතුරේ'– බුදුන් ගේ පිතෘ ස්ථානාන්තරයෙහි. 'ඔහු පිත්'– ඔහු ගේ දූතු වූ.

353. වි, 'සරද දෙ‍ාතා'– ශරත් කාලයෙහි චන්ද්‍රයා. 'දෙ‍ා' නම් තාරකාවෝ යැ. ඔවුනට නායක බැවින් චන්ද්‍ර දෙ‍ාතා නම්. 'යසසින් ලොවැ සුද ඕනා'– කීර්තිය කාරණ කොටැ ගෙනැ ලොකයෙහි සුද (සුදු පැහැය)වත් කරන්නා වූ. කීර්තිය සුදු යැ යනු කවි සමය යි. 'සිතැ කිලුටු'– සිතෙහි රාගචෛතනාදිය. 'දෙ‍ාතා'– ධෞවනය (සේදීම) කරන්නා වූ. 'සුදෙ‍ාතා'– ශුද්ධෝදන.

354. වි. 'එ පිරු'– ඔහු (බුදුහු) විසින් පූරන ලද.

355. වි. 'එ පින් පල දෙනු කොටැ'– ඒ (පිරූ) පින් පල දෙන්නට සලස්වා. ඒ පින් පල දීම් වසයෙන්.

357. වි. 'අඳුන් සක්'– අඤ්ජන ශාක්‍ය.

358. වි. 'තමායා'– තමා ගේ. මෙහි 'යා' පාද පූරණ යි 'ලෝ අමා (යා) සරි කළ'– ලොකයට අමෘතය සම්පාදනය කළා වූ. මායාවන් ගේ රූපශ්‍රීය මැ ලොකයට අමෘත වූ හ යි කී සේ යැ. 'නෙතට මායා වන්'– ඇසට මායාවක් (ඇස් බැඳුමක්) වැනි වූ.

359. වි. 'පිළිසඳ'– ප්‍රතිසන්ධි. 'සකස්'– මනා සේ. 'මැඳි පෝ දා'– පූර පසළොස්වක් පොහෝ දා. මාසයෙහි මැද වන බැවින් ඒ මැඳි පෝ දා නම්.

360. වි. 'අඩු කොටැ'– ලඝු කොටැ. දුටුදුටුවන් ගේ සිතට හැඟෙනුයේ ඒ රජ සැපතඹ සක්විති සැපත අඩු බව යි. 'ඉඳු ලෙසට'– ඉන්ද්‍රයා (ශක්‍රයා) සේ.

361. වි. 'සව් සුදු'– සියලු අන්දමින් මැ සුදු (ශුභ්‍ර.)

363. වි. 'දිගත'– දිශාන්තය. 'දිගු ඇසින්'– දික් වූ ඇසින්.

364. වි. 'මහ සබව්'– මහා සභාව. මහා සමූහය. 'සබව හෙන තෙපුලෙන්'– සැබෑව (සත්‍යය) හෙනනා වූ (වැගිරෙන්නා වූ) වචනයෙන්.

365. වි. 'නුබ කුසැ පලග බැඳැ ඉඳැ'– අකාශ කුක්ෂියෙහි පර්‍ය්‍යඞ්කය බැඳැ හිඳැ. පර්‍ය්‍යඞ්කය බැදැ හිඳීම නම් හසර වර්‍ණය බැඳැ හිඳීම ය. බොධි සත්ත්වයන් වප් මඟුල් දිනයෙහි අහසට නැගැ සිටියහ යි යන වැරැදි මතයට බුදුගුණ අලඞ්කාර කාරයන් ද වහල් වූ බව පෙනේ. 'පිය සිරස නම්මා'– පියා ගේ හිස නම්මා. පියා ලවා වන්දා.

367. වි. 'හිම'– හෙමන්ත. 'වසන්'– වර්‍ෂා (වසන්ත.)

368. වි. 'තෙසු'– සෙසු, ඉතිරි.

369. වි. 'කසුන් රුව මෙන්'– (කාඤ්චන) රන් රුව මෙන්. 'ගමනින් හසුන් මන් සුන්'– යන ලීලායෙන් හංසයන් ගේ මානය සින්දා වූ. හංසයන් ගේ ගමනට වඩා යහපත් ගමන් ඇති වූ. 'වුවොවු හට'– (වුව + ඔබු + හට.) 'සුදසුන්'– සුදර්‍ශන වූ. මනා දැකුම් ඇති. 'වුව'– වුවා යැ.

370. වි. 'මුන්'– මොවුන් ගේ. යශොධරාවන් ගේ. 'වරලස කලඹ'– කෙශ කලාපය. 'වරලස' යන තන්හි 'අස' යනු නිරර්ථක යි. 'නුදුටු නො ඇසූ සුබ මුහුල'– නොදක්නා ලද්දා වූ නො අසන ලද්දා වූ ස්වභාවය ඇති කෙශකලාපය.

371. වි. 'ඉඳුනිල්'– ඉන්ද්‍රනීල නම් මැණික් වර්‍ගය.

373. වි. මෙහි පූර්වාර්ධය ව්‍යාකුල යැ.

374. වි. 'කුඹු'– කුම්භ. කල. 'කලොත්'– කල හොත්. 'බඹසර'– බ්‍රහ්ම චර්‍ය්‍යය. උසස් හැසිරීම. කාමසේවනයෙන් තොර වැ විසීම. 'තහවුරු'– ස්ථිර. උන් ගේ පයොධරයන් කරන්නාහුට ඒ පයොධරයෝ පෙනෙති. එ කලැ බලවත් ආශාව උපදී. එයින් බඹසර බිඳෙයි.

375. අර්ථ: මොලොක් වූ ඉතා ශිතල වූ වස්තූන් එක් කොටැ මවා (එය) ප්‍රභාවට පැමුණුණ හොත් මූන් ගේ කොමල අත් ආකාර යැ. බලව. උපමාවක් සොයත් හොත් අනෙකෙක් නැත්තේ යැ.

මොලොක් මැ වූ ඉතා සිහිල් මැ වූ වස්තු එක්කොට ඇඹූ කල්හි ද එය ප්‍රභාවත් නොවියැ හැකි යැ. ඉදින් ප්‍රභාවත් ද වූව හොත් එ මැ මූන් ගේ අත් වැන්නැ.

376. අර්ථ: ෂඩ්දන්ත (හස්ති) කුම්භ ආකාර වූ පයොධර භාරය උසුලන්නා වූ ඉඟෙහි නිබොරු (සත්‍ය) වූ කෘශත්වය (සිහින් බව මෙපමණ යැ යි) කිවත් කවුරු අදහා ගනිත්.

එතරම් පියොවුරු බර උසුලන ඉඟ මෙතරම් සිහින් වියැ නොහැකි හෙයින් සැබෑ සිහින කීවත් නො අදහති යි යූ සේ යි.

377. අන්වය: තුනු සිරි රුවට කැරැ, කල කම් වෙසෙස එළි කොටැ දුන් කළු ගූ ලෙසට මූන් වසා රොද මොනවට වැජැඹී.

අර්ථ: ශරීර ශ්‍රිය මනා අන්දමින් කොටැ, කළා වූ කර්මයා ගේ විශෙෂය ආලොක වන සේ දුන්නා වූ කළු ඉරක් මෙන මූන් ගේ වසා රොද මනා සේ පැවැත්තේ යැ.

වි. 'එළි කොටැ'– වර්ණ කර්මක්ෂෙත්‍රහි කළු ඉරක් වැටුණු කලැ, වර්ණශොභාව අධික වෙයි. 'වසා රොද'– ළ මැද්දෙහි පටන් ගෙනැ උදර මධ්‍යයෙන් පහතට විහිදූ ගිය රොම රේඛාව.

378. අර්ථ: පෙරැ බ්‍රහ්මයා කළා වූ කෙසෙල් කඳ යැ ගජ (හස්ති) හස්තය යන කර්මාන්ත නො මැනැවැ යි සියල්ල දුරු දමා, මනොහර වූ මැය ගේ වටොර මැවූ වැන්නැ.

379. වි. 'උන්මතු කල'– උමතු කළා වූ. 'රන් උතු'– රනින් කළ උතු. 'පොල් උතු කටුව'– යනු පොල් කටුවට නම්. 'උතු' යන්නෙහි ස්වරූපය මින් දත හැකි යැ. 'සරි නොවත'– සමාන නොවන හෙයින් දුන් යුතු (සුදුසු) උවම් නැත' යි සබඳි. 'දුට'– දුටුව හොත්.

381. වි. 'රූ සයුරේ පතුල් නො පෑ'- රූප සාගරයෙහි පත්ල නොදක්වූ. අප්‍රමාණ රූප සෞන්දර්යයෙන් යුක්ත වූ. 'ලොබ තුල් සොරෙයි'- ලොභය මහත් සොරෙයි. 'තුල් කැරැ'- තුල්‍ය (සමාන) කොටැ.

382. අර්‍ථ දෙ ඇස නො වසා (මැ) දකා (ද) සිතෙහි ආශාව නොයන පරිදි රූපය මෙසේ (මෙහි) ඇති කලැ, නර ලොව යැ සුර ලොව යැ සි වෙනස කිම් ද?

383. අර්‍ථ: මනුෂ්‍යයක් ලෙසින් තම ඇසු පමණට (මැ) ලොභය වත් හොත්, මුන් ගේ රූපය ඇසට වන්නේ නම් ස්වර්ගී මොක්‍ෂ (සුඛය) ලැබීම උගහට යි.

384. වි. 'පෙම්බරින් බැඳුණෝ'- ප්‍රෙම භාරයෙන් බැඳුණාහු.

385. වි. 'රිවි කුල කොත්'- සූර්‍ය වංශයට මුදුන් වූ.

386. වි. 'ස සගින්'- ෂට් ස්වර්ගයෙන්. 'තුනුවගින්'- (තුනු + අඟින්) සිහින් ශරීරයෙන්.

387. අර්‍ථ: නො නවත්වා මැ දස දිගෙහි ද භවාග්‍රයෙහි ද කිත්‍තිය පෙන්වා, ස්වර්ගයෙහි සම්පත්තිය අඩු කළා වූ (ස්වර්ග සම්පත්තියට අධික වූ) ගිහි ගෙහි (ගෘහවාසයෙහි) විසි නව වර්‍ෂයක් විසී යැ. දස දිගට භවාග්‍රය ද අයත් බැවින් මෙහි වරදෙක් පෙනේ.

388. වි. 'සක කුල අඹර ළ සඳ'- ශාක්‍ය කුල නමැති ආකාශයෙහි බාල චන්‍ද්‍රයා වූ. 'කුමරු' යන්නට විශෙෂණ යි.

389. වි. 'ඉසොරු මැඳුරතට'- යශොධරාව ගේ මන්‍දිරයට. 'පය ඇඳු'- පාදය ඇඳ ගෙනැ. 'සත් මැතිඳු පසු කොටැ'- ඡන්න අමාත්‍යයා තමාට පසු කොටැ හිඳුවා ලා.

392. අන්වය: දිගු බිත පහන් කැරැ, මිණි දඹු වැට පහන් ගත, සිත පහන් එ හිමි ද නොපහන් රැ තිස් යොදන ගෙවා-

අර්‍ථ. දිශා ප්‍රදෙශය ආලොක කොටැ මිණි දඹු වැට පහන් (මිණි දඹු විලක්කු) ගත් කල්හි, චිත්‍ත ප්‍රසන්න වූ ඒ ස්වාමියා ද එළි වන්නට පෙර රැ පස් යොදන පසු කොටැ-

393. අන්වය: තඹසිළුන් මත රව සහ අරුණු රස් පතර වැ, රිවි රතතර වැ එත, අනෝමා නම් ගඟින් එතර වැ-

වි. 'තඹසිළුන්'- කුකුළන් ගේ. තඹ වන් සිළුවක් ඇති හෙයින් කුකුළු තඹසිළු නම්. 'මත රව'- මත්ත රාවය. ප්‍රීති නාදය. 'පතර වැ'- ප්‍රසාරිත වැ. පැතිරී. 'රතතර වැ'- ඉතා රත් වැ.

394. **අන්වය:** දස පැරුමන් බුහුටි නොකිලිටි සිතෙහි පිරුණෙන් හළ කෙලෙස් එවි දිගැටි සොස් වැටි මගුල් සාඩුවෙන් සාපා -

**වි.** 'දස පැරුමන් බුහුටි'- දශ පාරමිතාවන් ගේ ප්‍රාගල්භ්‍යය (ප්‍රගල්භ බව.) 'පිරුණෙන්'- පිරුණු හෙයින්. 'හළ කෙලෙස් එවි'- (බැහැරට) හරනා ලද ක්ලේශයන් වැනි වූ. සිතෙහි දස පාරමිතාවන් ගේ බුහුටිය පිරුණු හෙයින් ඉඩෙක් නැත. එ හෙයින් ක්ලේශයෝ බැහැරට හරනා ලද්දේ යැ. එසේ හරනාලද කෙලෙසුන් මෙන් කෝශයෝ වූ හ.

395. **වි.** 'පිය කරණ වැ'- ප්‍රිය කරණ වැ. ප්‍රියයට හෙතු වැ. 'පමණ වැ'- ප්‍රමාණ වැ. අඩු වැඩි නො වැ. 'සසර මහ අණව'- සංසාර නමැති මහා අර්ණවය (සාගරය.)

396. **වි.** 'පිළිවෙත'- ප්‍රතිපත්ති‍ය. පිළිපැදීම. 'පබඳින්'- ප්‍රබන්ධයෙන්. නොකඩ වැ. 'ලදින්'- ලබ්ධියෙන්. ඇදැහීමෙන්.

397. **වි.** 'මැඳුම් පිළිවෙතැ'- මධ්‍යම ප්‍රතිපදායෙහි. කාම සුඛල්ලිකානුයොග අත්තකිලමථානුයොග යන අන්තද්වයයට නොගියා වූ ප්‍රතිපත්තියෙහි.

398. **වි.** 'දිව ඔද'-දිව්‍ය ඔජස්.

399. **වි.** 'කිරි පිඬු'- කිරි බත්. 'එකුන් පනසක්'- එකක් අඩු පනසක්. සතලිස් නවයක්. 'සුබ නිමිති දැක්මට' ශුභ නිමිත්තයන් දක්නා පිණිස.

400. **වි.** 'පැළ දිග'- බස්නාහිරි දිශාව.

401. **වි.** 'මිහි ඉරු'- පොළොව ඉරු ගෙනැ. 'තුදුස් අත්'- දස සතර රියන්. 'සිවු ඉටන්'- සතර අධිෂ්ඨානය.

402. **වි.** 'තුමුල් නලැ පත්'- මහත් වාතයට පැමිණියා වූ.

403. **අර්.** පූර්ව යාමයෙහි දී පූර්ව කාලයෙහි අනෙක කල්ප කොටි ශත සහස්‍රයෙහි ස්කන්ධ පරිපාටි විශෙෂයෙහි පැවැත්තා වූ මොහාන්ධකාරය (අවිද්‍යා නමැති අඳුර) මුලින් දුරු කොටැ- පෙරැ විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ ලැබැ යැ යූ සේ යි.

404. **අර්.** මධ්‍යම යාමයෙහි දී දිව ඇස ලැබැ, ජනයන් සමූහයා ගේ ච්‍යුති ප්‍රතිසන්ධි දැකැ, අනාගත කාලයෙහි පැවැත්තා වූ මොහාන්ධකාරය වහා (අහක් කොටැ) දමා-

**405. වි.** 'සූ විසි පසාකර'- චතුර්විංශතිවිධ ප්‍රත්‍යයාකාරය- 'වත් මන් කල් අතර වැසුණු'- වර්තමාන කාලාන්තරය වැසුණා වූ.

406. **අර්:** පෙරළ බුදුවරු, සියල්ල දුටු ලෙස අත් නො හැරළ මැ දක්නා වූ ඥනයෙන්, අප්‍රියම්හි දී සකල ඥෙයයන් (සියලු දත යුතු දෑ) සොළවර කොටැ, අසමසම වූ බුදු වැ-

**407. අර්:** කිරි පිඬු එකුන් පනසින් වැළැඳුවා වූ අමෘත රසය කරණ කොටැ ගෙනැ විශෙෂයෙන් සත් සතියක් අන්‍ය ආහාරයක් කැමැත්තෙන් නො ගොස්-

**408. වි.** 'සදමින්'- සද්ධර්මයෙන්. 'අදමින්'- අධර්මයෙන්. 'සවන් රස්'- ෂඩ්වර්ණ රශ්මිය. 'විදමින් - විහිදිමින්, 'බඹ යැදමින් - බ්‍රහ්මයා ගේ ආරාධනයෙන්. 'යැදමෙන් සි වියැ යුත්තේ එළි පිණිස විරූප වී.

**410. වි.** 'සිතැ කෙලෙසුන් මූනන් රහතන්'- සිතෙහි ක්ලෙශයන් මිදුණා වූ අර්හතුන්.

**411. වි.** 'තවුසන් - උරුවෙල කාශ්‍යපාදි තාපසයන්. 'දහස් තුන් පන්සියක්'- තුන් දහස් පන්සියක්. මෙසේ මැ යෙදී යැ හැකි කලැ පෙරළි කොටැ යෙදීම සිතා බලා අවුල් කිරීමෙකි.

412. **වි.** 'පිරිවර සමූද සමඟ'- පරිවාර සමූහයා සමඟ. 'බව බැඳුමෙන්'- භව (සංසාර) බන්ධනයෙන්.

**413. වි.** 'බට සක් රුවන සේ'- බැස්සා වූ චක්‍රරත්නය මෙන්.

**415. වි.** 'ඇතුළු පිටි නුවරා පිරි මහ සෙන්'- මෙ සේ අන්වයය වෙයි.

**417. වි.** 'නිවන් පුර නම් මෙ යැ යි යන සේ'- නිර්වාණ පුරය නම් මේ යැ යි දක්වන්නා සේ.

**418. වි.** 'පළොල් සල් මල් වතු' පළොල් සල් (වෘක්ෂයන් ගෙන් යුත්) කුසුම උද්‍යාන. 'පන්සල්'- (වාසය පිණිස) පර්ණශාලා. 'පළ'- මහත් වූ. 'හෙළ'- සුදු වූ. 'වාසල්- ද්වාර.

**419. අර්:** බ්‍රහ්ම විමානයක් වැනි වූ, කිඞකිණිකා ජාල ද මුක්තාලතිකා ද ඉහිල් (ශිථිල) වැ එල්ලෙන්නා වූ, අති විශාල මතු මහල් (ද) මහත් වූ පාද (ස්තම්භ ද) ඇත්තා වූ ප්‍රාසාද පඞ්ක්ති යෙන් මනඃකල්‍ය වූ-

420. අ\ව: තාරකා සහිත වූ ආකාශය වැනි වූ, දිවා රාත්‍රි දෙක්හි රත්නයන් දිළිසෙන්නා වූ, අමෘත ආකරය වැනි වූ වෙළුවන නම් විහාරය කොටැ–

421. වි. 'දිය පොළොව පිරිසිඳැ'– ජල පොළොව පරිච්ඡේද (හිම්) කොටැ. 'එක බඳ'– එක සේ.

422. වි. 'තුන් දෙස්'– රාග, ද්වෙෂ, මොහ යන දෙෂ තුන. 'පින් කෙතෙහි'– පුණ්‍යක්‍ෂෙත්‍රයෙහි. මහා සඞ්ඝයා විෂයයෙහි.

423. වි. 'දහම් සක්'– ධර්ම නමැති ශඞ්ඛය. 'පද සුර බඹුන් සුම්බා'– (තමන් ගේ) පාදය දිව්‍යබ්‍රහ්මයන් ලවා සුඹුවා (සිඹින්නට සලස්වා.) 'සුඹු' ධාතු සි. සිඹි - සිඹිති - සිඹි - ඈ විසින් වරනැගේ. 'පුඹු' ධාතුව ද මෙබඳු යැ. සුඹු + වා = සුම්බ් වා = සුම්බ් ආ = සුම්බා. ඇතැමෙක් මෙය 'සිම්බා' සි වරදවා ගනිති. එහෙත් 'පුම්බා යනු 'පිම්බා' සි නො ගනිත්. 'ගුණ බිම්බා ඇරැ පැ' ගුණ ප්‍රතිබිම්බය ඉදිරි පත් කොටැ දක්වා. 'දෙසැට මිසදිටු සිඳු'– සැට දෙකක් මිථ්‍යාදෘෂ්ටි නමැති සමුද්‍රය.

424 අ\ව: අපාය භයට ආවරණ වූ තුන් සරණය ලොකයට දක්වා, තමා ගේ අභීතාඞ්ගාදි නවය ආදි කොටැ ඇති අප්‍රමාණ බුද්ධ ගුණය ප්‍රකාශ කොටැ–

425. වි. 'පන්වා'– පලවා හැරැ. 'දහම් ජය කොත' ධර්ම නමැති ජය කොඩිය. 'දළ මෙත'– දෘඪ (මහත්) වූ මෛත්‍රිය.

426. වි. 'සිහිල් අඹයා'– ශීතල ජලය. 'යා' පාදපූරණ සි. 'පොබයා'– ප්‍රබොධ කොටැ. 'අරබයා'– උදෙසා.

427. වි. 'සතුරු වා'– සතුරු වැ.

428. වි. 'තමන් නම අස්වා'- තමන්ගේ නාමය අසන්නට සලස්වා. තමන්ගේ නම කියවා. 'පිරිසිඳු පසස්වා'– පාරිශුද්ධියට (පිරිසුදු බවට) ප්‍රශංසා කරවා. 'සස්වා'- සසින්නට සලස්වා. පිරිසිඳු කරවා.

429. වි. 'මරු මන්'– මාරයා ගේ මානය.

430. වි. 'සමවත් සැපැ යෙදී'– සමාපත්ති සුඛයෙහි යෙදී. සඟටත්'– සඞ්ඝයාට ද. 'අමිස පුදෙහි'– ආමිෂ පූජායෙහි– ආහාරාදි දානයෙහි. 'නො බැඳී'–නො ඇලී.

431. වි. 'සිල් පවුර'– ශීල නමැති ප්‍රාකාරය. 'දහම් කඳවුර'– ධර්ම නමැති **සක**න්ධාවාරය. '**සක**න්ධාවාර' යනු යුද්ධ සෙනාව යැ, රාජ්‍යයගේ ප්‍රධාන නගරය යැ, සෙනාව ඇණි ලා ගත් තැන ය යන අර්ථයන්හි වැටේ. 'තර කැරැ'-සම්පූර්ණ කොටැ. 'පවර සවු මැති සඟ'– ප්‍රවර වූ ශ්‍රාවක නමැති මන්ත්‍රීන් සමඟ.

431. වි. 'මතුරු කළ'– මන්ත්‍රය කළා වූ. උවදුරෙහි දී බුදුන් ගේ නම කියැවෙන හෙයින් ඒ මන්ත්‍රයෙකි.

436. වි. 'මාඇඟි වත්'–මහාඝ්‍ර වස්තූන්.

438. වි. 'නර ඉසුරු'–නරේශ්වරයා. රජ.

439. වි. 'මුනි වඩනා කැමැති අසුන්'– සර්වඥයන් වඩින සේ (තමන්) කැමැති (බව දන්වන) සන්දේශයන්. 'අනුමති රැගෙනැ'– අනුදැනීම (කැමැත්ත) ඇරැ ගෙනැ.

444. වි. 'එ මඟ සරහනු හට'– ඒ මාර්ගය සරහන්නා වූ (මා) හට. ඒ මාර්ගය සරසන්නා වූ මා උදෙසා.

445. වි. 'සරා'– සරහා. 'සැසැ පිසැ'– කපා පහ කොටැ. 'සුවහසේ'– 'ඒ' එළි පිණිස යි.

447. වි. 'පිරිකුඹු'– **පූර්ණ** කුම්භ. පුන් කලස්. 'සඳ' යන්නට සාම් යි. 'සසසේ'– මොනොවට.

448. අර්: සෙවණැල්ලෙන් යන ලෙසට බඳනා ලද පට්ට වස්ත්‍රයෙන් ද, දිළියෙන්නා වූ කොඩියෙන් ද (යි යන) මේ සියල් ලෙන් මඟ දිගට අලඞ්කාර කොටැ.

452. වි. 'උදු ලා රසැ රදු'– හුඳෙක් ලාක්ෂා රසයෙහි රඤ්ජිත වූ. අමිශ්‍ර ලා සාඩ දියෙන් වර්ණ පොවන ලද. 'බඳු වද කුසුම් පට බඳු'– රතු වද මලින් කළ වස්ත්‍රයක් වැනි. 'මුදු'– මෘදු වූ. 'තෙ මඬුලු වසා'– (නැබ දෙ දණ යන) ත්‍රි මණ්ඩලය වසා. 'වඩා'– හැඳැ ගෙනැ.

453. **අන්වය.** රන් දමින් පබළු කලබක් බඳිනා ලෙසින්......

454. **අන්වය:** අවට සක්වළ ගිරි සුනෙරගිරි පිට සිටි සඟ දිය පොළොව හිම් කොටැ මිහි මඬල සාම්පා කොටැ රැ ගත් (මතු 'සිවුර' යනු හා සබඳි.)

**අව:** හාත් පසින් චක්‍රවාට පර්වතය, (උසින්) මහා මෙරු පර්වතය පිට සිටියා වූ ස්වර්ගය, යටින් ජල පොළොව (යන මේ තැන්) සීමා කොට මහී මණ්ඩලය කම්පිත කොට ගත්තා වූ - (බුදුන් සිවුර ගනුත් මැ පෘථිවිය කම්පිත වූ සේ කි හ.)

455. **අව:** ප්‍රභායෙන් දිශා ප්‍රදෙශයන් න්‍යග්‍රොධ ඵලයන් මෙන් අති රක්ත (වර්ණ) කරන්නා වූ කිසි කිලුටක් නොගත්තා වූ සුගත (බුද්ධ) මහා චීවරය ඒ සුගතයා (බුදුන්) ගෙනැ -

457. **වි.** 'ලෙවන් .... සොඳ'- ලොකයා ඇස් ලැබූ ඵලය විඳ සන්තොෂ වන සේ (සන්තොෂ වන්නට) සොඳ වූ. 'සවන්'- සර්ඥයා ගේ. 'සවන් රස් කඳ - ෂඩ්වර්ණ රශ්මි සමූහ ය.

458. **වි.** 'රැසින්'- රාශියෙන්. 'නව හම්'- නව කම්බානක. 'සැදිණි'- යුක්ත වී.

459. **වි.** 'රස් තරඟ - රශ්මි තරඞ්ගයෝ. රස් රළ.

460. **අන්වය** බඳු වද පෙති නිසරු (කැරැ) සැඳෑ වෙලෙහි සිරි දුරු කැරැ ..

**වි.** 'සැඳෑ වෙලෙහි' සන්ධ්‍යා වලාහකයෙහි. සවසැ වලාකුලෙහි.

461. **වි.** 'තරු වැළැ පැහැ පැහැසැ'- තාරකා සමූහයේ ප්‍රභාවට සිනා සී. ඒ ප්‍රභාව පරදවා යැ යූ සේ යි. 'රිදී රස - රිදී දිය.

462. **අව** මඳට වත් රශ්මි සමූහයක් චක්‍රවාටයෙහි සියලු තන්හි සුළි ගෙනැ ගෙනැ (සුළි ගනිමින්, සුළි නංවමින්) ඉතිරැ ගියේ. ලොකය තමා ගේ පැහැ (ඇති) කෙළේ පතළේ යැ.

463. **වි.** 'පබසර රැස්'- ප්‍රභාස්වර රශ්මිය. 'පිටැ පිටැ'- නොකඩ වැ. 'රුවට' මනා සේ.

464. **වි.** 'හැලි සිය දහස් සුවහස් තඟා'- හැලි සිය ගණින් දහස් ගණින් ලක්ෂ ගණින් උපදවා.

465. **වි.** 'බෙර සිය ගොස කරත'- භෙරි ශතයන් (සිය ගණන් බෙර) ඝොෂ කරත් මැ. 'වස් දඹු'- බට දඬු. නළා. 'නො පිඹි සක් හඬ (කෙනකුන් විසින්) නො පිඹිනා ලද ශඞ්ඛයන් ගේ නාදය. මේ සියල්ලෝ තුමූ මැ නාද කෙරෙති.

466. වි. 'හෙසරවත'- හේෂා රවය කරත් මැ.

467. වි. 'වලා'- වලාහකයන්.

469 වි. 'අවි වග'- ආයුධ වර්‍ගයන්. 'සිටැ'- සිටි සේ මැ. කොතකුන් විසින් නොලෙළවන ලදු වැ මැ. 'සැදෙත'- සැරසෙත් මැ. 'වුහුටු'- විහිදුනා ලද.

470. වි. 'සිටැ ගත'- 'සිටැ ගනුත' යි යෙදූව මනා තැති. මෙසේ යෙදීම වැරැදි වේ.

471. වි. 'තම සැපත විතරට'- තමා ගේ පොහොසත් කමේ පමණට.

472. වි. 'සිහිඳු ගුණ ගත්'- සහිඬ භාවය (ඇති කැරැ) ගත්තා වූ.

473. වි. 'සුදු නිල් වලා'- සුදු වූ ද නිල් වූ ද වලා කුළු. දිහිඳු මැඩැ'- සූර්‍ය්‍යා යටපත් කොටැ. 'නවත්වත් වත්'- මේ නවත්වත් නවත්වත්' යනු සඳහා යෙදූණු අපශබ්දයෙකි.

474. වි. 'පවත්වත්වත්'- වැරැදි වේ. 'පවත්වත් පවත් වත්' සි වියැ යුතු.

475. වි. 'කුසුම රද'- කුසුම රජස්. මල් රොන් සුනු. 'නුමුත්'- නොමිදුණා වූ. යුක්ත වූ.

476. වි. 'විසුරුවත් වත්'- වැරැදි වේ. 'විසුරුවත් විසුරු වත්' සි වියැ යුතු.

477. වි. 'රිවි රැස් මකා'- සූර්‍ය්‍ය රශ්මිය නැති කොටැ (පරදවා.) 'හෙත්'- වැටෙත් මැ.

478. අර්‍ථ: මහා රාෂ්ට්‍ර සමූහයා (මහ රට වැසි සමූහයා) අවුත්, රජහු ගෙන් අසා, මහා මාර්‍ගය සදනු පිණිස උත්සාහ වඩා බුදුන් වඩිති යි කියා යන කල්හි—

482. වි. 'මිණි රුවනට'- චක්‍රවර්ති රජහු ගේ මාණික්‍ය රත්නයට. 'මිණි රුවන් වැළයට'- මාණික්‍ය රත්නාවලියට.

483. වි. 'නිසරු කොටැ'- සාරත්වයක් නො කොටැ. පරාජය ඇති කොටැ. කා හට ද? බඹ පිරිසට, තුරු විලසට (තාරකා වන් ගේ ආකාරයට,) සුර සෙනඟට, රුවන් වැළයට, ගජ

සෙනඟට. (තිසරු කොට සි සබඳි.) 'නිකුත්'- පිටත් වූ ග. 'නිකුම්'ධාතු සි. නික්මී- නික්මිති- නිකිති- නිකුතු- ඈ විසිනි වරනැඟෙනුයේ.

485. අ.වි: ජනයෝ, 'දුලභ වූ මනුෂ්‍යාත්මභාවයට වන්නා වූ අභිවෘද්ධිය මේ මැ යැ' සි (මනුෂ්‍යාත්මභාවය ලැබීමේ ඵලය නම් මේ යැ සි) සඞ්ඝ සමූහයාට නොසාඩ කොට (නො හැර මැ) පන් සියයක් සුදු කුඩ නැඟූ.

486. 'පින් පල බල'- පුණ්‍ය ඵලයා ගේ බලය.

487. අ.වි දමාකාරයෙන් කුසුමයන් අතින් ඇරැ ගත්තා වූ සද්ධර්මාකාරයෙන් බුදුහු සිතින් ඇරැ ගත්තා වූ අයෙක්, භක්ති යෙන් (තමනට) ඇති ප්‍රමාණයෙන් නිත්‍යයෙන් බුදුහු පුදමින් යෙති.

488. වි. 'රැළි ...... විලසට' රැළි නඟා ගෙනැ පතිත පිටැ වැටෙන්නා වූ දිළියෙන්නා වූ ගඟුල් හැලි ලෙසින්. 'තිළී'- තුෂ්ට වැ. 'පිළී'- වස්ත්‍රයන්. 'සිසාරති'- කරකවති.

489. වි. 'ඔද වැඩි සිඳු'- ඔජස් වැඩුණා වූ (වඩ දිය වන් නා වූ) සමුද්‍රයෙහි.

490. වි. 'සිඳු වැදූ නැවැති ගඟක් සේ'- සමුද්‍රයට වැදී නැවැතුණා වූ ගඟක් මෙන්. මෙහි සමුද්‍රය නම් මහා මනුෂ්‍ය සමූ හයා සි. ගඟ නම් ඒ සමූහයා මැද නැවැතුණු රාජ සේනාව සි. 'සිටි'- (නැටුම් බැලීමට නැවැතී) සිටියා වූ. 'ළඳ'- තරුණි වූ.

491. වි. 'විමති නො වී'- වැරැදි මත ඇති කොටැ නො ගෙනැ. ඇති පරිදි දැනැ ගෙනැ.

492. වි. 'මොහු මැ වෙදැසි' මොහු මැ (මේ සම්බුද්ධයෝ මැ) වෙත් දැ සි. වෙත් + ද= වෙද්ද= වෙද. 'ද'කාර ලොපසි.

493. වි. 'වීදේ'- විහිදූ. 'එසිත් තුටු වූ' සි සබඳි. 'පැදේ'- පැහැදූ. 'අපවාදේ නො අසන ලෙස'- නො වරදවා යැ යු සේ සි.

494. වි. 'බව දුක් නිසරණ වේවයි'- සංසාර දුඃඛය නිඃ ශරණ වේවයි පතා. බව දුක් නවතීවයි පතා. 'පලන්'- පලඳනා ලද. 'පලඳ' ධාතුව පලදී- පලදිති- පලනි පලනු- ඈ විසින් වරනැගේ.

495. අර්: සිතෙහි ලොලය වඩන්නා වූ ළ දරුවෝ පලා නොයන තරම් යහපත් වූ කලා සම්පූර්ණ චන්‍ද්‍රයා අකාර වූ මුනි රුව බලා ගෙනැ මැ යෙති.

මුනි රුව කොතරම් සොඳුරු ද යත හොත් එ තැනින් පලා යැම කළ නො හැක්කැ.

496. අන්වය: ලියෝ දරුවන් ගෙන් පිරි බඩ ගෙනැ, මුනි යන මග පිරිබඩ ගෙනැ, මග බඩ සිටි අගබඩ සල් පිල් වෙතැ මැ සිටැ වඳිති.

වි. 'පිරි බඩ ගෙනැ'– සුවඳ කලල් ගල්වා. 'මග බඩැ සිටි'– මාර්‍ගාසන්නයෙහි පිහිටියා වූ. 'අගබඩ සල් පිල්'– අග්‍ර වූ භාණ්ඩ ඇති අපන ශාලා.

497. වි. 'වනින් වනැ මැ'– වනයක් වනයක් ප සා. 'සිදැ'– කඩා. 'රොනින් රොන මැ'– රොනක් රෙනක් පාසා.

498. අර්: බුද්ධ මඟිමය දකැ පූවාහු (නම්) සිටි සේ සිටි යාහු නැත. (කුමක් කළාහු ද?) (බුදුන්) වැදැ වැදැ අත සතපා ගත් හ. බුදු බව නොපැතුවාහු නැත.

499. අර්: මුනිහු ගේ රූපය දකැ (එහි) රසය වින්දාහු මුහුණ ශ්‍රීපාදයෙහි බැදැ (ශ්‍රීපාදයට ලං කොටැ) වැන්දාහු භවය සැපතැ යි නොසිතුවාහු තමා ගේ සිතෙහි කෙලෙශයන් සින්දාහු යැ (නැති කළාහු යැ.)

500. වි. 'අද'– හෘදයය. 'මද'– මන්‍ද. නුවණ නො මේරූ. 'ළද'– ඉතා බාල. 'අපියෝ'– ආශා ඇත්තාහු.

501. අන්වය: සමහරු, රට රටිනි දෙන දනට මැ නිසි බඩු දනැ, ගැල් පිටිනි වෙන වෙන රඟ නැව් පිටිනි වටිනි ගෙනැ එති.

අර්: ඇතැම් අය රටින් රටින් දෙන්නා වූ දානයට මැ සුදුසු වූ බඩු දනැ ගැල් පිටින් (ද) වෙනස් වෙනස් ආකාර වූ නැව් පිටින් ද හාත් පසින් ගෙනැ එති.

502. වි. 'වෙත් පත්'– සමීපයට පැමිණියා වූ. 'සුර අඹුන්'– දිව්‍ය අඞ්ගනාවන්. 'නො මැ නරඹන්නෝ'– නොබ ලන්නාහු. මෙය ද 'තබන්නෝ' 'නොතබන්නෝ' යන දෙක ද 'රජ සෙන්' යන්නට විශෙෂණ යි. 'මුනි රූ රෙසෙහි'– සර්‍වඥයා ගේ රූප රසයෙහි. 'හැම'– මේ මෙහි යෙදුණු සේ

නො මැනැවි. කුඩ කොඩි හැම නො තබති යි කී කලැ හැගෙනුයේ සමහරක් තබන බව යි. ඒ අර්ථය මෙහි අසම්භාව්‍ය යැ. 'යත් යත්'– යත් මැ යත් මැ. යන කල්හි මැ. යමින් මැ. 'මුනිඳු සුදන්නෝ යැ' යි සබඳි.

503. පි. 'මෙර වට ලූ'– මහා මෙරු පර්වතය වට ලාගත්තා වූ. 'කුල ගිරි සිරි වින්දෝ'– කුල ගිරි ආකාරය ගත්තාහු. බුදුහු මෙර වැන්නෝ යැ. නරනින්දෝ ඒවා සිටි කුල ගිරි වැන්න හ.

504. අන්වය: සෙත් මුනි විද්‍යෝතමින් යත් යත්, සිත් යුත් පුද වත් දෝ අතින් ගත්, කැත් ගොත් යුත් නමින් පර සිද්දෝ, නෙත් සිත් ලත් පල එදිනේ ලද්දෝ.

අර්ථ: ශාන්ති (දායක) මුනිඳු බබළමින් යත් මැ යත් මැ (යන කල්හි,) (තමන් ගේ) සිතට අනුකූල වූ පූජා වස්තූන් ද අතින් ගත්තා වූ, ක්ෂත්‍රිය ගොත්‍රයෙන් යුක්ත වූ, නාමයෙන් ප්‍රසිද්ධ වූවෝ, ඇස් ද සිත් ද ලැබූවා වූ ඵලය එ දිනයෙහි ලද්දෝ යැ.

බුදුන් දැකැ නෙත් ලත් පල ද බුදු ගුණ සිතා සිත් ලත් පල ද ලද්දෝ යැ.

පි. 'විද්‍යෝතමිනේ'– 'විද්‍යෝත' යනු ධාතුව කොටැ ගත් තැනි. සංස්කෘතයෙහි 'වි' පූර්ව 'ද්‍යුත්' ධාතුයෙහි අංගය 'විද්‍යෝත' යනු යි. නාම පද කෙසේ වුව ද ක්‍රියා පද මෙසේ නිපැදැවීම සිංහලයෙහි විරල යැ. මෙහි අගැ (ඒ) ඡඳස් පිණිස ගැනුණෙකි.

505. පි. 'සෙනඟ බළෝ (යා)'– සෙනා භටයෝ. 'යා' පාද පූරණ යි. 'මුනි සිරි දැනැ ගෙනැ'– සර්වඥයන් ගේ ශෝභාව දැනැ ගෙනැ. 'ඔසළෝ'– රැස් වූවා හු. 'දසනෙහි'– දර්ශනයෙහි. 'හසළෝ'– පුරුදු වූවාහු.

506. පි. 'ස වන කිරණ දුලු'– ෂඩ්වර්ණ රශ්මියෙන් ජ්වලිත වූ.

507. පි. 'සුර පා'– දිව්‍ය ප්‍රසාද. 'පවරා'– ආරාධනය කොටැ. 'සතපා'– සන්තර්පණය කොටැ. විධා සිඳුවා. 'පෙළ පාළිය'– පිළිවෙළ. ක්‍රමය. 'නරපා'– නරපාලකයා. (බිම්සර) රජ.

508. පි. 'අසුන් දින්'– ශාසනය දුන්නේ යැ. දැනුම් දුන්නේ යැ.

509. වි. 'සැප සපයා'– සුව සලසා. 'තොප ... පුද කොට්'– අනන්තර පද්‍යයෙහි 'කැදවා ගෙනැ' යන්නට විශෙෂණ යි.

510. වි. 'රට සෙත'– රටව ශාන්තිය. 'මෙහෙයා'– යවා.

511. වි. 'ගලපා යා'– 'යා' පාද පූරණ යි. සෙසු තුන් තන්හි ද මෙසේ මැ යැ. 'පා (යා) පෙළ පෙළ සිටුවා'– පාද යන් (ස්තම්භයන්) පේළිය පේළිය සිටුවා. මෙහි 'ප යා' යන් නට ව්‍යාඛ්‍යාන කාරයෝ 'ප්‍රාසාදයන්' යි අර්ථ කියති. 'ප්‍රාසාද යන් සිටුවා ප්‍රාසාදයන් කරවා' යි කී කලැ අර්ථ ඇත් මැ නු? 'නදවා'– ආනන්ද ජනක වූ. සන්තොෂදායක වූ. 'සුර පහ සිරි වෙළපා'– දිව්‍ය ප්‍රාසාද ආකාරය දක්වා. 'මහ පා'– මහා ප්‍රාසාද.

512. වි. 'සුර සිදු බදු'– දිව්‍ය සින්ධුව (අහස් ගඟ) වැනි වූ. අහස් ගඟ සුදු යැ. 'ලඹ'– එල්ලෙන්නා වූ. 'ඉදුවර'– ඉන්දීවර. මානෙල්. 'සදවා'– අලඞකෘත කොට.

513. වි. 'බත්'– බදනා ලද. 'නන්'– නොයෙක්. 'නෙලෙනී'– සුලඟින්. 'වෙවුල්ලා'– ලෙළ දෙවා. 'ලා'– දමා. 'පිරිබඩ ගත්නෙත්'– ගාවමින්. සුවඳ බිම ගෑම පිරිබඩ ගැනී ම යි. 'උදුල්ලා'– උදුල්වා. උජ්ජ්වලිත කරවා.

514. අඤ්ඤ: දිනැ රස් වනවා රන් මිණි මුතු බැදැ සොද මා ඇඟි පට ඇතිරලි වනවා, සත සිත පිනවා, පිරි සඳ මඩල එව්, මුනිඳුට නිසි අස්නක් මැදු පනවා–

අර්ථ: දිශාවෙහි රශ්මි ලෙළ දෙවා රන් ද මිණි ද මුතු ද බැදැ යහපත් වූ මහාඝී (බොහෝ අගනා) වූ පට ඇතිරිලි එලවා, සත්ත්වයන් ගේ සිත සතුටු කරවා, පිරුණා වූ චන්ද්‍ර මණ්ඩලය මෙන් මුනීන්ද්‍රයාට සුදුසු වූ අසනයක් මැද්දෙහි පනවා–

වි. 'බැදැ'– රන් මිණි මුතු බදනා ලද්දේ ඇතිරිල්ලෙහි යැ. 'රැස් වනවා'– රශ්මිය වැනෙන්නට හෙවත් ලෙළ දෙන්නට සලස්වා. 'ඇතිරිලි වනවා'– මෙහි වැනීම නම් විදුහීම යි.

515. වි. 'දැසමන් මල් ඉස්නේ'– ජාති සුමන (සමන්) මල් ඉසීමෙන්. 'බිම වසවා'– බිම වැසී යන තරම් මල් ඉසී බව මෙයින් කී හ. 'සිතැ තොස්නෙන්'– (සිතැ තොසිනි) සිතෙහි සන්තොෂයෙන්. 'බුදු සස්නේ'– බුද්ධ ශාසනයෙහි.

516. වි. 'පියුම් ඉළු'– නෙළුම් වනය. 'පත්'– පැමිණි. 'රත් පිළිමිණි'– රක්ත ස්ඵටික මාණික්‍ය. ස්ඵටික නම් පළිඟු යි. 'රත් තුරු වැල'–(අඟහරුවා මෙන්) රතු වූ තරකා සමූහය මැද්දෙහි.

සඞ්ඝයා රත් පලස ද, රත් පියුම් වනය ද, රත් පිළි මිණි ද, රත් තුරු වැල ද වැන්නැ. බුදුහු රන් වැඹ ද, රන් නැව ද, ගිනි කඳ ද, පුන් සඳ ද වැන්නෝ.

517. වි. 'වට සිටි පෙති මැද්'– වටා සිටියා වූ පත්‍ර මධ්‍ය යෙහි. 'කෙසුරු සළා'– රේණු සූළි. 'කෙසුරන් පිරි වැරු'– රේණූන් විසින් පිරි වරන ලද්දා වූ.

518. වි. 'පුද ලත්'– පූජා ලැබූ. 'මුනිඳුන්නේ'– යන් නට විශෙෂණ යි. 'විහිදෙත්'– විහිදෙන කල්හි. 'එ මැ වැදැ'– ඒ (ෂඞ්වණී රශ්මිය) මැ වැදී. 'පහ පල බිත් දිලිසෙන්නේ'– ප්‍රාසාදයන් ගේ පියසි ද භිත්ති ද දිලිසෙනුයේ. 'සත් රුව නින් නොකළත්'– සප්තවිධ රත්නයෙන් නොකරන ලද නමුත්.

519. වි. 'විදුලි සහස් සේ'– විදුලිය දහස් (ගණන්) මෙන්. 'රන් පලු'– රන් කරල්. 'බදවා' යන්නට කම් යි. ඉඳු දුනු සුවහස් සේ'– ඉන්ද්‍ර චාප (දෙව් දුනු) ලක්‍ෂ ගණන් මෙන්. 'රන් දද'– සවණී ධවජ. 'බදවා'– යන්නට කම් යි. 'අස්සේ සිදුරු නො වැ'– අතරෙහි සිදුරක් නැති කොටැ. 'ගඟ වැසුවා මෙන්' යි සබඳි. 'පසු පස්සෙ'– එකකට එකක් පසු වැ සිටින්නට.

520. වි. 'කර පමණක්'– ග්‍රීවාව දක්වා.

521. වි. 'සමමෙත් මුනි'– සමාන මෛත්‍රී ඇති මුනී. 'ඹබ'– උන්වහන්සේ ගේ. 'සිහි කොටැ කොටැ'– සිහි කෙරෙමින්.

522. වි. 'සඟ පිරිවැරු'– සඞ්ඝයා පිරිවැරුවා වූ. 'ළඟ'– ළං වූ. 'දිව නයි කැල'– දිව්‍ය නාග සමූහයා ගේ. 'මන දඟ වන'– සිත හිර වන්නා වූ. සිත බැදෙන්නා වූ.

523. වි. 'එ සුගත'– ඒ සුගතයා. ඒ බුදුහු. 'සැපත් වූ මෙන්'– සම්ප්‍රාප්ත වූවාක් මෙන්. පැමිණියා සේ.

524. වි. 'බුදුනැ යන නම'– බුදුන්' යැ කියන්නා වූ නාමය. 'අප මෙසේ සිටිනු නො යෙදෙයි'– අප මෙසේ සිටීම නුසුදුසු යැ. 'එ මැ සේ'– ඒ ඇසිල්ලෙහි.

525. අවි; මුනි උතුමා වඩින්නේ සිතෙහි මෛත්‍රී කරුණාවෙකින් යැ. පල දුන්නේ මේ අප ළිනිසුන් ගේ කලා වූ මහත් පිනෙකි.

526. වි. 'දුක් විඳින්නෝ අපි යැ'– දුක් විඳින්නෝ අපි ය. 'විද' ධාතුව විඳි – විඳිති – විනි – දිනු – ඈ විසින් වරනැගේ. අතීත කෘදන්තය 'විනු' යනු යි. 'විනි' යනු නො වේ. ඉදින් ඇතමකු ගන්නා 'වින්නෝ' යනු නිවැරැදි නම් 'දුන්නෝ' යනු වෙනුවට 'දින්නෝ' යනු ගත යුතු වේ.

529. වි. 'නිවනට මග'– නිර්වාණයට මාර්ගය. 'අරුම කිම'– කවර පුදුම යෙක් ද? කවර බරෙක් ද?

530. වි. 'කැට'– ගල් කැට.

531. වි. 'වැලි එවැ'– වැලි දමා. 'රුව කොට'– මනා සේ.

532. වි. 'බිගු දල් මුවුණ ගත්'– භෘඞ්ග සමූහයා නාද ගත්තා වූ. නාද කරන භෘඞ්ග සමූහයා ඇත. 'අතරණ කැරැ'– අසාධාරණ කොටැ.

533. වි. 'පුන් කුඹු'– පූර්ණ කුම්භ. පුන් කලස්. 'බඹා දිගු කැන් ඔලඹා'– බඹය දිග (කෙසෙල්) කැන් එල්වා. 'රන රඹා'– රන් කෙසෙල් (ගස්). 'අතුරු නො තබා'– අතරක් නො හැරැ. 'ලඹා'– මල් කැන් එල්වා.

534. වි. 'වට සුදෙ පට ඇදැ'– හාත්පස ඉඳුනු වන සේ වසතු ඇද. ඉඳුව = සුදෙ. 'රන් කලසැ කොහෙලි'– රන් රිදී කොඩි. 'සොදෙහ්'– සොඳ වැ. සොඳ සේ.

535. වි. 'දියට'– දිය පිණිස.

536. වි. 'ගැසූ මස් ගොදුරට'– ගසන ලද්දා වූ මත්ස්‍ය ආහාරයට. මසුන් ඉන්නා දියකට මස් ගොදුරක් ගැසූ කලැ සියලු මත්ස්‍යයෝ එ තැනට එක විටැ දිවැ එති. 'යාගෙහි'– දෙව පූජාවෙහි.

537. වි. 'දත් දිමට දොර හල ද'– දත් දිම පිණිස දොර හරිනා ලද්දේ නම්. 'සත් රුවන් පිරි නෙට'– සප්ත රත්නය පිරුණු වූ නගරට.

538. වි. 'ගොසින්'– බිඳු මෙන් ද, ගජ සෙන් ලෙසින් ද, මඳුන් විලසට ද, බමුණන් ලෙසින් ද, දිලිඳුන් ලෙසින් ද, තුන් පියවරින් යන සේ වහ වහා ගියාහු, 534 වන පද්‍යයෙහි දක්වුණු 'දහස් සත් දෙත් සියක් නිරිඳෝ'යැ.

539. වි. 'විල් කමලා පිපෙන මෙන්'– විලෙහි පියුම් පිපෙන්නා සේ. 'කමල්' යන්නට 'ආ' යනු එළි පිණිස වූයේ යැ.

540. වි. 'කවැපියෝ'– කරනු කැමැත්තාහු. 'බුදු ගුණ දැවැටියෝ'– බුද්ධ ගුණයෙහි දැවැටුණාහු. බුදු ගුණයෙන් බැඳුණා හු. 'සිටියෝ'– මෙහි උක්තය 534 වැන්නෙහි 'නිරිඳෝ' යනු යි.

541. වි. 'විදු මෙන්'– විදු ලිය මෙන්. බබලමිනැ යූ සේ යි. 'පිදුමෙන'– පූජායෙන් යුක්ත වැ. 'නරනිඳුන් යෙදු මෙන්'– රජුන් ගේ නියොජනයෙන්. 'පැදුමෙන්'– පැදීමෙන්.

552. වි. 'රස් වතුරේ දැවැටි'–(බුද්ධ) රශ්මි ප්‍රවාහයෙහි දැවැටුණු වූ. 'මුනිඳුන් පිළිපි නැව අවුත් නිවන් පුර සේ මැ ගොඩ දිටි'– බුදුන් සිටි නැව අවුත් නිර්වාණ පුරය (දුටුවා) සේ මැ ගොඩ දුටුයේ යැ.

543. වි. 'ගල'– ග්‍රීවාව.

544. අර්: පිය රජු ගේ හිසට මැණිකින් බර වූ වොටුන්නෙකැ ආකාරයට (පැමිණියා වූ,) කාලුදෙවල සාමීන් ගේ මුදුනට මල් වටයක් බවට පැමිණියා වූ—

පිය රජුන් විසින් මුදුනෙහි තබා ගෙනැ වදනා ලද්දා වූ ද, කාලුදෙවල සාමීන් ගේ මුදුනෙහි පිහිටියා වූ දූ යි කී සේ යැ. 550 වැන්නෙහි 'සිරි පා' යන්නට විශෙෂණ යි.

545. වි. 'කොසොල් රද රදහස'– කෝසල රජයා නමැති රජ හංසයා. 'එ ගැ'– ඒ ගැවා වූ. ඒ ධනපාල හස්තියා දමනය කළ දිනයෙහි ගැවා වූ. 'කිරි සිඳුරු පා'– හස්ති සින්දූර පාත්‍රයන්. 'කිරි' නම් හස්තියා යැ. 'සිඳුරු' නම් ඇත් හිසෙහි ගල්වනු ලබන රක්තවර්ණ චූර්ණ විශෙෂයෙකි. 'පා' නම් භාජනය යි. 'ඇස පැ'– ඇසට පැවා වූ. දක්වූ.

546. වි. 'එක් කල'–අඩම්බර වූ. 'මැඩි'– යටපත් කළා වූ. 'රු අඳුරිඳු ගෙ'– රුහු අසුංරඳුයා ගේ. 'මන්'– මානය.

547. වි. 'දුරු'– දුරු වූ. (මොලොක් ගුණයක් නැත්තා වූ) 'තමා සත් දුරු'– තමා ගේ (පාද) ලාඤ්ජනය (සලකුණ) දුරුවා වූ. සමනල ගල මෙන් සිරිපා ලකුණ දුරුවා වූ ගලට ද. 'උදක් සිත් පිත් දුරු'– සිත් පිත් පමණකුත් දුරු වූ. 'නොයෙක් ගිරි තුරු පවා වඳවන'යි සබඳ.

548. අ.ප: මහාමෙරු පර්වතයට දික් කළ හොත් නැමී ගෙනැ සිටැ උඳුලන්නා වූ, චක්‍ර ලක්‍ෂණය කරණ කොටැ ගෙනැ (දියතට) ලොකයට චක්‍රවර්ති භාවය මැ ලොකයාට පැවා වූ.

549. වි. අ.ප. ගලෙහි වූවත් (මොලොක් දෙයෙකැ මෙන්) එරී යන්නා වූ පුලුනෙහි වූවත් (තද දෙයෙකැ මෙන්) (පුලුන්) පෙඳ නො මිරිකන්නා වූ, සිංල්ල (මඞගල) ලක්‍ෂණයෙන් හොබනා වූ, මනා වැ පිපි සත් තල පියුම් පිටැ යන්නා වූ– (සිරි පා යි සබඳ.)

550. අ.ප. බ්‍රහ්මදිව්‍යමනුෂ්‍යයන් ගේ ඔදන් නමැති විලෙහි පිපුණු පියුමෙකැ ආකාරය දුන්නා වූ, දාකුමාර වන්නා වූ, නඤනීය වන්නා වූ ශ්‍රී පාදය, මුනීන්ද්‍රයන් විසින් පොළොවෙහි තබත් මැ–

සිරි පා බ්‍රහ්මාමරනරයන් විසින් වඳනා ලද බව පූර්වාර්ධයෙන් කියැවිණ.

551. අ.ප. ඒ රංචිහි සංසාර (දුක්) නමැති ග්‍රීෂ්මය පහ කොටැ වස්වන්නා වූ ධර්ම නමැති වැස්සට ශඞකාව දුරු කොටැ ඒ වෙලාවෙහි මැ ලොකයාට පාන්නා වූ පූර්ණිමන්ත පරිද්දෙන්–

මෙ තැන් සිටැ 558 වැන්න තෙක් 'ගන කුළු තුබැ පතල සැටි කියත්.

552. අ.ප. "එබැවින් ඒ සූර්යරශ්මියට දුර්භික්‍ෂයට මූලය' (මුල් හෙතුව) නම්, බැස්සා වූ චණ්ඩ වූ සූර්ය රශ්මිය මැ යැ. මෙ කාලයෙහි භූමියට වැද්ද නො දෙම" යි කියනනා සේ–

553. වි. 'කවද ගෙනැ'– කවච (සන්නාහ) ලා ගෙනැ. 'ගිරි දුදුලු'– පර්වත දුර්ගී. 'නුබ වසා'– ආකාශය වසා.

554. වි. 'දමව යි කියන්නා ලෙස'– දුරු කරව යි කියන් නා සේ. 'ගන ගොසින්'– ඝන ඝොෂයෙන්. මෙඝ ගර්ජනා යෙන්. 'දස දෙස පුරා ගෙනැ' යි සබඳි. අහස ගෙරවීම "කුණු දුරු කරව" යි හඬ නගා කියන්නා වැන්නැ.

555. වි 'දුනු රග'– දුනු වැනි. 'නන් පැහැ තරග ගත්'– නානා ප්‍රභා තරඞ්ගයන් ගත්තා වූ. නොයෙක් කාන්ති රැළි ගත්තා වූ. 'ඉඳු දුනු රැසින්'– දෙව් දුනු සමූහ යෙන්. ඉන්ද්‍රයා ගේ (ශක්‍රයා ගේ) දුන්න ඉඳු දුන්න යි. 'සුර මග සදා'– ආකාශය අලඞ්කෘත කොටැ. සුරන් ගේ (දෙවියන් ගේ) මග සුර මග යි.

556. වි. 'සිකි නල රගන රැඟුමට'– මොනරුන් නමැති නළුවන් (නටන්නන්) නටන්නා වූ නැටුමට. 'හළ මල් ඇඳිලි ලෙසට'– දමූවා වූ මල් දොත් ලෙසින්. 'අහසට නැගෙන කොක වැල සදා'– ආකාශයට නැගෙන්නා වූ කොක් පඞ්ක්තිය අලඞ්කෘත කොටැ – වැසි ඇති කලැ මොනරු නටත්, කොක් කු පියාසර කෙරෙත්.

557. අව. සර්වඥ පූජාවට අලඞ්කෘත වූ දිව්‍ය ශාටකයන් විදහා ලන්නා සේ, මෙඝ කූටයන් පළා ගෙනැ හෙන්නා වූ (බස්නා වූ) විදුලිඳළු එළි කොටැ (ප්‍රකාශ කොටැ)–

558. අව. මහත් වූ හිමාලය වන පඞ්ක්තියෙහි පර්වත කූටයන් උස් වැ නැංනා සේ, අඤ්ජන කූට සේ කළු වූ මෙඝකූට ආකාශය වසා පැතුරුණේ යැ.

559. වි. 'වතුරු වියැ'– ඔඝ (මහා ජල ප්‍රවාහ) වී යැ. 'හැම කුණප කුණු'– සියලු කුණප ද කසළ ද. 'තුරු ලිය ද'– ගස් වැල් ද. 'අකුරු වි යැ'– අඞ්කුරිත වී යැ. දළු ලී යැ.

560. වි. 'වාපී'– වැව්.

562. වි. 'සැතැපී'– විඩා හැරැ.

563. වි. 'වත'– වත් මැ. වනු හා සමග.

564. වි. 'පසුත් වත'– ප්‍රවර්ජනා වත් මැ. විනාශ වත් මැ. 'පිසසුන්'– පිශාචයන්. ප්‍රෙතයන්.

566. වි. 'මෙහෙ පතා'– මෙහෙ කෙරෙමි යි ප්‍රාර්ථනා කොට. 'සැපතා'– පැමිණියා වූ. 'අමතා'– බණවා. අම න්ත්‍රණය කොට.

567. අර්‍ථ. යක්‍ෂ–භූත–පිශාචයන් කළා වූ උපද්‍රවයන් දුරින් දුරු කළා වූ කෝටි ලක්‍ෂයක් චක්‍රවාටයෙහි අත් නොහැර ළ ඇශූ චක්‍රය නිත්‍යයෙන් පැතුරුණා වූ–

568. වි. 'පුර පිරිතට'– (විශාලා) පුර පරිත්‍රාණය (සර්ව ප්‍රකාරයෙන් රක්‍ෂම) පිණිස. 'රුවන් මහ සූතුර'– රතන මහා සූත්‍රය. 'ඒ තෙරිඳුව කියා' යි සබඳ.

569. වි. 'මිණි පයැ'–මණි පාත්‍රයෙහි. 'මෙ පිරිත සපුරු දෙසා'– මේ සූත්‍රය සම්පූර්ණයෙන් දෙශනා කොට. 'පිරිත් කරව යි'– පරිත්‍රාණය කරව යි.

571. වි. 'රජස'– ධූලි. 'දෙ පසැ සිතියම් කළ'–දෙ පිටැ චිත්‍ර කර්ම කරන ලද. 'වතින'– වස්ත්‍රයෙන්. 'සොයා'– සෙවිලි කොට.

572. වි. 'විදු'– විදුලි ය. 'ලඹ මල්'– එල්ලෙන මල්. 'මල් පට'– පුෂ්ප පටය., ඵ සත්‍රයක් මෙන් නොතන ලද මල්.

573. අර්‍ථ. නගරයේ පෙරහර සකස් කොට වහා (නොසරස්) සරහා, බුදුන් සහ සඞ්ඝ සමූහයා ඇතුළු නුවරට වැඩම කරවා ගෙනැ ගොස්.

574. අන්වය. මැනි යුත් (මනාත්‍රිත් සහිත වූ) සත් දහස් සත් සිය නිරිඳුන් ඉඳිනා මහත් දිගු පුළුල ඇති, සුරිඳු විජයොත් පායැ සිරි ගත්– (57ර වැන්නෙහි මහ පා යැ යනු හා සබඳි.)

575. වි. 'මෙර අගේ'– මේරු (පර්වත) අග්‍රයෙහි. 'සුරන් ලෙස'– දෙවියන් මෙන්. 'පල අගේ'– පියසි අගැ. පියසි අගැ රන් දද ලෙලෙන කලැ ඒ මෙර අගැ සුරන් ලෙලෙනා වැන්නැ. 'මිණි කොත් කිරණ තරගේ'– මැණික් කොතෙහි (ශෘඞ්ගයෙහි) රශ්මි තරඞ්ගයන්. (රැස් රළ). 'නුබැ සිතියම් රගේ පැතිරි'– ආකාශයෙහි සිතියම් මෙන් පතලා වූ. මිණි කොතෙහි රශ්මීන් රළ ගැසෙමින් අහසට වදනා කලැ ඒ අහසෙහි සිතියම් වැන්නැ.

576. අන්වය: හිරු සඳු රන් කිරුළු මුදුනැ දුන් මිණි සිරි දුන්, සත සිත නඳුන් කළ, නුවර මැද නිරඳුන් මහ පායැ–

* 'හිමසද' යනු මුද්‍රණ දෝෂයි.

අර්‍ථ. සූසියා ද චඳුයා ද වෙටුනු අනැ යෙදූ මාණික්‍ය ආකාරය දුන්නා වූ, සත්‍වයන් ගේ චිත්තය සතුටු කළා වූ, නගරයා ගේ මධ්‍යයෙහි රජුන් ගේ මහා ප්‍රාසාදය (සර්‍වා ගාරය) – 'නද කැරූ' 'අවුරු' යනාදිය හා සම්බන්ධ යි.

577. අර්‍ථ: වැදී සිටියා දූ ආකාශ ගඞ්ගාව මෙන් පිරිසිදු වූ සුදු වූ වියන් බැඳැ, රන් තරු මැද්දෙහි දිලෙන්නා වූ මාලාව ලම්බයෙන් (එල්ලෙන මල් වැලින්) ද මුතු ලැලින් ද නානා නිය කොටැ–

ටි. 'රන් තරු'– රන් පැහැ ඇති ද්‍රව්‍යයෙකින් කළ තාරකා දුනුදු වියන්හි යොදනු ලැබේ.

578 ටි. 'උදුරා ගත්'– පැහැරූ ගත්තා වූ. 'දිවි රස් එළි'– සූර්‍ය රශ්මිය මෙන්. ('ගත අඳුරු දුරු ලන' යි සබඳි.) 'නෙත් පැහැරූ රුවත්'– ඇස් ඇදූ ගත්තා වූ. එ තරම් අලංකාර වූ. ('රන් පට තිරෙන්' යි සබඳි.) 'අවුරු'– ආවරණය කොටැ.

579 ටි. 'සිවු දූ ගඳ'– සතර වර්‍ගයේ සුවඳ. 'බුමු තුරුණු'– භූම්‍යාස්තරණ. බිම් ඇතිරිලි.

580. ටි. 'බැඳ සේ සඳුන් මනනද'– මෙසේ වූයේ අසුන යි. අසුනට සුදු කුඩයක් බඳිනු සිරිති.

581. ටි. 'සත් රුවන'– චක්‍ර රත්නය. 'ගුණෙන් පිරි සිදුවා'– ගුණයෙන් පිරිසිදු වැ.

582. ටි. 'සිතු මිණ ඉදිරි කැරූ'– චින්තාමාණික්‍යය ප්‍රමුඛ කොටැ. •'පිය කරණ'– ප්‍රියයට හෙතු වූ.

583. ටි. 'ද්‍යො සිලිලින'– කාන්තිය නමැති ජලයෙන්. 'ද්‍යො' නම් කාන්තිය යි. 'සරණ ද්‍යො කැරූ'– පාදය සේදීම කොටැ. 'ශිස බිමැ පහරවා පාදය වැඳැ' යි කී සේ යැ. 'ද්‍යො අත මුදුනැ තබා' යි අන්වය යි.

584. ටි. 'මැති මුළු'– අමාත්‍ය සමූහයා.

585. අර්‍ථ: සකල ශාස්ත්‍රයෙහි නිපුණ (දක්‍ෂ) වූ, සුර ගුරු හු (බෘහස්පතිහු) මෙන් දීපිත (එළි ඇති) වූ, කුල චාරිත්‍ර යෙහි දන්නා වූ (විනීත වූ) බමුණෝ මුනිඳු වැදැ උන්නෝ යැ.

586. ටි. 'දෙනෙත් සුපිරිටියෝ'– ධනයෙන් සුප්‍ර තිෂ්ඨිත වූවාහු 'මහාධනවූ' යි කී සේ යි. 'යසෙසන් නො කිලිටියෝ'– යසසින් (කීර්ති‍යෙන්) කිළිටි නුවූවාහු.

587. වි. 'තැනෙකත් නොලස් වූ'– එක් තැනෙක ද ප්‍රමාද නුවූවා වූ. 'සෙනඟ' යන්නට විශෙෂණ යි. 'ඊස් වූ තැන් නො කොටැ'– ඊස් තැනක් නො තබා. 'රැස් වූ' යන්නට විශෙෂණ යි.

588. වි. 'අතුරු නො හැරැ'– අතරක් නො තබා.

589. වි. 'එ මුරු'– ඒ දෙවියෝ. 'සියුම් වෙස් ගෙනැ'– සූක්‍ෂ්ම ශරීර මවා ගෙනැ.

590. අන්‍වය: පිරි පිරි වට තුන් පවුරෙකින් වට කළ එ පුර...............

වි. 'පිරි පිරි'– පිරුණා වූ පරිඛාව (දිය අගල.) 'වට'– භාත්පස්හි වූ. පරිඛායෙන් පරික්‍ෂිප්ත වූ යැ යු සේ යි.

594. වි. 'සොළොස් රගෙකින්'– ආශය අනුශය ඈදි සොළොස් ආකාරයෙකින්.

595. අර්‍ථ: දත් නමැති රෙණු සමූහ රැඳුණා වූ දිව නමැති කෙමියෙන් දිලිසුණා වූ මුඛය නමැති පද්මය ප්‍රබොධ කොටැ (කට හැරැ) සියලු පෘථිවිය ද ආකාශය ද අතර සුවද කොටැ–

596. අර්‍ථ: (දඹ දිවට ලකුණු වූ) මහා ජම්බු වෘක්‍ෂය සොලවා සියලු එල අවුළා ගෙනැ, (ඒ එලයන් ගේ) රසය (සුෂය; අමෘත රසය (ද) යොදා ගෙනැ (එක් කොටැ ගෙනැ) ලොකයාට නිසි සේ බෙදා දෙන්නාක් මෙන්–

597. අර්‍ථ: පෘථිවිය පෙරළා යට (භාගය) උඩට හරවා ගෙනැ, එහි (වූ) රසය රැස් කොටැ ගෙනැ, මිටු (මීපැණි) රැසයට අධික වන්නා වූ ඒ මිහී (පෘථිවි) රසය ලොකයා හට දෙන්නා සේ–

ආදියෙහි පෘථිවිය අමා පිඩක් මෙන් රසවත් වූ හ යි ද මනුෂ්‍යයන් ගේ ආශාව කරණ කොටැ ගෙනැ මතු පිටැ රස නැති වූ හ යි ද යට රස තව මැ ඇතැ යි ද යෙහි.

598. වි. 'සවනැ'– ශ්‍රවණයෙහි. කනෙහි. 'බඹ ගොස' බ්‍රහ්ම ඝොෂය. බ්‍රහ්මයා ගේ හඬට බඳු හඬ.

600. වි. 'මෙ මැ සුතත'– මේ සූත්‍රාන්තය මැ. රතන සූත්‍රය මැ. 'සූත්‍ර' 'සූත්‍රාන්ත' යන දෙක මැ එකාර්‍ථ යි. 'අට්ඨ පන් සියක් දහසෙක'– පන්සිය අසූ අට දහසක් යැ. පන් ලක්‍ෂ අසූ අට දහසෙකි.

601. වි. 'ලොවට'– ලොකසත්ත්වයාට. 'මෙද ලොවට'– මෙලෝ පරලෝ දෙකට; මෙලෝ පරලෝ වැඩ පිණිස. 'සිරි යැ'– සිරිසේ යැ. 'සිවු' ධාතුව සිව්– සිවිනි– සිවි– ආ විසින් වරනැඟේ.

602. වි. 'ගුණ කදට'– ගුණ සමූහයට. 'පහදුව'– ප්‍රසන්න වව. 'උන් සරණට වදුව'– උන් ගේ ශරණයට පැමිණෙව්. 'බුද්ධං සරණං ගච්ඡාමි' යි උන් ගේ ශරණය ගනුව. ඇතැමෙක් 'උන් සරණට වඳුව' යි ගෙනැ 'උන් ගේ චරණයට නමස්කාර කරව'යි අරුත් බෙණෙති. එ ද මූලැ මැ 'ඉන් එ බුදුන් වඳුව'යි තබියැ දී මැ යැ. සිතාවට සුදුසු යැ.

603. වි. 'විරත වැ'– විරක්ත වැ. ඇලුම් නැතිවැ. 'මිස දිටු කිලුටු පතිත වැ නො ගොස්'– මිථ්‍යා දෘෂ්ටි නමැති අපවිත්‍රයෙහි වැටී නො ගොස්.

604. වි. 'පේ වව'– පෞෂධ සීලය ගනුව. අට සිල් ගනුව. 'දිවි'– ජීවිතය. 'දස පින් කිරිය වත්'– දශ පුණ්‍ය ක්‍රියා වස්තු.

605. වි. 'විසිතුරු පුද වතින්'– විචිත්‍ර වූ පූජා වස්තුයෙන්.

606. වි. 'පිළිවෙතැ'– ප්‍රතිපත්තියෙහි.

608. වි. 'පසිදැ'– ප්‍රච්ඡින්න කොටැ. වනසා.

609. වි. 'සමතැස් මුනිඳු'– සමන්ත චක්ෂුස් වූ මුනීන්ද්‍රයා සියල්ල දක්නා දිවැස් ඇති මුනීන්ද්‍රයා. 'දිය ගොස්'– ජය ඝොෂය. 'රජ බිසෙව් ලද'– රාජාභිෂෙකය ලැබුවා වූ. 'පිරි වස් තුනෙහි'– පිරුණා වූ තුන් වන හවුරුද්දෙහි.

610. වි. 'දින පුද'– ජින පූජා. බුද්ධ පූජා. 'දන මන රදන'– ජනයන් ගේ සිත් සතුටු කරන. 'සර ගෙ උයන් සිරින් සැදි'– සාර වූ ගෘහොද්‍යාන ශ්‍රීන් අලඞ්කෘත වූ. 'වැජැඹෙන'– පවත්නා වූ.

611. වි. 'කිත් යස කොත් දස දිගු දිගු යටි අගැ බඳ'– කීර්ති නමැති මනා කොඩි දශ දිශා නමැති දීර්ඝ වූ ඊටි අගැ බැන්ද වූ. දශ දිශායෙහි කීර්තිය පතළාවූ. 'මහ නෙත් පා මුල'– මහා නෙත්‍ර ප්‍රාසාද මූල. එනම් සඞ්ඝාවාසයට අධිපති. 'මෙත'– මෛත්‍රෙය. මේ තෙරිඳුන් ගේ නම යි. 'සත් වැඩ පිණිස'– ලොක සත්ත්වයාට යහපතක් වනු පිණිස. 'නඳ මෙ ද'– නන්දනීය වූ (සතුටු එළවන්නා වූ) මෙය ද.



